21 වන කාණ්ඩය
11 වන කලාපය

බ්‍රහස්පතින්දා
1982 ඔක්තෝබර් 28

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

### අන්තර්ගත ප්‍රධාන කරුණු

පාර්ලිමේන්තුව කැඳවීමේ ප්‍රකාශනය

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:
මහජන ආරක්ෂක ප්‍රකාශනය

පාර්ලිමේන්තුවේ වැඩබලන මහ ලේකම් පත් කිරීම

ණය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

නිවේදනය:
කථානායකතුමාගේ සහතික

විගණකාධිපතිගේ වාර්තාව

ණය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී

හාරිස්පත්තුව දෙවන මන්ත්‍රී ආර්. පී. විජේසිරි මහතාගේ ප්‍රකාශය

මහජන ආරක්ෂක ප්‍රකාශනය

... did not see Speaker in his chambers as required by Convention
Emergency Debate. TULF supported it
P.M. attacks Naikin
October

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 21
இல. 11

வியாழக்கிழமை
28 ஒக்ரோபர் 1982

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

## பிரதான உள்ளடக்கம்

பாராளுமன்றத்தைக் கூட்டும் பிரகடனம்

சனாதிபதியிடமிருந்து வந்த செய்தி :
    பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

பாராளுமன்றப் பதிற் செயலாளர் அதிபதி நியமனம்

கடன்கள் (சிறப்பேற்பாடுகள்) சட்டமூலம் : உயர் நீதிமன்றத் தீர்ப்பு

அறிவிப்பு :
    சபாநாயகரின் சான்றிதழ்கள்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

கடனகள் (சிறப்பேற்பாடுகள்) சட்டமூலம் :
    முதன்முறை மதிப்பிடப்பட்டது

ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர் திரு. ஆர். பி. விஜேசிறி அவர்களது அறிக்கை

பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

---

**Volume 21**
**No. 11**

**Thursday**
**28th October 1982**

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## OFFICIAL REPORT

**(Uncorrected)**

## PRINCIPAL CONTENTS

PROCLAMATION SUMMONING PARLIAMENT

MESSAGE FROM THE PRESIDENT :
    Public Security Proclamation

APPOINTMENT OF ACTING SECRETARY-GENERAL OF PARLIAMENT

LOANS (SPECIAL PROVISIONS) BILL : DECISION OF THE SUPREME COURT

ANNOUNCEMENT :
    Speaker's Certificates

AUDITOR-GENERAL'S REPORT

LOANS (SPECIAL PROVISIONS) BILL :
    Read the First time

STATEMENT BY MR. R. P. WIJESIRI, SECOND MEMBER FOR HARISPATTUWA

PUBLIC SECURITY PROCLAMATION

2–A 66177–3,425 (82/10)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

---

### 1982 ඔක්තෝබර් 28 වන බ්‍රහස්පතින්ද

***வியாழக்கிழமை, 28 ஒக்ரோபர் 1982***

*Thursday, 28th October, 1982*

**අ. භා. 3 ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [අල් හාජ් එම්. අබ්දුල් බාකීර් මාකාර් මහතා] මූලාසනාරූඪ විය.**

*பாராளுமன்றம் பி. ப. 3 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [அல் ஹாஜ் எம். அப்துல் பாகிர் மாகார்] தலைமை வகித்தார்கள்.*

*The House met at 3 p.m.*, MR. SPEAKER (AL HAJ M. ABDUL BAKEER MARKAR) *in the Chair.*

## පාර්ලිමේන්තුව කැඳවීමේ ප්‍රකාශනය
### பாராளுமன்றத்தைக் கூட்டும் பிரகடனம்
### PROCLAMATION SUMMONING PARLIAMENT

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

The Secretary-General will read the Proclamation summoning Parliament.

**අනතුරුව පහත සඳහන් ප්‍රකාශනය වැඩබලන මහ ලේකම් විසින් කියවන ලදී:**

*அதன்மேல் பதிற் செயலாளர் அதிபதி பின்வரும் பிரகடனத்தை வாசித்தார் :*

*Thereupon the Acting Secretary-General read the following Proclamation :*

**ජනාධිපති උතුමාණන් විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

**ජේ. ආර්. ජයවර්ධන**

මුද්‍රාව

1959 අංක 8 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සංශෝධිත (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන, 1982 ඔක්තෝබර් මස විසි වන දින ක්‍රියාත්මක විය යුතු බවට ප්‍රකාශ කරමින් (මෙහි මින් මතු "හදිසි අවස්ථා ප්‍රකාශනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රකාශනයක්, ඒ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ කරනු ලැබ, 1982 ඔක්තෝබර් මස විසි වන දින අංක 215/6 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද හෙයින් ද:

හදිසි අවස්ථා ප්‍රකාශනය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ (ii) වන අනුඡේදය සහ ඉහත කී ආඥාපනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය මගින් පාර්ලිමේන්තුවට දන්වා යැවිය යුතු යයි නියම කරනු ලැබ ඇති හෙයින් ද:

දින දහයක් තුළ දී අවසන් නොවන පරිදි රැස්වීම් කල් තැබීමක් නිසා පාර්ලිමේන්තුව විසංයුක්තව තිබෙන හෙයින් ද එහි ප්‍රතිඵලයක් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ (ii) වන අනුඡේදය සහ ඉහත කී ආඥාපනතේ 2 වන වගන්තියෙ (3) වන උපවගන්තිය මගින් නියම කරනු ලැබ ඇති පරිදි, දින දහයක් තුළ දී පාර්ලිමේන්තුව රැස්වීම සඳහා ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබිය යුතු හෙයින් ද:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ (ii) වන අනුඡේදයෙන් සහ ඉහත කී ආඥාපනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, ජූනියස් රිචඩ් ජයවර්ධන වන මම, හදිසි අවස්ථා ප්‍රකාශනයක් කළ බව පාර්ලිමේන්තුවට දන්වා සිටීමට හැකි **වන පරිදි 1982 ඔක්තෝබර් මස විසිඅට වන දින පස්වරු 3.00 ට පාර්ලිමේන්තුව රැස්වීම පිණිස මේ ප්‍රකාශනය මගින් කැඳවා සිටිමි.**

එක් දහස් නවසිය අසූ දෙකක් වූ ඔක්තෝබර් මස විසිඑක් වන දින කොළඹ දී දෙන ලදී.

උතුමාණන්ගේ අණ පරිදි,

ඩබ්ලිව්. ඇම්. පී. බී. මැණික්දිවෙල,

ජනාධිපති ලේකම්.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
### சனாதிபதியிடமிருந்து வந்த செய்தி
### MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
#### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
#### PUBLIC SECURITY PROCLAMATION

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

I have received the following communication from His Excellency the President dated October 20, 1982:

"ශ්‍රී ලංකා ජනාධිපති

**இலங்கையின் சனாதிபதி**

" PRESIDENT OF SRI LANKA

Colombo, October 20, 1982.

Hon. Mr. Speaker,

By Proclamation dated October 20, 1982 and made under section 2 of the Public Security Ordinance (Cap 40), as amended by Act, No. 8 of 1959 and Law No. 6 of 1978, I have declared that the provisions of part II of the aforesaid Ordinance shall come into operation on October 20, 1982, throughout Sri Lanka.

2. In compliance with paragraph (4) of Article 155 of the Constitution, I do hereby communicate to Parliament that the reason for making the Proclamation as aforesaid is for the preservation of public order and the maintenance of supplies and services essential to the life of the community.

J. R. Jayewardene,
*President.*

Hon. Speaker of the Parliament."

## පාර්ලිමේන්තුවේ වැඩබලන මහලේකම් පත්කිරීම
### பாராளுமன்றப் பதிற் செயலாளர் அதிபதி நியமனம்
### APPOINTMENT OF ACTING SECRETARY-GENERAL OF PARLIAMENT

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

The Deputy Secretary-General has received a letter from the Secretary to the President which will now be read to the Parliament.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අනිගරු ජනාධිපති උතුමාණන්ගේ ලේකම්ගෙන් ලැබුණු, පහත සඳහන් ලිපිය වැඩබලන මහ ලේකම් විසින් කියවන ලදී :**

*மேன்மைதங்கிய சனாதிபதியின் செயலாளரிடமிருந்து கிடைத்த பின்வரும் கடிதத்தை பதிற் செயலாளர் அதிபதி வாசித்தார் :*

*THE ACTING SECRETARY-GENERAL read the following letter received from the Secretary to His Excellency the President :*

"ජනාධිපති කාර්යාලය

ஜனாதிபதியின் செயலகம்

**PRESIDENTIAL SECRETARIAT**

මගේ අංකය : ජී/ජී/12.
எனது எண்
My No.
ජනරජ චතුරශ්‍රය,
කොළඹ 1,
குடியரசுச் சதுக்கம்,
கொழும்பு 1.
Republic Square,
Colombo 1.
1982 ඔක්තෝබර් 05.

මහත්මයාණෙනි,

පාර්ලිමේන්තුවේ මහ ලේකම්, එස්. එන්. සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකාවට පෙරළා පැමිණෙන තුරු හෝ නැවත නියෝග කරන තුරු හෝ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 (6) වැනි ව්‍යවස්ථාව යටතේ, ජනාධිපතිතුමන් විසින් 1982 ඔක්තෝබර් 02 වැනි දින සිට පාර්ලිමේන්තුවේ මහ ලේකම් වශයෙන් වැඩ බැලීමට ඔබ පත් කළ බැව් ඔබට දැන් වීමට එතුමන් විසින් මට නියම කර තිබේ.

2. ඒ අනුව ඔබගේ පත්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබේ.

මෙයට,
විශ්වාසී,
ඩබ්ලිව්. ඇම්. පී. බී. මැණික්දිවෙල,
ජනාධිපති ලේකම්.

පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්,
බී. එස්. බී. තිත්තවැල්ල මහතා."

## ණය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

### கடன்கள் (சிறப்பேற்பாடுகள்) சட்டமூலம் : உயர்நீதிமன்றத் தீர்ப்பு

## LOANS (SPECIAL PROVISIONS) BILL : DECISION OF THE SUPREME COURT

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

I have an announcement to make regarding the Loans (Special Provisions) Bll.

This Bill was referred for the special determination of the Supreme Court by His Excellency the President under Article 122 (1) (b) of the Constitution. The Court is of opinion that the Bill or any of its provisions are not inconsistent with any provisions of the Constitution.

I order that the decision of the Court be printed in the Official Report of today's proceedings.

"LOANS (SPECIAL PROVISIONS) BILL"

DECISION OF THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

In the matter of a reference under Article 122 (1) (b) of the Constitution.

S. D. 2/82

*Present.*–S. Sharvananda–Judge of the Supreme Court. J. A. R. Victor Perera–Judge of the Supreme Court. J. F. A. Soza–Judge of the Supreme Court. K. M. M. B. Kulatunga, Solicitor-General with S. Ratnapala, State Counsel, for the Attorney-General.

*Court Assembled for the Hearing.*–At 10.00 a.m. on 27th October 1982.

A Bill titled "Loans (Special Provisions) Act" No......... of 1982, was referred to this Court by His Excellency the President, in terms of Article 122 (1) (b) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, for the special determination whether the Bill or any provision thereof is inconsistent with the Constitution. The Bill contained a certificate by which the Cabinet of Ministers has certified that the Bill is urgent in the national interests. The learned Solicitor-General appeared before us and assisted us in the consideration of this Bill.

Paragraph 2 of the Bill provides for authority for raising loans for the service of the Government during any period commencing on the first day of any financial year for which no Appropriation Act has been passed by Parliament and ending on the date of commencement of the Appropriation Act. This paragraph stipulates that the aggregate proceeds of the loans raised in any period of three months in the relevant period shall not exceed one fourth of the total amount of the loans authorised to be raised for the preceding financial year of the Government by the Appropriation Act for that financial year.

We have considered these provisions and we determine that the bill or any of its provisions are not inconsistent with any provision of the Constitution.

S. Sharvananda,
*Judge of the Supreme Court.*
J. A. R. Victor Perera,
*Judge of the Supreme Court.*
J. F. A. Soza,
*Judge of the Supreme Court.*

## නිවේදනය

### அறிவிப்பு

## ANNOUNCEMENT

### කථානායකතුමාගේ සහතික

### சபாநாயகரின் சான்றிதழ்கள்

### SPEAKER'S CERTIFICATES

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

I wish to announce that the Deputy Speaker has under the provisions of Article 79 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, endorsed The Certificate on the following Bills on September 17, 1982 :

Muslim Ladies Study Circle (Incorporation)
Development Councils (Amendment)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I wish to announce that the Deputy Speaker has, under the provisions of Article 79 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, endorsed the Certificate on the following Bills on, September 23, 1982:

Muslim Mosques and Charitable Trusts or Wakfs (Amendment)
Naleemiah Institute of Islamic Studies Society (Incorporation)

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I wish to announce that I have, under the provisions of Article 79 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, endorsed the Certificate on the following Bills on October 12, 1982:

National crafts Council and Allied Institutions

Shop and Office Employees (Regulation of Employment and Remuneration) and Wages Boards (Amendment)

Fisheries (Regulation of Foreign Fishing Boats) (Amendment)

All Ceylon Muslim Women's Association (Incorporation)
Code of Criminal Procedure (Amendment)

## විගණකාධිපතිගේ වාර්තාව
### கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
### AUDITOR GENERAL'S REPORT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I present the Second, Third, Fourth and Fifth Instalments of the Report of the Auditor-General under Article 154 (6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka on the Accounts of the Government of Sri Lanka for the Financial Year 1981.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(திரு. எம். வின்சன்ற் பெரேரா—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)
(Mr. M. Vincent Perera—Minister of Parliamentary Affairs and Sports and Chief Government Whip)

I move,

"That the Second, Third, Fourth and Fifth Instalments of the Report of the Auditor-General under Article 154 (6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka on the Accounts of the Government of Sri Lanka for the Financial Year 1981, be printed."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
*Ordered that the Report be printed.*

## පෙත්සම්
### மனுக்கள்
### PETITIONS

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා** (ගාල්ල)
(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)
(Dr. W. Dahanayake—Galle)

I present a petition from Mrs. A. G. Perera of Clifton Balika Vidyalaya, Colombo 10.

**ජේ. එම්. කුමාරදාස මහතා** (වැල්ලවාය)
(திரு. ஜே. எம். குமாரதாச—வெல்லவாய)
(Mr. J. M. Kumaradasa—Wellawaya)

ගරු කථානායකතුමනි, සූරියවැව, මහගල්වැව නගරයේ පදිංචි ඩී. එස්. එන්. දිසානායක මහතා විසින් ඇති 1982 අගෝස්තු 14 දින දරන පෙත්සමක් මම ඉදිරිපත් කරමි.

**ෂෙල්ටන් රණරාජ මහතා (නියෝජ්‍ය අධිකරණ ඇමතිතුමා)**
(திரு. ஷெல்டன் றணராஜா—நீதிப் பிரதி அமைச்சர்)
(Mr. Shelton Ranaraja—Deputy Minister of Justice)

I present a petition from Mr. K. P. Siyathu of No. 9/4, Dharmasoka, Mawatha Arruppola, Kandy.

මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතුයයි නියෝග කරන ලදී.
பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
*Ordered to be referred to the Public Petitions Committee.*

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
### BILLS PRESENTED

### ණය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
### கடன்கள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்
### LOANS (SPECIAL PROVISIONS) BILL

"Bill to authorize the raising of loans in, or outside, Sri Lanka for the service of the Government during any period in respect of which no Appropriation Act has been passed authorizing expenditure during that period and to provide for the payment from such loans of moneys required during that period for expenditure on such service; and to provide for matters connected therewith or incidental thereto."

**පිළිගන්වන ලද්දේ ආර්. ජේ. ජී. ද මෙල් මහතා විසිනි.**

**1982 නොවැම්බර් 2 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.**

*நிதி, அமைப்புத்திட்ட அமைச்சர் திரு. ஆர். ஜே. ஜீ. த மெல் அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1982, நொவம்பர் 2, செவ்வாய்க் கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by R. J. G. de Mel, to be read a Second time upon Tuesday, 2nd November 1982 and to be printed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පාර්ලිමේන්තුවේ කටයුතු

*பாராளுமன்ற அலுவல்*

## BUSINESS OF THE PARLIAMENT

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

Item 2 is not being moved.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

*(திரு. எம். வின்சன்ற் பெரேரா)*

**(Mr. M. Vincent Perera)**

I move.

"That the proceedings on Items 1 to 3 of Public Business appearing on the Paper be exempted at this day's sittings from the provisions of Standing Order No. 23."

**ආර්. ජේ. ජී. ද මැල් මහතා (මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමා)**

*(திரு. ஆர். ஜே. ஜீ. த மெல்—நிதி, அமைப்புத்திட்ட அமைச்சர்)*

**(Mr. R. J. G. de Mel—Minister of Finance and Planning)**

Items 2 and 3 of Public Business can stand down for 2nd November.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)**

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—அத்தனகல்ல)*

**(Mr. Lakshman Jayakody—Attanagalla)**

Sir, this is confusing. May I ask the Hon. Minister to be more specific on this. Does it mean that only Item 1 will be taken up today ?

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

Yes.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

**வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

*Question put, and agreed to.*

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

*(திரு. எம். வின்சன்ற் பெரேரா)*

**(Mr. M. Vincent Perera)**

I move,

"That the proceedings on Item 1 of Public Business appearing on the Paper be exempted at this day's sittings from the provisions of Standing Order No. 7."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

**வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්

*பாராளுமன்ற அமர்வு*

## SITTINGS OF THE PARLIAMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

*(திரு. எம். வின்சன்ற் பெரேரா)*

**(Mr. M. Vincent Perera)**

I move,

"That this Parliament at its rising this day do adjourn until 3 p.m. on Tuesday, 2nd November, 1982."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

**வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

*Question put, and agreed to.*

## හාරිස්පත්තුවේ දෙවන මන්ත්‍රී ආර්. පී. විජේසිරි මහතාගේ ප්‍රකාශය

*ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர் திரு. ஆர். பீ. விஜேசிறி அவர்களது அறிக்கை*

## STATEMENT BY MR. R. P. WIJESIRI, SECOND MEMBER FOR HARISPATTUWA

**ආර්. පී. විජේසිරි මහතා** (හාරිස්පත්තුව දෙවන)

*(திரு. ஆர். பீ. விஜேசிறி—ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர்)*

**(Mr. R. P. Wijesiri—Second Harispattuwa)**

නැගී සිටියේය—

*எழுந்தார்.*

*rose.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

Nobody has seen me in my Chambers regarding this.

**ආර්. ප්‍රේමදාස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

*(திரு. ஆர். பிரேமதாச—பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)*

**(Mr. R. Premadasa—Prime Minister, Minister of Local Government, Housing and Construction, Minister of Highways, and Leader of the House of Parliament)**

I think the hon. Member has to make a statement.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

He has not seen me in my Chambers. The usual procedure has not been followed.

**ආර්. ප්‍රේමදාස මහතා**

*(திரு. ஆர். பிரேமதாச)*

**(Mr. R. Premadasa)**

With the permission of the House the hon. Member may be allowed to make a statement.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

This should not be taken as a precedent.

Yes, the hon. Member may make his statement.

අ. භා. 3.11

**ආර්. පී. විජේසිරි මහතා**

*(திரு. ஆர். பீ. விஜேசிறி)*

**(Mr. R. P. Wijesiri)**

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ අවසරය දීම ගැන මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. මම දීර්ඝ ප්‍රකාශයක් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මම අද ගන්නා තීරණයේ පියවර ගැන තමුන්නාන්සේට කෙටියෙන් කරුණු කිහිපයක් පමණක් මතක් කරන්නයි බලාපොරොත්තු වෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1977 මහ මැතිවරණයේදී ශ්‍රී ලංකාවෙන්ම ස්වාධීනව තරඟකොට ජයග්‍රහණය කළ එකම මන්ත්‍රීවරයා මමයි. ඒ ජයග්‍රහණය කරලා එදා අන්ත පරාජයට පත් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැදිලා එහි සාමාජිකත්වය අරගෙන අවුරුදු තුනහමාරක පමණ කාලයක් එම පක්ෂයේ වැඩිදියුණුව පිණිස—වැටුණු පක්ෂයක් ගොඩ ගැනීම පිණිස—සෑහෙන දුරකට මගේ කාලයත්, ශ්‍රමයත්, ධනයත් ආදී සෑම දෙයක්ම වැය කර මම කටයුතු කළා. 1980 ඔක්තෝබර් මාසයේ 16 වැනිදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිනියගේ ප්‍රජා අයිතිය අහිමි වුණාට පසුව අත්තනගල්ල ආසනයේ පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවේ සිට ඇති වූ ප්‍රශ්නයක් උඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ කණ්ඩායම් වශයෙන් අපි ක්‍රියා කළ හැටි තමුන්නාන්සේ දන්නවා ඇති.

එහෙම කටයුතු කළ පසුගිය කාලයේ 'අපියි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, අපියි නීත්‍යානුකූල ශ්‍රී ලංකා නිදහස් පක්ෂය' කියාගෙන මැදවච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ (මෛත්‍රීපාල සේනානායක මහතා) නායකත්වයෙන් අපි අවුරුද්දකටත් වැඩි කාලයක් 'අපියි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය' කියන තර්කය උඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සංවිධානය කරගෙන ගියා. එසේ තිබියදී සැප්තැම්බර් මාසයේ 9 වෙනිදා මැතිවරණ කොමසාරිස්තුමා විසින් නිල ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙයයි කියා ප්‍රකාශයට පත් කළාට පසුව, පසුගිය මාසයේ 21 වෙනිදා ජනාධිපතිතුමා හමුවට ගිය මා නැවත වරක් මා හිටිය පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයටම බැදෙන්නට කැමැත්ත ප්‍රකාශ කළ බව මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එදින සිට මට පුළුවන් ශක්ති ප්‍රමාණයෙන් එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂක ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාගේ ජයග්‍රහණය තහවුරු කිරීම පිණිස මම වැඩ කළාය කියන එකත් විශේෂයෙන්ම මතක් කරනවා.

ගරු කථානායකතුමනි, 1977 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරාජයට පත් වෙනවාත් සමග මම ඒ පක්ෂයට බැඳුනේ මේ වගේ වෙලාවක එම පක්ෂය අත්හැර යන බලාපොරොත්තුවෙන් නොවන බවත් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂ අතුරින් එක්සත් ජාතික පක්ෂයට විකල්ප පක්ෂයක් හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තිබිය යුතුය කියන අදහස උඩ මම ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැදී නැවත වතාවක් එම පක්ෂය ඉදිරියට ගෙන ඒම පිණිස මේ සභාව තුළදීත් පිටතදීත් මට පුළුවන් තරමින් ඒ පක්ෂය වෙනුවෙන් වැඩ කළ බව තමුන්නාන්සේත් පිළිගන්නවා ඇති. ඒදා, 1980 ඔක්තෝබර් මස 16 වෙනිද සිරිමා බණ්ඩාරනායක මැතිනියට ප්‍රජා අයිතිය අහිමි වීමත් සමගම අත්තනගල්ල ආසනය පුරප්පාඩු වීමේ ප්‍රශ්නය උඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ 12 දෙනෙක් එක පැත්තකටත් 5 දෙනෙක් එක පැත්තකටත් කැඩීම නිසා පක්ෂය ඇතුලේ අර්බුදයක් ඇති වුණා. මා කෙරෙහි බොහොම හිතවත්ව බොහොම කිට්ටුවෙන් විශ්වාසදායකව කටයුතු කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව ඊට පසුව, ඒ අත්තනගල්ල ප්‍රශ්නයෙන් පසුව, නොයෙක් විට ප්‍රකාශ කළා, ප්‍රසිද්ධ රැස්වීම්වලදී පවා ප්‍රකාශ කළා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මාව බඳවා ගැනීමෙන් ලොකු වරදක් කර ගත්තාය කියා. ඔය විධියේ ප්‍රකාශ කළත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කර ගැනීම පිණිස ඒ පක්ෂයේම රැඳී සිටිමින් මැදවච්චියේ මන්ත්‍රීතුමාගේ නායකත්වයෙන් අපි ඒ පක්ෂයේ සංවිධාන කටයුතු කරගෙන ගියා.

මේ විධියට කටයුතු කරගෙන යද්දී පසුගිය මාර්තු මස 31 වෙනිදා ඒ දෙපිළක් හැටියට සිටිය අපේ පිළෙනුත් එක් කණ්ඩායමක්—නුවරඑළිය මස්කෙලිය දෙවන ගරු මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) ප්‍රධාන මධ්‍යම කාරක සභාවේ 10 දෙනෙක්—අපෙන් කැඩී නැවත වරක් සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ පක්ෂයට එකතු වෙන්න යෝජනාවක් ඉදිරිපත් කළ වෙලාවේ දී බහින් බස් වීමක් සිදු වුණා. ඒ අවස්ථාවේදී, පක්ෂයට ඒ තරම් සේවයක් කරන ලද මට මගේ කුලය පවා ගෙනහැර පාමින් කරන ලද අපහාස විදින්නටත් සිදු වුණ බව මම මේ අවස්ථාවේදී කනගාටුවෙන් වුණත් මතක් කරන්න ඕනෑ. මෙවැනි ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදු වුණත් මාර්තු 31 වෙනිදයින් පසුවටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අත්නොහැර පසුගිය මාසයේ 21 වෙනිදා දක්වාම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් හැටියට අවංකව කටයුතු කළා.

ගරු කථානායකතුමනි, මට පෙනී ගිය කාරණයක් නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුලේ කිසිම සමගියක් නැති අතර එම පක්ෂය පවුලේ බූදලයක් හැටියට ගෙන යන බවයි. එම පක්ෂයේ නායකත්වය සම්බන්ධයෙන් නීත්‍යානුකූල ප්‍රශ්න බලපාන අතර එම නීත්‍යානුකූල තත්ත්වයට සම්බන්ධ ප්‍රශ්න ගැනවත් සැලකිල්ලක් නොදක්වා, වෙනත් නියෝජ්‍ය නායකයෙකුට හෝ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකුට හෝ එම පක්ෂයේ නායකත්වය දරන්න බැහැයි කියන මතය දරමින් ප්‍රජා අයිතිය අහිමි වුණත් "මම තමයි පක්ෂයේ නායිකාව" කියාගෙන කටයුතු කරගෙන යන බවයි, පෙනෙන්නේ.

මම කල්පනා කරන හැටියට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවූ නායක දිවංගත ගරු බණ්ඩාරනායක මැතිතුමා කෙරෙහි තැබූ විශ්වාසය උඩ මේ රටේ විශාල පිරිසක් ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විශාල වශයෙන් ගරු කරනවා. ඔවුන් ඒ පක්ෂය අදහනවා, ඒ පක්ෂය අනුගමනය කරනවා. නමුත් මේ පක්ෂය මේ විධියට පවුලක බූදලයක් හැටියට සලකාගෙන වැඩ කිරීම නිසා සාමාන්‍ය අසරණ ජනතාව මේ පක්ෂයෙන් බලාපොරොත්තු වන දෙයක් කිසිම දවසක ඉෂ්ට නොවන බව මගේ ඒකාන්ත විශ්වාසයයි කියන එක මම කනගාටුවෙන් වුවත් මතක් කරන්නට ඕනෑ.

මේ පක්ෂයට වැඩි වශයෙන් ආධාර කරන්නේ, හිතවන්කම් දක්වන්නේ, සාමාන්‍ය ජනතාවයි. එහෙත් ඒ අයගේ කර උඩින් ගිහින් බලයට පත් වන්නට බලාපොරොත්තු වන අය මේ පක්ෂය එක් පවුලකට, එක් ගෝත්‍රයකට, එක් කොටසකට, සීමිත පිරිසකට සීමා වුණු පක්ෂයක් හැටියට සලකන ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන බව මම කනගාටුවෙන් වුවත් මතක් කරන්නට ඕනෑ. මගේ දකුණු පැත්තේ සිටින, පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයෙක් හැටියට පෙනී සිටින, මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) පවා මේ ගැන සාක්ෂි දරනවා ඇතැයි මම විශ්වාස කරනවා. මේ පක්ෂයේ අවුරුදු විසි ගණනක් සිටි එතුමාට අද වුවත් දැක්වෙන අනුග්‍රහය, සංග්‍රහය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. පී. විජේසිරි මහතා]

කුමක්ද කියා අපි දන්නවා. එතුමා පාර්ලිමේන්තුවේ අවුරුදු 35 කුත් මේ පක්ෂයේ අවුරුදු 26 කුත් හිටියා. ගිය මස 25 වැනිදා එතුමාගේ නිවසේදී මම, මා ගන්නා පියවර එතුමාටත් මධ්‍යම කාරක සභාවටත් ඉතා පැහැදිලිව දන්වා, මා එක්සත් ජාතික පක්ෂයට යන බව දැනුම් දුන්නා. ඒ අවස්ථාවේදීත් මෛත්‍රීපාල සේනානායක මැතිතුමා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් වී සිටි ජනාධිපති අපේක්ෂක හෙක්ටර් කොබ්බෑකඩුව මහත්මයාට ආධාර කරන්නට උත්සාහයක් ගත්තා. එතුමා පත්තරයට ප්‍රකාශයක් කොට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපති අපෙක්ෂකයාට තම සහයෝගය දක්වන්නට ක්‍රියා කරගෙන යන අවස්ථාවේදී පක්ෂයේ නායිකාව 'දිවයින' පත්තරයට ප්‍රකාශයක් කරමින්, "කැඩී ගිය කණ්ඩායමට ඕනෑ නම් බඩගගෙන ආවාදෙන්" යයි කියා තිබුණා. වාසනාවකට මෙන් මම ඒ බඩගෑමෙන් බේරුණා. මම ඊට ඉස්සර වෙලා තීරණයක් කර තිබුණා. බඩගාගෙන යන්න ඔය වදේ මොනවාද තිබෙන්නේ? පැණි තිබෙනවාද? පැණි තියා මසුරන් තිබුණත් මම බඩගාගෙන යන්නේ නැත කියා තීරණයක් කර තිබුණා.

අද ඒ පක්ෂයට ආධාර කරන උදවියට, ඒ පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයාට ආධාර කළ උදවියට කරන්නේ සාදරයෙන් පිළිගැනීමක් නොවෙයි. කුඩම්මාගේ නැත්නම් බාප්පාගේ සැලකිල්ලක් දක්වන්නේ. ජනාධිපති අපේක්ෂකයෙක් ඉදිරිපත් කොට ඔහුගේ ජයග්‍රහණය තහවුරු කිරීමට වැඩ කරන විට, නොයෙක් විධියේ ප්‍රකාශ කරමින්, ඊට අකුල් හෙළමින්, ඊට බාධා කිරීමට කටයුතු කළ බව මතක් කරන්නට ඕනෑ.

මුලින් කිව්වා වාගේ මම පිළිගන්නේ, අනුගමනය කරන්නේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාද පක්ෂ දෙකක් තිබිය යුතුය යන ප්‍රතිපත්තියයි. දිවංගත ගරු බණ්ඩාරනායක මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කළේත් ඒ අදහස උඩයි. එතුමා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් හැටියට ඒ පක්ෂය ආරම්භ කොට ප්‍රජාතන්ත්‍රවාදීව එතුමා ක්‍රියා කරගෙන ගිය නමුත් එතුමා මිය ගියාට පසු අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදීයයි කියන්නේ නමට පමණක් බව මම කනගාටුවෙන් වුවත් මතක් කරන්න ඕනෑ. මේ පක්ෂය තුළ තිබෙන කුමන්ත්‍රණ අදහස්, මේ උදවිය ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන දේ ගැන හිතන විටත් අපේ ජීවිත ගැන පවා ඉතාම භයානක තත්ත්වයක් තිබෙන මම කනගාටුවෙන් වුවත් මතක් කරන්න ඕනෑ.

1980 ඔක්තෝබර් මස 16 වැනි දා සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ ප්‍රජා අයිතිය නැති වන අවස්ථාවේදී පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ නැත්නම් දේශපාලන මණ්ඩලයේ අපි දාහත් දෙනෙක් හිටියා. 1980 සැප්තැම්බර් 25 වැනි දා අපි පක්ෂ මූලස්ථානයේ රැස් වුණා. එසේ රැස්වී ඒ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණාට පසුව අපි ගන්නා පියවර කුමක්ද කියා සාකච්ඡා කළා. ඒ අනුව රට පුරා විශාල ඇවැන්ත රැස්වීම් මාලාවක් පවත්වා මහජන උද්ඝෝෂණයක් ඇති කරන්න ඕනෑ කියා අපි යෝජනා කළා. එදා ඒ දේශපාලන මණ්ඩලය එන්නට නොහැකි වූ පිරිසක් එකතු වී මේ පණ නැති දේශපාලන මණ්ඩලයට මේ ප්‍රජා අයිතිය අහිමි කිරීම ගැන කටයුතු කිරීම බාර දීම ඒ තරම් සුදුසු නැහැ කියා "ඇක්ෂන්" කොමිටියක් කියා එකක් පත් කර ගෙන ඒ "ඇක්ෂන්" කොමිටිය දේශපාලන මණ්ඩලයටත් දන්වන්නේ නැතිව මේ රටේ කලබලකාරී තත්ත්වයක් ඇති කරන්නට එදා ක්‍රියා කළා කියන එක තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ. එසේ ජාතියට හානිකර, සමාජයට හානිකර, පොදු දේපොළවලට හානිකර, මේ රටේ මංමාවත් විනාශ කරන පාලම් කඩන කෝච්චි පෙරළන භයානක වැඩ පිළිවෙළක් එදා සකස් කර තිබුණා.

කණගාටුවෙන් වුණත් මේ අවස්ථාවේ මා මතක් කරන්න ඕනෑ, ඒ තත්වයම මේ මාසයේ 20 වැනි දා ජනාධිපතිවරණයේදීත් තිබුණා කියා. ගරු විදේශ කටයුතු ඇමතිතුමාත් සාක්ෂි දරනවා ඇති, විශේෂයෙන්ම මගේ ආසනයේ එවැනි තත්ත්වයක් තිබුණා. අපට එළිපිටම තර්ජනය කළා. "20 වැනිදායින් පසුව උඹලා ගේ ගෙවල් flැට් කරනවා" යයි ගෙවල් නම් කළා. අපේ හාරිස්පත්තුව ආසනයේ එක ශාඛාවක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක දෙස්තර මහරුෆ් මහතාගේ සංවිධායක මහත්මයෙක් බෝම්බ ඔතන විට අතේ පත්තු වී තිබෙනව. මා හිතන්නේ දැන් ඔහුගේ අතත් කෑලිවලට ගිහින්. අපේ රටේ දෙවිවරු ඉන්නවා. අපරාධ කරන්න සූදානම් වන විට ඒ දෙවිවරු ඒවා ගැන බලනවා; ඒවායින් ආරක්ෂා කරනවා. අපේ ඇරංචියේ හැටියට මගේ ආසනයේ ගෙවල්වල බෝම්බ දහස් ගණනක් තබාගෙන ඉඳලා තිබෙනවා, 20 වැනි දා අපට ගහන්න. මගේ ගෙය flැට් කර එතැන වෙනත් යමක් හදන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක මහත්මයා වැඩ පිළිවෙලක් සූදානම් කර තිබුණා. මගේ නිවස තිබෙන්නේ පාර අයිනේ. මම කණගාටුවෙන් වුණත් කියන්නට ඕනෑ, මෙන්න මේ විධියේ ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ පිළිවෙළක් අනුගමනය කළා කියා. ප්‍රසිද්ධ රැස්වීම් පවත්වා ඒ මගින් මහජනතාව කුපිත කළා.

අපි ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරනවා නම් මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ ගරු කථානායකතුමනි, මම තරම් ගත වූ අවුරුදු පහ තුළ ගරු ජනාධිපතිතුමා විවේචනය කළ වෙනත් කෙනෙක් මේ මුළු රටේම නැහැ කියා. මම ඒ තරම් එතුමා විවේචනයට ලක් කළා. මට විරුද්ධව අපහාස කිරීමේ නඩුවකුත් පැවරුවා. ඒ නඩුවෙන් අවුරුදු 5 කට මා හිරේ යන එක ඒකාන්තවයි තිබුණේ. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා මට කිව්වා "අයිසේ විජේසිරි, මේ නඩුව කථා කළොත් අවුරුදු 5 කට තමුසේ හිරේ යන එක වලක්වන්නට මට බැහැ, ඒ නිසා මේ නඩුව බාර ගන්න බැහැ" කියා. එවිට මම කාරුණිකව ඉල්ලීමක් කළා කොහොම හරි මාව බේරා ගන්නය කියා. ඒ සඳහා දවසක් කල් ඕනෑ කියා පසුවදා මා කැඳවා මගෙන් ඇසුවා, ඒ නඩුව පවරා ඇති අන්දම පිළිබඳව. එය අසාගෙන ඊට පසුව කිව්වා "මම නඩුව කථා කරන්න ගියොත් තමුසේ හිරේ යනවා, ඒ නිසා මම නඩුව කථා නොකර නඩුව පැවරූ ආකාරයට විරුද්ධව කථා කරන්නම්" කියා. දින 8 ක් නඩුව කථා කර 8 වැනි දවසේ උදේ 11.40 ට ඇපැල් උසාවියේ රජ තුන් කට්ටුවක් විසින් චූදිතයා ඉදිරිපත් කර තිබුණු ඇපෑල පිළිගත්තා. පොලිසිය නඩුව පවරා තිබුණු අන්දම වැරදියි, ඒ නිසා මේ නඩුව විභාගයට ගන්නට බැහැ, කියා රජ තුන් කට්ටුව තීන්දුවක් දුන්නා. ඒ අවස්ථාවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩුව වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්තුමා නැගිට ප්‍රකාශයක් කළා, ඒ තීන්දුවට විරුද්ධව කථා කරන්නම්" කියා. දින 8 ක් නඩුව කථා මෙය දැනගත් විගසම, ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා ගාල්ලේ ඉඳල, "නිදහස් වුණා නම් ආයෙත් එළව එළවා ගහන්න ඕනෑ නැහැ, නඩුව පැවරීමේ වැරැද්දක් ඇති වී තිබෙනවා නම්, ඒක දෙපාර්තමේන්තුවෙ වැරැද්දක්, පොලීසියෙ වැරැද්දක්, ඔහු නිදහස් කරන්නය" කියල නියම කළා. ගරු කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය ගැන අද කවුරු මොනවා කිව්වත්, මේ පක්ෂ දෙකේම මම සාමාජිකත්වය දරා තිබෙනව. සිංහල භාෂාවෙන්, ගැමි භාෂාවෙන්, කියනවා නම් මම මේ හෝටල් දෙකෙන් කාලා තිබෙනවා. හෝටල් දෙකේම ලුණු මිරිස් මට හොඳට තේරෙනවා. එම නිසා එක්සත් ජාතික පක්ෂයෙ ලුණු මිරිස් මට මිහිරිය කියන එක මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ගතවූ කාලය තුළ, 1977 සිට කළ සේවාවන් ගැන මම කියන්න ඕනෑ නැහැ, තමුන්නාන්සෙත් දන්නවා ඇති. මේ රටේ සිටින ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් කවුරුත් දන්නව. පසුගිය දිනෙක "ඊව්රුස" පත්‍රයෙ පළ වී තිබුණ මම දැක්ක, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් යම් මන්ත්‍රීවරයෙක් 'එයා එදා ඉඳල එහෙ' කියල මා ගැන කළ ප්‍රකාශයක්. මම 1977 දියි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳුණෙ. 1978 සැප්තැම්බර් මාසයෙ 5 වනදා අන්තර් පාර්ලිමේන්තු සම්මේලනයකට සහභාගි වෙන්න එංගලන්තයට ගිහින් ඉන්න කොට අපේ කර්මාන්ත ඇමතිතුමා මට එංගලන්තයට දුර කථනයෙන් කතා කරල ආරාධනා කළා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන්න ඉස්සර නැවත වරක් එක්සත් ජාතික පක්ෂයට බැඳෙන්නටය කියල. ඒ වෙලාවේ මම බැඳුනෙ නැහැ. එදා මාත් එක්ක එංගලන්තයෙ හිටපු නුවරඑළිය මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමාට (අනුර බණ්ඩාරනායක මහතා) මම කතා කරල කිව්ව, මෙන්න මේහෙම සෙල්ලමක් යනව, ඒ මන්ත්‍රීතුමාගෙ මිත්‍ර සද්ධාතිස්ස වඩිගමංගාව මහත්මයත්, බේරුවල දෙවන මන්ත්‍රී සමරනායක මහත්මයාත් දැනටම එක්සත් ජාතික පක්ෂයට ඇවිත් කියල කර්මාන්ත ඇමතිතුමා කිව්වා, මෙන්න මේ විධයෙ තත්ත්වයකුයි දැන් ඇති වෙලා තිබෙන්නෙ කියන කොටම, නුවරඑළිය-මස්කෙළියෙ දෙවන මන්ත්‍රීතුමා කිව්ව 'අනේ විජේ, ඒ වැඩේ නම් කරන්න එපා, අපි බලයට ආපු දවසක උඹට හොඳ ඇමතිකමක් දෙනවා' කියල. මම එතුමාට කිව්ව "අපිට කෙන්දර බලන්න කාලයක් නැහැ; අපි කවදා බලයට එයිද දන්නෙ නැහැ; නමුත් දැන් මම එක්සත් ජාතික පක්ෂයට බැඳෙනවා නම් තමුන්නාන්සේට මේ පණිවුඩය මම දෙන්නෙ නැහැ; කරුණාකර ගිහින් යාලුවටත් බේරා ගන්න" කියල. පසුවදාම මම එතුමාව පිටත් කරල එව්ව. එහෙව් මන්ත්‍රීතුමාම දැන් සති තුනකට ඉස්සර මා ගැන කියනව 'එයා හැමදාම ඒ පක්ෂයේ හිටියා' කියල. මම කනගාටු වෙනව, නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමාගෙ ඒ ප්‍රකාශය ගැන. මොකද? 1978 සැප්තැම්බර් 5 වනදාත් මට බැඳෙන්න තිවුණ. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිතවත්ව සිටිය නිසා ඒ පියවර ගත්තෙ නැහැ. එමනිසා මින් ඉදිරියටවත් අප කළ සේවාවන් අගය කරන්නය, පක්ෂයෙන් වෙනස් වුණාය කියල කළ සේවාවන් අමතක කරන්න එපාය කියන එක නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමාගෙන් නැවත වරක් ඉල්ලා සිටිනව.

ගරු කථානායකතුමනි, අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පත්ව තිබෙන්නෙ මොන තත්ත්වයකටද? අපේ ගම්වල මරණාධාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, සමුපකාර සමිති තිබෙනව. මේ සමිතිවල අවුරුද්දකට වරක්වත් අයවැය ඉදිරිපත් කරනව. මම අවුරුදු පහක කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ සිටිය. මේ ගත වූ අවුරුදු පහ තුළ වාර්ෂික සම්මේලනයක් තියල අයවැයක් නම් ඉදිරිපත් කළේ නැහැ. මේ වාගේ හිතුවක්කාර [බාධා කිරීමක්] ඒකත් කිව්වෙ එතුමාමයි. දැන් මොනව කියන වාද මම දන්නෙ නැහැ. මා අසල සිටින මේ දෙපොළ සාක්ෂි දරනවා ඇති. මම හිතන්නෙ නැහැ, දැන් වුණත් කිව්ව දේ නැහැයි කියල මැදවච්චියේ මන්ත්‍රීතුමාවත් (මෛත්‍රීපාල සේනානායක මහතා) මැද කොළඹ තුන්වන මන්ත්‍රීතුමාටත් (එම්. හලීම් ඉෂාක් මහතා) කියාවි කියල. ගරු ඇමතිතුමනි, අයවැය නැති නිසා තමයි, අර සුමතිපාල ජයවර්ධන මහත්මය මා එක්ක කිව්වෙ එච්. පී. ටී. නිවාස වෙළඳ සමාගමේ, 1977 මැතිවරණයෙන් පස්සෙ රුපියල් දොළොස් ලක්ෂයක් තැන්පත් කරල, 1979 දී ඒකෙන් රුපියල් අට ලක්ෂ පණස් දහසක් අරගෙන හිටන්, යූ. එන්. ගුණසේකර කොන්ත්‍රාත්කාරයාට, අනුර බණ්ඩාරනායක මන්ත්‍රීතුමාගෙ ගේ හදාපු එකට බිල ගෙව්වාය කියල.

**අනුර බණ්ඩාරනායක මහතා** (නුවරඑළිය-මස්කෙළිය දෙවන)

*(திரு. அனுர பண்டாரநாயக்க—நுவரெலிய-மஸ்கெலிய இரண்டாம் அங்கத்தவர்)*

**(Mr. Anura Bandaranaike—Second Nuwara Eliya-Maskeliya)**

I am very sorry, Sir, to interrupt the hon. Member's last speech. [*Interruption.*]

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

Order, please !

**අනුර බණ්ඩාරනායක මහතා**

*(திரு. அனுர பண்டாரநாயக்க)*

**(Mr. Anura Bandaranaike)**

Some of these hon. Members who are shouting will be shouting for the last time because the President has already got their letters of resignation. He is watching their behaviour very carefullly. I am very sorry I have to interrupt my Friend, the hon. Second Member for Harispattuwa's speech because I do not like to interrupt grand final speeches of hon. Members in this House. But I think the hon. Member must not make use of this opportunity which you have so gracefully given him, to sling mud, to make innuendoes and make false accusations against other hon. Members of Parliament. This statement is completely incorrect. Mr. Jayawardena has denied this statement and I deny it. Therefore, I do not think you should allow the reputation of hon. Members of Parliament to be slandered in this manner.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

The hon. Member has denied it and you have to stop there.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

But when Mr. Jayawardena told this he did not tell this to me alone. He told it to the hon. Member for Medawachchiya (Mr. Maithripala Senanayake) and to the hon. Member for Colombo Central (Mr. Haleem Ishak). They are witnesses.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

Order, please ! Please accept the denial and carry on now.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

හොඳයි, කථානායකතුමනි, මම ඒ ගැන ඊට වැඩි යමක් කියන්නෙ නැහැ. මම විශෙෂයෙන් කියන්නේ අපි ප්‍රජාතන්ත්‍රවාදී නම් ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන්න ඕනෑ බවයි. ඒ ක්‍රමය නැති නිසා නැත්නම් තමන්ගේ මතයට විරුද්ධ නම් ඔහු හෝ ඇය කොන් කරනවා නම් මම හිතන්නෙ නැහැ, ඒ පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් වශයෙන් පිළිගන්න පුළුවන්ය කියා. ඒ නිසා මට සිද්ධ වුණා යම් කිසි ක්‍රියා මාර්ගයක් ගන්න. ස්වාධීන මන්ත්‍රීවරයෙකු වශයෙන් මා පාර්ලිමේන්තුවට එවූ මගේ ජනතාවට, මගේ ඡන්ද දායක දායිකාවන්ට වැඩ කොටසක් කර දෙන්න මට ඉඩ තිබුණා එදා ආණ්ඩුවට බැදුනා නම්. ඒකත් නොකර මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳීම නිසා ගත වූ අවුරුදු පහක් තුළම මගේ ආසනයට විමධ්‍යගත අයවැයෙන් මුදලක් ගන්නට ලැබුණෙත් නැහැ ; මගේ ඡන්ද දායක දායිකාවන්ට රක්ෂා බැංකු පෝරම ලැබුණෙත් නැහැ.

මා හැම දෙයක්ම පරීක්ෂා කරලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳිලා අවුරුදු පහක්ම සේවය කළා. නමුත් මම ඔය සඳහන් කළ කරුණු නිසා මට සිද්ධ වුණා නැවත වතාවක් එක්සත් ජාතික පක්ෂයට බැඳෙන්න. එසේ බැඳිල ගරු කථානායකතුමනි, මා ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන නිසා අද ඉස්සෙල්ලාම ආණ්ඩු පක්ෂයේ රැස්වීමට ගිහින් මන්ත්‍රීකමෙන් ඉල්ලා අස්වීමේ ලිපියත් අත්සන් කර දුන්නා. මොකද මන්ත්‍රීකම නොවෙයි ලොකු, ජනතාවයි ලොකු, ප්‍රතිපත්තියි ලොකු, රටට යම් යහපතක් වෙනවා නම්, අපට වඩා සුදුස්සන් ජනතාව තෝරා ගන්නවා නම් ඒකටත් අපි අවස්ථාවක් දෙන්න ඕනෑ. ඒ නිසා අවුරුදු හතකට පස්සෙ නැවතත් එක්සත් ජාතික පක්ෂයට බැඳෙන්නට මම තීරණය කළා. 1975 ජූලි මාසෙ 23 වෙනිදා මාව එක්සත් ජාතික පක්ෂයෙන් අස් කළා. 1982 සැප්තැම්බර් මාසෙ 21 වෙනිදා මම නැවත වතාවක් එක්සත් ජාතික පක්ෂයට බැඳුණා. අද මන්ත්‍රීකමෙන් අස්වන ලියුමත් භාර දීල යි මම මේ තමුන්නාන්සේට කථා කරන්නෙ. ඒත් මම සන්තෝෂයි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකීමට තමන්ගේ මන්ත්‍රීකම පරිත්‍යාග කළත් සන්තෝෂයි කියන එක මම විශේෂයෙන් මතක් කරනවා.

එසේ මතක් කරන අතරම මට මේ අවස්ථාව ලබාදීම ගැන ගරු කථානායකතුමාට මගේ ස්තුතිය පිරිනමනවා. ඒ එක්කම මාත් සමග ගත වූ අවුරුදු එකහමාරක් තිස්සේ විශේෂයෙන් අපේ නායකයා හැටියට කටයුතු කළ මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාගෙනුත් (මෛත්‍රීපාල සේනානායක මහතා) මගේ වම් පසින් සිටින මැද කොළඹ තුන්වෙනි මන්ත්‍රීතුමාගෙනුත් (එම්. හලීම් ඉෂාක් මහතා) ඈත්වීමට සිද්ධ වීම ගැන මගේ කනගාටුව ඒ දෙපළට ප්‍රකාශ කරන අතර මම ඒ දෙපළටත් ආරාධනා කරනවා අපිත් එක්ක යන්න එන්නය කියා. එසේ ආරාධනා කරමින් මට එහා පැත්තට යන්නට තමුන්නාන්සේගේ වරම් ලැබෙන්නය කියනා ඉල්ලීම කරන්න කැමතියි.

අ. භා. 3.36.

**[අනතුරුව ආර්. පී. විජේසිරි මහතා (හාරිස්පත්තුව දෙවන) විරුද්ධ පාර්ශ්වයේ සිට ආණ්ඩු පක්ෂයට ගියේය.]**

*அதன் பின்னர், திரு. ஆர். பீ. விஜேசிறி (ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர்) எதிர்த்தரப்பிலிருந்து அரசாங்கத் தரப்புக்குச் சென்று அமர்ந்தார்.*

[Thereupon Mr. R. P. Wijesiri (Second Harispattuwa) crossed from the Opposition to the Government Benches.]

## මහජන ආරක්ෂක ප්‍රකාශනය

### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

## PUBLIC SECURITY PROCLAMATION

**ආර්. ප්‍රේමදාස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
*(திரு. ஆர். பிரேமதாச—பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)*
**(Mr. R. Premadasa—Prime Minister, Minister of Local Government, Housing and Construction, Minister of Highways, and Leader of the House of Parliament)**

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ මගේ නමින් තිබෙන පහත දැක්වෙන යෝජනාව සභාවේ අනුමැතිය සඳහා මම ඉදිරිපත් කරනවා :

"1959 අංක 8 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සංශෝධිත (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ 1982 ඔක්තෝබර් මස 20 වන දින දරන ප්‍රකාශනය මගින් ජනාධිපති උතුමාණන් විසින් ඉහත කී ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතුය."

"That the Proclamation dated October 20, 1982 made by the President under section 2 of the Public Security Ordinance (Chapter 40), as amended by Act, No. 8 of 1959 and Law, No. 6 of 1978, bringing into operation the provisions of Part II of the aforesaid Odinance throughout Sri Lanka, be approved."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, මම හිතන්නෙ නැහැ මේ යෝජනාවට මේ සභාවේ විරුද්ධත්වයක් ඇතිවේයයි කියල. නමුත් මේ යෝජනාවට අදාළව අද මට තරමක දීර්ඝ කථාවක් කරන්නට සිදු වන බව මුලින්ම සැළ කරන්නට කැමතියි. මේ යෝජනාව අදාළ වන්නේ ඔක්තෝබර් මාසයේ 20 වැනිදා පවත්වපු ජනපතිවරණයටයි. එම නිසා ඒ ජනපතිවරණය ගැනත් ඒ කාලය තුළ උද්ගත වූ තත්ත්වය ගැනත් ජනපතිවරණයේ ප්‍රතිඵලයක් ඒ අනුව උද්ගත විය හැකිව තිබුණ තත්ත්වයත් ඉන් අනතුරුව උද්ගත වූ තත්ත්වයත් ජනපතිවරණයේ ප්‍රතිඵලය අනුව මෙම පාර්ලිමේන්තුවේ තත්ත්වයත් ගැන මේ සභාව ඉදිරියේත් මේ සභාව තුළින් රටේ මහජනතාවටත් දැන කියා ගැනීමට අවශ්‍ය කරුණු රාශියක් මට අද ඉදිරිපත් කරන්නට සිද්ධ වී තිබෙනවා රජය වෙනුවෙන්. විශේෂයෙන්ම අද අපි රැස්වුණෙත් කාලයකට පස්සෙ ; ඓතිහාසික ජනපතිවරණයකින් පස්සෙ.

මේ රටට සර්ව ජන ඡන්ද බලය ලැබුණු අවස්ථාව ඓතිහාසිකයි. ඒ වාගේම මේ රටට නිදහස ලැබුණු අවස්ථාවත් ඓතිහාසිකයි. ඊළඟට ඉතාමත්ම වාර්තාගත විය යුතු ඓතිහාසික අවස්ථාවක් තමයි ඔක්තෝබර් මාසයේ 20 වැනිදා මුළු රටේම ජනතාව සර්ව ජන ඡන්ද බලයෙන් රටේ නායකයා—ජනාධිපතිවරයා—තෝරා ගත් අවස්ථාව. ඊට අනතුරුව රැස්වුණු මේ පාර්ලිමේන්තුව තුළින් ජනතාව අපේක්ෂා කරනවා අද උද්ගත වී තිබෙන කරුණු පිළිබඳව රජයේ ප්‍රකාශයක්.

ගරු කථානායකතුමනි, මම විශ්වාස කරනවා තමුන්නාන්සෙත් මේ ගරු සභාවෙ ගරු මන්ත්‍රීවරු හැම දෙනාමත් එකඟ වෙයි, මම කිව්වොත් අද දවසේදී අපේ ප්‍රධාන යුතුකම නම් විශිෂ්ඨ විජයග්‍රහණයක් අත්පත් කර ගත් අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාට මේ මුළු සභාවේම සුබ පැතුම් පිරිනැමීම අවශ්‍ය බව සියළු දෙනාම සියළු මන්ත්‍රීවරුන් මා සමග ඊට එකතුවෙනවාට කිසිම සැකයක් නැහැ, ඒ ජයග්‍රහණය එතුමා ඉතා විශිෂ්ඨ අන්දමින් ලබා ගත් නිසා. ඡන්ද ප්‍රමාණයෙන් පමණක් නොව සියයට ගණනින් සළකා බැලුවත් එතුමාගේ ජයග්‍රහණය ලෝක වාර්තාවක් හැටියට සළකන්න පුළුවනි. ඡන්දය පාවිච්චි කළ ඡන්ද දායකයන්ගෙන් 53% කට කිට්ටු ප්‍රමාණයක් ලබා ගනිමිනුයි, එතුමා ඒ විශිෂ්ඨ ජයග්‍රහණය අත් කර ගත්තේ. තරඟ කළ සියලුම අපේක්ෂකයන්ගේ ඡන්ද එක පැත්තකට දැමීමත්, තරග නොකල ඒ ඒ පක්ෂ වලට ගන්න පුළුවන් යයි හිතාපු ඡන්දත් ඒ පැත්තටම දැමීමත් ඒ සියල්ලටම වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබමින් ජනාධිපතිතුමා ජයග්‍රහණය කළ බව තමුන්නාන්සේලාට පැහැදිලි වෙනවා ඇති.

විශිෂ්ඨ අන්දමින් ජයග්‍රහණය කළ ජනාධිපතිතුමාට අපේ සුබ පැතුම් පිරිනමන අතර විශිෂ්ඨ අන්දමින් පරාද වුණු අපේක්ෂකයන්ට අපේ හොඳ හිත පිරිනමන්නටත් අපේ යුතුකමක් තිබෙනවා. ඒ මන්ද ? අපි ජයග්‍රහණයෙන් උඩඟු නොවෙනවා වගේම ඒ උදවියට කියන්න ඕනැ, පරාජයෙන් අධෛර්ය වන්න එපාය කියාත්. අධෛර්ය වන්න ඕනෑ තරම් කරුණු තිබුණත්, ධෛර්ය වන්න පුළුවන් කරුණු නැතත්, එවැනි කරුණු ඇතැයි තිතින් මවාගෙන හෝ සෑහෙන ප්‍රමාණයක සතුටක් භුක්ති විඳින්න, ඒ අය පුළුවන් තරම් හිතට ගන්න ඕනැ. එහෙම නැත්නම් ශාරීරික වශයෙන් පමණක් නොව මානසික වශයෙනුත් යම්-යම් අමාරුකම් ඇති වන්න පුළුවන්කම තිබෙනවා.

ඒ වගේම මේ වෙලාවේදී මේ සභාවේ අපි සියලු දෙනාගේම යුතුකමක් තිබෙනවා ; මේ ජනපතිවරණයේදි අපේ රටේ පොදු ජනතාව ප්‍රදර්ශනය කළ බුද්ධිමත් භාවය, දේශපාලන දැනුම, රටේ දියුණුව පිණිස තමන් තුළ පවත්නා උණුසුම් හැඟීම් ඉතා විශිෂ්ඨ අන්දමින් ප්‍රකාශ කිරීම ගැන මේ රටේ පොදු ජනතාවට අපේ උපකාරය පිරිනමන්නත්.

මේ අලුත් මැතිවරණය—ප්‍රථම වරට ලංකාවේ සිදු වුණු ජනපතිවරණය—සංවිධානය කිරීමේ කාර්යය ඒ තරම් ලෙහෙසි—පහසු කාර්යයක් නොවෙයි. එම නිසා මැතිවරණ කොමසාරිස්තුමා ඇතුළු එම දෙපාර්තමේන්තුවටත්, ඊට අදාළ විවිධ අංශවලටත් අපේ සතුට හා ප්‍රශංසාව හිමි කළ යුතුව තිබෙනවා, එහිලා ක්‍රියා කළ ආකාරය ගැන.

ඒ වගේම පොලීසියත්, ත්‍රිවිධ හමුදාවත් මේ කාර්යයේ දී මැතිවරණ කොමසාරිස්තුමාට නොයෙක් ආකාරයෙන් උපස්ථම්භක වූ බවත් අපට අමතක කරන්න පුළුවන් කමක් නැහැ.

ලංකාවේ පුවත් පත් ඒ කාල සීමාවේදී මැතිවරණ නීති-රීති, ඡන්දය පාවිච්චි කරන ක්‍රම ආදිය ජනතාවගේ අවධානයට යොමු කරවමින් විශිෂ්ඨ සේවයක් කළ බවත් අප මේ අවස්ථාවේදී ස්තුති පූර්වකව සඳහන් කරන්න කැමතියි.

ඒ වගේම රජයේ සෑම ක්ෂේත්‍රයකම රාජ්‍ය සේවකයන් තමන්ගේ රාජකාරිය මැනවින් ඉටු කළ බව අප කවුරුත් පිළිගත යුතුයි. ඒ හැම දෙනාටමත් අපේ ස්තුතිය පිරිනැමිය යුතුයි. ඇතැම් තැනක නොමනා ක්‍රියා සිදු නොවුණා නොවෙයි. ඇතැම් රාජ්‍ය සේවකයන් තමන්ගේ සේවාවටත් නිගා දෙන අන්දමින් පක්ෂ හජනයෙන් ක්‍රියා කළ බවට චෝදනා ඇහුවා නොවෙයි. ඇතැම් ප්‍රදේශවල සමහර ග්‍රාම සේවකයන් ඒ ආකාරයට පක්ෂ හජනයෙන්, අයථා අන්දමින් ක්‍රියා කළ බවට චෝදනා තිබෙනවා. නමුත් ඒවා ගැන ක්‍රියා කළ යුතු ක්‍රමයක් තිබෙනවා. මගේ හිතේ ඒවාට අදාළ අංශ ඒවා ගැන නිසි පරීක්ෂණ පවත්වා, නිසි පියවර ගන්නවා ඇති. නමුත් ඒ නිසාම රාජ්‍ය සේවයෙන් සිදු වුණු සේවය සුළු කොට තකන්න අපට පුළුවන්කමක් නැහැ. හැම විටම අපේ විශ්වාසයක් තිබුණා, අපේ රාජ්‍ය සේවය ඕනෑම අවස්ථාවකට මුහුන පාන්න පුළුවන් අන්දමේ චරිත ශක්තියක් තිබෙන සේවාවක් ය කියා.

මට මතකයි, මේ මැතිවරණ කටයුතු ආරම්භ වන්න ඔන්න-මෙන්න කියා තිබෙන අවස්ථාවේදී, ස්වදේශ කටයුතුභ භාර ඇමතිතුමාගේ ආරාධනයෙන් මේ වර්ෂයේ දිසාපතිවරුන්ගේ සම්මේලනය මා විවෘත කළ අවස්ථාව. රාජ්‍ය සේවකයන්ගේ දක්ෂ පක්ෂකම් ගැනත් මෙවැනි කාර්යයක් කරන්නට ඇති හැකියාව ගැනත් ඒ අවස්ථාවේදී මම ප්‍රකාශ කළා. එදා මම ප්‍රකාශ කළ ඒ බලාපොරොත්තුව ඉතාමත්ම උසස් අන්දමින් ඔවුන් ඉටු කළ බව මම මේ අවස්ථාවේදී නොපිරිහෙලා ප්‍රකාශ කරන්නට ඕනැ.

ගරු කථානායකතුමනි, මේ මැතිවරණ ප්‍රතිඵල විග්‍රහ කර බලන විට මේ ගරු සභාවේ පෙනී සිටින හැම පක්ෂයකම මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශ අතුරෙන් ඇතැම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

නැතක ඒ පක්ෂ වලට ඡන්ද අඩුවෙන් ලැබුණු බව අපි දන්නවා. ඒ අනුව බැලුවා නම් සමහර මන්ත්‍රීවරුන් පරාද වුණාය කියලත් හිතන්නට පුළුවන් තත්ත්වයක් ඒ ප්‍රතිඵල අනුව මතුවෙලා තිබෙනවා. මොකද? කොට්ඨාශ මට්ටමින් ඒ ප්‍රකාශ වුණ නිසා. නමුත් ඇතැම් තැනක මට පෙනුණා, එහෙම එළිපිට පෙනුණත්, බැරි වෙලාවත් ඒ කොට්ඨාශය වෙනුවෙන් පිරිනැමුණු තැපැල් ඡන්ද එකතුකලා නම් ඒ තත්ත්වය වෙනස් වෙන්නටත් තිබුණු බව. සිරිතක් වශයෙන් ඒ ඒ කොට්ඨාශවල තමයි තැපැල් ඡන්දය පාවිච්චි වෙන්නේ. නමුත් මෙවර කොට්ඨාශ මට්ටමින් තැපැල් ඡන්ද ගත්තත් ගණන් කෙරිලා තිබෙන්නේ දිසා මට්ටමින්. එහෙම එකතු කළත් වැඩි ඡන්ද ගණනක් ලබා ගන්නට බැරි වුණු කොට්ඨාශ මතු වී පෙනෙනවා. එහෙම වුණු කොට්ඨාශවල මන්ත්‍රීවරුන්ටත් අපේ කණගාටුව ප්‍රකාශ කරනවා, පමණක් නොවෙයි අධෛර්ය වෙන්නට එපාය කියලත් මට මේ අවස්ථාවේ සඳහන් කරන්නට වෙනවා. "දිනුමත් පැරදුමත් සෝකත් කමක් නැහැ" කියල කථාවක් තිබෙන නිසා.

මම විශේෂයෙන්ම එහෙම කිව්වේ මේ ජනපතිවරණයේ ප්‍රතිඵල අනුව ඇතැම්විට අද නැත්නම් නොවැම්බර් මාසයේ දෙවැනිදාට මම ඉන්න තැන සිට කථා කරන්නට සිටි මගේ මිත්‍ර මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා).

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා (සංස්කෘතික කටයුතු ඇමතිතුමා)**

*(திரு. ஈ. எல். பி. ஹுருள்ளே—கலாசார அலுவல்கள் அமைச்சர்)*

**(Mr. E. L. B. Hurulle—Minister of Cultural Affairs)**

තාවකාලිකව.

**මෛත්‍රීපාල සේනානායක මහතා** (මැදවච්චිය)

*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*

**(Mr. Maithripala Senanayeke—Medawachchiya)**

එහෙම පොරොන්දුවක් වුණේ නැහැ.

**ආර්. ප්‍රේමදාස මහතා**

*(திரு. ஆர். பிரேமதாச)*

**(Mr. R. Premadasa)**

නෑ! නෑ! පොරොන්දුවක් නැති බවත් මම දන්නවා. වෙච්ච පොරොන්දුව ඉෂ්ට නොවෙන බවත් මම දන්නවා. තමුන්නාන්සේගේ අවුරුදු තිස් පහක පාර්ලිමේන්තු ඉතිහාසයේදී 1977 මැතිවරණයේදීත් තමුන්නාන්සේ මැදවච්චිය ආසනය ජයග්‍රහණය කළා. නමුත් මෙවර එසේ නොවුණේ එක ගැන අපි කණගාටු වෙනවා. මම ඒක එසේ සඳහන් කරන්නට කල්පනා කළේ මෙන්න මේ නිසයි. අපට ලැබිච්ච ආරංචියේ හැටියට නම් තමුන්නාන්සේ තමයි අග්‍රාමාත්‍යවරයා හැටියට නම් කර තිබුණේ.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**

*(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)*

**(Mr. E. L. B. Hurulle)**

තාවකාලිකව.

**මන්ත්‍රීවරයෙක්**

*(அங்கத்தவர் ஒருவர்)*

**(A Member)**

අනුර එනකන්.

**මෛත්‍රීපාල සේනානායක මහතා**

*(திரு. மைத்திரிபால சேனநாயக்க)*

**(Mr. Maithripala Senanayeke)**

ඒකටත් විරුද්ධවාදීන් සිටියා.

**ආර්. ප්‍රේමදාස මහතා**

*(திரு. ஆர். பிரேமதாச)*

**(Mr. R. Premadasa)**

ගරු කථානායකතුමනි, මම ඒ කාරණය එසේ සඳහන් කරන්නේ මෙන්න මේ නිසයි. එතුමා ඇත්තක් කියනවා, එහෙම අදහසක් තිබුණා නම් ඒකටත් විරුද්ධවාදීන් සිටියාය කිව්වා. නමුත් මේ පැත්තෙන් නොවෙයි, ඒ පැත්තෙන් වෙන්න ඕනෑ. මම ඒ කාරණය එහෙම කිව්වේ මැතිවරණ ඡන්ද විග්‍රහයට අනිත් හැම දෙනාටම කලින් එතුමා ඉදිරිපත් වී තිබුණ නිසයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැඩිපුර ඡන්ද හය ලක්ෂයක් ගත්ත කාරණය ගැන එතුමා විග්‍රහ කර තිබුණා. ඉතින් සමහර උදවිය කිව්වා මොනවටද මේ මෛත්‍රීපාල සේනානායක මහත්මයා ඡන්ද හය ලක්ෂයක් ගැන කථා කරන්නේ තමුන්ගේ කොට්ඨාශයෙන් ඡන්ද නොලැබිච්ච එක ගැන කථා නොකර කියා. ඒක කියන්නටයි මම ඒ කාරණය ගැන සඳහන් කළේ. [බාධා කිරීමක්] එහෙනම් වැඩිපුර හය ලක්ෂයක් ගත්තෙ කොහොමද? ඒක ගැන හිතේ අමාරුවක් ඇතිකර ගන්න වුවමනා නැහැ. නමුත් මම කිව්වෙ අර විග්‍රහය ගැනයි.

ගරු කථානායකතුමනි, මේ ඉදිරිපත් වී තිබෙන හදිසි නීතියේ ප්‍රශ්නයේ දී ගරු මන්ත්‍රීවරු පිළිගන්නවා ඇති, මෙය ඉතාම ඥානවන්ත පියවරක් බව. අපි ස්තුති කරන්න ඕනෑ ජනාධිපතිතුමාට, මේ ගැන කල්පනා කිරීම ගැන. මේක කල්පනා කළේ මැතිවරණ දවසෙ නොවෙයි. ඊට මාසයකට පමණ කලින්. මම දන්නවා පෞද්ගලිකවම, එතුමා මට කියා තිබුණා, "අපි ඈත් පරණ අත්දැකීම්වල පාඩම් ඉගෙනගෙන ක්‍රියා කරන්න ඕනෑ" කියා. තමුන්නාන්සේ දන්නවා, 1956 යේ ඉඳලාම, මැතිවරණවලින් පසුව, කොයි පක්ෂය ජය ගත්තත් නොයෙකුත් විධියේ අඬන්තේට්ටම්, මිනීමැරීම්, කලබල ආදිය ඇති වුණා. ඒ හැම අවස්ථාවකම මේ රටේ ජනතාව බොහොම දුක් කරදර වලට භාජන වුණා. ඇතැම් විට මධ්‍යස්ථ උදවියට හිරිහැර කරදර පැමිණුණා. ඔය අත්දැකීම නිසා එතුමා හිතාගෙන හිටියා, මේක කරන්න ඕනෑ කියා. ඒක මැතිවරණ දවසෙම කරන්න බැරි නිසා එතුමා සූදානම් වුණා, ඒ සඳහා, හැබැයි ජනතාව ඡන්දය පාවිච්චි කරලා අවසාන වුණාම.

එතුමා හමුදාවල් කැඳවලා ජනතාවත්, රටත් ආරක්ෂා කිරීමේ වැඩට අවශ්‍ය පියවර ගන්න බැහැ නීත්‍යානුකූලව, හදිසි නීතිය පනවන තුරු. නමුත් එතුමාට සූදානම් වෙන්න තිබෙනවා. මේ සූදානම් වීම ආරංචි වුණාම විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කලබල වුණා. ඔවුන් කියන්න පටන්ගත්තා, "මෙන්න මැතිවරණය කඩාකප්පල් කරන්න පියවරක් ගන්න යනවා" කියා. ඒකෙනුත් ජනතාවගේ සිත් සතන් කම්පනයට පත් කළා. කොයි තරමට ගියාද කිව්වොත්, "නීති විරෝධි නියෝග පිළිපදින්න එපා" කියල හමුදාවටත් නියෝගයක් නිකුත් කළා. කව්ද ඒ නියෝගය නිකුත් කළේ? දිනන්න හිතාගෙන හිටපු අපේක්ෂකයෙක්. 'ඩියුක් ඔෆ් වෙලිංටන්'.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා ළඟ තිබෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පුවත් පත, 'දිනකර' පුවත්පතේ පසුබිම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වුණත්, මේකේ අයිතිය චන්ද්‍රිකා කුමාරණතුංගගේ. මා කියන ඒවායේ වැරදක් තිබෙනවා නම් කරුණාකර දන්නා උදවිය ඒක හරිගස්සන්න. 1982 ඔක්තෝබර් 13 වැනිදා—මැතිවරණයට සතියක් පමණ තිබියදී—ලොකු අකුරින් කියනවා :

"නීති විරෝධී නියෝග පිළිපදින්න එපා—කොබ්බෑකඩුව හමුදාවට කියයි. ජනාධිපතිවරණයට දින 3 කට කලින් මෙම 17 වැනිදා සිට හදිසි නීතිය ක්‍රියාත්මක කරන්න ආණ්ඩුව ගෙන ඇති තීරණය—"

එහෙම තීරණයක් තිබුණේ නැහැ. මේ විධියටයි මැතිවරණ කටයුතු ගෙන ගියේ.

"ආණ්ඩුව ගෙන ඇති තීරණය සම්බන්ධයෙන් ප්‍රකාශයක් නිකුත් කරන පොදු ජන සමගි අපේක්ෂක"

පස්සෙ නම් ජනතාව කිව්වා, පොදු අපේක්ෂක නොවෙයි, 'පොලු අපේක්ෂක' කියා.

"පොදු ජන සමගි අපේක්ෂක හෙක්ටර් කොබ්බෑකඩුව මහතා නීත්‍යනුකූල නොවන නියෝග ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ක්‍රියාත්මක නොකළ මැනවයි සන්නද්ධ හමුදාවලට ආයාචනයක් කරයි."

කොයි තරමට ජනතාවගේ හැඟීම් වික්ෂිප්ත කරන්න උත්සාහ කළාද කියා මේකෙන් පේනවා.

"සන්නද්ධ හමුදාවලට නීතියට ගරු කරමින් නීත්‍යානුකූල නොවන නියෝග නොපිළිපදින ලෙස තමා මෙම ආයාචනය කරන්නේ, සන්නද්ධ හමුදාවල මිළඟ අණදෙන නිලධාරියා හැටියට බව ද කොබ්බෑකඩුව මහතා සිය ප්‍රකාශයේ සඳහන් කරයි."

මම ඒ තමුන්නාන්සේලාට පෙන්නුම් කළේ ජනතාවගේ ආරක්ෂාව සඳහා ගන්නට ගිය පියවරත් වෙනස් මුහුණුවරකින් ජනතාවට පෙන්නා එය තමන්ගේ වාසියට පෙරලා ගැනීමට ක්‍රියා කළ ආකාරයයි.

ගරු කථානායකතුමනි, එපමණක් නොවෙයි, එතුමා යාපනයට ගිය වෙලාවෙදිත් එතුමා කල්පනා කළා, අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න. තමුන්නාන්සේ දන්නවා, හදිසි නීති පනවා සාමය ආරක්ෂා කිරීමේ ක්‍රියා මාර්ග ඇති වෙන විට ඇතැම් තැන්වල යම් යම් සිද්ධි ඇති වෙනවා. නොයෙක් විට එහෙම වෙලා තිබෙනවා. මේවායින් ප්‍රයෝජන ගන්න, හමුදාවල් කෙරෙහි ජනතාව තුළ යම් යම් හැඟීම් ඇතිවෙලා තිබෙනවා නම් ඒවායින් ප්‍රයෝජන ගන්න යාපනයට ගිහින් මොකක්ද කිව්වෙ? එතුමා කිව්වා "මම ජනාධිපති වුණ හැටියේම ත්‍රස්තවාදී මර්ධන පනත— Prevention of Terrorism. Act—ඉවත් කරනව" කියල. එතුමා එහෙම ප්‍රකාශ කළා. අපි මේ පනත ගෙන ආවේ කිසිම ජන කොටස කට අසාධාරණයක් කිරීමේ කැමැත්තෙන් නොවෙයි, පොදු ජනතාවගේ ආරක්ෂාව සඳහායි. මම හිතන්නෙ නැහැ, මේ ආණ්ඩුවේ පරම හතුරෙකුටවත් කියන්න පුළුවන්ය කියා කිසිම ජන කොටසක් මර්ධනය කිරීම පිණිස මෙම පනත ගෙන ආවාය කියා. මේ මුළු සභාවම, මේ මුළු රටම දන්නවා යාපනය අර්ධද්වීපයේ පසුගිය වකවානුවේ සාමකාමී පොදු ජනතාවට මොන විධියේ තර්ජන, හිරිහැර, කරදර ඇති වුණාද කියා නිලධාරීන්ට පමණක් නොවෙයි, පොලීසිවලට පමණක් නොවෙයි, සාමාන්‍ය ජනතාවට ඇතැම් දාමරික කොටස්වලින් වෙච්ච දේ. දැන් බලන්න, දවස් දෙකකට පමණ කලින් වාවකච්චේරියේ ඇති වුණු සිද්ධිය. පිරිසක් පොලීසියට කඩාගෙන වැදිල පොලිස් නිලධාරීන් මරල දැමීම ; සිර කුඩුවේ සිටි මනුෂ්‍යයෙක් අනතුරට භාජන කළා ; පැහැර ගෙන ගියා. අර විධියේ නීතියක් තිබියදීත් එවැනි තත්ත්වයක් සිදු වෙන වෙලාවක කල්පනා කරල බලන්න, වගකීමක් දෙන්න පුළුවන් පුද්ගලයෙක් කරන කතාවක්ද මේ? සාමයක් ගැන හැඟීමක් තිබෙන පුද්ගලයෙක් කරන කතාවක්ද? කවිද මේ පුද්ගලයා? අවුරුදු 7 න් අවුරුදු 6 ක්ම හදිසි නීතියෙන් රට පාලනය කරන්න රුකුල් දුන්නාය කියල ප්‍රසිද්ධියේම කිව්ව පුද්ගලයෙක් ; තරුණ තරුණියන් 25,000 කගේ පමණ රුධිර ධාරාවෙන් මේ ශ්‍රී ලංකා ධරනීතලය තෙත් වෙනවා බලාගෙන සිටි පුද්ගලයෙක්, මේ රටේ අහිංසක තරුණ තරුණියන්ගේ මළ කඳන් මේ රටේ ගංගාවලින් මහ මුහුදට ගෙන ගොස් අත හරිනවා බලාගෙන සිටි පුද්ගලයෙක් ; අවුරුදු 6 ක් මුළුල්ලේ හදිසි නීතිය රට පුරාම ක්‍රියාත්මක කරන්නට රුකුල් දුන්න පුද්ගලයෙක්. බලයේ ඉන්න විට, රජ කම් කරන විට, ඇමතිකම් දරන විට එක ප්‍රතිපත්තියක්. පැරදිලා, ජනාධිපති වෙන්න තිබෙන කෑදරකම නිසා යාපනය අර්ධද්වීපයට ගිහින් ඒ ජනතාවගේ සිත් දිනා ගැනීමට කළ ප්‍රකාශය තමයි ඒ.

බලන්න ඊයේ පෙරේදා වෙච්ච දේ? මගේ හිතේ මේ ජනපතිවරණයේදී ජනතාවට කැපී පෙනුන මේ සිද්ධිය. හැබැයි, මේ ප්‍රකාශය කළේ ඡන්දයට ඔන්න මෙන්න කියල තිබියදීයි. යාපනයට ගියෙත් අවසාන මොහොතේ, යාපනය අර්ධද්වීපයට ගිහින් කළ ඇතැම් අවස්ථාවාදී ප්‍රකාශයක් දැන කියාගන්නට රටේ සෙසු ප්‍රදේශවලට අවකාශයක් ලැබුණේ නැහැ. රටේ සෙසු ප්‍රදේශවලට ගිහින් කිව්වේ නැහැ, මම අසවල් දවසේ යාපනයට යනවාය, ඒ ගියාම මෙන්න මේ පොරොන්දු දෙනවාය කියා. මම හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ මුද්‍රණය කළ ප්‍රකාශනවල එසේ කියා තිබෙනවාදැයි සොයා බැලුවා. යපනේ අර්ධද්වීපයට ගිහින් එහේ ගොවියාට මේ සහනාධාර දෙනවායයි කියන බව හෝ ඔවුන්ගේ නිෂ්පාදනවලට වැඩි මිලක් ලැබීම පිණිස අතිරේක අහාර ද්‍රව්‍ය ගෙන්වීම නතර කරන බවට පොරොන්දුවක් දෙනවාය කියා හෝ රටේ අනෙක් කිසිම ප්‍රදේශයකදී එතුමා කිව්වේ නැහැ. යම් නායකයෙක් යම් මැතිවරණ පොරොන්දුවක් දෙනොත් එය මුළු රටටම සාධාරණ ලෙස දැන ගන්නට සැලැස්විය යුතුයි. නමුත් මොහු එහෙම කළේ නැහැ. රටේ අනෙක් ප්‍රදේශවලට ගිහින් කිව්වේ නැහැ, ත්‍රස්තවාදී පනත ඉවත් කරනවාය කියා. තමන් ඇත්තටම එය කරන්න යනොත් කිව්වාට කමක් නැහැ. මොකද අන්තිම මොහොතේ එක ප්‍රදේශයකදී පමණක් ඒක කියන්නේ? දඬුවම් ලබා සිටින උදවිය නිදහස් කරනවාය කියා අනෙක් ප්‍රදේශවල කිව්වේ නැහැ. අවසාන මොහොතේ ගියේ. ඒ ප්‍රවෘත්තිය ප්‍රවෘත්ති පත්තරවල පළ වී ජනතාවට ඒ ඒ ගැන හිතා බලන්නවත් අවකාශයක් තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, ඒක නිසා තමයි, ස්වභාව ධර්මය විසින්ම ඔප්පු කළේ, මේක අවස්ථාවාදී ක්‍රියාදාමයක් බව.

ත්‍රස්තවාදී පනත ඉවත් කරනවායයි කී පුද්ගලයා, ඊයේ පෙරේයිදා ඇති වුණු සිද්ධිය ගැන මේ මොහොත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

වනාතුරු වචනයක්වත් ප්‍රකාශ කර තිබුණේ නැහැ. මගේ හිතේ ජනතාව මේ වාගේ උදවිය හොඳින් අඳුනා ගනියි, මොන විධියේ කුහක චේතනා අනුව ක්‍රියා කරන අංද කියන කාරණය සම්බන්ධයෙන්. මේ විධියේ අයට තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය උදවු ආධාර දෙන්නේ. මේ උදවිය අද අපට චෝදනා කරනවා ඇති වුණු සිද්ධි ගැන. මේ මැතිවරණයට—ජනපති වරණයට—අදාළව මම කියන්න කැමතියි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවියට, අපි කිසිම වේදිකාවක කොයිම අවස්ථාවකවත් සාමයට බාධා වන ප්‍රකාශ කොයිම වෙලාවකවත් නොකළ බව. අවසාන මොහොත දක්වාම අපි කිව්වේ, කරුණාකර මැතිවරණයට කලිනුත් පසුවත් සාධාරණ ලෙස සාමකාමීව ක්‍රියා කරන්න කියායි.

අපට ලොකු බයක් ඇති වුණා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වේදිකාවලින් නිකුත් වුණු ගිනි පුපුරු ගැන. ඇතැම් උදවිය කතා කළේ මේ රටේ බලය ලබා ගත් නායකයන් වාගේ. ගෝල බාලයන් එහෙම කතා කිරීමේ පුදුමයක් නැහැ, ජනාධිපති අපේක්ෂකයා කතා කරන විට අණ දෙන නිලධාරියා හැටියට. පසුව ඔහු ප්‍රකාශ කළේ "මා කතා කරන්නේ ජනාධිපති අපේක්ෂකයෙක් හැටියට නොව තේරී පත් වුණු ජනාධිපති හැටියට" කියායි.

"I am not speaking as a Presidential candidate, but as the President elect."

එයා එක්ක රටපුරාම ගමන් කළ එයාගේ සුවච කීකරු ගෝලයා විජය කුමාරතුංග. "ගුරා" කිව්වත් වරදක් නැහැ. ඔහු මොනවද වේදිකාවල කිව්වේ? අද අපට චෝදනාවක් කරනවා, රටේ ඇතැම් ප්‍රදේශවල ඇති වූ සිද්ධීන් ගැන. කරුණාකර හෘදය සාක්ෂිය විභාග කරන හැටියට මම ඉල්ලනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට උදව් පදව් කළ අයගෙන්, මේ රටේ ජනතාව ප්‍රකෝප කළේ කවුද කියා. මම ළඟ තිබෙනවා, ඒ පුද්ගලයාගේ පටිගත කළ කථා. මම ළඟ තිබෙනවා ඒ පුද්ගලයාගේ, ලඝු ලේඛනයෙන් සටහන් කර ගත් කථා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලජ්ජාවෙන් මුසපත් විය යුතුයි, ඒ පුද්ගලයා ගැන. ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කිළිටි කළා පමණක් නොවෙයි, මුළු දේශපාලන වාතාවරණයම කිළිටි කළා. ඒ තරම් පහත් භාෂාවෙන් ඒ තරම් නින්දනීය ලෙසයි ඔහු කථා කළේ, පරුෂ අන්දමින්. ඔහුත් ඔහුගේ බිරිඳත් ඒ නින්දිත ක්‍රියා කලාපයේ රජුත් රාජිනියත් හැටියට නම් කළ හැකියි. චන්ද්‍රිකා කුමාරතුංග අත්තනගල්ලේදී ජනාධිපතිතුමාට කථා කළේ "බල්ලා" කියලයි. ඒ කථාව අසාගෙන සිටි අය කියන්න ගත්තා "අනේ මේ පර බැල්ලි කියන්නේ මොනවාද" කියා. ලංකාවේ ජනවරමින් පත් වූ ජනාධිපතිවරයාට චන්ද්‍රිකා කථා කළේ "බල්ලා" කියලයි. ජනතාවගේ ඉවසීමේ සීමාව ඉක්ම ගියාය කිව්වොත් මම හිතනවා කිසි කෙනෙක් මා සමග විරුද්ධ වන්නේ නැහැ කියා.

ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ වෙනවාත් සමගම ජනාධිපති මන්දිරයට කඩාගෙන වදින්නට ඒ අය දිවුරුම් දීලා තිබුණා. ජේ. ආර්. ඇදල දමනවා පමණක් නොවෙයි, ඔහු මරා දමනවා කියා සාකච්ඡා වුණේ කවදාද කියා ටිකක් සොයා බලන්න. 20 වනදා රාත්‍රී වී 21 වන දාට එලි වන යාමයේ කැබිනට් මණ්ඩලය එහෙම පත් කරගෙන ඉවරයි. අපට ලැබුණු ආරංචි අනුව ඒ කණ්ඩායමෙන් අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) බේරුණේ අප දිනපු නිසයි. ඉස්සෙල්ලාම කණෙන් ඇදලා දොට්ට දමන්නේ එතුමායි. ඒ පක්ෂයෙන් එතැනට පත් වන්නේ විජය කුමාරතුංග අත්තනගල්ලේ මන්ත්‍රීවරයා හැටියට. රාජ්‍ය අමාත්‍ය ධුරය බාර ගන්නේ එතුමායි. [බාධා කිරීමක්] අගමැතිද අකමැතිද මම දන්නේ නැහැ.

ජිනදාස නියතපාල කළ කථාවක් විග්‍රහ කර බලන්න. ඔය යෝදයා නැවතත් එක්සත් ජාතික පක්ෂයට එකතු වෙනවා කියන විට මගේ ඇඟ කිලි පොලාගෙන ගියා. මිනිහා එකතු වුණු පක්ෂය පරාදයි. සූරියප්පෙරුම ගැමුණු පක්ෂය පරාදයි. ඒ දෙදෙනා නැති තැන දිනුම්. වාසනාවකට අපි ගත්තේ නැහැ. මිනිහා පක්ෂ නායකයෙක් හැටියට එකතු වුණේ. මිනිහත් පොඩි පක්ෂයක් හැදුව, නෙවිල් ප්‍රනාන්දු දොස්තර එක්ක. එයා මෙයාටත් ඉස්සර පැනගත්ත, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. මෙයාට තැනක් නැතැයි කියල පෙනිච්ච හැටියෙ මිනිහ පක්ෂයක් හැදුව. හදල මිනිහත් පක්ෂ නායකයෙක් වුණා. එයා මොකද ගිහින් කළේ? විජය කුමාරතුංගට දෙවෙනි නොවන්නට තර්ජන ගර්ජන කරන්න පටන් ගත්ත. අපි බොහොම අමාරුවෙනුයි, අපේ හැම රැස්වීමක දීම අපේ ජනතාවට සාමය රකින්න කිව්වේ. ඒ තරමටම ප්‍රකෝපවෙලයි තිබුණේ. රටේ තිබුණු දේශපාලන ප්‍රශ්න, වාතාවරණ ජනතාවට අමනාපවෙලයි තිබුණේ. පුදුම විධියෙ උද්යෝගයක් මේ ගෙන ගිය ප්‍රචණ්ඩ, දාමරික මැතිවරණ වැඩ පිළිවෙළ ගැන ඇති වුණා.

ගරු කථානායකතුමනි, මේ තොරතුරු ලැබෙන්නට ලැබෙන්ට ජනාධිපතිතුමා කිව්ව, "මම කරන්න යන වැඩේ හරි, හදිසි නීතිය දාම්මෙ නැති නම් තත්ත්වය භයානක වෙන්නට පුළුවනි" කියල. අපි සාමය ගැන කතා කරනව; සංවරය ගැන කතා කරනව; අර ගොල්ලන් ජනාධිපතිවරණය දිනල අණ දෙන්න පටන් ගන්නව. රැස්වීම්වල ඉඳගෙනත් පොලිස් නිලධාරීන්ට කතා කරල කියනව, "අරක කරපන් මේක කරපන්, නැතිනම් උඹේ ඇඳුම ගලවල ගෙදර අරිනව 21 වෙනිදාට" කියල. විජය කුමාරතුංගව මේ තත්ත්වයට ගෙන එන්ට අපේ මධ්‍යස්ථ භාවය හුඟක් දුරට උපකාරී වුණා. අපේ රූපවාහිනියට ඒ පිළිබඳව ලොකුම ගෞරවය ලැබෙන්න ඕනෑ. බොහොම මධ්‍යස්ථ භාවයෙන් ක්‍රියා කළ නිසා පසුගිය මාස පහ-හය තිස්සෙ, රූපවාහිනියෙන් බොහොම ලස්සනට එම්. ජේ. පෙරේරත්, එච්. එම්. ගුණසේකරත් මූර්තිමත් කර පෙන්නුව, විජය කුමාරතුංගව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙ සභාපතිගෙ කාමරයෙ දොර නිකම්ම ඇරෙනව නියතපාල එනකොට. ඒමන් කාරියකරවනගෙ කාර්යාලයෙ දොර නිකම්ම ඇරෙනව නියතපාලට. ඒ තරමටම අපි මධ්‍යස්ථවයි, ක්‍රියා කළේ. අපි ඒ තරම් සාධාරණ පක්ෂයක්.

ගරු කථානායකතුමනි, මේ රටේ සිටින ශ්‍රේෂ්ඨ නළුවා විජය කුමාරතුංගයි, රූපවාහිනියෙ. ඉතින් මේ නළුවා එනවාය කියල කිව්වාම ජනතාව එක් රොක් වෙන්න පටන් ගත්ත. ජනතාව එක් රොක් වුණාම අති විශාල සෙනගක් පිරෙනව. බලන්න එපා දිනුම්. බලන්න මෙතන ඉන්න සෙනග. පණස් දහසක් ඉන්නව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉතින් කොහොමද දිනන්නෙ? නුගේගොඩ රැස්වීමක් තිබ්බ. මගේ හිතේ රාජ්‍ය ඇමතිතුමාගෙ ඇපෙත් නැති වන තත්ත්වයෙ රැස්වීමක්. ඔක්කොම කියන්න පටන් ගත්ත කෝට්ටෙන් පරාදයි යූ. එන්. පිය කියල මගේ කොට්ඨාශයට ඇවිත් රැස්වීමක් තිබ්බ අලුත් කඩේ. ඇත්ත වශයෙන්ම විසිපන්දහසක් පමණ හිටිය, සෙනග. ඒක ඇත්තමයි. මම කෙනෙක් වේදිකාවට යවල ගණන් කෙරෙව්ව. මම කිව්ව ගණන් කරන තාලෙ. 10 දෙනෙක් ගනින්න. ඒ වාගෙ පේළි දහයක් ගනින්න. එතකොට සියයි. සියෙ ඒව දහයක් ගණින්න. එතකොට දාහයි. ඒවාගෙ ඒවා තියල බලන්න ඉන්න සේනාව, පාරවල් දෙකක් පිරෙන්න හිටය. මට ඇවිත් කිව්ව විසිපන් දහසකට වැඩි මිසක් අඩු නැහැයි කියල. නමුත් මුළු මැද කොළඹින්ම හෙක්ටර් කොබ්බෑකඩුව ගත්තෙ විසි දෙදාහයි. මේ එක රැස්වීමක කොටගෙන්න ගල්පොත්ත හන්දියෙ රැස්වීමක් තිබ්බ, සෙනග තිස් දහසකට වැඩියි. පුංචි බොරැල්ලෙ රැස්වීමක් තිබ්බ, කතාව ගියා හතලිස් දහසකට වැඩියි කියල. ලංකාව පුරාම. බොහොම දෙනෙක් හිතුව වැඩේ හරි කියල. ඉලංගරත්න කියන්න පටන් ගත්ත පණස් හයේ රැල්ල එනවාය කියල. පුදුම විධියෙ රැල්ලක් එනවාය කිව්ව. මගේ හිතේ ඒ තත්ත්වය ඇති කිරීම ගැන අපට ඒ ගෞරවය හිමි කර ගන්න ඕනෑ. විශේෂයෙන්ම රූපවාහිනියත් [බාධා කිරීමක්] මොකක්ද කිව්වෙ? ඒ ගෞරවය ලැබෙන්න ඕනෑ. රූපවාහිනියෙ එම්. ජේ. පෙරේරටයි, එච්. එම්. ගුණසේකරටයි. කවුද, මොන ජාගොඩද ඉන්නෙ? [බාධා කිරීමක්] ඔව්, ධම්ම ජාගොඩ ලට ඒ ගෞරවය දෙන්න ඕනෑ. අපේ රජයක් යටතේ ඉඳගෙන අපේ රජය විනාශ කිරීමට ආයුධ සන්නද්ධ කිරීම ගැන, ඇතැම් අයගේ අවි ආයුධ මුවහත් කිරීම ගැන

කථානායකතුමනි, අපි ක්‍රියා කෙළේ එහෙමයි. දවසක් හෙක්ටර් කොබ්බෑකඩුව උන්නැහේ රූපවාහිනියෙන් කථාවක් පවත්වනවා. කථාව පවත්වන ගමන් එයා කියනවා, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව යටතේ කථා කිරීමේ නිදහසත් නැතෙයි කියල. රූපවාහිනියෙන් කථා කරන ගමන්. කවුද මෙයාව මේ කථාවට පුහුණු කෙළේ? විජය කුමාරතුංග. හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ කථාවක් අහගෙන ඉඳල ගිහිල්ල, මම රැස්වීම්වලදී කිව්වා අන්තිමට එයාට නළුව ඉතුරු වෙන් නෙත් නැහැ, ඉතුරු වෙන්නෙ එයාගෙ ' අඹදරුවො " විතරයි කියා.

අපට දොස් කිව්වා, අපේ රැස්වීම්වලට සෙනඟ එන්නෙ ජනප්‍රිය නළු නිළියන් නිසාය කියා. ඇත්ත වශයෙන්ම ලංකාවෙ රූපවාහිනියෙන් පිහිට නොලැබු වත් තමන්ගේම ස්ව ශක්තියෙන් තමන්ගෙම හැකියා වලින් නමක් තියාගත් නළු නිළියො අපේ වේදිකාවට ආවා. ඔවුන් ආවෙ අවංකවම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති පිළිගත්ත නිසා බව මම ප්‍රකාශ කරන්න කැමතියි. නළු නිළියො පමණක් නොවෙයි, ගායක ගායි කාවොත්.

මගේ කොට්ඨාශයේ රැස්වීම් ප්‍රචාරය කරන කොට fපවුසි, ඉෂාක් දෙන්නගෙ මෙහෙයවීමෙන් තමයි ව්‍යාපාරය ගෙනිච්චෙ. ඔය හලීම් ඉෂාක් මැද කොළඹ තුන්වෙනි මන්ත්‍රීතුමා කොපමණ ඒකට හේත්තු වුණත් එයාට තැනක් තිබුණෙ නැහැ. මොකක්ද ප්‍රචාරය කෙළේ? "අපේ රැස්වීම්වලට නළුවො එන්නෙ නැහැ, නිළියො එන්නෙ නැහැ, අපේ රැස්වීම්වල සින්දු නැහැ" කිව්වා. මේක අපට ඇනුමක්. ඇයි නළු නිළියන්ට දේශපාලන වේදිකාවට එන්න බැරි? ඔවුන් මේ ජන ජීවිතයේ කොටස් කරුවො නොවෙයිද? එහෙම කිය කියා පත්‍රවල ප්‍රසිද්ධ කරන්න පටන් ගත්තා, ඒ ගොල් ලන්ගේ නළු නිළියන්ගෙ නම් ලැයිස්තු. මෙන්න මා අත තිබෙන "දිනකර" පත්‍රයේ තිබෙනවා "චිත්‍රපට නළු නිළියො කලා කරුවො ජේ.ආර්. පරද්දන්න කැඳවුරු බඳිති" කියා. කවුද මේ නළු නිළියො? මම කැමතියි ඒ ගොල්ලන් වාර්තාගත කර තියන්න. කොබ්බෑකඩුව මහතා ජයග්‍රහණය කරවීම සඳහා ජනතාවගෙන් ඉල්ලී මක් කරන නළු නිළියො කවුද? "සොමී රත්නායක, ගීතා කුමාරසිංහ, අජිත් ජිනදාස, බන්දු මුණසිංහ කියන නළු නිළියෝද මේ අය අතර වෙති" කියා පළ වී තිබෙ නවා.

මේ ආයාචනයට අත්සන් කළ අය කවුද? කේ. ඒ. ඩබ්ලිව්. පෙරේරා, ප්‍රේමසිරි කේමදාස. කවුද මේ ප්‍රේම සිරි කේමදාස? මට දැනගන්න ලැබී තිබෙන හැටියට රූපවාහිනිය මෙයාට කියල තමයි අලුත් තේමා ගීතය ඈත් හදාගත්තෙ මේ ළඟදී. දැන් රූපවාහිනියටත් මිට වඩා දක්ෂ සංගීතඥයෙක් නැහැ. ඊළඟට, යසපාලිත නානායක්කාර, තිස්ස අබේසේකර, වසන්ත අබේසේ කර, සුවිනීතා කෝන්ගහගේ, ගීතා කුමාරසිංහ, අමරසිරි කලන්සූරිය, රෝයි ද සිල්වා, සුමනා අමරසිංහ, හියුගෝ ප්‍රනාන්දු, ඇන්තනි සී. පෙරේරා, ඩී. ආර්. නානායක් කාර, සුමිත්‍රා අමරසිංහ, ජී. එස්. බී. රානි, ධර්ම ශ්‍රී කල්දේරා, අශෝකා පොන්නම්පෙරුම, ශිරානි නුගේරා පතිරාජ එල්. එස්. දයානන්ද, අජිත් ජිනදාස, එච්. ඩී. ප්‍රේමරත්න, මර්වින් ජයතුංග, සොමී රත්නායක, ඇලරික් ලයනල් ප්‍රනාන්දු, දයානන්ද ජයවර්ධන, සිරිල් වික්‍රමගේ, ගාමිණී හේවාවිතාරණ, අග්‍රා සජීවනී, නිමනි වීරරත්න, ජීවන් කුමාරතුංග, කිංස්ලි දිසානායක, බැසිල් ද සේරම්, ජයන්ත දාස් පෙරේරා, ආරියරත්න විතාන, හර්බට් අමරවික්‍රම, මූ. අරුක්ගොඩ, බන්දු මුණසිංහ, පියදාස විජේකෝන්, බණ්ඩාර කේ. විජයතුංග, ලාල් දිසානායක, ජේ. සෙල්වරත්නම්, ලලිත් ගුණවර්ධන, රංජිත් පෙරේරා, එස්. ඒ. ප්‍රේමරත්න, ලූවී වැන්ඩස්ට්‍රා, සුනිල් ගුණවර්ධන, පියසිරි විජේරත්න, බඳුන්දුල විජේවීර, ජේ. ජේ. යෝගරාජා බර්ටි තලගල, ශ්‍රේෂන් අමරසිංහ, ජිනදාස පෙරේරා, වික්ටර් බණ්ඩාර සේනාරත්න, නිහාල් සිල්වා, රෝයි ජයවර්ධන, එස්. පී. කෝස්තා, සුනිල් සෝම පීරිස් සෙබැස්තියන්, ජයසිංහ දීපාල් ප්‍රනාන්දු, පියසේන අහංගම, ගුණදාස ගඳුනැන්න, නවනන්දන විජේසිංහ, රොබින් ප්‍රනාන්දු, අසංකා මොනරවිල, විමල දාස පෙරේරා, සිරිල් කහවල, සරත් කුමාරසිරි, ආනන්ද වීරරත්න, සෝමපාල ලැනරෝල්, සමන්ති ලැනරෝල්, මේ අය අපට දෙස් කිව්වා.

මේ මැතිවරණයට දින කිපයකට කලින් චින තානා පති කාර්යාලයේ සාදයකදී ප්‍රේමසිරි කේමදාස හොඳටම බිල මොනව කියලද කර්ජනය කළේ? එතැන් අහගෙන හිටපු කීප දෙනෙක් මට කිව්වෙ, "අපි ඉන්නෙ 21 වැනිද වෙනකල් ටවර් හෝල් එක මට්ටම් කරන්න, යූ. එන්. පී. එකේ ජේ. ආර්. ජයවර්ධනට, ප්‍රේමදාසට නියම පාඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

අපි උගන්වනව" කියල තර්ජනය කරල තිබෙනව. මේ ජේ. ආර්. ජයවර්ධන නිසා බඩ ගෝස්තරය හම්බ කර ගන්නවා රූපවාහිනියෙන්. එතුමාව නැති කරන්නව, මේ මැතිවරණයට ඉස්සෙල්ල ප්‍රසිද්ධියේ කණමැදු වෙන්න බිල සාදවලදී එහෙම කියන්නෙ. කියනවා විතරක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ දර්ශනය අනුව අපේ ගමන් මග අපත් සමග ගමන් කරන අපේ කලා කාමීන්ට පුළුවන් තරම් අපහාස උපහාස කර තිබෙනවා. නමුත් ඒ එක කලා ශිල්පියෙකුවත් වේදිකාවේ කථා කරන විට විජය කුමාරණතුංගගෙ භාෂාවෙන් වත් අනෙකුත් ඔයු නම් සඳහන් කළ උදවිය කථා කළ භාෂාවෙන්වත් පිළිතුරු දෙන්නට නොගිය බව මම ඒ අපට උදව් කළ නළු නිළියන්ට සහ ගීත ගායක ගායිකාවන්ට උපහාරයක් හැටියට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමතියි.

ඇත්ත වශයෙන්ම ඇතැම් කලා ශිල්පීන කථා කරන විට මට කල්පනා වුණා, ඔවුන් කලා ක්ෂේත්‍රයේ කටයුතු කළත් පොදු ජන ජීවිතය පිළිබඳව කොයි තරම් ඇල්මක් බැල්මක් ඇතිව අවධානයක් ඇතුව ඉන්නවද කියල. දේශපාලන වේදිකාවේ ඒ නළු නිළියන් කථා කරන විට මට ඒ හැඟීම ඇතිවුණා. විශේෂයෙන්ම ලංකාවේ ශ්‍රේෂ්ඨ සිනමා නළුවෙක් වන ජෝ අබේවික්‍රම මහත්මයා රවීන්ද්‍ර රන්දෙනිය මහතා ආදී ඒ කවුරුත් කථා කරන විට අපි වේදිකාවේ ඉඳගෙන කථා වුණා, "බලන්න, රටේ ප්‍රශ්න පිළිබඳව මේ අය මේතරම් අවධානයක් යොමු කර ගෙන ඉන්නවද" කියල. මේ රජය කරගෙන යන සංවර්ධන වැඩ ගැන හොයන්න, නිෂ්පාදන වැඩ පිළිවෙල ගැන හොයන්න, එවැනි වැඩ පිළිවෙල්වල් මගින් සමාජය ඉදිරියට ගෙන යන ආකාරය ගැන හොයන්න ඔවුන්ට විවේකයක් තිබුණද කියා ඒ අවස්ථාවේදී අපට හිතුණා. අපේ සැසි වාර්තාවලින් දැන ගත යුතු තොරතුරු ඔවුන් හරිහැටි දැනගෙන හිටියා. ඔවුන් ගායනා කළ ගීතත් රටේ පොදු ප්‍රශ්නවලට අදාළ වන විධියටයි, සකස් කරගෙන තිබුණේ.

අපේ වේදිකාවට ආ ඒ කලා ශිල්පීන් පිරිස තමයි, මේ:

ජෝ අබේවික්‍රම, මාලිනී ෆොන්සේකා, රවීන්ද්‍ර රන්දෙණිය, සෝනියා දිසා, සනත් ගුණතිලක, සෝමි රත්නායක—මගේ හිතේ, සෝමි රත්නායකගේ නම අර පත්තරේ දමා තිබෙන්නේ වැරදීමකින්—රෙක්ස් කෙඩිප්පිලි, දෙනු සිරිසේන, සබීතා පෙරේරා, ස්ටැන්ලි පෙරේරා, රෝහිණී ජයකොඩි, ෆ්‍රෙඩී සිල්වා, බන්දු මුණසිංහ, වික්ටර් රත්නායක, එච්. ආර්. ජෝතිපාල, මොහිදීන් බෙග්, මිල්ටන් පෙරේරා, අබේවර්ධන බාලසූරිය, නිරංජලා සරෝජිනී, සුනිල් සිරිවර්ධන, සනත් නන්දසිරි, චන්ද්‍රිකා සිරිවර්ධන, සුජාතා අත්තනායක, මිල්ටන් මල්ලවාරච්චි, 'ත්‍රී සිස්ටර්ස්' ඩෙස්මන් රූද්‍රිගු, රොමිලස් පෙරේරා, ක්‍රිස්ටෝපර් පෝල්. සී. ඩී. ෆොන්සේකා, අයතුල්ලා මවුජින්, එම්. එස්. ප්‍රනාන්දු, සිසිර සේනාරත්න, ඉන්ද්‍රාණී සේනාරත්න, ඇනස්ලි ඩයස්, බර්ටි ගුණතිලක, සැමුවෙල් රූද්‍රිගු, රම්දාස් සහ පිරිස, සරත් දසනායක, විපුල පෙරේරා, ඔස්ටින් මුණසිංහ, සුසිල් ප්‍රනාන්දු මවුන්ට් වයිම්ස්.

සෝමි රත්නායක සහ බන්දු මුණසිංහ යන අයගේ නම් "දිනකර" පත්‍රයේ ඔවුන්ට සහය දුන් කලාකරුවන් හැටියට සඳහන් වුණත් ඔවුන් දෙදෙනා ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය පිණිස එ. ජා. ප. වේදිකාවට පැමිණි බව සඳහන් කරන්න ඕනෑ.

මේ කලා ශිල්පීන්ට අපේ උපහාරය පිරිනමන්නේ අපට උදවු උපකාර කළ නිසා පමණක් නොවෙයි. සාමය සංවරය ආරක්ෂා වන විධියට ඔවුන් කථා කළා. ඇත්ත වශයෙන්ම මම බලාගෙන හිටියා, අහගෙන හිටියා ඔවුන් ජනතාවට අවවාද කරනවා, 'කුපිත වන්න එපා, ප්‍රකෝප වෙන්න එපා' කියා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! Shall we suspend the Sitting till 5 p.m.?

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
Mr. R. Premadasa)

Yes.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, ප. ව. 5 ට නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

*அதன்படி, அமர்வு பி. ப. 5 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 5 p.m. and then resumed.* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNE] *in the Chair.*

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියාගෙන යමින් සිටියේ මේ රටේ කලා ශිල්පීන් මේ මැතිවරණයේදී ක්‍රියා කළ ආකාරය ගැනයි. ඔවුන්ගේ සහාය අපි ලබා ගන්නවාය කියා අපට චෝදනා කළා. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ඒකම කළ බවයි, මට පෙන්වන්නට වුවමනා කළේ.

ඊළඟට බලන්න 'ජයවර්ධනගේ ආණ්ඩුවට බුද්ධිමතුන්ගේ විරෝධයත් පැනනැගිච්ච ආකාරය' කියා වැරදි හැඟීමක් රට පුරා ඇති කළා. මේ ගොල්ල තමයි මේ රටේ ඉන්න බුද්ධිමතුන්. මම මේක කියන්නේ මේ පිරිසට අවමානයක් කරන අදහසින් නොවෙයි. ජනතාව මේ උදවියට සලකපු හැටි පෙන්වන්නටයි. මට ඒකයි කණගාටුව. අපිත් කිසිසේත් කැමති නැහැ බුද්ධිමතුන්ය කියා ගන්නා කෙනෙකුටවත් අවමානයක් කරන්න. නමුත් මේ රටේ පොදු ජනතාව කවුද බුද්ධිමත් කියා දන්නවා. මගේ හිතේ මේ රටේ ඉන්න අග්‍රගණ්‍ය බුද්ධිමතා මේ රටේ ජනතාව. යම් දේශපාලන පක්ෂයකට වැරදුණා නම් වැරදුණේ ඒක තේරුම් නොගත් නිසයි. හැම දේශපාලන පක්ෂයක්ම හිතුවා ඒ ගොල්ල තමයි බුද්ධිමතුන් කියා මම කැමතියි, මේවත් වාර්තාගත කරලා තබන්න. මේ බුද්ධිමතුන්. මහාචාර්ය සරච්චන්ද්‍ර—බුද්ධිමතුන්. මගේ හිතේ අන්තිමට බුද්ධිමතුන් වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

මම කියන එකක් නොවෙයි මේ. ජනතාවගේ තීරණයෙන් පෙනෙන්නේ. ජනතාව කිව්වා "උඹලා නොවෙයි බුද්ධිමතුන් අපි. අපි මුලා වෙන්නේ නැහැ උඹලාට."

මෙන්න ඒ බුද්ධිමතුන්:

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ප්‍රේමසිරි කේමදාස, මහාචාර්ය ඒ. වී. සුරවීර, ගුණසේන විතාන, මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන, ආචාර්ය ප්‍රේමදාස උඩගම, දෙස්තර කේ. ඉන්ද්‍රකුමාර, මහාචාර්ය මැන්දිස් රෝහණධීර, මහාචාර්ය විශ්වා වර්ණපාල, ආචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු, අධිනීතිඥ වී. බ. දොරකුඹුර, ආචාර්ය ජිනරතන ගමගේ, ආචාර්ය ඒ. අබේසිංහ, කවිකාචාර්ය ඒ. ඒකනායක, ආචාර්ය එච්. එන්. ගුණතිලක. ආචාර්ය නිව්ටන් ගුණසිංහ, ආචාර්ය උපාලි සේදර, ආචාර්ය වයි. ආර්. අමරසිංහ, ආචාර්ය ඒ. වී. ජේ. ජයසේකර, ආචාර්ය කඹුරුපිටියේ ආරියසේන හිමි, ආචාර්ය මයිකල් ප්‍රනාන්දු කවිකාචාර්ය මි. ර. ග. දැල බණ්ඩාර, ආචාර්ය මාලනී ඇඳගම, ආචාර්ය එස්. පී. හෙට්ටිගේ, ආචාර්ය ඩී. සෝමසුන්දර, කවිකාචාර්ය කුමාර් පියසිරි, කවිකාචාර්ය ඩී. ඒ වෙනිසන් පෙරේරා, අධිනීතිඥ ජගත් වික්‍රමසිංහ, කවිකාචාර්ය ටී. තිලෙයිනාදන්, ඩොමිනික් ජීවා, ඩබ්ලිව්. ඒ. අබේසිංහ, රන්ජිත් ධර්මකීර්ති, බන්ඩාර විජේතුංග, අගස්තියර්ගේ ජයතිලක, සිරි කහවල, පී. මලල්ගොඩ, බොරලැස්ගමුවේ විමලසිරි පෙරේරා, කේ. ඒ. ඩබ්. පෙරේරා, සිරිලාල් කොඩිකාර, වේල්ස් පෙරේරා, විජයංග බී. රාමසාමි, නවනන්දන විජේසිංහ, ආරියරත්න විතාන, කරුණාසේන ජයලත්, බන්දුල කරුණාතිලක, ඇන්. සින්නතම්බි, වරකාවේ ධර්මාලෝක හිමි. මේ ආදී විශාල පිරිසකගේ අත්සනින් ඒ බුද්ධිමතුන්ගේ ආයාචනය ජනතාවට නිකුත් කළා. මට කණගාටු මේ බුද්ධිමතුන් කියන වචනයටත් නිගා ගෙන දුන් එකට, මේ ජනතාවගේ තීරණයෙන්.

ඒ අතර බොහොම ලස්සන විග්‍රහයක් කරලා තිබුණා, එක මහාචාර්යවරයෙක්, "දිනකර" පත්‍රයේ, 1982 ඔක්තෝබර් 18 වැනිදා:

"සංඛ්‍යාලේඛන විද්‍යාඥ මතයන්—වැඩිම ඡන්දය අනට—පොදු ජන සමගි අපේක්ෂක හෙක්ටර් කොබ්බෑකඩුව මහතා ස්ථිර වශයෙන්ම ඡන්ද තිස්අට ලක්ෂය ඉක්මවා ලබමින් ජය ලබා ගන්නා බැව් පේරාදෙනියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සංඛ්‍යාලේඛන විද්‍යාඥ, ආචාර්ය එල්. ඩයස් හේවාගම මහතා ප්‍රකාශ කරයි"— කොබ්බෑකඩුවට ජය සිකුරුයි."

එයා හොඳට ගණන හදලා තිබුණා.

"මෙම ජනාධිපතිවරණයේදී ඡන්ද ප්‍රකාශ කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි සංඛ්‍යාව ලක්ෂ 68.248 ය"— [බාධා කිරීමක්]

හරි සංඛ්‍යාලේඛන කාරයෙක්, මිනිහා.

ඔක්තෝබර් 18 වැනිදා 'දිනකර' පත්‍රයේ එයා ප්‍රසිද්ධ කරනවා, ප්‍රසිද්ධියේම:

"ලක්ෂ 68.248 යි. මේ තත්ත්වය යටතේ එක්සත් ජාතික පක්ෂයට ලබාගත හැකි ඡන්ද ප්‍රමාණය ලක්ෂ 22.4 සිට ලක්ෂ 26.4 ක් පමණ යයිද ආචාර්ය ඩයස් හේවාගම මහතා සඳහන් කරයි."

මේ මුළු විග්‍රහයම එහෙම තිබෙනවා. එහෙම කියලා, කියනවා.,

"මේ තත්ත්වය යටතේ එක්සත් ජාතික පක්ෂයට හිමිවන ඡන්ද ප්‍රමාණය ලක්ෂ 22.4 සිට 26.4 ක් විය යුතුය."

ඉතින් අනික් අපේක්ෂකයින් ඔක්කොම ගන්නා ප්‍රමාණය—එක්සත් ජාතික පක්ෂයෙන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අපේක්ෂකයෝ දෙන්නා ඇර—

"අනික් ඔක්කොම අපේක්ෂකයෝ ගන්නා ඡන්ද ප්‍රමාණය—ලක්ෂ 6.825 යි, කොබ්බෑකඩුව මහතාට හිමිවන ඡන්ද ප්‍රමාණය ආසන්න වශයෙන් ලක්ෂ 33.98 සිට ලක්ෂ 39.98 අතර විය යුතුය.—විශ්ව විද්‍යාලයේ සංඛ්‍යාලේඛන විද්‍යාඥ ආචාර්ය එල්. ඩයස් හේවාගම මහතා"

සමහර ජෝති ශාස්ත්‍රඥයොත් මේ තරඟයේදී සෑහෙන්න මට්ටම් වුණා. "ඇත්ත" පත්‍රයක් කොයි තරමට ගියාද කිව්වොත්—කොමියුනිස්ට් පක්ෂයේ තමුන්නාන්සේගේ පත්‍රය—කොයි තරමට ජනතාවට ඒන්තු ගන්නවන්න ගියාද කිව්වොත්, රටේ හඳහනත් එක්ක සංසන්දනය කරලා, කෝ. දේ. ලීලපාල කියන ජෝති ශාස්ත්‍රඥයාගේ ලිපියත් දාලා "ඔක්තෝබර් 20 වැනි දින පවත්වන ජනාධිපති මැතිවරණයෙන් ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා පරාජය වන බව නියත වශයෙන්ම පළ කර සිටියි." කියා ප්‍රසිද්ධ කළා.

"ඔක්තෝබර් 20 වෙනිදා පවත්වන ජනාධිපති මැතිවරණයෙන් ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා පරාජය වන බව නියත වශයෙන්ම පළ කර සිටී. ඔක්තෝබර් මස 20 වන දිනට යෙදෙන ග්‍රහ චාරය අනුව ජනාධිපති මැතිවරණයෙන් වර්තමාන රජය පරාජය වන බව අප ඉහත සාධක සහිතව පළ කළේ ලොව ප්‍රකට ජෝති ශාස්ත්‍රඥයකු වන ක්‍රිෂ්ණ මූර්තිතුමන්ගේ ජෝතිෂ් ක්‍රමය අනුවය."

අනේ අපරාදෙ ක්‍රිෂ්ණ මූර්තිටත්............මේ මොකද මෙහෙම කිව්වෙ? "ඉරණම" පත්‍රයේ පළ කරල තිබුණා හැම වාරයකම වාගේ මොන පක්ෂය ජය ගන්නවාද කියල. මම දන්නවා 1970 දී කිව්වා, එක්සත් ජාතික පක්ෂය පරදිනවා කියල. එය ජෝති ශාස්ත්‍රඥයින්ගේ අනාවැකි අනුව පමණක් නොවෙයි අර කුපන් පත් ක්‍රමයෙනුත් ප්‍රකාශ කර තිබුණා, "දවස" නිවස පත්‍රයේ. හරියටම එය හරිගියා. මේ වාරයේ පමණක් නොවෙයි මීට කලිනුත්--1970 දීත් කිව්වා; 1977 දීත් කිව්වා; දැන් මේ 1982 දීත් කිව්වා. ඒ වෙලාවෙ පතුරු යනකල් බැන්නා "ඉරණම" පත්‍රයට, "දවස" පත්‍රයට සහ "සන්" පත්‍රයට "ඇත්ත" පත්‍රයෙන්, "දිනකර" පත්‍රයෙන් සහ මේ අයගේ බල ඇණියෙන්. 1982 ඔක්තෝබර් 13 වෙනිදා "ඉරණම" පත්‍රයේ "ජේ. ආර්. ට ජය." මේ පත්‍ර ලක්ෂ ගණනක් එක්සත් ජාතික පක්ෂයෙන් අච්චු ගස්සලා බෙදුවයි කියල කිව්වා. අමූලික බොරු නේ. මොන තරම් පහත් තත්ත්වයට වැටෙනවාද? දිනා ගැනීමේ කෑදරකමින් මේ උදවිය මොන විධියට කටයුතු කරනවාද කියා මෙයින් තේරෙනවා ඇති. මගේ කොට්ඨාශයේ ඉන්න ජෝති ශාස්ත්‍රඥයෙකුත් 18. 10. 82 දින "ඇත්ත" පත්‍රයට ලියල තිබෙනවා:

"නව ග්‍රහයන්වත් දේශපාලන මාරු
ජනාධිපතිවරණයේ ජයග්‍රහණය සම්බන්ධයෙන් ඉකුත් "ඉරණම" පත්‍රයෙන් අනාවැකි ප්‍රකාශ කර තිබුණු ආකාරය ජෝති ශාස්ත්‍රයට එකඟ නැතැයි සුප්‍රකට ජෝති ශාස්ත්‍රඥයකු වන විජයසිරි විද්‍යාරත්න මහතා පවසයි."



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

මට කණගාටුයි මිනීහට වෙච්ච ඇබැද්දිය ගැන. එයත් බොරුකාරයෙක් වුණා. මම මේ තමුන්නාන්සේට කියන්නෙ මේ උදවිය අතට ගන්න පුළුවන් හැම අවි ආයුධ යන්ත්‍ර ගත්තා. බුද්ධිය ගෙන ඉන්න මතුත් ගත්තා. බොරු ශාස්ත්‍රඥයින් ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තරම් පහත් තත්ත්වයකට ගිහිල්ලයි ජනාධිපති වරණයේ දී විපක්ෂය ක්‍රියා කළේ විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම්පූර්ණයෙන්ම ලංකා කොමියුනිස්ට් පක්ෂයේ හිරකාරයෙක් බවට පත් වුණා. යන එන මං නැතිව සිටි ලංකා කොමියුනිස්ට් පක්ෂය. අන්ත පරාජයකට පත්වෙලා සිට, අර කලවානෙන් යන්නම් මෙහාට ආපු කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂකයා මහ ජනමත විචාරණයක්—ඡන්දයක්— මොකද කලවානට තියන්නෙ නැත්තෙ කිය කියා නැගිටින හැම වෙලාවකම අපට දෙස් කිව්වා. ඔන්න ජනමතය තිබ්බා. මට කණගාටුයි පැරදුනාය කියල කියන්න. අන්න ජනමතය තිබ්බ ඡන්දයෙන්ම තිබ්බා. තිබුණ එකත් නැති වුණා. [බාධා කිරීම්] ඔව් ඒවා දමන්නෙ නැහැ. කාට විරුද්ධ වද වැඩ කළේ ? මේ රටේ මාක්ස්වාදයේ නායකයාට. තමන්ගේ මාමණ්ඩිට විරුද්ධවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා කොමියුනිස්ට් පක්ෂය මේ මුළු මැතිවරණ ව්‍යාපාරයම අතට ගත්තා. කියන්න පුළුවන් බොරු ඔක්කොම කිව්වා. බණින්න පුළුවන් අන්තිම පහත් භාෂාවෙන් බැන්නා. අපි ඒවා ඔක්කොම ඉවසා ගෙන හිටියා. අපට තිබුණා එක ශක්තියක්. ජනතාවගේ බුද්ධිමත් භාවය පිළිබඳ විශ්වාසයක් අපට තිබුණා. ජනතාවගේ බුද්ධිමත් භාවය පිළිබඳ විශ්වාසය. මම කිව්වා මොන විධියේ තර්ජන ගර්ජන ආවාද කියල. විජය කුමාරතුංග මගේ ජීවිතය භාර දීල තිබුණේ කාටද? fපවුඩිට. මට සලකන හැටි රැස්වීම්වලදී කිව්වා. කව්ද fපවුඩි? අලුත් ආණ්ඩුවේ මැණික් සංස්ථාවේ සභාපති. මම මගේ කථාවේදී එලියට දෙන්නම් පත්විම්. කවුද අවසානයේදී මේ මහා ජයග්‍රහණයේ නියමුවා ? මේ නියමුවාගේ වෛවර්ණ චිත්‍රයක් අච්චු ගසා ස්ටොක් කර තිබුණා. මට එකක් ලැබුණා මේන්න: සිරිමා බණ්ඩාරනායක නොවෙයි, මෛත්‍රීපාල සේනානායක නොවෙයි, හෙක්ටර් කොබ්බෑකඩුව නොවෙයි.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

බොරු කොණ්ඩයක් තියෙන්නෙ.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

මොකක්ද මේයාගෙ ඇත්තට තියෙන්නෙ? ඔක්කොම කෘත්‍රිමනේ ? ඒක දන්න අය මේ රටේ සිටිනවා. කොණ්ඩෙ විතරක් නොවෙයි. මොනවාද මේ කියන්නේ ? මේක 21 වනදා ඡන්ද ප්‍රතිඵල නිකුත් වන විට බෙදා හරින්න තිබුණේ. මුද්‍රණය කළේ fපවුඩි සහ ඉසතු. පොදු ජන යුගයක බලාපොරොත්තුව. ලංකා කොමියුනිස්ට් පක්ෂයේ බලාපොරොත්තුව. [බාධා කිරීමක්].

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Order, please ! Are you tabling it ?

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

Yes. You can take a photocopy. මට මේක නුවරඑළිය මස්කෙළියේ දෙවන ගරු මන්ත්‍රීතුමාට (අනුර බණ්ඩාරනායක මහතා) දෙන්න පුළුවනි. මට භය එතුමා මේකට වසී වෙයිද කියලයි. අස්කා වසී කර ගත්තා වාගේ මල් ලිත් වසී කර ගනීසිද කියලයි. මෙන්න මෙයා දිනවන්නයි ඔක්කොම කළේ. තමුන්නාන්සේලාගේ ලංකා කොමියුනිස්ට් පක්ෂය මොන තරම් පරිභානියට පත් වී තිබෙනවාද කියා කලවානේ ගරු මන්ත්‍රීතුමාට (සරත් මුත්තෙට්ටුවේගම මහතා) තේරෙයි. නිතාගෙන හිටියා ගලාගෙන එයි කියල ඡන්ද. මේ රටේ ජනතාව මන්ද බුද්ධිකයන් නොවන බව මේ වාරයේදී ඉතාමත් උසස් අන්දමින් ඔප්පු කළ බව මම ඔවුන්ට උපහාර වශයෙන් ප්‍රකාශ කරන්න කැමතියි. නුවරඑළිය මස්කෙළියේ දෙවන ගරු මන්ත්‍රීතුමාට මේක දෙන්නම්. මට ආපහු ඕනෑ. ඔය පින්තූරය ගන්න සෑහෙන 'මේක්අප්' එකක් කර තිබෙනවා. පින්තූරය පරීක්ෂාවෙන් බලන විට මේ මස්සිනාට පෙනෙයි අර මස්සිනා 'ලිප්ස්ටික්' පවා ගාගෙන තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ නායකතුමාගේ ජයග්‍රහණය නිසා අපට අද මේ විධියට සතුටු සාම්චියෙන්, සිනා මුහුණින් මේ ජයග්‍රහණය මේ ආකාරයට භුක්ති විඳින්නට පුළුවන්කම තිබෙනවා. නමුත් එදා හෙක්ටර් කොබ්බෑකඩුව මහතා දිනුවා නම් මේ රට ලේ ගංගාවක් වන බව තමුන්නාන්සේට කියන්න මට පුළුවන්. ලේ ගංගාවක් වන්නට තිබුණා. මම හිතන්නේ නැහැ බණ්ඩාරනායක මහත්මියගේ ජීවිතයවත් අනුර බණ්ඩාරනායක මහතාගේ ජීවිතයවත් බේරෙන්නට තිබුණාය කියා ඒ වැඩ පිළිවෙළෙන්. කලුගල්ල මහතාගේ ප්‍රකාශයක් මම දැක්කා, ඊයේ පෙරේදා පත්තරවල. සිවිල් යුද්ධයක්. නමුත් සිවිල් යුද්ධයකටත් දෙපක්ෂයක් ඉන්නට ඕනෑ. අපට වෙන්නට තිබුණේ ඊටත් වඩා භයානක තත්ත්වයක්. සූදානම තිබුණා රට පුරාම. බලය ගත්ත හැටියේ අන්න නියමුවා අණ දෙන ආකාරය ප්‍රසිද්ධ රැස්වීම්වලදී කියා තිබුණා. ප්‍රසිද්ධ රැස්වීම්වලදී කියා තිබුණා මොන මොනවාද කියන්නේ මොන මොනවාද කරන්නේ කියා. අපට අද මෙය විනෝදාත්මකව සාකච්ඡා කරන්න පුළුවන්කම තිබෙනවා. නමුත් මා කලින් කිව්වා වගේ තිබුණු තත්ත්වය නම් ඒ තරම්ම භයානකයි.

කොබ්බෑකඩුව මහතා විටින් විට මොනවද කිව්වේ? "ජේආර්ට මම කියන්න කැමතියි, 21 වැනිදාට බලා ගන්නට පුළුවන් එයාට මම කථා කරන භාෂාව". මොකද, අපේ නායකතුමා කියා තිබුණා, 'රූපවාහිනියේ කථාව අහගෙන හිටියම, සිංහලත් බැහැ, ඉංග්‍රීසිත් කියා ගන්න බැහැ, දෙමළත් බැහැ' කියා. ඒකට කිව්වේ ඕකයි.

ඒ නායකයෝ කී ඒවා. ගෝල බාලයෝ කී ඒවා ගැන මම සඳහන් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

රූපවාහිනියෙන් කථා කළේ චාලිචැප්ලින් වගේ.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

මා ළඟ තිබෙනවා 'ජනදින' පත්‍රයේ 25 වැනි දා ලිපිය කතු වැකියේ කොටස් වගයක්.

"ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් දිනකර පත්‍රයත් ජනාධිපතිවරණයෙන් කොබ්බෑකඩුව ජනාධිපති කළේ නාම යෝජනා පත්‍ර බාර දෙන්නටත් කලින්. ඔවුන් සටන සටනක් සේ පිළිගත්තේ නැති තරමටම ඝුවර් කරගෙන සිටියේය. සමහර කොටස් පහර දෙන ප්‍රතිවාදීන් වෙන් කර ගත්තේය."

කවුද මේ කියන්නේ? "ජනදින".

"තවත් අය උසස්වීම්, තනතුරු වෙන් කර ගත්තේය. තවත් අය ලේක් හවුසියේ ප්‍රධාන දොරටුවේ පසි පෙළෙල් බාගයක් තැය සිටියහ."

මගේ හිතේ කලවානේ ගරු මන්ත්‍රීතුමා [සරත් මුත්තෙට්ටුවෙගම මහතා] දන්නවා කවුරු ගැනද මේ සඳහන් කරන්නේ කියා.

"ඔවුන් සිටියේ බ්‍රහස්පතින්ද ලේක් හවුසියට ගොස් බලෙන් වැඩ භාරගෙන 'සිළුමිණ' පත්‍රය ඔවුන් අතින්ම මුද්‍රණයට සකස් කිරීමටය. ඔවුන්ගේ සටහන් අරමුණු ඒ තරමටම බොළඳවීම පරාජයට එක් හේතුවකි.

අනික් ප්‍රධාන හේතුව වුයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අභ්‍යන්තර අවුලයි. තරඟයට අපේක්ෂකයා තෝරූ මොහොතේ සිට ඡන්ද ප්‍රචාරක ව්‍යාපාරයේ අවසාන වේදිකාව දක්වා එම අර්බුදය විහිදී ගියේය. ජනාධිපති අපේක්ෂකයා නාමයෝජනා දිනයේ ඉදිරිපත් කරන බව පක්ෂයේ නායිකා සිරිමා බණ්ඩාරනායක මහත්මිය කියා සිටියාය. එයට හේතුව වශයෙන් ඇය කියා සිටියේ කලින් නම් කළහොත් ඔහුගේද ප්‍රජා අයිතිය නැති කරන්නට ඉඩ ඇති බවය. කෙසේ වෙතත් අපේක්ෂකයා අනුමත කිරීමට සමස්ත ලංකා කාරක සභාව කැඳවන ලෙස ලේකම් රත්නසිරි වික්‍රමනායක මහතාට ඇය දැනුම් දුන්නාය.

වික්‍රමනායක මහතා සැඟවුණේය. බණ්ඩාරනායක මහත්මියටත් හොරා කොබ්බෑකඩුව මහතාගේ නම යෝජනා කළේය. එයින් උග්‍ර වූ පක්ෂ අර්බුදය ඡන්දය අවසන් වන තුරුත් නතර වූයේ නැත."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ අවුල් ඇති කරන්නට පටන්ගත්තේ පක්ෂය තුළ ම අවුල් ඇති කරලයි.

"ලබන විශ වෙනි ද ජනපති මම. කොබ්බෑකඩුව කියයි"

ඒ ගොල්ලන් සාකච්ඡා කළා, මේ බලය ලැබුණාම මොන විධියට ඒක භාර ගන්නවාද කියල. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් වන ජනාධිපති වශයෙන් ඉන්න ජනාධිපතිම පත් වුණොත්, ඔහුගේ සම්පූර්ණ නිල කාලය ඉවර වෙලා 1983 පෙබරවාරි 4 වනදාට අනික් නිලය භාර ගන්නව දිවුරල. ඉන්න ජනාධිපති හැරෙන්නට වෙනත් කෙනෙක් පත් වුණොත් සති දෙකක් ඇතුළත දී වැඩ භාර ගන්නව. ඒ ජනාධිපතිගේ බලය ක්‍රියාත්මක වෙන්නේ නීත්‍යනුකූලව දිවුරුම් දුන්නාට පස්සෙයි. නමුත් මේ අය කොහොමද මේක කරන්න හිටියෙ.

" ඔය නීතිරීති වලින් අපට වැඩක් නැහැ. අපට ඔය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වුවමනාවක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිකම් කඩදාසියක් කෑල්ලක් පමණයි. අපි ඒක ඉරල දමනව. අපි පැන ගන්නව රජ ගෙදරට. බලය අතට ගන්නව. " ඔන්න! කරන්න හිටියෙ ඕක.

විජය කුමාරණතුංග කියා සිටියා, මෛත්‍රීපාල සේනානායක මහත්මයව අගමැති කරන්න. ඔකට මැකී රත්වත්තේ කණ්ඩායම විරුද්ධවයි හිටියේ. විජය කුමාරණතුංගගෙ බලාපොරොත්තුව තිබුණෙ පාර්ලිමේන්තුවේ ඉන්න කෙනෙක් අගමැති කරන්නටයි. සුනේත්‍රාගෙ ස්වාමි පුරුෂයා තමයි එයාර් ලංකා එකේ චෙයාර්මන්. [බාධා කිරීමක්].

Prasanna Dahanayake, Secretary, Defence ; H. G. S. Ratnaweera of the Communist Party in charge of Lake House as Chairman and in charge of the communication system including the T.V., ඔකයි අර 'ජනදිනේ' කියන්නෙ පසි පෙළේ හිටියාය කියලා. M. D. Fernando, ex-army officer, as Army Commander. කොයි මිනිසාද මේ ගොල්ලන්ට අලුගෝසුවා නොවෙන්නෙ ?

The plan was to storm the President's House and the houses of the Prime Minister and other Ministers, to install Kobbekaduwa as President even before the results were announced by Government Gazette, not to restore the civic rights of Mrs. Bandaranaike, violence to break out throughout the country, UNP members of Parliament and other supporters of the UNP were to be exterminated and a pro-communist government was to be set up. Vije Kumaratunge testified that at public meetings.

විජය කුමාරතුංග ප්‍රසිද්ධ රැස්වීම්වලදී කිව්ව, අපි පිහිටුවන්නෙ වමේ ආණ්ඩුවක් ය කියල; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් නොවෙයි. මා ළඟ තියෙනව ඒ ප්‍රකාශන. ඒවා නැතැයි කියල කිව්වෙ නැහැ. පොලිස් අධිකාරී වරයෙක් ඉන්නව කොටකෙදෙනිය කියල. එයා තමයි පොලිස්පති. කොටකෙදෙනියගෙ නෝනා රක්ෂාව කරන්නෙ සංස්කෘතික ඇමතිතුමාගෙ කාර්යාලයෙ.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

සහකාර ලේකම්.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

කොයි තරම් සාධාරණ මිනිසුන්ද ඉන්නෙ එක්සත් ජාතික පක්ෂයෙ? එහෙම නම් ඇයි අපට චෝදනා කරන්නෙ? මම කිව්වෙ, එම්. ඩී. ප්‍රනාන්දු ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ එක අමාත්‍යාංශයක කිව්වු නිලධාරියෙක්ම සිටියා එක් කෙනෙක්. එයත් දහනායක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

කෙනෙක්, මගේ හිතේ. [බාධා කිරීමක්] නැහැ. ආචාර්ය ඩබ්ලිව්. දහනායක ඉතාම උසස් අන්දමින් මේ ජනාධිපති වරණයේදී ක්‍රියා කළ බව මම ප්‍රකාශ කරන්න ඕනෑ.

කථානායකතුමනි, අපේ අමාත්‍යාංශයක එක නිලධාරි යෙක් ඔය හාල් පොත ගහන්න ප්ලේට් ගිහින් දී තිබෙන් නෙ. ඔව්, මගී දහනායකද මනී දහනායකද කියන එක් කෙනා.

**අනුර බණ්ඩාරනායක මහතා** (නුවරඑළිය-මස්කෙළිය දෙවන)

*(திரு. அனுர பண்டாரநாயக்க — நுவரெலிய-மஸ்கெலிய இரண்டாம் அங்கத்தவர்)*

**(Mr. Anura Bandaranaike—Second Nuwara Eliya-Maskeliya)**

මානි දහනායක කියන්නෙ වෙළඳ ඇමතිතුමාගෙ පෞද්ගලික ලේකම්.

**ආර්. ප්‍රේමදාස මහතා**

*(திரு. ஆர். பிரேமதாச)*

**(Mr. R. Premadasa)**

බලන්න කොයි තරම් සාධාරණද කියා. අපි මේ මැතිවරණය කෙළේ නයි ටික පොලොංගු ටික සාක්කුවේ දාගෙන. අපි ඒත් ඒ විස පොළඟුන්ට බය වුණේ නැහැ.

කවුද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව භාර සභාපති වෙන්ට හිටියේ? තිස්සමහාරාමයේ සංවිධායකයා— මර්වින් සිල්වා. කවුද නායක විනිශ්චයකාරයා? වී. ඩබ්. කුලරත්න. නීතිපති කවුද? නිමල් සිරිපාල ද සිල්වා. චෙයාමන් ජෙම් කෝපරේෂන්, ඒ. එච් එම්. පවුසි.

මම ඉස්සෙල්ලා කිව්වා, රාජ්‍ය ඇමතිතුමා වෙන්නෙ කවුද කියා. විජය කුමාරතුංග [බාධා කිරීම්] ඒ, ටික කාලයකට පස්සෙ නෙ. එතකොට හරියට කිකිළියො ටික නරියට භාර දුන්න වගේ හිටි. කථානායකතුමනි, මම පෙන්වන් නම් මොන විධියේ විශ්වාසයක් ඇතිවද මේ වැඩපිළිවෙල ගෙනිච්චෙ කියලා. අපි කොයි තරම් සාධාරණ වුණාද කියලත් මේකෙන් තමුන්නාන්සේලාට පේනවා. මේ සාධාරණත්වය හෙළා දකින්න පහත් කොට සලකන්න මේ උදවිය දැන් නොයෙකුත් ප්‍රචාර ඇති කරගෙන යනවා.

බලන්න හෙක්ටර් කොබ්බෑකඩුව මහතාට ලැබුණු වාසි. පුළුපටු වාසිද ලැබුණෙ? මම කියන්න කැමතියි, ඒ වාසි මොනවාද කියලා. ඒක දැනගන්න ඕනෑ. ඡන්ද ලකුණ ලැබුණා. මැතිවරණ කොමසාරිස් පත් කළ අවස්ථාවේදී කලවාන මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) මේ සභාවේදී සමහර ප්‍රශ්න ඇහැව්වා, අපට පක්ෂපාත කෙනෙක් පත් කළාය කියා හැඟීමක් දෙන්න. ඒක කලවාන මන්ත්‍රීතුමාට මතක ඇති. [බාධා කිරීම්] ආන්න, මම හිතුව ඔය කටේ තිබෙන්නෙ එක දිවක් කියා. මට දැන් පේනවා ඊට වැඩිය තියෙනවාය කියා. ඒවායේ විපාක තමයි ඔය ලැබුණෙ. කට තිබුණට, කථා කරන්නට පුළුවන්කම තිබුණාට, කථා කරලා වෙච්ච දේ ඔය.

ඡන්ද සලකුණ ලැබුණා. මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) පක්ෂ මධ්‍යස්ථානය පරිත්‍යාග කළා. තමන්ගෙ පිළත් පරිත්‍යාග කළා. කොමියුනිස්ට් පක්ෂය උදව් කළා. මහජන එක්සත් පෙරමුණ උදව් කළා. ලංකා සමසමාජ පක්ෂයෙනුත් සෑහෙන ඡන්ද සංඛ්‍යාවක් ලැබුණා. ඡන්ද පත්‍රිකාවෙත් උඩින්ම නම ලැබුණා. උඩින්ම ලකුණ ලැබුණා. හාල් පොතක් නිකුත් කළා. හාල් පොතක් වාගේම පොතක්. මොනවාද කිව්වෙ? "අතට ඡන්දෙ දෙන්න. 21 වෙනිදාට සමුපකාර යන්න හාල් ගන්න." අර රේස්වලදී "හැන්ඩිකැප්" කියා එකක් තිබෙනවා නෙ. ඒ වාගේ ලෙන්ත් ගාණක් ඉස්සරහයින් තියලයි අපට මේ තරඟය කරන්න සිද්ධ වුණෙ. නමුත් දැන් කියනවා, වැළැක්කුවලු ඡන්දය දෙන්න යන ඡන්ද දායකයො. කොහොමද වළක් වන්නෙ? මේ හාල් ගන්න—

**සිරිල් මැතිව් මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)**

*(திரு. சிறில் மத்திவ் — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)*

**(Mr. Cyril Mathew—Minister of Industries & Scientific Affairs)**

හාල් පොතයි, "ප්‍රීති" එකයි එන්විලොප් එකක දාල කැළණියෙ බෙදුව ග්‍රාම සේවකවරු ලවා. එකක මිළ අඩු කළාය, අනිත් එක නැති කළාය කිව්ව.

**ආර්. ප්‍රේමදාස මහතා**

*(திரு. ஆர். பிரேமதாச)*

**(Mr. R. Premadasa)**

ඔය ලැබිච්ච වාසි. මම අපේ මැදවච්චියේ මන්ත්‍රීතුමාට කියන්නට කැමතියි කරුණාකර අදවත් ගෙදර ගිහින් මෙන්න මේ සංඛ්‍යා ලේඛන ටික එකතු කරන්නය කියල. ඒතුමා කියනවා, "බලන්න, හය ලක්ෂයක් වැඩියෙන් ඡන්දය දුන්නා නොවැ; එක්සත් ජාතික පක්ෂයට වැඩියෙන් දීල තියෙන්නෙ තුන් ලක්ෂයක් නොවැ" කියල. නමුත් කලින් කිවෙ මොකක්ද? කලින් ලැබුණු තිස් දෙලක්ෂයවත් අපට ලැබෙන්නෙ නැහැ කියලයි කිව්වෙ. ඇත්ත වශයෙන්ම එහෙම කිව්වෙ මොකද? හාල් පොත පොරොන්දු වුණා. හාල් ්පොත් කොපමණ ගන්නාය කියලද කිව්වේ? හැත්තෑ ලක්ෂයක් Seven million Rice ration books මේ ආණ්ඩුව කිසිම කෙනෙකුට සහනාධාර දෙන්නෙ නැහැ කිව්වා. හැත්තෑ ලක්ෂයකට සහනාධාර දෙනත් ඒක කිව්වෙ නැහැ. මේ ආණ්ඩුව හැත්තෑ ලක්ෂයක් පවුල් අනාථ කළාය කිව්ව අපි ආපු හැටියෙම හාල් පොත ආපසු දෙනවාය කිව්වා.

අපිත් ගැහුවා පොඩි පොතක්. මට තිබුණෙ විසිහතර පැයයි. ඒ විධියටම පොතක් ගැහුවා, හැබැයි, අපි ඔය ප්ලේට් හොරකම් කරල නොවෙයි ඒක ගැහුවෙ. ඒ ගොල් ලන්ගෙ ප්ලේට් එකම ගැහුව. ඒකෙ මම ලිව්ව "පොත විතරයි, හාල් නැහැ" කියල. ඒක බෙදන්නත් වෙලාවක් තිබුණෙ නැහැ. මොකද, අන්තිම මොහොතෙ ඒක කළේ. සමහර ඡන්ද කොට්ඨාශවලට ඒක ගියෙ නැහැ. නමුත් මම ඒපොතට ඇතුළු කළා හෙක්ටර් කොබ්බෑකඩුව මහත්මයාගේ කුහකත්වය පිළිබඳ සංකේතය. මොකක් ද මම ඇතුළු කළේ? එතුමා ජාතික රාජ්‍ය සභාවේදී සහනාධාර ගැන කියපු දෙය. සම්පූර්ණ කුහක ප්‍රතිපත්තියක් ගෙනිච්චෙ. මොනවද එතුමා එදා කිව්වේ මේ සහනාධාර ගැන? මම කියවන්නම් ඒ කියපු දෙය. මේවා වාතීගත වෙන්න ඕනෑ. මේ විධියට තමයි මැතිවරණ ව්‍යාපාරයකදී කුහකත්වයෙන් ක්‍රියා කරල ජනතාව මුළා කරන් නෙ. අපට සිද්ධ වුණා හැම තැනම ගිහින් කියන්න,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"බණ්ඩාරනායක මහත්මිය 1970 දී අපව පැරද්දුවා; 'අඳප අම්මා ළඟ එනවා. හාල් සේරු දෙක දෙනවා' කිව්වා; තමුන්නාන්සේලා ඩඩ්ලි සේනානායක මහත්මයා පැරද්දුවා, නමුත් බණ්ඩාරනායක මහත්මිය තිබුණු එකත් නැති කර දැම්මා; ඩඩ්ලි සේනානායක මහත්මයාගේ අභාවයෙන් පස්සෙ එතුමාට 'බත් දුන් පියා බුදු වේවා' යයි කිව්වා; ඒකෙ අනිත් එක තමයි හෙක්ටර් කරන්නෙ" කියල.

මොකක්ද මේ පුද්ගලයාගේ නියම අදහස සහනාධාර ගැන? මා ළඟ තිබෙනවා පොත් දෙකම. මේ ඒ ගොල්ල නිකුත් කළ පොත. මේකෙ කූපන් හිටින් තිබෙනවා. මේ ප්ලේට් එක ගත්තේ කොහොමද කියන එක ගැන දැන් විභාග කරගෙන යනවා. මම මේකෙන් කියවන්නම්:

"එක් කෝටි පණස් ලක්ෂයක අනාගතය අඳුරෙන් අඳුරට ඇද දමා වංචාවෙන් දූෂණයෙන් පීඩනයෙන් පොදු ජනතාව පාගාගෙන ප්‍රජාතන්ත්‍රවාදී නිදහස වළලා දමා අග හිඟයෙන් අනන්ත දුක් විඳින හැත්තෑ ලක්ෂයක හසල් සළාකය උදුරාගෙන එක් ලක්ෂ හතළිස් දහසක් කම්කරුවන්ගේ රැකියාවල් අහිමි කොට අහිංසක කම්කරුවන්ගේ ජීවිත මැරවරයන් ලවා විනාශ කළ—"

ඔය විධියට කියාගෙන කියාගෙන ගිහින්—

"........මුළු රටම එකහෙලා අවංකත්වයේ ප්‍රතිමූර්තියක් යයි හඳුන්වන උගත් එඩිතර නිහතමානී දක්ෂ මානව දයාවෙන් යුතු හදවතක් ඇති කොබ්බෑකඩුව අපේ අනාගත ජනාධිපති ලෙස පත් කරමු."

මේ මානව හදවත මොන විධියෙ හදවතක්ද කියල බලන්න මුල් ගෙදරට යන්න ඕනෑ. අයියටයි මල්ලීටයි උරුමයෙන් ලැබුණු මහ ගෙදර මේ පුද්ගලයා සහෝදරයාට වෙන් කළේ කොහොමද? හරියටම ගේ මැදින් තාප්පයක් බැඳලා; බිත්තියක් බැඳල. [බාධා කිරීම්] මේ සහෝදරයත් එකයි. ඒ සහෝදරයගේ මේ සහෝදරය.

'අවංකත්වයේ ප්‍රතිමූර්තිය යයි හඳුන්වන උගත්, එඩිතර, නිහතමානී, දක්ෂ, මානව දයාවෙන් යුතු හදවතක් ඇති—

[බාධා කිරීම්] හොඳයි, මේ සහෝදරයා නොවෙයි කියමුකො. මේ සහෝදරයා නේද, තමුන්නාන්සේට අරව කීවෙ? මොනවද රංජී ගැන එහෙම මතක් කරල කීවේ. ඒ ඒ සහෝදරයාද, මේ සහෝදරයාද? ඇයි, විවෘත ලියමන? හෙක්ටර් කොබ්බෑකඩුව තමුන්නාන්සේලාට ලියල ඇරපු ඒ විවෘත ලියමන මම කියවන්නද? අර, රංජී ගැන එහෙම මතක් කරල තමුන්නාන්සේගේත් චරිතය ඝාතනය කරපුවා?

**මෛත්‍රීපාල සේනානායක මහතා (මැදවච්චිය)**
*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*
**(Mr. Maithripala Senanayeke—Medawachchiya)**

ඒව අපි බේර ගන්නම්.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

තමුන්නාන්සෙ හැමදාම බේර ගත්ත හැටි අපි දන්නවනේ! බේර ගත්ත ආකාරය තින්ද තමයි, අද ඔතන ඉන්නෙ මැදවච්චිය ආසනෙත් පැරදීලා.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
**(Mr. Maithripala Senanayeke)**

ඇයි, එසෙම නම් මහ මැතිවරණයක් නොතියා ජනමත විචාරණයක් පවත්වන්නෙ?

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி—கொழும்பு மாவட்ட அமைச்சர்)*
**(Mr. Weerasinghe Mallimaratchi—District Minister, Colombo)**

සාමාන්‍ය කථාව තියෙන්නෙ, රංජී හැණ්ඩි කෑ ගහන කොට ඒ මන්ත්‍රීතුමාට මුත්‍රා යනව කියලයි. [බාධා කිරීමක්] නෝනා කථා කරන කොට මුත්‍රා යනවාලු.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

ඒ උදවිය අර පත්‍රිකාවෙන් මොකක්ද, කීවෙ?

'ජනතාවගෙන් උදුරා ගත් බත් පත නැවතත් ජනතාව අතට'

අපි අපේ පොතේ අර කූපන් ගහන්න ගියේ නැහැ. අපි මොකක්ද, කළේ? ඒ පොතේ මුල් පිටුව ගත්තා. කොබ්බෑකඩුවගෙ පින්තූරෙත් ගත්තා. අපි කීවා, මෙහෙම:

'පොත විතරයි, හාල් නෑ. ඒකත් හරියට හඳෙන් හාල් ගෙනාව වගේ'

ඒ පොත ඇතුළෙ දැම්ම මිනිහගෙ නියම ස්වරූපය. එයා එදා සහනාධාර ගැන කී දේ අපි දැම්ම, මොකක්ද, ඒ?

'1971 නොවැම්බර් 23 වැනි දා, **හැන්සාඩ් වාර්තාව.** 96 වැනි වෙළුම, 1832 වැනි තීරුව. **හෙක්ටර් කොබ්බෑකඩුව මහතා** (කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමා)

**කෘෂිකර්ම හා ඉඩම් ඇමති හැටියටයි, එය කීවෙ.**

අපෙ ආහාරපාන ආදිය සහනාධාරයට දිගින්-දිගටම සැපයිය නොහැකිය. එය කළ නොහැක්කකි. මේ රටේ දේශපාලන දේහය පුරා පැතිරෙන පක්ෂාඝාතයක් ය ඒ. මේ සහනාධාර සමහරක් අත් හැරිය යුතු බව පාරිභෝගිකයාම අවබෝධ කොට ගත යුතු වේ. නිෂ්පාදකයාට සහනාධාර සැපයීම තේරුම් ගත හැකිය. එහෙත් ඒ සමගම පාරිභෝගිකයාටද සහනාධාර සැපයිය යුතු නම් අපි ඉටිපන්දම දෙකොනේම දල්වන්නා සේ ක්‍රියාවක යෙදෙන්නෙමු.'

මේ කිව්වෙ හෙක්ටර් කොබ්බෑකඩුව දැන් පාර හැදුවෙ ඉටිපන්දම ඒ විධියට දල්වන්න?

**This is what he said then. I would like the Jaffna voters to know what sort of a man this Hector Kobbekaduwa is.**

කොයි විධියටද, එයා පොරොන්දු ඉෂ්ට කරන්නේ. මොනවාද එයා කීවෙ කියල අපි කිය දුන්නා.

**"We cannot just go on subsidizing all our foodstuffs. It is just impossible. It is something like a creeping paralysis on the entire body**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

politic of this country. The consumer himself must realize that we have to give up some of these subsidies. One can well understand the producer being subsidized,"–

That is what this Government is doing.

"–but if we have to subsidize the consumer also we are burning the candle at both ends. (OFFICIAL REPORT ; Representatives ; 23rd November, 1971; Vol. 96, c. 1832.).

අපට සිදුවුනා හැත්තෑ ගණන්වල ඒ අය කළ හැටි මතක් කර දෙන්න.

පාන් ගෙඩියට, රෙදි කෑල්ලට වින්ද දුක. රතු ඇනූ ගෙඩියටත් ඇවැන්ත පෝලිම්. ලංගම වාහනයටත් හාල් පොලු හා මිරිස් පොලු.'

එම නිසා ඒ උදවියට බැරි වුණා, ජනතාව රවටන්න නියෝජ්‍ය කථානායකතුමනි, මෙතෙක් කල් හාල් මේ රටේ ආණ්ඩු පත් කරන, ආණ්ඩු අස් කරන ආයුධයක් බවට පත් වී තිබුණා. ඒ ආයුධය ඔක්තෝබර් 20 වැනි දා ජනතාව විසින් මොට්ට කළ බව ඒ ජනතාවට උපහාර වශයෙන් මම ප්‍රකාශ කරන්න කැමැත්තයි. ඒ මොට්ට කිරීම නිසා අර කපනවාය කියපු කඩුවත් මොට්ට වුණා. මොනවද, එයා කිව්වේ? 'මගේ කඩුව හොඳට කැපෙන කඩුවක්, පෙති-පෙති ගහනවා' කියලයි, එයා කිව්වෙ. නීත්‍යානුකූලව මුදල් ඇමතිතුමාට ලැබී තිබෙන ඉඩම් ටික පවා ආපසු ගන්නවාය කිවා. වෛරයෙන්, ක්‍රෝධයෙන්, ද්වේශයෙන්, තන්හාවෙන් පිරී ඉතිරී ගිහින් තමයි, එයා කථා කළේ.

ජනතාව ඒ පුද්ගලයාව හොඳට හඳුනා ගත්තා. මට හරියට වෙලාවක් තිබුණේ නැහැ, මේ කොටස ප්‍රචාරයට පත් කරන්න. 1976 දී, මැතිවරණයට කලින්, දෙසැම්බර් 10 වැනිදා එදා හිටපු මුදල් ඇමතිතුමා සමහර සහනාධාර සම්පූර්ණයෙන් කපා දැමූ වෙලාවේ හෙක්ටර් කොබ්බෑකඩුව මහතා ජාතික රාජ්‍ය සභාවේ කථා කරලා මොකක්ද කිව්වේ? මේ සහනාධාර නැවතත් ඇති කරන්න පොරොන්දු වුණු—පසු ගිය 21 වැනිදාට ඒවා ඇති කරන්න පොරොන්දු වුණු—කොබ්බෑකඩුව එදා මොකක්ද කිව්වේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියවන්නේ 1976 දෙසැම්බර් 10 වැනිදා **හැන්සාඩ්** වාර්තාවේ 449 වැනි තීරුවෙන්

"1948 දී අප රටට නිදහස ලැබුණා. අප රට භාර ගන්නා විට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් තිබුණා. අපේ විදේශ විනිමය ප්‍රමාණය අඩු වෙනවාය කියා හිතන්නේ නැතිව, ඒ මුදල් දිගට හරහට වියදම් කළා. නිදහස් අධ්‍යාපනය දුන්නා. නිකම් බෙහෙත් හේත් දුන්නා. නොමිලයේ කෑම බීම දුන්නා. මේ විධියට දිගටම කරගෙන ඒම නිසා අපට ප්‍රශ්න කීපයක් මතු වුණා. 1961 දී මෙයට පිළියමක් වශයෙන් කාර් ගෙන්වීම නතර කර දැමුවා."

ඔහොම කියාගෙන ගියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා වරක් මුදල් ඇමතිතුමාට ඉංග්‍රීසියෙන් උපහාරයක් පිරිනැමුවා. 1972 නොවැම්බර් 24 වැනිදා **හැන්සාඩ්** වාර්තාවේ 1960 තීරුවේ එය මෙසේ සඳහන් වෙනවා:

"I must congratulate our specialist doctor, the Hon. Minister of Finance, for the great care and skilful treatment he has administered to our patient, the common patient who is affectionately known as 'Pina'.

මේ රටේ ජනතාවට එදා හෙක්ටර් කොබ්බෑකඩුව 'පිනා' කියල කිව්වා. නොමිලයේ බෙහෙත් හේත්, නොමිලයේ අධ්‍යාපනය, නොමිලයේ හාල් ආදී වශයෙන් 1948 ඉඳල එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව දීපු සහනාධාර ලබපු මේ රෝගියාට කිව්වේ මෙහෙමයි:

"who is affectionately known as 'Pina', the lucky man who has grown to manhood on free rice, free education, free health and many other things."

This is the hypocrite who went to the polls this time and promised everything on earth, everything under the sun and the moon to the people for the sake of getting their votes.

අපට අවකාශයක් තිබුණේ නැහැ හරියට මේවා හෙළි කරන්න. මම ඒකයි, මේ රටේ බුද්ධිමත් ජනතාවට අපේ උපහාරය හැම මොහොතකම පිරිනමන්නේ. අපේ ජයග්‍රහණය ඒ ජනතාවගේ බුද්ධියේ මහිමය නිසයි. 34 ලක්ෂයක්—35 ලක්ෂයකට කිට්ටු වෙන්න—ජනතාව ඡන්දය පාවිච්චි කළා.

මොකක්ද, මේ හය ලක්ෂය? වැඩි වුණු හය ලක්ෂය. 1977 ඡන්ද ගණන් ඒක සංසන්දනය කරලා බලන්න එදා ලංකා සමසමාජ පක්ෂයට කීයක් ලැබුණද? මෙවර කීයක් ලැබුණද? ඉතුරු ඡන්ද ගියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයාට. මහජන එක්සත් පෙරමුණේ, කොමියුනිස්ට් පක්ෂයේ ස්වාධීන අපේක්ෂකයෝ කොච්චර සිටියුද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1977 දී එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව ඉදිරිපත් වුණු ස්වාධීන අපේක්ෂකයෝ කොපමණ සිටියාද? කෝට්ටේ නියතපාල, මොරටුවේ මෙරිල් ප්‍රනාන්දු, බේරුවල ජී. අයි. ඩී. ධර්මසේකර, තිස්සමහාරාමයේ ටෙනිසන් එදිරිසූරිය, නාත්තන්ඩියේ හියු ප්‍රනාන්දු, නිකවැරටියේ මුදියන්සේ තෙන්නකෝන්, කටුගම්පොල පී. බී. ඒකනායක, කුරුණෑගල ඩී. බී. මොන්නැකුලම, ඇහැලියගොඩ වාසුදේව නානායක්කාර, රත්නපුරයේ නන්ද එල්ලාවල, මේ ඔක්කොම ස්වාධීනව එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව ඉදිරිපත් වුණේ. මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා කරුණාකර ගිහින් ගණන් එකතු කරලා බලන්න. ඔය තරම් ආඩම්බරයෙන් කෑගහන්නට ඡන්දයක් එකතුවෙලා නැහැ. එක්සත් ජාතික පක්ෂයට බෙදී ගියේ (බාධා කිරීමක්.) ඔව්, ආව, ආව කියල තමුන්නාන්සේ කියල තිබුණා. එක්සත් ජාතික පක්ෂයට වැඩි වුණේ තුන් ලක්ෂයක් විතරයි කියල තිබුණේ. වැඩි වෙච්ච එක කියල කට වහගෙන හිටියා නම් කමක් නැහැ.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

මැදවච්චියට මොකද වුණේ?

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

යටිනුවරට මොකද වුණේ?

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

ලක්ෂ තුනහමාර වැඩිවුනත්, ඒ ලක්ෂ තුනහමාර නොවෙයි. මම අහනවා, එදා ලැබුණු ලක්ෂ 32 එහෙමම රැක ගැනීම සුළුපටු දෙයක්ද කියා. මේ අවුරුදු පහේදී මේ ආර්ථිකය නිසි පරිදි හසුරුවන්නට ගත්ත පියවරවල් වෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිසිම රජයක් නොගත්ත පියවරවල්. හැමවිටම විපක්ෂය ගිහින් අවුල් කළා, තත්ත්වය. එහෙත් ඒ ඡන්ද තිස් දෙලක්ෂය ආරක්ෂා කළා විතරක් නොවෙයි නියෝජ්‍ය කථානායකතුමනි, වැඩිපුර ගත්තා ඡන්ද ලක්ෂ තුනහමාරක් අපේ ආර්ථික ප්‍රතිපත්තියෙන් ඵල ප්‍රයෝජන ලැබූ ලක්ෂ ගණනක් අද මේ රටේ නැහැ, ඡන්දය තිබෙන අය. මගේ කොට්ඨාශයේ පමණක් විසි දාහක් පමණ පිටරට. ඡන්ද 1,26,000 ක් තිබෙනව, මැද කොළඹ. ඒ ඡන්ද කෝ? ඒවා පිටරට. ඒ අපේ ආර්ථික ප්‍රතිපත්තියෙන් ප්‍රයෝජන ගත්ත, අද පිටරටවල ගිහින් රැකියාවල් කරන අයගේ ඡන්දය. අපට කාලයක් තිබුණේ නැහැ, ඒ අයට ඡන්දය ප්‍රාවිච්චි කරන්න පිළිවෙළක් ඇති කරන්න; ඒ ඡන්ද ගැන කල්පනා කරන්න.

මම මේ සභාවේදී එක දවසක් කිව්වා, ග්‍රාමෝදය මණ්ඩල අරමුදලට මම මුදල් එකතු කරනවාය කියා, පිට රටවලට ගිය උදවියට ලියුමක් යවලා. මට පුදුමයි, ගලා ගෙන එන ආධාර. දිනකට ලියුම් 10 ක් 12 ක් එනවා. ඩොලර් හත් අට සියයක් දිනකට එවනවා, ඒ රැකියාවල් කරන අය මේ ඡන්දෙට කලින්, අපේ ආණ්ඩුවක් එයිද නේයිද කියා තිබෙන අවස්ථාවක, 'සෙවන' ලොතරැයිය මම නිකුත් කළා. මැතිවරණයට කලින් රුපියල් හතලිස් හය ලක්ෂයක ටිකට් විකිණිලා තිබෙනවා. මොන තරම් විශ්වාසයක් ජනතාවගේ තිබුණාද? කවිද ඡන්දයකට යන රජයක ලොතරැයි ටිකට් එකක් ගන්නෙ, රුපියල් දහයකට? මම ඕනෑකමින්මයි නිකුත් කළේ කලින්, බලන්න. එයිද, නේයිද කියා දන්නෙ නැහැ. නමුත් ජනතාව විශ්වාස කළා. ඒකයි අර 'දවස' පත්‍රයෙන්, 'ලේක්හවුස්' පත්‍රවලත් කූපන් වලින් ඒ ප්‍රතිඵලය ආවේ. ඒක බොරුවට කළ දෙයක් නොවෙයි. මැතිවරණයට ඉස්සරවෙලාම ලක්ෂ 46 ක ටිකට්ස් විකිණිලා ඉවරයි.

ජනතාවගේ තිබෙන මේ විශ්වාසය ඡන්ද ප්‍රතිඵලවල පේන්න තිබෙනවා. සුළු පිරිසක් හයවුණා, අවසාන මොහොතෙ. ඇයි, මොනවද කියාගෙන කියාගෙන ගියා නෙ? 1977 එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දීපු අයගෙ නම් ලියාගෙන තියෙනවා, රක්ෂාවල් ගත්ත අයගෙ නම් අපි සටහන් කරගෙන තිබෙනවා කිව්වා. මේක මටම ඇහුණු එකක්, එක්තරා ප්‍රදේශයක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ රැස්වීමක් තිබෙන වෙලාවෙ; 'ප්‍රේම දාසගෙ ගෙවල් ලක්ෂය ප්ලෑට් කරනවා කිව්වා. මම හිතුවා තව්වු නගගන්න යනවා කියා. නැහැ මට්ටම් කර නවලූ. එහෙම තර්ජනය කළා සෙනග රැස්වුණාම. ඒ රැස්වීම්වලට සමහර උදවිය හයවුණා. අයියෝ මොකටද මෙතැනට ගිහිල්ලා අපේ ඡන්දය දීලා 21 වැනිදාට ගුටි කන්නෙ කියා ඔවුන් හිතුවා.

තමුන්නාන්සේට මම පෙන්වා දෙන්නම්, පොලීසියට ලැබුණු පැමිණිලි. නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ පුදුමවෙයි, රජයක් බලයේ ඉන්න වෙලාවෙ මොන විධියේ පැමිණිලි ලැබුණාද කියා. මා ළඟ තිබෙනවා, පොලිස් වාර්තාවක්. මම හිතන්නෙ නැහැ විපක්ෂයවත් කියාවි කියා මීට කලින් මැතිවරණ වලදී වුණු තරම් දරුණු සිද්ධි මේ අවස්ථාවේ වුණාය කියා. මම හිතන්නෙ නැහැ මේ උදවිය කියාවි කියා එහෙම. මට ලැබී තිබෙන පොලිස් වාර්තාව අනුව මා කියන්නට ඕනෑ, ඒ පැමිණිලිවල තත්ත්වය.

නාම යෝජනා දුන්නේ සැප්තැම්බර් 17 වෙනිදා. මැතිවරණය තිබුණේ ඔක්තෝබර් 20 වැනිදා.ඒ අතරතුර ලංකාව පුරාම නොයෙක් නොයෙක් සිද්ධීන් පිළිබඳව පැමිණිලි ලැබුණේ කොහොමද? නව ලංකා සමසමාජ පක්ෂයෙන් එක් පැමිණිල්ලයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවියගෙන් පැමිණිලි 271 යි. එක්සත් ජාතික පක්ෂයෙන් 419 යි. මේ මැතිවරණයට කලින්. කොමියුනිස්ට් පක්ෂයෙන් 2 යි. ජේ. වී. පී. පක්ෂයෙන් 135 යි. ස්වාධීන 13 යි. පොලිසියෙන් 20 යි. ඔක්කොම 861 යි. ඊට පසුව, මැතිවරණයෙන් පසුව, එක්සත් ජාතික පක්ෂයෙන් පැමිණිලි 143 යි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිතවතුන්ගෙන් 157 යි. නව ලංකා සමසමාජ පක්ෂයෙන් එකක්වත් නැහැ. ජේ. වී. පී. පක්ෂයෙන් 3 යි. කොමියුනිස්ට් පක්ෂයෙන් එකක්වත් නැහැ. ස්වාධීන 19 යි. පොලිසියෙන් එකක්වත් නැහැ. ඔක්කොම 322 යි. මොකක්ද මෙයි තේරුම?

මේ විපක්ෂයේ නායකයින් ගිහින් තිබුණා පොලිස් පතිතුමා හමු වෙන්න. එතුමාගේ වාර්තාව අනුව—

Mr. Kobbekaduwa stated that if the forces were withdrawn by the emergency being lifted there may be an escalation of trouble. Mr. Maithipala Senanayeke also stated that the emergency should be continued or that it be maintained regionally. Mr. Keuneman stated that he was not asking for the emergency to be continued, but drew my attention to the incidents that were occurring and stated that the decision to continue the emergency rests with the Government."

එතැනත් ඒ ගොල්ලන් එක එක පැත්තෙ. එක මතයක් නැහැ.

"The delegation met me this afternoon and informed me that though the incidents that took place this time after the Presidential elections were much less than after previous elections"–

මීට කලින් මැතිවරණවලට පසුව ඇති වුණ සිද්ධිවලට වඩා බොහොම අඩුයි කියල කියනවා එයින් පෙනෙන්නේ අපි කල්තියාම මේ පියවරවල් ගත්තේ මෙවැනි සිද්ධීන් ඇතිවෙනවාට කැමැත්තක් නැති නිසා බවයි. අපේ ආණ්ඩුවේ අවංක භාවය එයින්ම ඔප්පු වෙනවා. නමුත් මම දන්නවා මේ ජනාධිපතිවරණයට කලින් ඉඳලම අපේ ජනතාව ප්‍රකෝප කරවන්න පුදුම විධියේ වැඩ පිළිවෙලක්, පුදුම විධියේ ක්‍රියා දාමයක් තිබුණ බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙහෙම කටයුතු කළත් මට මතකයි 1970 මහ මැතිවරණය අවසාන වුණාට පසුව මේ වගේ හතර පස් ගුණයක සිද්ධීන් ඇති වුණ බව. හැම තැනම මරා දමන්න, ගිණි තබන්න පටන් ගත්තා. මොකක්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දැරූ මතය? 1970 ජූනි 24 වෙනිදා හැන්සාඩ් වාර්තාවේ 750 වැනි තීරුවේ එදා අගමැතිණිය කිව්ව කතාව සඳහන් වෙනවා.

"ඒ වාගේම විපක්ෂ නායකතුමා කියා සිටියා මහ මැතිවරණයට පසු මේ රටේ නොයෙක් නොයෙක් කලබල ඇති වුණාය, ඇති වෙනවාය කියා. සමගි පෙරමුණට හිතවත් උදවියගෙන් එක්සත් ජාතික පාක්ෂිකයන්ට නොයෙක් හිරිහැර විඳින්නට සිද්ධ වුණාය කිව්වා. ඇත්ත වශයෙන්ම මෙවැනි ජයග්‍රහණයකින් පසු ජය පානය බොන අවස්ථාවේදී මහජනතාව සමහර විට ටිකක් සීමාවෙන් පිට යන්නට ඇති."

මෙන්න ඉතිහාසය තමුන්නාන්සේලාගේ. මෙන්න තමුන්නාන්සේලා ඒ අවස්ථාවේදී ක්‍රියා කළ ආකාරය. මම කියන්නේ කොයිම විධියකින්වත් මැතිවරණයෙන් පස්සේ නොවෙයි, ඉස්සරවෙලා නොවෙයි, කොයිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

අවස්ථාවකදීවත් හිංසාකාරී සිද්ධි ඇති වීමට අපි රුකුල් දෙන්න ලෑස්ති නැති බවයි. අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන විට, ඒ නීතිය නිසි පරිදි හසුරුවන්නට බැඳී සිටින නිලධාරීන්ට කියා තිබෙන්නේ, පුද්ගලයා කවුද බලන්න එපා, කුමන තරාතිරමක කෙනෙක්ද බලන්න එපා, දරන නිලය බලන්න එපා, අයත් පක්ෂය බලන්න එපා, මධ්‍යස්ථව ක්‍රියා කරන්න කියායි. ඒ නිසා මොකද ඇතැම් උදවිය කරන්නේ? එය දඩමීමා කරගෙන අපටම අයුතු අසාධාරණකම් කළ අවස්ථා මම දන්නවා. මට දවසක් බදුල්ලේ දිසා ඇමතිතුමා කිව්වා, මහියංගනේ කම්කරු ඇමතිතුමා අසනීපයෙන් සිටින නිසා උන්නැහේ මහියංගනයට ගියාය, මහියංගනේ ඇත්තේ ඇති වී තිබෙන්නේ පුදුම තත්ත්වයක්ය කියා. නිකම් සිටින අහිංසක උදවියට බැට දෙනවාය කිව්වා. මම වහාම සොයා බැලුවා. මට හමුදාපතිගෙන්ම වාර්තාවක් ලැබුණා. ඒ කියාපු පැමිණිල්ල ඇත්ත. හැබැයි, හමුදාපති වහාම ක්‍රියා කර තිබෙනවා. මේ නිකම් සිටින අහිංසක උදවියට බැට දීගෙන ගිහින් තිබෙනවා. කම්කරු ඇමතිතුමාගේ හිතවතුන්ට, පාක්ෂිකයන්ට. එතුමාගේ ලේකම් කොයි තරම් සාධාරණද කිව්වොත් එතුමාම ගිහින් කට උත්තරයක් දී ඇත්ත තත්ත්වය කියා තිබෙනවා. කම්කරු ඇමතිතුමාට මම ඒ වාර්තාව දුන්නා.

ජනාධිපතිතුමා සාධාරණව කටයුතු කරන්න යන විට සමහර උදවිය එය දඩමීමා කරගෙන මේ ආණ්ඩු පක්ෂයේම උදවියට, පාක්ෂිකයන්ට, මැති ඇමතිවරුන්ට සලකන ආකාරය මම කියන්නේ. මේ අධ්‍යාපන ඇමතිතුමා කියයි තමුන්නාන්සේලාට. එදා ජනාධිපතිවරණයේ ඡන්ද ගණින්නට ගිය අවස්ථාවේදී මේ රජයේම නිලධාරීන් ක්‍රියා කළ ආකාරය. මේ ඇමතිවරයාට සැලකූ හැටි. මම කැමතියි එතුමා ඒ විස්තරය කියතොත්. ඒ සිද්ධිය එතුමා කියයි. මොකද මේ? හෙට එළි වෙන කොට අලුත් ජනාධිපති කෙනෙක්, අලුත් ආණ්ඩුවක්. මේ එන්නේ තව පැය කීපයකින් ඇමතිකම නැතිවන අය.

අපි දෙගොල්ලන්ගේ පොඩි වෙනසක් තිබෙනවා. අපි සමහර විට හරි වැඩේ කරන්නත් පසු බානවා. තමුන්නාන්සේලාට තිබෙනවා ශක්තියක්. ඕනෑම වැරදි වැඩක් කරන්න බය නැහැ. ඒකයි, තමුන්නාන්සේලාගේත් අපේත් පාලනයේ වෙනස. එක්සත් ජාතික පාක්ෂික පාලනයේදී හරි දේ කරන්නත් ටිකක් පසු බානවා. අපි වුවමනාවට වඩා සාධාරණය පෙන්වන්නට ගිහින් කවුද බැට කන්නේ? අපේ ප්‍රතිපත්ති පිළිගන්නා, අපේ ක්‍රියාදාමය පිළිගන්නා, අහිංසක උදවිය බැට කනවා. මම කියා තිබෙනවා අවස්ථා කීපයකදී මොන විධියටද ඒ තත්ත්වය ඇති වුණේ කියා. නමුත් අපේ ජනතාව මේ රජය ගෙන යන පොදු ක්‍රියා මාර්ගය අවබෝධ කරගෙන සිටිනවා.

ජනතාව ආපහු පස්සට යන්න ලෑස්ති නැහැ. ආපහු හැත්තෑ දෙකට යන්න ජනතාව ලෑස්ති නැහැ. මේ රටේ ජනතාව 'රිවර්ස් ගියර්' එකේ යන්න ලෑස්ති නැහැ. තමුන්නාන්සේලාගේ පක්ෂයෙන්ම ආ අයයි, අපට ඕවා කිව්වේ. පස්සට යන්න ලෑස්ති නැහැ. එකම එක සහනාධාරයයි මේ රටේ ජනතාව බලාපොරොත්තු වන්නේ. හරිහම්බ කර ගන්නට, රැකියාවක් කර ගන්නට, උපයා ගන්නට. අවස්ථාවන් ලබා ගැනීමේ සහනාධාරය පමණයි ඔවුන් බලාපොරොත්තු වන්නේ. එය ලබා ගන්නට පුළුවන් මේ මාර්ගයෙන් බව ඔවුන් දන්නවා. නිදහසේ ජීවත් වන්නට, හොඳට කාලා බීලා ඇඳලා, තමන්ටම ගෙයක්, තමන්ටම ඉඩම් කැබැල්ලක්, තමන්ටම ව්‍යාපාරයක් ඇතුව. මේ රටේ පමණක් නොව පිටරටවලත් ගිහින් හරිහම්බ කරගෙන ප්‍රීතියෙන් ජීවත් වන්නට හැම මනුෂ්‍යයෙක්ම මේ රටේ ආසා කරනවා. විශේෂයෙන්ම තරුණ පරම්පරාව මේ ගමන් මාර්ගය අනුමත කරන බව පැහැදිලි වෙනවා. මම ඒකයි කිව්වේ අපි ඔවුන්ට අපේ උපහාරය පිරිනැමිය යුතුයි කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කිව්වාම ලේ ගංගාවක් වෙන්නට තිබුණා කියා සමහරවිට බොහොම ලෙහෙසි වෙයි විපක්ෂයට නැගිට කියන්නට මෙය මහා ප්‍රලාපයක්ය කියා. නමුත් මම තමුන්නාන්සේලාට කියන්න කැමතියි. තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න කැමතියි, මොන විධියේ මානසිකයක් මේ පුද්ගලයින් තුළ තිබෙනවාද, ඔවුන්ට බලය ලැබෙන්නටත් කලින් මොන විධියට ක්‍රියා කළාද කියා. මට එය ඔප්පු කරන්නට පුළුවන්. මම එය ඔප්පු කරන්නේ වෙන කා ලවාවත් නොවෙයි, මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) ලවාම මට එය ඔප්පු කරවන්නට පුළුවන්.

තමුන්නාන්සේලාට මතක ඇති, බණ්ඩාරනායක මහත්මිය කිව් බව, 'හදිසි නීතිය පැනෙව්වේ මුළු කැබිනට් මණ්ඩලයේම අනුමැතිය ඇතිවයි, මගේ පමණක් මොකද ප්‍රජා උරුමය නැති කරන්නේ, අනික් ඇමතිවරුන්ගේත් නැති කරන්නට ඕනෑ' කියා. අපි පත් කළා, පාර්ලිමේන්තුවේ නිල කාරක සභාවක්. ඒ කාරක සභාවට සාක්ෂි දෙන්නට අපි කැඳෙව්වා මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

He is trying to read extracts of my evidence without reporting to the House the full proceedings of the Committee. He must present the report to the House and then he can read. But without presenting the report he is trying to use parts of my evidence, which is not fair. I say that the Hon. Prime Minister is not fair by the House. This House appointed a Committee. We went before that Committee and gave evidence and he has not presented the report to the House and he is now trying to read parts of it. I say it is not fair by the House nor by me. (*Interruption.*)

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

May I answer that point. If he says it is a point of Order, I would, like to say it is not a point of Order.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)

Why not it is a point of Order !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

This House appointed a Committee and we gave evidence before that Committee. Now, without presenting the report he is trying to read extracts of my evidence.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

You have already said it.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Let me finish. After that you can decide.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

What is there to decide after you have read it ?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Let me argue your point.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

There is no point to be argued.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Wait, wait ! Now are becoming too hasty. You are losing your balance. I know what has happened to you after your defeat at Medawachchiya. Wait, do not be in a hurry. In the first instance, I will make my submissions. The Deputy Speaker will make a decision. I do not mind his making a decision after I make my submissions.

Firstly, I should like to say the hon. Member for Medwachchiya is an experienced Parliamentarian. If he is rising to a point of Order he should do so under the Standing Orders, which he has not done.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

Surely this is procedure !

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Wait, I will come to procedure again. I will come to No. 2. This is from a report I submitted to Parliament.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

You have not yet submitted it to Parliament.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Wait, I will give you a copy.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

The Hon. prime Minister is just now trying to say that he submitted the report. The report must be submitted, accepted by the House and printed, and then you can quote from it.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Quite right.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

**I am very sorry that you are going to become a liar also. This is the report !**

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

You have not submitted it.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I am sorry I have to say that. That is why I say that you have lost your bearings.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

When was the report submitted to Parliament !

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

You have become imbalanced.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order please !

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

May I ask the Hon. Prime Minister when it was presented to the House ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

He will give you the details.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I do not want to teach how you should behave in Parliament. If you are not sure of your facts you must ask a question. Then I will answer. This you did not do. I know you are in great trouble now. Not only politically, it appears that you are imbalanced mentally also.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

You are trying to quote from an interim report which is not the final report.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Wait, wait ! I know you are in great trouble. You are now trying to get into a further mess. You asked the question : "Did you submit the report to Pariament". I say "Yes". " Did you get authority to publish the report ". I say " Yes ". Once it is published it is a public document. Anybody can refer to it, not only in the House but even outside. Here it is :

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළමුවැනි පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 33

1972 දෙසැම්බර් අවසානයේ සිට 1977 පෙබරවාරි 16 වන දින දක්වා වූ කාලසීමාව තුළ හදිසි අවස්ථා තත්ත්වයක් තවදුරටත් පවත්වාගෙන යාමට නිර්දේශ කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයින්ගේ වගකීම් පිළිබඳව විභාගකර බැලීමට පත් කරන ලද විශේෂ කාරක සභාව නිකුත් කළ

විශේෂ වාර්තාව

ඉදිරිපත් කරන ලද්දේ

විශේෂ කාරක සභාවේ සභාපති තැන්පත්

ගරු ආර්. ප්‍රේමදාස මහතා විසිනි

මුද්‍රණය කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියම කළේ

1981 සැප්තැම්බර් මස 24 වැනිදා.

මිළ : රු. 1.30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි."

This is the gentleman who was going to occupy my position on the 21st of October in this House. This is the Parliamentary leader that Mr. Kobbekaduwa was going to select.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

That would have been your information. There was no such thing.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Am I now entitled to quote ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Certainly.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Do not think that I come to this House without preparing myself ? You can be rest assured that I do.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Quite so.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

If I am not that type of person, my President would not have appointed me to take this place in this House. I carry the responsibility of the whole government in this House, and I shall not betray the trust that has been reposed in me by the President and the hon. Members of this House.

I am thankful to you for giving me this opportunity to show my credibility to this House.

This may be the reason why Mrs. Bandaranaike did not think that you are a fit person to lead the SLFP. I do not know. These things must have contributed.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පෙන්නුම් කරන්නට යන්නේ මේකයි. අර කළුගල්ල මහත්මයා ඊයෙ පෙරේදා "ලංකාදීප" පත්‍රයට දුන් ප්‍රවෘත්ති සාකච්ඡාවේදී කිව්වා, 'There would have been a blood bath' ලේ විලක් වෙන්නට තිබුණාය කියල. [බාධා කිරීමක්] මට කිව්වා සිවිල් යුද්ධයක් කියල. මොකද ? මේ ගොල්ලන්ගෙ පරණ කැරළිවලු, පරණ කෙරුවාවල් දන්නව. අපි නොවෙයි කියන්නෙ. අපේ වචනවලින් නොවෙයි, අපේ සාක්ෂිකාරයන් නොවෙයි. ඒ පක්ෂයේම නායකයන්ගෙ වචනවලින් කියන්නෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ කෙරුවාවල්, බණ්ඩාරනායක මහත්මියත් සමග ආරාවුලක් ඇති කර ගත්තු වෙලාවේදී මේ මැදවච්චියෙ මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) ඒතුමියට ලිව්වා ලියමනක්. ඒවා පත්‍රවලත් පළ වුණා. දැන් මොකද මේතැනදි මට ඉදිරිපත් කරන්න එපාය කියල කියන්නෙ ? එදා පත්‍රවල පළ වුණා. එතකොට අර පරීක්ෂණ කොමිටියට මෙතුමාම සාක්ෂි දෙන්න ආවාම මම කිව්වා, ඒකෙ සභාපති හැටියට ක්‍රියා කළේ මමයි—

"Under the Constitution the responsibility is also with the head of the Government. Then there is another matter I wish to ask you".

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

This is what you stated in reply to the letter of Mrs. Bandaranaike which appeared in the "Daily Mirror" of 25.08.1981.

මෙතුමා 1981 අගෝස්තු 25 වෙනිදා බණ්ඩාරනායක මැතිණියට ලියුමක් ලිව්වා. මම ඒ ලියුම 'ඩේලි මිරර්' පත්‍රයෙන් අරගෙන මෙතුමාට කියෙව්ව. ඒ මන්ත්‍රී කාරක සභා වේදී මෙතුමාට කියෙව්වා. ඒ ලියමනේ මෙතුමා මෙන්න මේ විධියට ලියා තිබුණා.

I am quoting that passage :–

"You may now know the nature of instructions issued by the former General Secretary Mr. Ratnasiri Wickremanayake to the party's youth organizations and other groups about the campaign carried out last year against the deprivation of your civic rights. You also know that neither the politbureau nor any other party executives were at this time even remotely aware of these instructions. If it is very necessary for the welfare of the party, we are prepared to divulge these instructions to the whole party and the country. We shall not allow the party and the people to be destroyed by such an uncivilized course of action as proposed in these instructions."

මම ඒක ඉංග්‍රීසියෙන් කියව්ලා එම කාරක සභාවෙ සභාපති හ වියට එතුමාගෙන් මෙහෙම ප්‍රශ්න කළා. මම සිංහලෙන් මෙහෙමයි ඇසුවෙ.

"**සභාපතිතුමා :**

දැන් මා මේ ප්‍රශ්නය අහන් නේ මේ නිසයි. පක්ෂයේ යම් වැඩ පිළිවෙලක් ගැනත් පක්ෂයේ බලධාරීන් සමග ප්‍රධානීන් සමග සාකච්ඡා කළේ නැතැයි කියනවා. දැන් ඊකකට කලිනුත් තමුන් නාන්සේ කිව්වා හුඟක් කාරණා වලදී එහෙම කාගෙනුත් අනල වැඩ කරන සිරිතක් බණ්ඩාරනායක මහත්මය ළඟ තිබුණේ නැතැයි කියල. ඒ නිසා ඒ කාරණයටත් මෙය ප්‍රයෝජනවත් වෙනවා. තමුන් නාන්සේ සඳහන් කර තිබෙන මේ කාරණයෙන් මොකක්ද කියන්නෙ ?"

මා එහෙම ඇසුවේ, බණ්ඩාරනායක මහත්මියට ලියූ ඒ ලියුමේ එක්තරා ක්‍රමයකින් තර්ජනයක් කර තිබුණ නිසයි. මොකක්ද කියන්නෙ ? බණ්ඩාරනායක මැතිණි යට කියනවා :

"ඔබ දන්නවා ඇති හිටපු ප්‍රධාන ලේකම් රත්නසිරි වික්‍රමනායක මහතා ඔබේ ප්‍රජා අයිතිය නැති කිරීමට විරුද්ධව කළ යුතු එක්තරා වැඩ පිළිවෙළක් ගැන පක්ෂයේ තරුණ සංවිධානවලටත් අනික් සංවිධායම්වලටත් යම් උපදෙස් වගයක් නිකුත් කළ බව. ඒ අවස්ථාවේදී ක්‍රියාත්මක කරන්න. ඔබ දන්නවා, අපේ දේශපාලන කාරක සභාව හෝ පක්ෂ විධායකය හෝ කොයි වෙලා වකවත් එවැනි උපදෙසක් ගැන දැන සිටියේ නැති බව."

If it is necessary for the welfare of the party,–

පක්ෂයේ සුභ සිද්ධියට හේතු වෙනවා නම්—

We are prepared to divulge these instructions to the whole party and the country.

අපි ලෑහැස්තියි එළි කරන්න ඒ උපදෙස් මොනවාද කියා. මුළු පක්ෂයටත් රටටත්. අපි ඉඩ දෙන්නෙ නැහැ පක්ෂයවත් ජනතාවත් විනාශ කරන්න—

We shall not allow the party and the people to be destroyed by such an uncivilized course of action, –

යෝජනා කර තිබුණු අශීලාචාර අශිෂ්ට යෝජනාවලින්, වැඩවලින්— as proposed in these instructions."

යෝජිත උපදෙස් මාර්ගයෙන් එය ක්‍රියාත්මක වුණා නම් මොන තරම් දරුණු තත්ත්වක් ඇති වෙනවාද කියන එක පක්ෂයටත් රටටත් එළි කරන්න අපි පසුබට වෙන්නෙ නැහැ කියා එතුමා මේ ලියමනේ ලියා යැව්වා. "ඩේලි මිරර්" පත්‍රයෙන් මම එය කියෙව්ව. කියවා මම එතුමාගෙන් ඇහැව්වා ඒ කාරණයෙන් මොකක්ද කියන්නෙ කියා. එතකොට එතුමා මෙසේ කියනවා :

"**සේනානායක මහතා :**

ඒ දිනවල, ඒ කියන්නේ ඔක්තෝම්බර් 16 වෙනිදයි මැතිණියගේ ප්‍රජා අයිතිවාසිකම් නැති කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවෙන් අනුමත වුණේ. ඒ දවස්වල අපට යම් ආරංචියක් ලැබිල තිබුණා. පක්ෂ ලේකම්තුමා යම් යම් කොටස්වලට, විශේෂයෙන් තරුණ කොටස්වලට, යම් විධියක වැඩපිළිවෙලක් ගැන උපදෙස් දී තිබුණයි කියා අපට ආරංචි වුණා. ඒ ආරංචිය අපට ලැබුණේ පිටස්තර මාර්ගවලිනුයි. සමහරෙක් අපෙන් ඇහුවා, දේශපාලන මණ්ඩලයේ අනුමැතිය ඇතිව මේ විධියේ උපදෙස් දී තිබෙනවාද කියා. අපට කියන්නට සිද්ධවුණා, නැහැ, එහෙම මොකවත් තීන්දුවක් අපි අරගෙන නැහැයි කියා"

එතකොට සභාපතිතුමා—ඒ කියන්නෙ මම—මෙහෙම ඇහුවා.

"**සභාපතිතුමා :** මොන විධියේ උපදෙස් ඒ පිරිසට දී තිබුණයි කියලද ඒ අය කිව්වෙ ?

**සේනානායක මහතා :** යම් විධියක කඩාකප්පල්කාරී වැඩ පිළිවෙලක් දියත් කළ යුතුයි කියලයි. ඒ කියන්නේ රජයට විරුද්ධව යම් යම් වැඩ පිළිවෙළවල් දියත් කළ යුතුයි කියලයි."

එතුමාගේ කටින් මේක කිව්වෙ. මම මේක කියන්නේ ඇයි ? අපේ ආණ්ඩුවක් බලයේ තිබෙන වෙලාවක 1981 දී මේ විධියේ වැඩ පිළිවෙළක් දියත් කරන්නට ඉඩ තිබුණාය කියා මෙතුමාම කියනවා. අපේ ආණ්ඩු කාලය ඔන්න මෙන්න කියල අවසාන වෙන්න යන වෙලාවෙ මේ කියන ලේ විලක්, ලේ ගංගාවක් ඇති වෙන්න වැඩ කටයුතු නොකරයි කියල කාටද කියන්න පුළුවන් කියන කාරණය ඔප්පු කරන්නටයි මම මේ කාරණය ගෙනෙන්නේ මම මේ සාක්ෂිකාරයා කුඩුවට නගගත්තේ එක වයි. මම නැවතත් කියවන් නම් :

"**සේනානායක මහතා :**

යම් විධියක කඩාකප්පල්කාරී වැඩපිළිවෙලක් දියත් කළ යුතුයි කියලයි. ඒ කියන්නේ රජයට විරුද්ධව යම් යම් වැඩපිළිවෙලවල් දියත් කළ යුතුයි කියලයි.

**සභාපතිතුමා :**

අර යෝජනාව මෙහාට එන දවස්වල.

*Hon. Athulathmudali :*

That means, commit an offence under the Penal Code ?

**සේනානායක මහතා :**

ඒ වගේ වැඩක් වෙන්න ඇති.

*The Chairman :*

What were they asking ?

They must have come and told you " We have got instructions to do this, that and the other ? " What sort of things did they mention ?

**සේනානායක මහතා :**

විදුලි බලාගාරවල ඇති ට්‍රාන්ස්ෆෝර්මවලට බෝම්බ ගහන්න, පාලම් කඩන්න, ඔන්න ඔය අන්දමේ වැඩ පිළිවෙලක් තිබුණාය කියා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

අපෙන් ඇවිත් අහපු උදවියගෙන් අපට වැටහුණා. දේශපාලන බල මණ්ඩලය ඔය වගේ තීන්දුවක් අරගෙන නැහැ. එම නිසා ඒ වැඩට බහින්න එපාය කියා. අපි ඒ අයට උපදෙස් දුන්නා.

**සභාපතිතුමා :**

ඒ ගොල්ලන්ට ඒ විධියට උපදෙස් ලැබුණාය කිව්වේ කාගෙන්ද ?

**සේනානායක මහතා :**

පක්ෂයේ ලේකම් මහතාගෙන් ලැබුණු බවයි ඒ අය කිව්වෙ. දේශපාලන බල මණ්ඩලයෙන් ගත් තීන්දුවක් හැටියටයි ඒ අයට කියා තිබුණේ. සමහර විට එයාගේ අදහසක් හැටියට කිව්වා නම් පිළි නොගන්නා හින්දාදෝ දේශපාලන බල මණ්ඩලය තීන්දු කළ දෙයක් හැටියට ඒ අයට පක්ෂයෙ ලේකම් මහතා කියන්න ඇති."

මම අහනවා මැදවච්චියේ මන්ත්‍රීතුමාගෙන්, ඒ ලේකම් නේද මේ මැතිවරණයත් මෙහෙයවපු ලේකම් ?

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
**(Mr. Maithripala Senanayeke)**

මගේ කිසිම සම්බන්ධයක් නැහැ ඒකට.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

මම කිව්වේ නැහැ නොවැ තමුන්නාන්සෙගෙ සම්බන්ධයක් ගැන. මම කිව්වේ ඔප්පු කරන්නට යන්නෙ තමුන්නාන්සෙ අද එකතු වී ඉන්න කණ්ඩායමේ දාමරික තිරශ්චීන ක්‍රියාදාමය ගැන. අර කලුගල්ල මහත්මය ප්‍රවෘත්ති පත්‍ර සාකච්ඡාවේදී "There would have been a civil war" කියල කිව්වා. ඕනෑ කෙනෙකුට කියන්න පුළුවනි, එයා එක්සත් ජාතික පක්ෂය පැත්තට ආපු හින්ද එහෙම කියනව කියල. නමුත් මම එයාගෙ සාක්ෂිය ගන්නෙ නැහැ. මම ගන්නෙ තවමත් හෙක්ටර්ට තුරුළු වී ඉන්න මැදවච්චියේ ගරු මන්ත්‍රීගේ සාක්ෂිය. තමුන්නාන්සේ කිව්වා—මට පෞද්ගලිකව නොවෙයි ප්‍රසිද්ධියේ බණ්ඩාරනායක මහත්මියට ලියපු ලියමනෙන් කිව්වා—" මම නුඹලා කරන්නට හදපු එක එළි කරනවා" කියල. " ඔයාගෙ පුජා උරුමය නැති කරන දවසෙ මොනව කරන්න හිටියද කියන එක මම එළි කරනවා " කිව්වා.

I read that paragraph. I would like to repeat it. He told Mrs. Bandaranaike by the letter which appeared in the " Daily Mirror " of 25.8.81:

" You may now know the nature of instructions issued by the former General Secretary, Mr. Ratnasiri Wickramanayaka, to the party's youth organisations and other groups about the campaign carried out last year against the deprivation of your civic rights. You also know that neither the Politbureau nor any other Party Executives were at this time even remotely aware of these instructions. If it is very necessary for the welfare of the party, we are prepared to divulge these instructions to the whole party and the country. We shall not allow the party and the people to be destroyed by such an incivilised course of action as proposed in these instructions. "

You wrote this letter to Mrs. Bandaranaike and when you came before the Select Committee I read out this extract to you and asked for particulars, and what did you say when I asked you – ' They must have come and told you, we have got instructions to do this that and the other, what sort of things did they mention ? '

**' සේනානායක මහතා :**

විදුලි බලාගාරවල ඇති ට්‍රාන්ස්ෆෝර්ස්වලට ගහන්න පාලම් කඩන්න ඕන්න ඔය අන්දමේ වැඩපිළිවෙළක් තිබුණාය කියා අපෙන් ඇවිත් අහපු උදවියගෙන් අපට වැටහුණා. දේශපාලන බල මණ්ඩලය ඔය වාගේ තීන්දුවක් අරගෙන නැහැ. එම නිසා ඒ වාගේ වැඩට බහින්න එපාය කියා අපි ඒ අයට උපදෙස් දුන්නා.'

In fairness to you, I am reading what you said. You had given instructions not to indulge in any of these things. I am not saying that you were going to resort to these things. I know you are not capable of such a thing. But there are people in your party who are capable of these things, which you know very well although you are now trying to safeguard them simply because they have got round you.

ඒ විධියට 1981 දී මේ රජය බලයේ ඉන්න වෙලාවේ දී ට්‍රාන්ස්ෆෝමර්ස් ' වලට ගහන්න, පාලම් කඩන්න යනාදී වශයෙන් දාමරික ක්‍රියාවක් කරන්න ලෑස්ති වෙච්ච උදවිය 'ජනාධිපතිතුමා පරදිනවාය, මේ ආණ්ඩුව වැටෙනවාය' කියන හැඟීම ඇති කරල ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තුවෙන් සිටි දාමරික වැඩ පිළිවෙළක් තිබුණා. එවැනි වැඩ පිළිවෙළක් තිබුණේ නැත කියා කොයි මනුෂ්‍යයාටද ප්‍රකාශ කරන්න පුළුවන් ?

මේ යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේදී මම කීවේ ඒ නිසයි, මම සෑහෙන කාලයක් ගන්නවාය කියා. මම දන්නවා, අද විරුද්ධ පාර්ශ්වයේ උදවිය ගෙන යන ප්‍රචාරය. දැන් නිකම් බබ්බු වෙන්න, සාන්තුවරයන් වෙන්න යනවා ; අපේ ඇතැම් මන්ත්‍රීවරුන්ට මඩ ගහනවා. මොකක්ද, මේ ජනපතිවරණය ඉවර වෙනවාත් සමඟම බොහෝ දෙනකුට මුහුණ පාන්න සිදු වුණු තත්ත්වය ?

ආරංචියක් ගියා, ජේ. ආර්. ජයවර්ධන මහතා පරාද වෙනවාය කියා. ඒ සිතුවිල්ල උඩ මෙහෙ කොළඹ ලෑස්ති වෙන කොට කලින්ම පිට පළාත්වලටත් කියා තිබුණා. පටන් ගත්තා, අහිංසක උදවියට හිරිහැර කරන්න. අපේ මන්ත්‍රීවරුන්ට මේවා බලන් ඉන්න බැහැ. මම දන්නවා නෙ, මගේ කොට්ඨාශෙ වෙච්ච දේවල් ? ඡන්දදායකයන් ඡන්දය දමන වෙලාවෙ fපවුසිගෙ පන්දන්කාරයො 500 ක් විතර—මැද කොළඹ අය නොවෙයි—බෙත්තාරාම මාවතේ ඡන්ද පොළට කඩාගෙන වැදුණා. කොළඹ නගරාධිපති සිරිසේන කුරේ මහතාගේ ස්ථානෝචිත ප්‍රඥාව නිසා නොවන්නට එතැන පුදුම විධියේ මිනිස් ඝාතනයක් සිදු වන්න තිබුණා.

ඊට දවස් තුන-හතරකට ඉස්සෙල්ලා fපවුසිගෙ දමරික කණ්ඩායම පිස්තෝල ආදී අවි-ආයුධත් ඇතිව ක්‍රීඩා ඇමතිතුමාගෙ නිවස ගාවට ඇවිත් එතුමාටත්, එතුමාගෙ දරු පවුලටත්—එතුමාත් ගෙදර ඉන්දැද්දීම—තර්ජනය කළා ; පරිභව කළා.

I am placing before this House evidence that I can produce and prove.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වෙච්ච සිද්ධිය ගැන ඒ පළාතේ නාගරික මන්ත්‍රීතුමා—ටී. එම්. සංසදස මහතා—ඉදිරිපත් කළ දිවුරුම් පෙත්සමක් මා ළඟ තිබෙනවා. හැන්සාඩ් වාර්තාගත වීම සඳහා මා එය සභාගත කරනවා.* ග්‍රෑන්ඩ්පාස් පොලීසියේ ස්ථානාධිපතිතුමා—පතිරණද, විතාරණද කවුද කියන එක්කෙනා—ඡන්දය විමසන දවසේ කොයි තරමට භය වුණාද කීවොත් භයෙන් වෙවුලනවා. ඇයි, හොට ආණ්ඩුව භාර ගන්න ඉන්න කණ්ඩායමක් නෙ‍ාවැ, ඇවිත් ඉන්නේ ! වාසනාවකට කොළඹ නගරාධිපතිතුමා එතැනට ගියා. එතුමාට නොයෙකුත් අපහාස කළා. නමුත් ඉවසීමේ ශක්තිය තිබෙන පුද්ගලයෙක් නිසා එතුමා බොහොම අමාරුවෙන් හරි සාමය ඇති කළා. මොකද ඡන්ද පොළ එහෙම විනාශ කළා නම් මුළු මැතිවරණයම අවුලක් වෙන්න තිබුණා ; තත්ත්වය වෙනස් වන්න තිබුණා. නගරාධිපතිතුමා නිසයි ඒ කොට්ඨාශයේ තත්ත්වය බේරුණේ. දකුණු ග්‍රෑන්ඩ්පාස් කොට්ඨාශය යුද පිටියක් කරන්නට ගියේ.

ඒ මගේ කොට්ඨාශයේ. අනික් සාමාන්‍ය මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවල මොන විධියේ තත්ත්වයක් තිබෙන්නට ඇද්ද? ඇමතිවරයෙක් නොවන, නියෝජ්‍ය ඇමතිවරයෙක් නොවන සාමාන්‍ය පසුපස මන්ත්‍රීවරුන්ගේ ආසනවල මොන විධියේ තත්ත්වයක් තිබෙන්නට ඇද්ද? මේ ගැන ගල්ගමුවේ ගරු මන්ත්‍රීතුමාත් එච්. එම්. ඒ. ලොකුබණ්ඩාර මහතා මට කිව්වා. මම හිතන විධියට එතුමාගේ ගෙය තිබෙන්නේ යාපහුව ආසනයේ. එතුමාගේ ගෙය විනාශ කරන්නට තර්ජනයක් තිබුණාය කියා එතුමා මට කිව්වා. ඒ ගම් ප්‍රදේශවල. ඇතැම් තැන්වල සමහර නිලධාරීන් ඒවාට හවුල්. ඇත්ත යුක්ත අපි හොයලා බලන්නට ඕනෑ. මම මේක කියන්නේ මෙන්න මේ හේතුව නිසයි. සමහර උදවියට ආරංචියක් ලැබුණු හැටියේ ඒක පතුරුවලා හරින්න බොහොම ලෙහෙසියි. ඒකේ ඇත්ත යුක්ත බලන්නේ නැහැ.

අපේ මන්ත්‍රීවරු මොකටද කරදර කරන්නේ, ජය ග්‍රහණය කරලා තිබෙන වෙලාවේ? නමුත් අහිංසක උදවියට හිරිහැර කරදර කරනවා. කවුද මේ? මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාම කියනවා, එදා ප්‍රජා උරුමය නැති කරන දවසේදී ලැස්ති කරලා තිබුණාය කියා. රත්න දේශප්‍රිය සේනානායක මොකක්ද පොලොන්නරුවේ සිද්ධියකට මැදි වෙච්ච නිසා—පොලීසිය එයාව ඒ වෙලාවේ අත් අඩංගුවට ගත් නිසා—ඒ මාරක අවස්ථාවෙන් මිදුනාය කියලයි අපට දැනගන්නට ලැබුණේ. මේ සාක්කිය උඩ මේ කාරක සභාව මොකද කළේ? මම ගෙන්නුවා ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා. මේ කාරණය ගැන විභාග කරන්නය කියා පොලීසියට කිව්වා. පොලීසිය වාර්තාවක් කර තිබෙනවා.

**I have with me the police report which was submitted to the Select Committee where they have made inquiries in certain areas. May I present this copy of the report to the hon. Member for Medawachchiya to recollect his memory ?**

මම කාරක සභාව ඉදිරියට කැඳෙව්වා. මේ ගැන පරීක්ෂණයක් කරන්නය කියා පොලීසියට නියම කළා.

* කථාව අවසානයේ පළකර ඇත.
* உரையினிறுதியில் தரப்பட்டுள்ளது.
* *Produced at end of speech.*

**This report was submitted by Hon. T. B. Werapitiya, Minister for Internal Security and Deputy Minister of Defence. I would like to assure this House that this report too was presented by me to this House and it has ordered its publication. This is the report :**

"Appendix II

**REPORT SUBMITTED BY HON. T. B. WERAPITIYA, MINISTER FOR INTERNAL SECURITY AND DEPUTY MINISTER OF DEFENCE**

The Select Committee appointed by Parliament to inquire into the responsibilities of Ministers for the recommendation for the continuance of a state of emergency for the period from end of December, 1972 to 16th February, 1977, in the course of its report to Parliament (published as Parliamentary Series No. 33) referred to a paragraph in a letter sent by Mr. Maithripala Senanayeke, M. P. dated the 23rd August 1981 to Mrs. Sirima R. D. Bandaranaike, and published in the 'Ceylon Daily Mirror' of 25th August 1981. In this letter Mr. Senanayeke referred to certain instructions issued by Mr. Ratnasiri Wickramanayaka to the Party's Youth Organisations and other groups about the campaign carried out against the deprivation of the civic rights of Mrs. Bandaranaike which could lead 'to the People (being) destroyed '.

The Select Committee recommended to Parliament to request 'the Government to take any steps it deems appropriate in this regard'."

**Before reading that, I would like to say this.** හාරිස්පත්තුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මහතා) කිව්ව විධියට බණ්ඩාරනායක මහත්මිය මෛත්‍රීපාල සේනානායක මහත්මයාට, ඒමහත්මයාගේ කණ්ඩායමට, බඩගාගෙන එන්නය කිව්වේ මොකද කියා මේකෙන් තේරෙනවා ඇති නේ බඩගාගෙන එන්නයි කිව්වේ, මෙහෙම කිව්වට පස්සේ ආපසු ගත්තේ කොහොමද කියන එක අහන්නටයි. වෙන මොනවද කියන්නේ ? [බාධා කිරීමක්] නැහැ : මම දන්නවා, තමුන්නාන්සේ ලෙව කාගෙන යයි. ලෙව කාගෙන යයි. බඩගාගෙන නොවෙයි, ලෙව කාගෙන යයි.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
**(Mr. Maithripala Senanayeke)**

එහෙම පුරුදු අපට නැහැ.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

තමුන්නාන්සේ කෙරෙහි මගේ තිබුණු ගෞරවය නැති වුණා, අද කථා කරපු ආකාරයෙන්. තමුන්නාන්සේ බඩගාගෙන නොවෙයි, ලෙවකකා යයි. ලෙව කකා යයි.

**I have lost all respect for you. I can understand why Mrs. Bandaranaike asked you to come crawling.**

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
**(Mr. Maithripala Senanayeke)**

**Your Leader tried to go to her through the back-door.**–(*Interruption.*)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I can understand why she said so.–(*Interruption.*)

රනිල් වික්‍රමසිංහ මහතා (යෞවන කටයුතු හා රැකියා ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමා)
(திரு. ரணில் விக்கிரமசிங்ஹ—இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்பு அமைச்சரும் கல்வி அமைச்சரும்)
(Mr. Ranil Wickremasinghe—Minister of Youth Affairs & Employment and Minister of Education)

Why are you talking about other people ? You want to join us through the back-door.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මනුෂ්‍යයෙක් යමක් කිව්වා නම් මොකටද ඒක වහන්න උත්සාහ කරන්නෙ? ඇයි, මෙතැන කිව්වාම ඇති වරද? බණ්ඩාරනායක මහත්මියට ලියා යවන්න පුළුවන් නම්, ඒවා පත්‍රයේ දාන්න පුළුවන් නම්, සිලෙක්ට් කොමිටි එකට ඇවිල්ලා කියන්න පුළුවන් නම්,—

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

මම ඒ ප්‍රශ්නය නැඟුවෙ නැහැ නෙ?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

මොකක්ද නැඟුව ප්‍රශ්නය? මට බලයක් තිබෙනවාද කියලා ඇහුවානේ මෙතැන මේක කියවන්න?

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

නෑ නෑ ඔබතුමා කලින් ඒ විශේෂ කොමිටිය පත් කළේ වෙන කාරණාවකට—

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ඔව්.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

ඊට පස්සේ ඒ විශේෂ කොමිටි වාර්තාව මේ සභාවට ඉදිරිපත් කළේ මා කිව්ව දේ ගැන පරීක්ෂා කරන්න.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ඔව්, ඒක තමයි මම කියන්නෙ.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

මම කිව්වෙ සම්පූර්ණ වාර්තාව ඉදිරිපත් කරන්න ඉස්සරවෙලා ඒකෙන් "කෝට්" කරන්න එපා කියලයි.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ඇයි කෝට් කරන්න බැරි? වාර්තාව විකුණන්න පුළුවන් නම්, ප්‍රසිද්ධ කරන්න නියෝග කර තිබෙනවා නම්, මොන නීතියක් උඩද ඔය කතා කරන්නෙ? මට මේ වාර්තාව මේ සභාවට ඉදිරිපත් කරලා ප්‍රසිද්ධ කරන්න අවකාශ නොලැබී තිබුණා නම් තමුන්නාන්සේගේ තර්කය හරි ගියා නම්, මම 'ඩේලි මිරර්' පත්‍රය ගෙනෙනවා දැන් මම ඒක ගෙනල්ලා තියනවා. ඇයි වහන්න යන්නේ, පැත්තකින් පැත්තකට ගියා කියලා? ඇයි වහන්න යන්නේ, මෙතැන මේක ඉදිරිපත් වුණා නම්?

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

මම කියාපු සෑම වචනයක්ම මම නැවත වරක් ස්ථිර කරනවා.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

එහෙම නම් තමුන්නාන්සේට මම කියනවා තමුන්නාන්සේ ඉන්නේ විනාශකාරී පිරිසකට එකතුවෙලා, රත්නසිරි වික්‍රමනායකට එකතුවෙලා. ඒක පිළිගන්න [බාධා කිරීමක්] අන්න බොහොම හොඳයි දැන් එනවා කටින් ඇත්ත. ඒ ඇත්ත ඇවේ මම මේක කියවපු හින්ද.

"The Government accordingly instructed the Inspector-General of Police to conduct investigations in regard to this matter."

To which matter ? To the matter that he referred to.

"Investigations were conducted in the following electorates :-

| | |
|---|---|
| Colombo | Hakmana |
| Kelaniya | Ratgama |
| Mahara | Kandy |
| Gampaha | Senkadagala |
| Attanagalla | Kundasale |
| Mirigama | Galagedera |
| Ambalangoda | Harispattuwa |
| Galle | Patha Dumbura |
| Matara | Hewaheta |
| Minipe | Nawalapitiya |
| Teldeniya | Bingiriya |
| Anamaduwa | |

These investigations reveal that meetings had been held in these electorates to organise the people to protest against the deprivation of civic rights of Mrs. Sirima R. D. Bandaranaike.

These were to take the form of mass meetings, the sending of telegrams and letters of protest, poster campaigns etc.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

However, the investigations reveal that a separate Action Committee had been formed of a select group in the Sri Lanka Freedom Party to make the protest a violent one with a view to disrupting the economy. There is evidence that this Action Group had sent special emissaries to various parts of the country to organise violent and disruptive action. The members of this Action Group have been identified.

The Action was to take the form of :

(*a*) the breaching of the bunds of major irrigation tanks,

(*b*) blowing up of major bridges and culverts,

(*c*) disrupting the electricity distribution system by causing damage to transformers and electricity posts,

(*d*) disrupting the telecommunications network,

(*e*) causing derailment of trains,

(*f*) blocking the main roads by felling trees across them,"–

**They are masters at that !**

–"(*g*) destroying water supply schemes,

(*h*) causing damage to Government property etc.

It was also proposed to bring large masses of people into Colombo on the 15th October 1980 and to destroy the Parliament Buildings. Some of them admitted having given instructions to commit acts of violence. The offences disclosed come within Section 120 of the Penal Code and certain acts have been committed in furtherence of the conspiracy sections.

Fortunately there did not appear to be public support for these acts of violence. The scheme failed. Only in a few places was damage caused.

Investigations are being continued with."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර කට උත්තරය—කොමිටියට ඇවිත් කිව්ව කට උත්තරය—ඇත්ත නේ. එන කොට ඒ, මේ රජයේ පාලන කාලය මැද්දේදී, ආරම්භයේදී. මේ අවසාන වෙන්න යන වෙලාව; ජනාධිපති ඡන්දය යන වෙලාව; පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු ඔක්කොම ගෙදර යවනවාය කියා හෙක්ටර් කොබ්බෑකඩුව මහත්මයා කිව්ව වෙලාව; ප්‍රේමදාස පැයක් ඉන්නෙ නැහැ. ඇමතිවරු පැයක් ඉන්නෙ නැහැ, ඔක්කොම ගෙදර යවනවා කිව්ව වෙලාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහන්න කැමතියි මේවා අහලා අපේ රටේ ජනතාව බියෙන් මුසපත් වුණා නම් ඒක පුදුමයක්ද? මේ වගේ දෙයක් සංවිධානය කරන්න එද ලෑස්ති වුණු උදවිය—එහෙම ලෑස්ති වුණාය කියල කියන්නෙ කව්ද? අද හෙක්ටර් කොබ්බෑකඩුව මහත්මයාගේ දකුණු අත වෙලා ඉන්න මැදවච්චියේ මන්ත්‍රීතුමා එහෙම කිව්වා නම්, එය පොලීසියෙන් විභාග කළාම ඒ තොරතුරු හරිය කියලා කිව්වා නම්, මම අහන්න කැමතියි, අද රට පුරාම තිබෙන භීතිය

එදා මැතිවරණය අවසාන වෙනවාත් සමගම මේ රටේ ලේ ගංගාවක් කරන බව තිබුණු තර්ජනය—බොරුවක් කියල කියන්න පුළුවන්ද?

මම දන්නවා අද මෙතැනට ඇවිත් අපට වෙන පින්තූරයක් ඇඳල පෙන්නන්න ලෑස්ති වෙන බව. ඒ නිසයි මම තමුන්නාන්සේගෙන් අවසර ගත්තෙ, අද රෑ එළි වන තෙක් වුණත් කමක් නැහැ, අපි ලෑස්තියි මේ විවාදය කරන්න. අපි දන්නවා මොනවාද වෙන්න තිබුණේ කියා. වාසනාවට—මේ රටේ ජනතාවගේ වාසනාවට නැත්නම් විරුද්ධ පාර්ශ්වයේ සමහර උදවියගේ වාසනාවට—ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා නැවතත් මේ රටේ ජනාධිපති බවට පත් වුණා. නැත්නම් ඉවරයි. ඔය ලක්ෂ ගයේ පුරසාරම කොච්චර තිබෙන්නෙ, එහෙම නම් ලේ ගංගාවක පීන්නනයි වෙන්නෙ. ඔය බුද්ධිමතුන්ට තේරෙයි එදාට. ඔය කෑ ගැහුව, අවමානයට ලක් වුණු අරජීනියා නාළ තිලියන්ට තේරෙයි එදාට, මොකද වුණේ කියල. බත් පතට මූලා වුණු උදවියට තේරෙන්න ඕනෑ එදාට. මේ රටේ අහිංසක ජනතාවයි, දුගී දුප්පත් ජනතාවයි පෝලිමේ ගොස් ඡන්දය දී මේ රජය නැවතත් බලයට පත් කළේ. අපේ හාල් පොතට වැඩිය අපේ ආත්ම ගෞරවය උතුම්. අපේ ආත්ම ආරක්ෂාව උතුම්. මේ රජය යන ගමනින් තමයි, අපේ දුප්පත් දරුවන්ට අපේ ඇස් ඉදිරිපිටම මේ රටේ සෞභාග්‍ය සම්පන්න ජාතියක් හැටියට ජීවත් වන්නට පුළුවන් වන්නේ කියන විශ්වාසය ඔවුන්ට තිබුණා. ඔය මහ බලපුළුවන්කාරයන් නොවෙයි ඔය ලක්ෂ 35 කට වැඩිය ඡන්දය දී තිබෙන පිරිස. මේ රටේ අහිංසක ගැමි ජනතාව, අහිංසක නාගරික ජනතාව, උදේ පාන්දරින්ම ගිහිල්ල පෝලිම්වල ඉන්නවා මම දැක්කා. ගම්බද ජනතාව—මේ ගොල්ලන්ට මුලා කරන්න ලේසියෙන්ම පුළුවන්කම තිබුණු ජනතාව—තමයි ඒ පෝලිම්වල ගමන් කළේ.

මට දෝස් කියන්න බැහැ, යම් අහිංසක පිරිසක් මුලා වුණා නම් අර හාල් පොත දැක්කාම. මට දොස් කියන්න බැහැ ඒ ජනතාවට. අපට දොස් කියන්න බැහැ. තවමත් දරිද්‍රතාවයෙන් ඉන්න ජනතාවට දොස් කියන්න බැහැ. අපි ඒ ජනතාව බේරගන්න තමයි මේ උත්සාහ කරන්නෙ. නමුත් ඔය කියන ලක්ෂ ගණන අතරේ කොයි තරම් මුළා වුණු අය ඉන්නවාද? කොයි තරම් ඉන්නවාද බියෙන් ගිහින් ඡන්දය දුන්නු අය. මම ඒ නිසයි කිව්වේ නුවරඑළිය—මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) වේදිකාවට නැගීමෙන් මිග මෝඩකමක් කරගත්තාය කියල. මෝඩකමක් කර ගත්තාය කියල මම කිව්ව. [බාධා කිරීමක්.] ඔව්, ඒවගේ තත්ත්වයක්. මම දන්නේ නැහැ, එතුමා අද ඒ ගෙදර කොහොම ඉන්නවද කියල. ඒක වියට්නාමයක් වාගෙයි. මොකක්ද එදා ඇති වුණේ ?

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

මම ඉන්නෙ සාම කලාපයෙ.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

ඒ කියන්නේ, සෑහෙන ප්‍රමාණයක යුද පිරියක් තිබෙනව කියන එකයි. එය හරි. ඒක ඇත්ත.

එදා ප්‍රතිඵල නිකුත් වෙන්න ඔන්න මෙන්න කියා තියෙද්දී වත්තල ගරු මන්ත්‍රීතුමා (ජේ. ඒ. ඊ. අමරතුංග මහතා) ජනාධිපතිතුමා බලන්න ආවා. වත්තල සිට පිරිසක් එක්ක. එතුමා හරිගස්සයි මගෙන් වැරදීමක් වුණොත්. එහෙම එන කොට වෝඩ් ප්ලේස් එකට යන්න දුන්නේ නෑ, පොලීසිය. මොකද බොහෝම භයානක අවස්ථාවක්. ජනාධිපතිතුමාගෙ ජීවිතය විනාශ කරන්න ඉන්න වෙලාව. වාහන යැව්වා අනෙක් පැත්තෙන් යන්න කියා. තවම ප්‍රතිඵල හරියට ආවෙත් නෑ. මේ අයට නගරශාලාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

පැත්තෙන් යන්න වුවමනා කළා ඒ වෙලාවෙ මැකානි පාරෙන් රොස්මිඩ් පෙදෙස පාරෙන් ඇවිල්ලා නගර ශාලාව පැත්තෙන් කොටුවේ ජනාධිපති මන්දිරයට යන්න වුවමනා කළා. මොකද වුණේ ?

මම ජනාධිපති මැදුරෙ ඉන්න කොට එතුමා ඇවිත් මට කිව්ව, "මේ බලන්න, හරි වැඩේ ; අපිට පොලිසිය අනික් පැත්තෙන් එව්ව, චන්ද්‍රිකාගෙ ගේ ළඟදී අපේ වාහන යට බෝතල ගැහුව" කියල. එතුමා ඒ විස්තරය කියන්න ඕනෑ. මම හරියට දන්නෙ නැහැ. මේ කලබල අස්සේ—[බාධා කිරීමක්]. අයි. ආර්. සී. සුදා. අයි. ආර්. සී. කාරයො ඔක්කොම ගේ අස්සෙ දාගෙන විජය කුමාරනතුංග ගැහුව බෝතල්වලින්. කාටද ගැහුවෙ ? එයා වුවමනාවෙන්ම එහාට ගියේ නැහැ. එහාට යන්න අවශ්‍යතාවක් තිබුණේ නෑ එයාට. එයා වෙන ගමනක් යන්න ආවෙ. පොලිසිය අනික් පැත්තෙන් ඇරියා. මම පෙන්නන්න යන්නෙ, මොන විධියෙ තත්ත්වයක් තිබුනද කියල. බොහොම ලේසියි 'ඇත්ත' පත්තරේට 'දිනකර' පත්තරේට මේවා වෙනස් කර වෙන මුහුණුවරකින් පෙන්නන්න. ජනතාව මුලා වෙන්නෙ නෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Hon. Speaker will now take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.**

*அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தி லின்று அகலவே, குழுக்களின் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and the* SPEAKER *took the Chair.*

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

ගරු කථානායකතුමනි, මම කියාගෙන ආවෙ මොන විධියෙ සූදානමක් තිබුණද මේ රටේ සාමය සමාදානය විනාශ කරන්නට කියන එකයි. ඇයි, ඡන්දය ඉල්ලන එක්කෙනාම කිව්වනෙ, මගේ කඩුව හොඳට කැපෙන කඩුවක් කියල. හොඳට ඒක කැපෙන නිසා විසිවෙනිදාට පස්සෙ මොන මොනව කැපෙයිද දන්නෙ නැහැ කියල හෙක්ටර් කොබ්බෑකඩුව කිව්ව. අපි දන්නව, බෙලි කැපෙන්න තිබුණු බව. අපි ඒකයි කියන්නෙ.

ගරු කථානායකතුමනි, මේ ජයග්‍රහණයේ විශිෂ්ටත්වය තමුන්නාන්සේට පේනවා. සියයට 52 කට වැඩි සංඛ්‍යාවක්—සියයට 53 කට කිට්ටු වෙන්න—ලක්ෂ 34 කට වැඩි සංඛ්‍යාවක්—ලක්ෂ 35 කට කිට්ටු වෙන්න—ගැනීම පමණක් නොවෙයි, මේ ඡන්ද ලැබුණේ කොහෙන්ද කියලත් බලන්න ඕනෑ. ආසන 139 ක වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගැනීමෙන් 1977 වාගෙම හයෙන් පහක මන්ත්‍රී කොට්ඨාශ ජයග්‍රහණයක් ලබාගත්තා.

ආසන 139 ක්. ආසන 8 ක් අපට අඩු වුණා. නමුත් නොතිබුණු ආසන තුනක් අපට ලැබුණා. කලවාන, කොත්මලේ සහ මැදවච්චිය. මට බොහොම කණගාටුයි, කොත්මලේ ගරු මන්ත්‍රීතුමා ගැන. කොත්මලේ ජලාශය ගැන මච්චර කෑගහලත් මම උදේ 8 ට කොත්මලේට ගියාම,—ගරු මන්ත්‍රීතුමාටත් ආරංචි ඇති—මම උදේ 8 ට සංගිලි පාලමට ගියාම, මට එදා තේරුණා එතුමා කපෝතියි කියා. මම බොහොම ආඩම්බර වෙනවා. තමුන්නාන්සේලා සියලුදෙනාමත් ආඩම්බර වෙන්න ඕනෑ, අපේ සංවිධායක දැල්පිටිය මහතා ගැන. ඉතාමත්ම විශිෂ්ඨ සංවිධානයක් ඇති කර තිබුණා. මම එදයි දැනගනත්තේ නුවරඑළියේ ගරු දිසා ඇමතිතුමිය කොයි තරම් දක්ෂ සංවිධායිකාවක්ද කියා. පොඩි වුණත් වැඩ ලොකුයි.

ගරු කථානායකතුමනි, එකක් මතක තබා ගන්න ඕනෑ. ආසන 139 කින් ලැබූ මේ ඡන්ද ප්‍රමාණයම, මේ සියයට ප්‍රමාණයම, අපේ ජනාධිපතිතුමාට ලබා ගන්නට පුළුවන්කම තිබුණා, ආසන 100 කින් පමණක්. අනික් ආසන හැටෙන්ම—මන්ත්‍රීවරු 168 ක් ආවාට ඡන්ද කොට්ඨාශ තිබෙන්නේ 160 යි—අඩු ඡන්ද ගණනක් අරගෙන පැරදිලා අර අනික් ආසන අටෙන් වගේ, ආසන 100 කින් තිබුණා, මේ ඡන්ද ලක්ෂ 35 ට කිට්ටු ගණනක්, සියයට 52 ක්, ගන්නට. නමුත් මේ ජයග්‍රහණයේ විශිෂ්ඨත්වය මේ ඡන්ද ප්‍රමාණයම ගන්නා අතරේ ආසන 139 කුත් දිනාගෙන මේ ගණන ගත් එකයි, එකට එකතු වූ එක්සත් විරුද්ධ පක්ෂයකුත් සමග හැප්පිලා.

Against a combined opposition. He was not only able to get a massive victory in the country but he got that victory winning 139 electorates.

ඒකයි, මෙහි වටිනාකම. මෙහි විශිෂ්ඨත්වය සමහර උදවිය තේරුම් ගත්තේ නැහැ. ඒ නිසයි, අපි තීරණය කළේ, මේ හයෙන් පහක ජයග්‍රහණයක ඒ කොට්ඨාශ මට්ටමෙන් ලබා දුන් නිසා නැවතත් ජනතාව ඉදිරියට ගොස් මහජන මත විමසීමේ ඡන්දයක් ඉල්ලන්නට ; තමුන්නාන්සේලා ජනාධිපතිතුමාට තව අවුරුදු 6 ක් බාර දුන්නා වගේම පාර්ලිමේන්තුවේ මේ හයෙන් පහේ බලයත් දෙනවාද තව අවුරුදු 6 ක් තමුන්නාන්සේලාට සේවය කරන්නට කියා අහන්නට. ජනාධිපති වරණයේදී දුන්නා කියා අපි ඉන්න හදන්නේ නැහැ. අපි නැවත අහනවා ඡන්දයකින් ; මහජන මතය විමසන ඡන්දයකින්.

සමහරුන්ට මේ වචනය තේරෙන්නෙ නැහැ. 'රෙපරන්ඩම්' කිව්වාම හිතනවා, ඡන්දයක් වෙනුවට තබන්නට යන එකක්ය කියා. නැහැ. රෙපරන්ඩම් කියන එකට නියම තේරුමක් දෙනවා නම්, මහජන මතය පිළිබඳව ඡන්දයක්. මොකක්ද එයින් අහන්නේ ? අපි අහනවා, එදා තමුන්නාන්සේලා ඡන්දය දුන්නා අපේ ජනාධිපතිතුමාට සියයට 52 ක වරමක් ; තිස්පන් ලක්ෂයකට කිට්ටු ඡන්ද සංඛ්‍යාවක්. එසේ දෙන අතර ආසන 139 ක ජයග්‍රහණයක් එක්සත් ජාතික පක්ෂයට ලබා දී තිබෙනවා. අපි දැනගන්න සතුටුයි ප්‍රශ්නයක් අහනවා—එයින් අදහස් කළේ, එතුමා ලබා ගත් වරම ක්‍රියාත්මක කිරීමට—එතුමාට ආධාර කිරීමට—එතුමාගේ නිල කාලය තුළ මේ හයෙන් පහක තවත් අවුරුදු 6 ක් ක්‍රියාත්මක විය යුතුය කියන එකද නැද්ද කියා. "ඔව්" නම් ලාම්පුව ඉදිරියේ කතිරය ගහන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනමත විචාරණ නීතිය යටතේ ඒකට තිබෙනව, සිම්බල් —සලකුණු—දෙකක්. "ඔව්" කියනව නම් ලාම්පුව ඉදිරියේ කතිරය ගහන්න "නැහැ" කියනවා නම් පෝච්චිය ඉදිරියේ කතිරය ගහන්න. මේ පෝච්චිය කියල කිව්වෙ 'පොට්' කියන වචනයට. මගේ හිතේ, අර "පොට්" කියන ඉංග්‍රීසි වචනයට සිංහලෙන් දෙන්න පුළුවන් ළඟම වචනය "පෝච්චිය" කියන එකයි. කියන එකයි. (බාධා කිරීමක්) ගරු කථානායකතුමනි, මේකට වෙනත් අර්ථයක් දෙන්න පුළුවන් බව මම දන්නව. මම ඒකයි, මේක පැහැදිලි කරන්න යන්නෙ.

අපේ ජනාධිපතිතුමා සියයට 52 ජයග්‍රහණයක් ලැබුවේ, ලක්ෂ 35 කට කිට්ටු ඡන්ද ප්‍රමාණයක් ගත්තෙ දිස්ත්‍රික්ක 21 කින්ම ජයග්‍රහණය ලබා ගත්තෙ, ආසන 139 ක් දිනාගනිමිනුයි. ඒ මැතිවරණය තිබ්බෙ ආසන මට්ටමේ ඡන්දයක් පවත්වන්න නොවෙයි. නමුත් ඒක දිනුව ඒ විධියට. අපි අහනව ඒක අපේ ජනතාවගෙන්. ජනතාව, මේ ජනාධිපතිතුමාට විධායක ජනාධිපති හැටියට තවත් අවුරුද්දක් දෙන කොට ජනතාව දන්නව එතුමාට පාලනයක් ගෙන යන්න බැහැ කියා, එතුමාගෙ ප්‍රතිපත්ති පිළිගන්නා පාර්ලිමේන්තුවක් නැත්නම්. එමනිසා වෙන්න ඕනෑ, අර විධියට ආසන 139 කින්ම ජයග්‍රහණය දුන්නෙ. නමුත් ඒක හරිද වැරදිද, ඇත්තද නැද්ද කියල දැනගන්න ඕනෑ. එම නිසා අපි ජනමත විචරණයෙන් ඒක අහනව. එහෙම නොවෙයි නම්? අපි එහෙනම් ඡන්දයක් තියනව. එහෙම නොවෙයි කියල කිව්වොත් ඡන්දයක් තියන්න පුළුවනි. ඒක තියන්නෙ 1983 අගෝස්තු මාසයෙ 1983 අගෝස්තු මාසය විනතුරු මේ පාර්ලිමේන්තුවට යන්න පුළුවනි. ජනතාව කිව්වොත් "අපි ජනාධිපතිතුමාව මෙතෙන්ට දැම්මෙ පාලනයක් ගෙනයන්නට බැරි විදියට එතුමාට බාධා කරන පාර්ලිමේන්තුවක් ඇතුව නිකම් දුර්වල පාලනයක් ගෙන යන්න නොවෙයි; ආසන 139 කින්ම එතුමාට ජය ලබා දුන්නෙ මේ පාර්ලිමේන්තුවට සහායක් දෙන්නයි" කියා කිව්වොත්, අන්න එහෙම නම් 1983 අගෝස්තු මාසයෙන් පසුවත් තවත් අවුරුදු හයක් මේ පාර්ලිමේන්තුවට ජනතාවගෙ කැමැත්තෙන් ඉන්න පුළුවනි. මහජනතාව 'ඔව්' කියල කිව්වොත් මැදවච්චිය මන්ත්‍රීතුමාටත් (මෛත්‍රීපාල සේනානායක මහතා) පින පැදෙනව, මෙතැන ඉන්න. කොත්මලේ මන්ත්‍රීතුමාටත් (ආනන්ද දසනායක මහතා) පින පැදෙනව මෙතන ඉන්න. කලවානෙ මන්ත්‍රීතුමාටත් (සරත් මුත්තෙට්ටුවේගම මහතා) පින පැදෙනව මෙතැන ඉන්න. අපි කැමතියි, එතුමන්ලා එක්ක ඉන්න. මම දන්නව තමුන්නාන්සේලා රටට ගිහින් කියයි", මේක ඒකාධිපතිවාදය; මේක ජන සම්මත වාදයට විරුද්ධයි; undemocratic" කියල. එහෙත් හිත යටින් කියයි 'දීපල්ල දීපල්ල' කියල. පක්ෂයෙ තිබෙන ආරාවුල් ගැන බැලුවාම ලැයිස්තුව හදන්නෙ කොහොමද? හෙක්ටරුයි, ඇක්ටරුයි, කොන්ට්‍රැක්ටරුයි, මොන මොන ගිණිකෙළිද? අර "සාම කලාපය" නැතිව යයි, බැරි වෙලාවත් ජනතාව එහෙම නැහැයි කියල කිව්වොත්. ඉවරයි. සාම කලාපයත් ඉවර වෙයි.

ගරු කථානායකතුමනි, මම දන්න ඇනටම මේකට වෙන අර්ථ කථනයක් දෙන්න ලැහැස්ති වෙනව. කරුණාකර ජනතාවගේ බුද්ධිය අඩුවෙන් තක්සේරු කරන්න එපා. මම මේ සභාවේදී කියපු ඒවා ඔක්කොම ඉටුවෙලා තියෙනව. නගර සභා ඡන්දය ගැන කිව්ව. සංවර්ධන සභා ඡන්දය ගැන කිව්ව. ජනාධිපතිවරණය ගැන කිව්ව. හාරිස්පත්තුව දෙවන මන්ත්‍රීතුමාටම (ආර්. පී. විජේසිරි මහතා) කිව්ව. මම කියාපු දේ කොයි තරම් ඉටු වුණාද කියල කිව්වොත් එතුමා අද මේ පැත්තටත් ආව. මම තවත් එකක් කියන්නම්. (බාධා කිරීමක්) මම කියාපු එක වුණානෙ. අපි දිනුවානෙ. අපි දිනන කොට තමුන්නාන්සෙත් දිනුව. මම තවත් අනාවැකියක් කියන්නම්. ඔය ජනමත විචාරණ මහ ඡන්දෙනුත් ජනාධිපතිවරණයේදී ලැබුවාට වඩා ඡන්ද සංඛ්‍යාවක් ලැබෙනව. මේක ලියල තියා ගන්න. ඒ විතරක් නොවෙයි, ඒ පාර්ලිමේන්තුවේ හය අවුරුද්ද ඉවර වෙන්න ඉස්සර අර ඉස්සරහ ඉන්න කීප දෙනාගෙන් භාගයකුත් මේ පැත්තට එන තත්ත්වයක් ඇති වෙයි. (බාධා කිරීමක්) දැන්නම් නැහැයි කියයි.

කථානායකතුමනි, මම ඒ ඔක්කොම කියන්නෙ හොඳ හිතින්. ඕනෑ කෙනෙක් හොඳ හිතින් කියන ඒවා ඉෂ්ට වෙනවා. ද්වේෂ සහගතව නොවෙයි කියන්නෙ. අපේ පක්ෂයේ ඒ විධියේ පුණ්‍ය බලයක් තිබෙනවා. පිලිප් ගුණවර්ධන මහතා වරක් කිව්වා, එක්සත් ජාතික පක්ෂයට මම කොච්චර විරුද්ධද කිව්වොත් අන්තිම සේනානායක දේශපාලන භූමියෙන් ඉවත් කරන තුරු මට නින්ද යන්නෙ නැහැ කියා. මොකද වුණේ? ඩඩ්ලි සේනානායක මහතා ළඟට ඇවිල්ලා ඇමතිකමක් ලබා ගෙන තමයි අවසානෙ එක්සත් ජාතික පක්ෂයෙන් ඉවර වුණේ.

සී. පී. ද සිල්වා මහතා අපිත් එක්ක එකතු වුණා. මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පතාක යෝධයෙක්. ආරම්භක යෝධයෙක්. අශෝක කරුණාරත්න ඇමතිතුමා, රොනී ද මෙල් ඇමතිතුමා, ඒ වාගේම දහනායක මැතිතුමා, හිටපු අගමැතිතුමා. මේක ආඩම්බරයෙන් කියන එකක් නොවෙයි. උඩඟුකමෙන් කියන එකක් නොවෙයි. අපට ඕනෑ මේ රට එක්සේසත් කරන්න. එක්සත් කරන්න. වාද භේද අඩු, මත භේද නැති, අග හිඟය නැති, සශ්‍රීක, සාමකාමී සංවරශීලී, සෞභාග්‍ය සම්පන්න සමාජයක් ඇති කරන්නට එක්සත් ජාතික පක්ෂය කටයුතු කරන බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි.

අපි හැම කොටසකටම අපේ දෑත් දිගු කර ආයාචනා කරනවා, හැම කොටසකටම ආරාධනා කරනවා, ඒ සඳහා සහයෝගය දෙන්නය කියා. අද තමුන්නාන්සේලා අපිත් එක්ක එකඟ නොවෙන්න පුළුවන්. මත භේද තිබෙන්න පුළුවන්. නමුත් අපේ ජීවන කාලය තුළදීම අපි ප්‍රාර්ථනා කරනවා, මේ රටේ සියලුම කොටස් එකට එකතු වී මේ රට හදන බැඩපිළිවෙළට එක්සත් වී ක්‍රියා කරන්නය කියා.

ඒකයි අපේ චේතනාව. මේ පවිත්‍ර චේතනාව නිසයි මේ විශිෂ්ට ජයග්‍රහණය ලැබුවෙ. නැත්නම් අපට විරුද්ධව විසි කළ අවි ආයුධ බලන්න: දේශපාලනමය වශයෙන්, තර්කානුකූල වශයෙන්, ඒ වාගේම ජනතාවගේ සිත් සතන් නම්මගන්න පුළුවන් හාල් පොත් වගේ—සහනාධාර වාගේ—දේවල්. ඒ විධියේ සටන් පාඨ ගැන කල්පනා කළොත් පුදුම වෙන්න ඕනෑ, මේ ලැබූ ජයග්‍රහණය ගැන. ඡන්ද ලකුණුත් ලැබිලා, මධ්‍යස්ථානයත්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

ලැබිලා, ඉතුරු පිලුත් ලැබිලා, එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව නැඟී සිටි පක්ෂ ඔක්කොම එකට එක්සත් වෙලා තිබියදීත් මේ විධියේ ජයග්‍රහණයක් ලැබීම ගැන. ඒකයි මම කිව්වෙ ජනාධිපතිතුමා ජයග්‍රහණය කලා පමණක් නොවෙයි, ආසන 139 ක ජයකුත් සමග ජය ලැබුවාය කියා.

එතකොට ජනමතය විමසන මහ ඡන්දයක් පැවැත්වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන එකක්. දැන් කියන්න පුළුවන්, කොනෙකුට හපෝයි මේ කරන්න යන්නෙ වැරදි වැඩක්, ඡන්දයක් නැතිව මොකටද නිල කාලය දික් කරන්නෙ කියා. ඇයි ඡන්දයක් නැත්තේ ? ඡන්දයක් තිබෙනවා. ඒ ඡන්දය සුළුපටු ඡන්දයක් නොවෙයි. ඡන්ද නීතිය අනුව මේ ජනමත මහ ඡන්දයෙන් ජයක් ලබන්නට නම් අඩු ගණනේ ලියාපදිංචි වෙච්ච ඡන්ද සංඛ්‍යාවෙන් තුනෙන් එකක් "ඔව්" කියන්නම ඕනැ. ඊට වැඩිය ගියොත්—තුනෙන් දෙකක ප්‍රමාණයකට ගියත්—ඡන්ද—ඡන්ද ලකුණු දෙකයි, ඒ කියන්නේ අපේක්ෂකයන් දෙන්නයිම, 'ඔව්' කියන අපේක්ෂකයයි, 'නැහැ' කියන අපේක්ෂකයයි—සියයට පණහකට වැඩිය ගන්න ඕනැ. ඒක එක ඡන්දයකින් වුනත් පුළුවන්, සියයට 50 කට වැඩියෙන් ගන්න ඕනැ. ලක්ෂ 27 ක්—මේ ඡන්ද ප්‍රමාණය අනුව—එක, වරම "ඔව්" කියන්නට ඕනැ. ඒ නිසා ඒක විශිෂ්ට ඡන්ද තරඟයක්. ඡන්ද ලකුණු දෙකයි තිබෙන්නෙ. අපේ පළපුරුදු ඡන්ද ලකුණකුත් නොවෙයි, 'ඔව්' කියන්න පහන. 'නැහැ' කියන්න 'පොට්' එක. ඉතින් මුළු රටේම අපි සංවිධානය කරන්න ඕනැ. මන්ත්‍රී තරඟයකට, ජනපතිවරණයකට තිබෙන ඡන්ද නීති රීති ඔක්කොම ක්‍රියාත්මක වෙනවා. දැන්වීම් පත්‍ර අච්චු ගැසීමේ නීති රීති, රැස්වීම් තැබීමේ නීති රීති, ආගමික ස්ථාන පාවිච්චියට නොගැනීමේ නීති රීති "කරප්ට් ප්‍රැක්ටිසස්" දූෂණ ක්‍රියා අල්ලස් දීම ඒවාට බලපාන දඬුවම් ඔය ආදී සියලුම නීති රීති ක්‍රියාත්මක වෙනවා.

ඒ නිසා ඒක මහ ඡන්දයක්. අර "රෙෆරන්ඩම්" කියන වචනය අරගෙන ජනමත විචාරණය කියන වචන අරගෙන "හා, ඒක ඡන්දයක් නොවෙයි" කියල කෙනෙකුට අර්ථ කථනයක් දෙන්න පුළුවනි. නමුත් මේක අර සාමාන්‍ය ඡන්දයකටත් වඩා බරපතල එකක්. එතකොට මේ ඡන්දය ගන්නෙ පාර්ලිමේන්තුවේ නිල කාලය තවත් හය අවුරුද්දකින් දික් කළ යුතුද නැද්ද කියල ජනතාවගෙන් අහන්න. එහෙම කරන්න යන්නෙ අපේ 1978 ව්‍යවස්ථාව අනුව. හොඳයි, හෙක්ටර් මහත්මයත් කොල්වින් මහත්මයත් කියපු විධියට 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අද තිබුණ නම් මේ පාර්ලිමේන්තුව අවුරුදු හයක් නොවෙයි අවුරුදු සියයක් වුණත් තියා ගන්න පුළුවනි, තුනෙන් දෙකේ ඡන්ද බලයෙන්. ජනතාවගෙන් අහන්නෙ නැතිව. අන්න වෙනස.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වර්ණනා කළා. ටෙලිවිෂන් එකෙන් පවා වර්ණනා කළා. මොකක්ද ඒ වර්ණනාව? දැන් අපට තුනෙන් දෙකක්ද මෙතැන තියෙන්නෙ? හයෙන් පහක්. 1975 දී මොකක්ද කළේ? තුනෙන් දෙකේ බලයක් තිබුණු නිසා නේද පස් අවුරුද්දකට පත් වී හත් අවුරුද්දක් හිටියේ? හැන්සාඩ් වාර්තාව බලන්න. මම ඒක ප්‍රසිද්ධ කරන්නට බලාපොරොත්තු වෙනව. ජාතික රාජ්‍ය සභාවේදී ඔය සිද්ධිය වෙන වෙලාවෙදි මම ආචාර්ය එන්. එම්. පෙරේරා මහත්මයාගෙන් ඇහුවා, "තමුන්නාන්සේලා පස් අවුරුද්දකට පත් වෙලා මේ විධියට හත් අවුරුද්දක් ඉන්න එක හරිද?" කියල. එයා ඇහුව "ඇයි, මොකක්ද වරද?" කියල. "තුනෙන් දෙකක බලය තියෙනව නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න පුළුවන්ය කියල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න පුළුවන්ය කියල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ තියෙනව නොවැ. එතකොට නිල කාලයත් වෙනස් කරන්න පුළුවන් නොවැ" කියල එයා කිව්වා. එතකොට මම ඇහුව, "එහෙම තියෙන්න පුළුවන්, නමුත් ඒක හරිද?" කියල. "මොකද වරද?" කියල මගෙන් ඇහුව. ඊළඟට මම ඇහුව, "එහෙම නම් තුනෙන් දෙකක බලයෙන් සර්ව ජන ඡන්දයත් නැති කරන්නට පුළුවන්ද?" කියල. එතකොට එයා මෙහෙම ඇහුව: "Why not? Why not? But you will have to face the repercussions from the public". එහෙම වුණොත් මහජනයා තුළ කොයි විධියෙ හැඟීමක් ඇති වෙයිද කියල අපි දන්නෙ නැහැ, නමුත් තුනෙන් දෙකේ බලයකින් ඒකත් කරන්න පුළුවන් කියල කිව්ව. ඒක හැන්සාඩ් වාර්තාගත වී තිබෙනවා. මම ඒක මුද්‍රණය කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ එහෙම තිබුණා නම් තුනෙන් දෙකේ බලයට අවුරුදු පහ, හත කර ගත්තා නම්, හයෙන් පහක බලයට අවුරුදු පහළොවකින් පමණ දික් කර ගන්නට පුළුවන් නොවැ!

එපමණක් නොවෙයි. තුනෙන් දෙකෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ එක වගන්තියයි වෙනස් කරන්නට තියෙන්නෙ. කොහොමද? අර "නිල කාලය" කියන එකට "1977 ජූලි මාසයේ 21 වැනිද යම් මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් යම් පාර්ලිමේන්තු ආසනයකට තේරී පත් වුණාද ඔහුගේ හෝ ඇගේ ඇවෑමෙන් ඔහුගේ හෝ ඇගේ උරුමක්කාරයින් පොල්මෑකාරයින් ඒ ආසනවලට පත් විය යුතුය" කියල තුනෙන් දෙකෙන් පාස් කර ගත්තම ඉවරයි. ඒ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව. අද හයෙන් පහක නොවෙයි හයෙන් හයක බලයක් තිබුණත්, මුළු මන්ත්‍රී මණ්ඩලයම එකතු වුණත්, කථානායකතුමාත් එකතු වුණත්, අපේ නිල කාලය දික් කර නවාය කියල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම අපි මෙතැන සම්මත කළත්, ඒක වලංගු නැහැ. ඕනැම කෙනෙකුට ඒ ගැන උසාවියට යන්නට පුළුවනි.

දැන් වෙන්නෙ මොකක්ද? මම ඒ නීතිය—ඒ සංශෝධනය—මේ සභාවට ඉදිරිපත් කළාම ඒකට තුනෙන් දෙකක ඡන්දයක් ගන්නට ඕනැ. හිටපු මන්ත්‍රී සංඛ්‍යාවෙන් නොවෙයි මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක ඡන්දයක් ගන්නට ඕනැ. ඒක සම්මත වුණාම තමුන්නාන්සේට සිද්ධ වෙයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඒක ජනාධිපතිතුමාට යවන්නට. ජනාධිපතිතුමාට සිද්ධ වෙයි ජනමත විචාරණයක් කරන්නටය කියල ජනතාවගෙන් අහන්නය කියල, මැතිවරණ කොමසාරිස්ට නියෝගයක් කරන්නට. ජනතාවගෙන් අහනවා මේ පාර්ලිමේන්තුව තව අවුරුදු හයකට දික් කරන්නට කැමතිද කියල. ජනතාවයි කියන්නෙ. අන්න වෙනස. යම් දිඩියකින් ජනාධිපතිතුමාට මේ ජයග්‍රහණයම ආසන සියයකින් පමණ ලැබුණා නම්, එහෙම නම් එහෙම ජනතාවගෙන් අහන එක වැරදියි ,කියල මම කියනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙම නම් හයෙන් පහක බලයක් තිබෙන මේ පාර්ලිමේන්තුව තව අවුරුදු 6 ක් ගෙන යන්න අනුමැතිය ඉල්ලන එකක් වැරදියි. එහෙම නම් දෙන එකකුත් නැහැ. නමුත් මේ ජනාපතිවරණයේදී ජනාධිපතිතුමාට ආසන 139 කින් කැමැත්ත දුන්නා, වැඩි ඡන්දයෙන්. නමුත් ඒ නිසාමත් අපි පාර්ලිමේන්තුවේ කාලය දික් කර ගත්තේ නැහැ. ඒ සඳහාත් අපි ඡන්දයකට යනවා, අර මැතිවරණ නීති—රීති අනුවම. කොච්චර ප්‍රජා උරුමය නැති වුණත් බණ්ඩාරනායක මහත්මියටත් පුළුවන් ඇවිල්ල මේකට විරුද්ධව ක්‍රියා කරන්න. මම එතුමියට ආරාධනා කරනවා, 'මේ වරම දෙන්න එපා, පෝච්චියට දාපන්' යයි ජනතාවට කියන්නය කියා. මේකට විරුද්ධ පක්ෂ ඉන්නවා නම් ඒ ඔක්කොම එකට එකතු වෙලා එන්න.

We are prepared to take that challenge. We have trust in our people. I know what the decision is going to be.

මම කියන දේ ලියල තියා ගන්න. ඔක්තෝබර් 20 වැනි දා අපට ලැබුණු ඡන්ද ප්‍රමාණයට වැඩිය එකක් හරි ලබා අපි ජයග්‍රහණය කරනවා. අනෙකුත් මැති ඇමතිවරුන් වගේම මමත් රට පුරාම ගියා. අපට තේරුණා, ජන මතය. ඒකයි, මම පුන—පුනා මේ රටේ ජනතාවට මගේ කෘතඥතාව පිරිනමින්නේ.

කථානායකතුමනි, මේ රටේ හුඟක්ම අමාරුවෙන් ඉන්න කොටස ආණ්ඩුවේ සේවකයෝ බව තමුන්නාන්සේත් දන්නවා. සීමාසහිත පඩියකුයි, ඒ පිරිස ගන්නේ. නමුත් බලන්න තැපැල් ඡන්ද දිහා. අඩුම ගණනේ අපට ලැබුණා 65% ක්වත්, ඒ තැපැල් ඡන්ද වලින්. මැද කොළඹ ආසනයේ ඊට වඩා විශිෂ්ඨ ගණනක් ලැබුණා. හමුදාවල ඉන්න අය, පොලීසියේ ඉන්න අය, සහ වෙනත් ක්ෂේත්‍රවලත් ඉන්න රජයේ සේවකයෝ තමයි, ඒ තැපැල් ඡන්ද දුන්නේ. ඔවුන්ට තමයි, හුඟක්ම අමාරුකම් තිබෙන්නේ. අපි දන්නවා, ඒ බව. සීමාසහිත පඩියක් ගන්නා ඒ උදවියට කරන්න පුළුවන් ලොකුම දේ අපි කරනවා. දැනටමත් ඔවුන්ගේ පඩිනඩි තුන් වාරයක්ම වැඩි කර තිබෙනවා. ගිය ආණ්ඩුවෙන් නතර කර තිබුණු 'පෙන්ෂන්' එකත් අපි නැවත ලබා දුන්නා.

past him. He was fast asleep. No provision was made even for people to rest. Counting agents in my area could not even get any meals, because the Veyangoda boutiques were closed. I wanted to find out where the postal count was taking place and I went into the room where the Returning Officer was. I must say, he was busy on the telephone. In fact, he had two telephones. He was speaking and I was waiting till he finished speaking to find out where I should send my counting agent for the postal count. There were a large amount of government officials who are Senior Assistant Secretaries and Heads of Departments in Colombo, all seated. The room was full. I was standing and waiting because this gentleman was on two telephones. I know many of them. They all looked at me. Some of them did not even recognise me. I very humbly smiled at them, Mr. Speaker. Not a single chair was offered to me. It did not matter to me, though, in fact, Paththalagedera Training School comes under my Ministry. Generally as a matter of courtesy a Minister or Member of Parliament or even an ex-Minister, if he was there, should be offered a seat, I think. No, some of them could not even recognise me. Anyway, when Mr. Rodrigo finished his conversation, I found out where the centre for the count was and I sent my counting agent there. The people in charge of the hostel, Mr. Suriyapperuma and the matron, Mrs. Suriyapperuma, were good enough to accommodate the District Minister and me in their quarters. Of course, by about 1 o'clock, when it was known that the UNP was leading, Mr. Speaker, these same officials were congratulating me and some of those who did not even recognise me earlier were not only shaking my right hand, but some of them were shaking even my left hand on which I had an injury. I had to put my left hand in my pocket to save my hand from getting injured further. I do not blame them. This is the way people act during election time. But this was the mood that was going on in this country. In Homagama I just checked from the Minister of Agriculture–I heard it from an official who was working in my Ministry, the S.P., Mr. Gamini Perera, was taking orders from Yasaratne Amaratunga. This is the way. [ *Interruption.* ] Yes the same Gamini Perera from Balangoda to whom we gave a promotion. I mean taking orders. Take it from the I.G.P. This is what happened. People thought the UNP was going to lose. Some of our voters went to the polls wearing white. And there was a justification for the fear of violence, because violence had been planned long before; preached and planned by the Hector-Actor group. I heard on the 14th, from people who were very close, who had contacts with these groups, that violence was going to break out, and it was openly mentioned that the Second Member for Nuwara Eliya-Maskeliya was one of those who was in the list. I must say that for the first time I found that he and I were put in the same list for elimination. Generally we are in opposing camps in many respects, but this is what was taking place in the country. Among their circle the talk was going on that though in fact they were telling that the SLFP had been asked to vote for Mr. Kobbekaduwa to restore the civic rights of Mrs. Bandaranaike, privately they were talking of not restoring it and that there was a deal on between the Maithri group and Mr. Kobbekaduwa's group not to restore the civic rights of Mrs. Bandaranaike–(*Interruption*). I am telling you of the talk that was going on. That is why I said that there was a talk. But I know of one thing that a leading member of that group–not your group but of the Hector-Actor group–made a very obscene remark about what Mrs. Bandaranaike can do with her civic right. I will not mention it in this House. Because I heard it I want to say. The remark about what she could do with it was made by one of the leading members of that group. These are what I have heard and I take responsibility for what I utter here–(*Interruption*). The person who uttered it is our friend. See what they have been talking! They have been telling something else to the country.

Then subsequently on the night of the 20th there was a meeting held at Aloe Avenue at the residence of Mr. Kobbekaduwa because they by then were sure of victory. They said at every meeting held on the 17th there was a larger crowd than the two UNP meetings in Colombo. They were sure of victory. They had even divided up the posts, and on the 20th night there was a meeting. What they planned and implemented was going to be a violent take over after the polls. If we lost we would have certainly handed over our resignation and gone. We were not going to stay. After having won we have handed over our letter of resignation to the President. Do you think we would have waited here if we had lost? Some members from the SLFP may have had aspirations of becoming chairmen by a peaceful process, that sort of thing we do not mind even if they happen to be government officials because the change over must be peaceful. But what was planned was a violent take over.

In villages the houses of our supporters were noted though they were the same people who protected the SLFPers from violence in 1977. Estates were to be taken over. They were going to jump into factories. This is the information that is coming from members and the general public, and this is one thing I propose that the Government should investigate. We should not let go of this. All those who planned violence, of post election violence, should be prosecuted and dealt with. If a man has an aspiration and the SLFP is willing, and after someone becoming a Minister he makes him a Chairman, yes, that is quite legal. You can aspire to that, but not violence. You must stop this once and for all. Just having an enmergency alone is not enough. Those who planned should be dealt with and that is what I would advocate. They were planning a very violent take over of the country. There were discussions. The hon. Member for Attanagalla (Mr. Lukshman Jayakody) is not here but I would like to say that the Hector-Actor group suspected the bona fides of the hon. Member for

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රංජිත් විජේරත්න මහතා]

Attanagalla. He was marked as someone who should not be relied upon. Marked for elimination among others was the second Member for Nuwara Eliya-Maskeliya, the Rajapaksas and some other members of the SLFP. There were discussions as to what whould be done. There were many groups present including Dr. Mackie Ratwatte and the Vijaya Kumaratunga group. I think Dr. Ratwatte suggested that there should be no Ministers, that there should be only Secretaries appointed by the new President, Kobekaduwa. It was suggested by the Kumaratunga group that the hon. Member for Medawachchiya should become the Prime Minister and take over as Prime Minister. This was going to take place even before the Gazette was issued when they were sure of victory. After the election, of course, the plan was that the actor should be the Prime Minister. Anil Munasinghe should be the Minister of Finance. Mr. Udaya Nanayakkara was to be the Chairman of Air Lanka. Mr. M. D. Fernando formerly of the army was to be the Commander of the army. Prasanna Dahanayake was to be the Secretary, Defence. Harry Gunatilleke, former Commander of the Air Force, was to be the Co-ordinating Secretary to the Ministry of Defence, replacing Gen. Attygalle. The Air Force and Navy Commanders were also to be replaced as was the I.G.P. On a report given by former Air Vice-Marshal, Mr. Harry Gunatillake, to Mr. Anurudha Ratwatte, a few months ago, many of the pilots of the Air Force were deemed to be unreliable and all the fixed wing formations as well as the choppers were to be grounded and a team of people were to be asked to remove certain parts so that the planes could not fly and could not be made use of against Kobbekaduwa's Government. Five units of the army were to be confined to barracks and a decision was to be taken whether they are to be disarmed. Similarly, many units of the Navy were regarded as being pro-U.N.P. and they were to be confined to the barracks until a future decision was to be taken. In this meantime, the party supporters and party cadres were to take over the country and certain police officers were in touch with them to ensure the breakdown of law and order. The cadres of the Communist Party especially–there were some members–who had been urging that arms should be taken away from the unreliable units and handed over to the trade unions for the purpose of arming the workers and the peasants. This was what was going to take place. Certainly, all of them were to be locked up under the Prevention of Terrorism Law. In order to safeguard the independence of the press, the Independent Newspaper Group was to be demolished and a young journalist who was suspected of being Migara was going to be dealt with in a very unsavoury fashion, more reminiscent of the times of the Sinhalese Kings, as described by Robert Knox in his books about his travels in Sri Lanka. Mr. Ratnaweera of the Communist Party was to be in charge of Lake House as its Chairman, which even the Janadina mentioned, and was to be the overall co-ordinator of the mass media in this country. These are some of the things which had been planned. Many corporations were to be taken over violently and many members of the SLFP who did not agree with them were going to be eliminated and pushed out and amongst them was Mr. T. B. Illangaratne who had in fact helped Mr. Kobbekaduwa to be the Presidential Candidate of the SLFP. The judiciary was to be replaced with Mr. V. W. Kularatne as the Chief Justice. Hector and actor had got a proctor. The doctor of course is Dr. Neville Fernando.–(*Interruption*)–They had planned for an Attorney-General also to take over. Then the State Film Corporation was to ensure that none of the actors and actresses who campaigned sgainst Mr. Hector Kobbekaduwa was going to have any future in the film world. I wonder what will happen if we do the same thing to those who campaigned against His Excellency the President.

Their plan as far as Mrs. Bandaranaike was concerned was this. Although they promised publicly to restore to her civic rights and to make her the leader they were not going to do it. She was going to be isolated. A part of the SLFP was going to be eliminated completely, was going to be done away with. Further, their plan was to storm the President's House, the house of the Prime Minister and other Ministers–I was the only fortunate one because I have no house–and to install Kobbekaduwa's Government. They discussed when they should install Mr. Kobbekaduwa as President and Mr. U. L. M. Farook who was there suggested that they must wait till the Gazette is out and Mr. Kumaratunga has said " What Gazette do we want ? We are going to tear this Constitution. We are going to get in and we are going to shoot the President". If this information got out on the 20th to our supporters even the United States Army could not have stopped the massacre that would have taken place in this country. Fortunately, we kept this information to ourselves, but I think the country is entitled to know of what at least was going to be done. Many Members of Parliament were to be exterminated. The only consolation is that some of us would have been among SLFP Members and would have walked together. This was what they were going to do.

Mr. Speaker, I do not know whether you would have been there to be addressed or whether someone else would have been put there instead. I suppose you would have got a Muslim burial, that is within 24 hours. All this was not necessary and as I said earlier if they won we would have handed over. Why do we want to hang on ? Why penalize the Government Officers who carried out instructions ? Then many people made their own lists in their areas.

In Corporations, political appointments such as those of Chairman would not have varied very much if this Government had changed, but they were goint to do away with many efficient officials in the Corporations

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

who had just carried out the instructions, who had even served the previous administration. We must take notice of this and inquire into this. Certainly, people campaigning to defeat the Government democratically, we do not mind. People having aspirations of taking over high posts after we lose in a non-violent change over, we do not mind. But not by violence like this. This is not given by the Constitution. How can we allow people to contest these elections when they talk of tearing the Constitution ? Was is not condoned by the Communist Party ? Was it not condoned by the hon. Member for Medawachchiya, though he says now that he was against violence ? What did he do when Hector Kobbekadduwa and Vijaya Kumaratunga said they were going to tear up this Constitution ? Those who condoned that should not sit in this House as Members of this House. We have taken an oath to uphold this Constitution. Silence should be taken as consent. Did you in fact dissent from it ? Kindly tell us about this. Why was this violence planned ? I mean, we would have handed over if the people wanted us to do so. It would have been their verdict that Mrs. Bandaranaike should also get her civic rights back, if we lost. That would have been the people's verdict which we would have followed. But they were not even going to do that. What was planned was a violent take over, which would have eliminated the leadership of the United National Party up to grassroot level and a section of the leadership of the SLFP which was capable of independent action. We may not agree with them.

I certainly do not agree with them. I know the harm that I have suffered under them. That is another matter. I think Mrs. Bandaranaike has been punished for some wrong which she did. But that does not mean that she or the hon. Second Member for Nuwara Eliya-Maskeliya (Mr. Anura Bandaranaike) or any one else should be killed. If the people want them back and they want to eat grass istead of rice, that is their wish which we must bow to. But what happened ? What was planned was a violent take over, the elimination of the UNP by force. They were being told that they were the people who did away with Mrs. Bandaranaike and then opponents were being roused up by ' The Dinakara ' and ' The Aththa '. I make this specific charge. So they will abuse me in the papers tomorrow. That is their game, but we also know how to deal with these matters now. The people are being roused up. They would have exterminated the leadership of the UNP down to the grassroots. Then what would come in is not what is called the leadership of the SLFP. That section of the leadership of the SLFP including the MP for Attanagalla (Mr. Lakshman Jayakody) would have been disposed of already. Only the ' Hector-Actor Group ' would have been in that. They cannot run the country. Behind it there would have been the Communist Party ready to take over this country. They were trying to do what they were doing in Afghanistan and other places. Eliminate the total anti-communist leadership, allow chaos to take place and then take over. Now they are silent and they will deny it. But that is what they planned. I say so on the Floor of this House, on the evidence this Government has got. Complete elimination of the leadership of two Parties. The TULF would have counted for nothing in that. A little bit of violence is unleashed on the Tamil speaking people of the area, and that is the end of it. What more ! Who was one of the brains behind this ? K. P. Silva of the Communist Party. They were waiting for this take over. Because there was a dilemma in the Communist Party whether they should remain as an Independent Left Group together with the LSSP and go on from there or whether they should join with the LSSP and get into the SLFP but some are against it because the association with Mrs. Bandaranaike will make them go down further. But with the situation which arose in the SLFP with different factions fighting, Mrs. Bandaranaike being moved out and the Kobbekadduwa faction taking over the Party, they saw an opportunity of taking over the Party which was not available earlier. That is why they went in, deserting Dr. Colvin R. de Silva to whom they had promised their support just two weeks before, and that is why they do not want to summon their main assembly to discuss this. This was what was planned by the Communist Party. They put forward the hon. Member for Kalawana (Mr. Sarath Muttetuwegama) as their very civilized mouthpiece. Certainly, I know he himself was not very happy about joining with the LSSP and he would do his defence now, but he would have been very unhappy of what he had to do, in getting away from the LSSP. But this was what was planned by the Communist Party and this is what I think the country should know. For it is the very same people who will now get up and say we are going to impose a dictatorship in the country, that we are going to do away with elections. We are not going to do away with elections. We do not want a dictatorship in the country. We are only asking the people of this country. Since you gave a mandate to His Excellency the President to continue for six years, would you like to give the same mandate to the UNP Parliament which you elected in 1977 to continue to finish this work ?"

I certainly as an individual do not think that people who preach violence should be allowed to come into Parliament. Their views on economic questions, on social questions and educational questions can be far different from ours. But they must not use violence. That is what we are against. I think the country should know about this. They will talk of our trying to establish a dictatorship. We are not going to establish a dictatorship. We are going before the people and asking the people to use their vote and decide whether they should give us a mandate to carry on the work with His Excellency for the future, and His Excellency had given the assurance that he will remove any Member whom he feels the people of the area are against. No one else has done this beofre. We have voluntarily handed our resignations over to him. We are asking for a mandate to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රනිල් වික්‍රමසිංහ මහතා]

continue the economic, the social, and the political policies of this Government. We have seen from the results of the presidential election that the people wants us to go ahead. They have given His Excellency a mandate and said, "Go ahead and finish the job". And now we are asking him to finish the job. The people of this country can decide to give him the team that he deserves, and that too the people of this country can decide. We are not imposing it ourselves. No other Government in this world would have done this except the United National Party. The last government extended their term without consulting the people. We have not done so. Remember, in fact, in spite of this referendum, in spite of winning it, there will be Development Council elections, there will be local authority elections and there will be more elections in time to come with more bodies having elected members than before. That system is not being done away with. But we should tell the people what took place and I think we should also ask them for a mandate to continue in the future.

I would like to commend His Excellency for his wise decision of having imposed emergency to prevent violence. Some of those whom we are safeguarding today do not derserve that protection. But we do it because we are committed to safeguarding law and order in the country. Whatever may be our personal views, we will give them that protection. If necessary, we will hide them even in our houses though they have threatened to kill us and do away with us.

I do not want to take any more of the time of hon. Members of this House, and I thank them for giving me this hearing.

එම්. හලීම් ඉෂාක් මහතා (මැද කොළඹ තුන්වන)
(ஜனாப் எம். ஹலீம் இஷாக் — கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)
(Mr. M. Haleem Ishak—Third Colombo Central)

Mr. Speaker, Sir, I do not wish to make a lengthy speech on a historical occasion like today when every Member of the government has resigned from his Seat and handed over his resignation in the democracy of the dharmista government.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. ரணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

Will you resign from Colombo Central ?

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஷாக்)
(Mr. M. Haleem Ishak)

I am the elected Member for Colombo Central and I have not resigned. (*Interruption*). I am the elected Member for Colombo Central. Only the people can defeat me, but not the democracy of the United National Party in which you were compelled this morning to hand over your letter of resignation to the President of the party.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

No, No!

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஷாக்)
(Mr. M. Haleem Ishak)

And also, Sir, today may be the last day that we meet some of ourt Colleagues whom we see in this House. So it is a historical day and also a sad day.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Why ? Why ?

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஷாக்)
(Mr. M. Haleem Ishak)

That you should know yourself. (*Interruption*) As the hon. Member for Medawachchiya (Mr. Maithripala Senanayake) said, we agree with the decision of the government in declaring emergency. The Hon. Prime Minister and the Minister of Education spoke of violence that was planned by the SLFP presidential candidate, Mr. Hector Kobbekaduwa. I am not aware of this. I do not know whether this story has been planted to discredit Mr. Kobbekaduwa and his supporters. But there are a few matters that I would like to raise on the floor of this House. That is, with regard to certain incidents that took place in my own electorate. I was not able to participate fully in the campaign, for more than one reason. For one thing, I was not quite well. But in some way I had to participate, and certain representations have been made to me by some of my constituents.

One matter is, Sir, just after the victory of His Excellency the President, a Boutique at Abdul Hameed Street, bearing No. 52/1 A, which has an Assessment No. and is occupied by a person called Razeek who has been paying rates for the last so many years, has been demolished. You spoke of thugs and hooligans and people who threw bombs or planned to throw bombs. Here I regret very much to state, Sir that the Colombo Municipal Council with the assistance of the Aluthkade Police demolished this permanent building that was standing there for so many years. For one thing, the occupants of that shop by conviction were opposed to the United National Party. I have brought the Assessment Notice and the rates that were paid by this occupant. Today that building is completely demolished and razed to the ground. That is one matter, Sir, regarding constituent of mine.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Then Sir, two shops at Dam Street which have been occupied for so many years have been completely smashed. One was a tea boutique and the other was a tinker's shop.

All this has been done by Municipal employees with the assistance of the Police, and not by thugs or hooligans. I do not know; I was not able to check whether it was the Kobbekaduwa group or–(*Interruption*)–.

Then, Sir, at Gas works Street, there are some very poor vegetable vendors, one by the name of Kularatne and the other by the name of Kalumahattaya, who are really pavement hawkers with many others; their places of business have been completely shattered and thrown out. Many such instances have taken place in Colombo Central. The hon. first Member happens to be the Hon. Prime Minister and also the Hon. Minister of Local Government. I do not know whether he is aware that the Municipality did these things. He could even inspect these premises at Abdul Hamid Street, No. 52/1A, of which I have even brought the assessment notice and receipts to show that rents have been paid. I have given the particulars regarding the Gasworks Street incident, about these poor vegetable vendors, Kularatne and Kalumahattaya and so many others, and even some at the Manning Market who were really on the pavement. Why was this done? It was done for the simple reason that they might have had a photograph of Mr. Hector Kobbekaduwa or they might have had a blue flag flying. Sir, is it reasonable, is it fair or is it dharmishta, to throw these people into the streets, just because they are opposed to the policies of the United National Party by conviction?

Then, I wish to bring to the notice of the Hon. Minister of Transport that at the Bandarawela and Badulla CTB Depots, quite a number of workers are unable to enter the places of work. This was brought to my notice by some very responsible people, and I hope the Hon. Minister of Transport will look into this matter–(*Interruption*)– කරුණාකරල තමුන්නාන්සේ උත්තර දෙන්න බොරුනම්.

In the Nivitigala Electorate a procession of cars, vans and lorries proceeded from Kahawatta to Galwetiwatte Kiranthotaagama Housing Scheme headed by an influential politician in a jeep, but fortunately the police had to intervene and no trouble took place there. Again, at Rakwana Electorate, a person by the name of Ariyadasa, a supporter of the SLFP was taken and nearly assaulted. He was asked to worship the photograph of His Excellency the President and the Hon. Member for Rakwana. There too fortunately, the police had to intervene in this matter and save that poor man. Another instance that took place in the Rakwana Electorate was that a car belonging to a person called Moti was taken by force, and he happened to be an SLFP supporter. Again, the Army and the Police had to intervene and the car was returned. There were many other instances in Rakwana that were brought to my notice. I am happy that the Government is taking a stand to see that these matters are investigated. I do not know who really has spread this rumour and who really is behind this. As the hon. Member for Medawachchiya (Mr. Maithripala Senanayake) said, we as democrats are opposed to any form of violence in this country–(*Interruption*)–May be, but the Communist Party has been contesting Parliamentary Elections from 1947, and I do not think that if they think of contesting a Parliamentary Election, they would think of violence in this country.

Mr. Speaker, the Hon. Minister or Education made an allegation, a charge, against Mr. Kobbekaduwa, that he did not thank his voters. But, I read a statement in the English newspaper where he had thanked his voters. Then, the General Secretary of the Sri Lanka freedom Party, Mr. Ratnasiri Wickramanayake, in his capacity as General Secretary has made a statement to the press thanking all the supporters, every person who suppouted the SLFP.–( *Interruption* )–I read the English newspaper. Sir, the hon. Second Member for Nuwara Eliya-Maskeliya (Mr. Anura Bandaranaike) brings to my notice that it had appeared in the Sinhala newspapers also. Sir, do you think that Mr. Kobbekaduwa who had been a Minister for seven years in the last government, a person of his age, an active lawyer, a Chairman of the Public Service Commission, would have condoned violence in this country? I am sure some group of people have got together to plant this story in the minds of the Government, and the Government has also taken advantage of this story to tell the people that this is a violent section that asked for a mandate from the people to rule this country.

I do not wish to take much more time. I hope the Hon. Prime Minister will inquire into these matters where the Municipality itself used Municipal vehicles for demolishing this building and throwing out those poor hawkers in Gasworks street and Manning Market. I also hope that the Hon. Minister of Transport will take necessary action about the Budulla and Bandarawela depots.

Thank you. Mr. Speaker.

අ. භා. 8.35

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)**

*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி — கொழும்பு மாவட்ட அமைச்சர்)*

(Mr. Weerasinghe Mallimaratchi—District Minister, Colombo)

ගරු කථානායකතුමනි, මෙම විවාදයට සම්බන්ධ වන අතරම මම පළමුවෙන්ම එක් ඉල්ලීමක් කරන්න කැම තියි. එනම් මෙම විවාදයෙන් අද මේ කාරණය අවසන් නොකර මම ගරු අගමැතිතුමාගෙනුත්, ගරු ජනාධිපති



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

තුමාගෙනුත් ඉල්ලනවා මෙම ජනාධිපතිවරණය සම්බන්ධව විරුද්ධ පක්ෂය සහ ආණ්ඩු පක්ෂය ක්‍රියා කළ ආකාරය පිළිබඳව සහ කරන ලද යම් යම් වැරදි ක්‍රියා සම්බන්ධයෙන්ද පරීක්ෂා කර බැලීමට යම්කිසි කාරක සභාවක් පත් කරන්නය කියා. එසේ කරනවා නම් මම එය ඉතාමත් අගේකොට සලකනවා. මම ඒ ඉල්ලීම කරන්නේ මම මේ ගරු සභාවට ඡන්දයෙන් පත් වී ආ මන්ත්‍රීවරයෙක් වශයෙන්. මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමාගේ (එම්. හලීම් ඉෂාක් මහතා) කථාවේදී මුලින්ම සඳහන් කළා, සමහර මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුවේ අවසාන වරට කථා කරනවා වෙන්න ඇත කියා. මම එතුමාට සඳහන් කරන්න කැමතියි, සාමාන්‍ය මිනිහෙක් වශයෙන් එක්සත් ජාතික පක්ෂය යටතේ ජීවත් වන එක වැඩිය හොඳයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ ඉඳල මැරෙනවාට වඩා කියා.

ගරු කථානායකතුමනි, මම තමුන්නාන්සේට සඳහන් කරන්න කැමතියි, මේ අවුරුද්දේ මුල සිට මේ රටේ දේශපාලනය සම්බන්ධව කටයුතු කරන සියලුම පක්ෂ දන්නා පරිදි ඉතාමත්ම නින්දිත පහත් ක්‍රියා මාර්ගයක් මේ රටේ දේශපාලනය සම්බන්ධව අනුගමනය කළා නම් මේ මැතිවරණ වර්ෂයේදී එය කෙළේ ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සහ "ඇත්ත" පත්‍රය බව. "ඇත්ත" පත්‍රය මේ ජනවාරි මාසෙ සිටම පටන්ගත්තේ මොකක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ භේද ඇති කර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් බණ්ඩාරනායක මැතිණිය කොහොම හෝ ඉවත් කරලා පැත්තකින් තබා කිසිම බලයකට පත් වන්නට බැරි පඹයෙක් වාගේ පුද්ගලයෙක්, නිවට නියාළු පුද්ගලයෙක්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරියට අරගෙන ඒ පුද්ගලයාට ආධාර කර ඔවුන්ගේ බලය මේ රටේ තහවුරු කර කොමියුනිස්ට් රජයක් පිහිටුවා ගැනීමේ ව්‍යාපාරයක් දියත් කිරීමයි.

කොමියුනිස්ට් පක්ෂය ජනවාරි මාසයේ සිටම ක්‍රියා කෙළේ ඒ අනුවයි. පළමුවෙන්ම කෙළේ මොකක්ද? මේ ගරු සභාවේ, කැබිනට් ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට නොයෙක් අන්දමේ දෝෂාරෝපණ බොරු චෝදනා එල්ල කරන්නට පටන් ගත්තා. ඊළඟට මම අහන්න කැමතියි, මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාගෙන් (මෛත්‍රීපාල සේනානායක මහතා) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මේ රටේ මැයි දින රැළි පවත්වනවා එතුමාට මතකද කියා. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මොන ආධාරයද කෙළේ ලංකා කොමියුනිස්ට් පක්ෂය? එදා බණ්ඩාරනායක මැතිණියගේ වේදිකාවට ආවෙ නැහැ ලංකා කොමියුනිස්ට් පක්ෂය. කිසිම ආධාරයක් දුන්නෙත් නැහැ. එකතු වෙන්න බැහැ කිව්වා. අද බණ්ඩාරනායක මැතිණිය අයින් කර දමා කොබ්බෑකඩුව වාගේ දේශපාලන වශයෙන් අවුරුදු පහක් පමණක් පාර්ලිමේන්තුවේ හිටිය, බණ්ඩාරනායක මහත්මයා තමන් ළඟට නොගත්, උග්‍ර මාක්ස්වාදියෙක් වන මේ පුද්ගලයාව ඉදිරියට ගෙනිච්චෙ මොන හේතුවක් නිසාද කියා මට වඩා හොඳින් තමුන්නාන්සේට අවබෝධ වෙනවා ඇති.

ඊට ආධාර උපකාර කෙළේ කවුද? බණ්ඩාරනායක මැතිණියට හොරෙන්—මම කියනවා ඒ ගොල්ලන්ට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන්, දිසා ඇමතිවරයෙක් වශයෙන්—බණ්ඩාරනායක මැතිණියටත් හොරෙන් කොබ්බෑකඩුවට නාම යෝජනා දී කුමන්ත්‍රණයක් මගින් ඉදිරියට ගෙනා බව. බණ්ඩාරනායක මැතිණිය අන්තිම මොහොතේදියි මේක දැනගත්තෙ, ඒ වෙලාවෙ මේක නවත්වන්න පුළුවන්කමක් තිබුණෙ නැහැ. මොකද, ඉතාමත් විශ්වාසදායක පුද්ගලයෙක් වශයෙන් බණ්ඩාරනායක මැතිණිය සැලකුව රත්නසිරි වික්‍රමනායකත් අන්තිම මොහොතේ ඒ පැත්තට හේත්තු වුණු නිසා. ටී. බී. ඉලංගරත්න [බාධාකිරීමක්] මගේ යාළුවා වුණාට මම එයාව දෙවරක් පැරද්දුවා. ඔන නම් එන පාරත් පරද්දලා පෙන්වන්නම්. [බාධා කිරීමක්] තමුන්නාන්සේගේ නායකයා ; තමුන්නාන්සේ දෙකට තුනට නැමිලා වඳින මිනිහා.

ගරු කථානායකතුමනි, මොකක්ද කොබ්බෑකඩුව කොලොන්නාවට ගිහින් කිව්වේ? මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු දෙන්න මම කැමතියි. රැස්වීමේ මූලාසනයේ තබාගෙන වැඳලා කිව්වේ මොකක්ද? "තමුන්නාන්සේ තමයි මගේ දේශපාලන නායකයා" කිව්වා. මෙහෙම කිව්වේ ඉලංගරත්නට කොබ්බෑකඩුව. මෙහෙම මිනිහෙක් තමයි, මේ රටේ ජනාධිපති කරන්නට ගියේ.

ගරු කථානායකතුමනි, "ඇත්ත" පත්‍රය මොකක්ද කළේ? "ඇත්ත" පත්‍රයේ එක්තරා කණ්ඩායමක් සිටිනවා. ඒ කණ්ඩායම පුළුවන් තරම් බලනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දුර්වල කරන්නට. අද මෙතන සිටින නිසා නුවරඑළිය-මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමාට (අනුර බණ්ඩාරනායක මහතා) මම කියන්න කැමතියි, "ඇත්ත" පත්‍රය ගෙන ගිය ව්‍යාපාරය මොකක්ද කියා. සැප්තැම්බර් මාසයේ පළමුවන බදාදා මොකක්ද කිව්වේ?

"ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දෙපිලම පිළිගැනෙයි. ඒත් අංක කාටවත් නෑ"

මැතිණියගෙයි මෛත්‍රීපාල මන්ත්‍රීතුමාගෙයි ඡායාරූප දෙක පළ කර "ඇත්ත" පත්‍රය කළ සම්පූර්ණ බොරුවක් මේක. ඒ එක බොරුවක්. ඊළඟට සැප්තැම්බර් මාසයේ 6 වන බදාදා කිව්වා "විපක්ෂ නැති කරනවා—ජේ. ආර්." කියා. කවදාවත් අපේ ජනාධිපතිතුමා කිව්වේ නැහැ. විරුද්ද පක්ෂ නැති කරනවා කියා. එතුමා කිව්වේ මහජනතාවගේ ඡන්ද බලයෙන් විරුද්ධ පක්ෂ නැති කරනවා කියලයි. එතුමා කිව්වේ නැහැ, කඩුවක බලයෙන්වත් බෝම්බයක බලයෙන්වත් තමන්ගේ නිලයෙන් බලයෙන්වත් එය කරනවා කියා. එතුමා කිව්වේ මහජනතාව එය නැති කරයි කියලයි. අද ඒක වුණේ නැද්ද? තිබුණු එකත් නැහැ. කොමියුනිස්ට් පක්ෂයට තිබුණු එකත් නැහැ. එහෙත් කොමියුනිස්ට් පක්ෂයට ඒක පෙනෙන්නේ නැහැ. මම පෙන්වා දෙන්නම්. 1982 ඔක්තෝබර් 20 වැනිදා හෝ 21 වැනිදා කොමියුනිස්ට් පක්ෂයේ පත්‍රයේ මොකක්ද කියන්නේ? මා ළඟ පත්‍රය දැන් නැහැ. සමහර විට ඊයේ පත්‍රයේ වෙන්නත් පුළුවන්. කොහොම වුණත් මේ දවස් කීපය තුළ පත්‍රයක 3 වැනි පිටුවේ තිබුණා "ලංකා සමසමාජ පක්ෂයට බිංදුවයි, අනික් පක්ෂවලටත් බිංදුවයි" කියා. ඒ අයට තිබුණු එකත්—කලවානේ—නැති වූ බව "ඇත්ත" පත්‍රකාරයාට පෙනෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ බිංදුවයි. ඒක තේරෙන්නේ නැහැ. ඒකයි මුලින් පළකරන්න තිබුණේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබුණු එකත් නැති කර ගත් එක. ඒක ගැන කියන්නේ නැහැ. ලංකා සමසමාජ පක්ෂයේ එක් කෙනෙක්වත් නැති බව මේ අවුරුදු පහ තිස්සෙම මුළු රටම දන්නවා.

ඊළඟට, සැප්තැම්බර් 8 වන බදාදා තවත් පත්‍රයක තිබුණා "කොල්වින්-කොබ්බෑකඩුව සාකච්ඡා සතුටු දායකයි" කියා. මොකක්ද මේ ව්‍යාපාරය? බණ්ඩාර නායකලා මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අයින් කිරීමයි. ඒ එකකවත් නැහැ බණ්ඩාරනායක කෙනෙක් ගැන සඳහන් කරලාවත්.

ඊළඟට කියනවා ඇවෙන ප්‍රශ්න ගැන කොමියුනිස්ට් පක්ෂයෙන්. කවුද මේ කථා කරන්නේ? කේ. පී. කේ. පී. කියන්නේ කවුද? කොමියුනිස්ට් පක්ෂයේ ලේකම්. මේ "ඇත්ත" පත්තරකාරයා හිතනවා කේ. පී. කියන මිනිහා එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ සභාපතිටත් වඩා ලොකු මිනිහෙක්ය කියා. නමුත් නගර සභාවේ ග්‍රෑන්ඩ්පාස් කොට්ඨාශයට තරඟ කර කේ. පී. සිල්වාගේ ඇපෙත් නැති වුණා. එවැනි පුද්ගලයෙක් තමයි, මේ පත්‍රයෙන් ලොකු කර මහ ලොකුවට පෙන්වන්නට හදන්නේ. හරියට මහාමේරු පර්වතය වගේ. කළුවට කළුවේ සිටින නිසා පෙන්වන්නට යනවා මහාමේරු පර්තනය වගේ. මෙයා කිව්වොත් හරියට හරි. ලංකාවෙ තිබෙන සියලුම පක්ෂ එක්කාසු කරන්න පුළුවන් කියා හිතනවා.

මට කණගාටු ගරු කථානායකතුමනි, මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා ගැනයි. මා පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයකු වශයෙන් පත් වී ආවේ 1977 දී. එතුමා පාර්ලිමේන්තුවට ආවේ අපි ඉස්කෝලෙ යන කාලයේ. එහෙත් මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාට මම කියන්න කැමතියි, එතුමාගේ දේශපාලනය අවසන් වන්නේ මහජනයා අතර එතුමාට තිබෙන ගෞරවය අන්තිමට නැති වෙලාය කියා, එතුමාගේ ප්‍රතිපත්ති නිසා. මම එය එතුමාට ආදරයෙන් හා කරුණාවෙන් කියන්න කැමතියි. එතුමා අදත් කළේ මොකක්ද? එතුමාට ඉතා ආදරයෙන් කරුණාවෙන් සැලකූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාට එතුමා සැලකුවා නම් මේ වෙලාවේ කොබ්බෑකඩුව මහතාට ආධාර කරන්න එතුමාට පුළුවන්කමක් තිබුණේ නැහැ. උදව් කරන්න තිබුණේ කාටද? බණ්ඩාරනායක මැතිණියටයි. එහෙම නැත්නම් අනුර බණ්ඩාරනායක තරුණයාට උදව් කරන්න තිබුණා. බණ්ඩාරනායක මැතිණිය තරම් මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා ගැන දැනුමක් ඇති වෙන කිසිම කෙනෙක් මේ ලංකාවේ නැති බව මම කියන්න කැමතියි. එතුමිය එතුමාගේ ප්‍රතිපත්ති දන්නා නිසා තමයි කිව්වේ දූන් ඉතින් බඩගාගෙන එයි කියා.

ඇත්තවශයෙන්ම මම දේශපාලන වශයෙන් බණ්ඩාරනායක මැතිණියට සම්පූර්ණයෙන්ම විරුද්ධයි දේශපාලන ප්‍රතිපත්ති අනුව. නමුත් මම එතුමියට ගරු කරන්න කැමතියි ඒ කීමට. කාන්තාවක් වුනත් තිබුණා හොඳ කොන්දක්, තමුන්නාන්සේට වැඩිය, කියන දේ කෙළින්ම කියන්න. ඊළඟට මොකක්ද කළේ? සැප්තැම්බර් 13 වැනිදා "ඇත්ත" පත්‍රයේ මොකක්ද කියන්නේ? 'ස්ට්‍රයික් කැළොත් සංස්ථා වහනවා.' මේ ප්‍රචාර ගෙන ගිය හැටි! ඊළඟට සැප්තැම්බර් මාසයේ 17 වැනිදා මොකද කියන්නෙ? 'අලියා පෙරළීම හෙටම ඇරඹේ' [බාධා කිරීමක්.] බඩ ගාගෙන තමයි යන්නෙ ආපහු. 1982 සැප්තැම්බර් 25 වැනි සෙනසුරාදා මොකද කියන්නෙ? 'යූඇන්පිය නාය යයි. බුරුතු පිටින් කොබ්බෑකඩුව වටා එක්වෙති'. මේ ඔක්කොම සම්පූර්ණ බොරු කළේ. බුරුතු පිටින් මේ කොහෙද නාය ගියයි කියන්නෙ? නාය ගියයි කියන්නෙ කොහිද? කටාන ආසනයෙ. මොකද වුණේ? කටාන ආසනයත් හොඳට දිනුවා. ගිය පාර දිනුවා වාගේම අපේ විජයපාල මැන්ඩිස් ඇමතිතුමා දිනුවා. ඒ පැත්තෙ නායකයා විජය කුමාරණතුංග—අර ලස්සන ෆේපාටෝ එකක්, කටේ ලිප්ස්ටික් ගාලා බොහොම දිලිසෙනව ෆේපාටෝ එක තොල් දෙකේ ලස්සන කොච්චරද? ලිප්ස්ටික්ම අතුල්ලලා, ඔක්කොම ගෑනු අතුල්ලලා, පිරිමි අතුල්ලලා—ඊළඟට මොකද කියන්නේ සැප්තැම්බර් 29 වැනිදා? "කව්රු කුමක් කීවත්, කළත්, අපි කොබ්බෑකඩුවටයි. මෛත්‍රීපාල යළිත් සහතික වෙයි." ඔන්න ඇල්ලුවා ගිහිල්ලා පන්දම, ආපහු. බඩගාගෙන එනවා කියා මැතිණිය කිව්වාම, මැතිණිය පැත්තක තියලා ගියා කොබ්බෑකඩුව ළඟට.

ගරු කථානායකතුමනි, මේ විධියට දිගටම කියාගෙන යනවා. මේ ජනාධිපතිවරණයේ දී කොබ්බෑකඩුවට දුන්නු සහයෝගය—කොමියුනිස්ට් පක්ෂය—මොන හේතුවක් නිසා දුන්නු සහයෝගයක්දැයි මම දන්නෙ නැහැ. අන්තිමට කියාගෙන ගියා එක එක දේවල්. "සමගි අපේක්ෂක" යයි කිව්වා. මේ සමගි අපේක්ෂක නම් බොහොම ලස්සනයි. කව්ද මේ පොදු අපේක්ෂකයා? සමගි අපේක්ෂක කියා "ඇත්ත" පත්තරේ පුම්බන්න ගිය මනුෂ්‍යයා කොහොමද කියන්නෙ? කව්ද එයාට ඉන්නෙ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එක පැත්තකට කැඩුණු මෛත්‍රීපාල සේනානායක හලීම් ඉෂාක් දෙන්නා. ඊළඟට එක්කෙනෙක් ඉන්නව කොමියුනිස්ට් පක්ෂයේ, අපේ කලවානෙ මන්ත්‍රීතුම. ඊළඟට ධර්මසේකර. ධර්මසේකරගෙ පක්ෂයට තිබෙන්නෙ ධර්මසේකරයි ධර්මසේකරගෙ රැවුල විතරයි, වෙන කිසි දෙයක් නැහැ. ඊළඟට අනිත් එක්කෙනා කව්ද? දිනේෂ් ගුණවර්ධන. එයයි එයාගෙ කිහිලි දෙකේ තිබෙන කෝටු දෙකයි. ඒක තමයි මහජන එක්සත් පෙරමුණ කියන්නෙ. ඇත්ත වශයෙන්ම මට එක වෙලාවකට හිතෙනව ඇත්තටම මේ දිනේෂ් ගුණවර්ධන, පිලිප් ගුණවර්ධනගේ පුතාද කියලා. මේක මම රැස්වීමකදීත් ඇහුවා. මට පුදුමයි, තමන්ගේ පියා අසනීපයෙන් ඉන්න කොට බෙහෙත් ටිකක්වත් ගෙනත් දෙන්න දුන්නෙ නැති, බෙහෙතක් ගන්න ඕනෑ නම් මුල්ලේරියාවේ ඉස්පිරිතාලෙන් මොලේ අමාරුවක් තියෙනවා කියලා ලියුමක් අරන් එන්න කියලා තාත්තාට කිව්ව අයත් එක්ක එකතුවීම ගැන. එයාගෙ පුතා තමයි අද ඔය පක්ෂයට කිහිලි දෙකෙන් ගිහිල්ලා දුන්නෙ ඔය සපෝට් එක, මේ මහජන එක්සත් පෙරමුණ කියලා. ඉතින් මොකද වුණේ මහජන එක්සත් පෙරමුණට?

එපමණක් නොවෙයි, කථානායකතුමනි, ජිනදාස නියතපාල, සිංහල බල මණ්ඩලයේ ප්‍රධාන ලේකම් ඉක්මණට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හේත්තු වුණා. ප්‍රධාන ලේකම්. අපේ පළාත්වලට ඇවිල්ලා මොනවද කිව්වෙ? "හපෝ, මේ වගේ පච්චකාර මිනිස්සු පාර්ලිමේන්තුවට එවන්න මමත් සහයෝගය දුන්නු මිනිහෙක්", මේ නියතපාල කියනවා. "ජේ. ආර්. ජයවර්ධන කව්ද? ඩඩ්ලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

සේනානායක මැතිතුමා බුදුවරයකුට සමානයි". නියත පාලට කොහොමද? ඩඩ්ලි සේනානායක මැතිතුමාට හොඳ ගතිගුණ තිබුණා. එතුමා අවංක නායකයෙක්, මේ රටේ හිටිය අගමැතිවරයෙක්, එතුමාගේ මළ මිනිය පවා වික්ක මිනිහා තමයි ජිනදාස නියතපාල. මළ මිනියත් වික්කා. ඒ විතරක් නොවෙයි, මම කියනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමාට (අනුර බණ්ඩාරනායක මහතා) නමුන්නාන්සේ පරෙස්සම් වෙන්න කියා අනාගතයේදී පවා මේ පුද්ගලයාගෙන්. මේ පුද්ගලයා ගිය හැම තැනකම පරාදෙ තමයි තිබෙන්නේ. මම අහන්න කැමතියි මේ ගරු සභාවේදී මෙයා එක්සත් ජාතික පක්ෂයේ ලේකම් වෙලා ඉන්න තාක් කල් එයාට උඩින් කපුටෙකුටවත් යන්න දුන්නාද කියා. ඒවාගේම එයා කොහොමද ලක්ෂ 36 කට ගෙයක් හැදුවෙ? මම මේ ගරු සභාවේදී කියනවා විභාග කරන්න කියා ඕනෑ නම්.

ඊළඟට මොනවද කෙළේ? අන්තිමට අපි පරාජය වෙලා නැවත සටන ආරම්භ කරන විට තමන් අර ගුරුවරයාය කිව්ව ඩඩ්ලි සේනානායක මැතිතුමාට සිහිවටන ගෙයක් සෑදීම සඳහා කියා මුදල් එකතු කළ වෙලාවේ මමත් අතේ රුපියල් තුන් දහක් බොහෝම අමාරුවෙන් සොයා දුන්නා. මගේ සල්ලි නොවෙයි, මට දෙන්න සල්ලි තිබුණේ නැහැ, කොට්ඨාශයෙන් එකතු කරලයි දුන්නෙ. ඔය විධියට රු. 25,000 ක් 30,000 ක් සුමානෙකට වරක් එකතු කළා. නමුත් තවමත් ඉදි වෙලා තිබෙනවාද ඩඩ්ලි සේනානායක ගුණානුස්මරණ ශාලාවක් කෝච්චේ. මුල්ගල තියන්න මමත් ගියා. දැන් එතන දරමඩුවක් තිබෙනවා. ඔන්න සලකන පුද්ගලයා. දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දිනවින්න කථා කරනවා. නමුන්නාන්සේ මේවා දන්නවා.

ඊළඟට අනික් වීර පුරුෂයා කවුද? මේකයි මම කිව්වෙ මේ සම්බන්ධව විභාගයක් තැබිය යුතුමයි කොමිෂන් සභාවක් පත් කළ යුතුමයි කියා, මේ මැතිවරණයේදී යම් යම් පුද්ගලයන් හැසුරුණු පිළිවෙල ගැන. ඔසී අබේගුණසේකර—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

දැන් ඉතින් හදිස්සි නීතියට එමුද?

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

හදිසි නීතිය නොවෙයි, ගරු කථානායකතුමනි, හදිසි නීතිය හෙට නැත්නම් අනිද්දා අරන් දැවි. හදිසි නීතිය දැමීම නිසා තමයි [බාධා කිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

Order, please! M.P. for Nivitigala (Mr. Gamini Atukorala) I think you are a little boisterous. Order please! may I know what you are muttering there. Please allow the speakers to carry on.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

ගරු කථානායකතුමනි, හදිසි නීතිය හෙට හෝ අනිද්දා ඉවත් කරන්න පුළුවන් දෙයක්. හදිසි නීතියට අමතරව වැදගත් කාරණයක් මේක. මේ රටේ යම් යම් පුද්ගලයන් ක්‍රියා කළ ආකාරය ගැන පරීක්ෂණයක් පැවැත්වීම කළ යුතුමයි කියා මම ඉල්ලනවා. ඒ මොකද යම් විධියකින් කොබ්බෑකඩුව ජනපති වුණා නම් එදාට ඇති විය යුතුව තිබුණ තත්ත්වය සඳහා ඇතැම් අය කටයුතු කර තිබෙන ආකාරය පිළිබඳව විස්තර තිබෙනවා. මම මෙසේ පරීක්ෂණයක් පවත්වන්නය කියා ඉල්ලන්නේ මම පරිස්සම් වෙන්න නොවෙයි. මම තවත් පුද්ගලයෙක් ගැන කියන් නම්. නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) ගැන මම කියන් නම්, එතුමාවත් ආරක්ෂා කිරීම සඳහා.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

ආ එයාට ආදරෙයි වාගෙ.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

කොබ්බෑකඩුව ජනාධිපති වුණා නම් පළමුවෙන්ම ජනාධිපතිතුමා ඉවරයි. ඊළඟට අගමැතිතුමා ඉවරයි. මම ලියල දෙන් නම්. ඊළඟට ඒ එක්කම ඉවර වෙන්නෙ නුවරඑළිය මස්කෙළිය දෙවන මන්ත්‍රී අනුර බණ්ඩාරනායක මහතායි. මම දන්න නිසයි කියන්නෙ. මේ ගොල්ලන්ගේ කණ්ඩායමට එකතු වුන තවත් චන්ඩියෙක් තමයි ඔසී අබේගුණසේකර. කැලණියේ අපේ මේ ඇමතිතුමාව පරද්දන්න වීර පුරුෂයෙක් වෙලා හාල් පොත හොරකම් කරගෙන තවත් කෙනෙක් එක්ක එකතු වී මුද්‍රණය කළ මිනිහා.

ගරු කථානායකතුමනි, මේ හොරකම කියන එක, එක පාරටම කරන්න පුළුවන් එකක් නොවෙයි. ඒක පරම්පරාවෙන් එන එකක්. පරම්පරාවෙන් එන්න ඕනෑ. මේ "ඇත්ත" පත්‍රයේ කතෘට මට මතක් කර දෙන්න කැමතියි, කවුද ඔසී අබේගුණසේකර කියන්නෙ කියා. ඔසී අබේගුණසේකර කියන්නේ කොටහේනේ බිංදුවගෙ පුතා. කොටහේනේ බිංදුවා කියන්නේ කොමියුනිස්ට් පක්ෂයේ ඒ ගොල්ලන්ගේ නායකයා වෙලා තවමත් ඉන්න ලෙම් හැලී ඉන්න පීටර් කේනමන් පැරද්දූ—

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

එක්සත් ජාතික පක්ෂයේ නාගරික මන්ත්‍රීවරයෙක්.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

ඒක කියන්න තමයි මම එන්නෙ. ඉන්න කලබල වෙන්නෙ නැතුව. එක්සත් ජාතික පක්ෂයෙන් එයාට නාම යෝජනා දුන්නෙ. එක්සත් ජාතික පක්ෂයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එයා පත් වුනේ. එක්සත් ජාතික පක්ෂයෙන් නාම යෝජනා දෙන කොටත් පත් වෙන කොටත් එයා බොහෝම හොඳ මිනිහෙක් හැටියට අපේ හැඟීමක් තිබුණේ. අපි ඒක දැනගෙන හිටියේ නැහැ. අපිට ඒක කියා දුන්නෙ කවුද? තමුන්නාන්සේලාගේ මිත්‍රයා වන "ඇත්ත" පත්‍රයයි. කොහොමද කිව්වෙ? අහගෙන ඉන්න මම කියලා දෙන්නම්.

එක්සත් ජාතික පක්ෂයෙන් නාගරික මන්ත්‍රීවර යෙක් වෙලා ඉඳලා නාගරික මන්ත්‍රීකමෙන් පැරදුණාට පස්සෙ, අපේ රජය බලයට පත් වුණාට පස්සෙ 1965 දී අපි මෙයාව පත් කළා වරාය සංයුක්ත මණ්ඩලයේ ගරු සභාපති ධුරයට. පත්කර අවුරුද්දක් ලදකක් ගියාට පස්සෙ මෙන්න "ඇත්ත" පත්‍රයේ හෙඩ්ලයින් එකක් යනවා, මේ අබේගුණසේකර කියන්නෙ හොරකම් කර හිරේ ගිය මිනිහෙක් කියා. ඊළඟට අපි මොනවද කළේ? එයාව ඒකෙන් ඉවත් කළා. එපමණක් නොවෙයි මේ මනුෂ්‍යයා කොටහේන පළාතේ සිටි දුප්පත් මනුෂ්‍ය යෙක්. ලැජ්ජාවට කාරණයක් නොවෙයි දුප්පත් වීම. නමුත් ප්‍රශ්නෙ ඒක නොවෙයි, කෙළේ මොකක්ද? අර දිවංගත සුගතදාස ඇමතිතුමාට පිං සිද්ධ වෙන්න මෙයා නගර සභාවෙන් පැරදුණාට පස්සෙ මුස්ලිම් මුදලාලි කෙනෙක් ළඟට—මම හිතන්නෙ නූල් මුදලාලිය කියලයි එයාට කියන්නෙ—මෙයාව යැව්වා. ඒ මුදලාලි ලංකාවෙ සෑහෙන ලොකුම ධනපතියෙක්. ඒ පුද්ගලයාට නැව් පවා තිබුණා. මොන හේතුව නිසාද කියන්න මම දන්නේ නැහැ, උන්නු ගමන් එකපාරටම ඒ නූර් මුදලාලි මැරුණා. මුස්ලිම් මිනී ආදාහනය කරන්නේ පැය 24 ක් ඇතු ළත නොවැ. මැරුණු හැටියේම විගහට ඒ මිනියත් පිච්චු වාය කියලයි මට ආරංචි. මගේ මතකයේ හැටියට එහෙමයි. දැන් මේක අවුරුදු ගණනාවකට ඉහත දී සිදු වුණු දෙයක්. පිච්චුවා, එහෙම නැත්නම් කොහොම හරි ඉක්මණට වැඩය ඉවර කරලා දැම්මා. වැඩය වහලා දැම්මා. වහලා දමලා මාස හයක් යනවිට දෙවියනේ මෙන්න නිකම් හිටිය 'බිංදුවා' කෝටිපතියෙක් වෙලා. ලොරි 18 ක් එකපාරටම ආව. මම මේ ගරු සභාවේ බොරුවක් කියන්න කැමති නැහැ. සම්පූර්ණ සත්‍යය කියන්නේ. මුල ඉඳලා අගට සොයාගෙන ගියොත් කාටද පුළුවන් මේ ලංකාවේ හිටපු ගමන් ලොරි 18 ක් ගන්න. ලොරි 18 ක් කියන්නේ එකක් දෙකක් නොවෙයි. ඊළඟට ඒවාත් දැම්මේ වරායටයි. දමලා ඇදලා ගත්ත සල්ලිවලින් තමයි කෝටිපතියෙක් වුණේ.

ඊළඟට තවත් ලස්සන කාරණයක් වුණා. ඔහොම ඉන්න අතරවාරෙදි මේ සල්ලිත් ඇවිල්ලා, ලොරිත් ඇවිල්ලා මිනිහා කැළණියේ පදිංචියට ගියා. කැළණියේ ගෝනවල පදිංචියට ගියා. පදිංචියට ගිහින් ලොකු ඉඩ මක් කාරිය අරගෙන එතන ඉන්න කාලෙදි හදිසියේ අබයගුණසේකර මහත්මයා ඉන්දියාවට යද්දී ඒ ගිය අහස් යානය කඩා වැටිලා පිච්චිලා මැරුණාය කියා ආරංචි වුණා. නමුත් ලැයිස්තුවේ අබයගුණසේකර කෙනෙක් නැහැ. මිනිස්සු හොයනවා, හොයනවා, නමුත් අබයගුණ සේකර කෙනෙක් නැහැ. බලනකොට මෙන්න දෙවියනේ 'ඛාන්' ද මොකක්ද කියල මරක්කල නමකින් මිනිහා ගිහින් තිබෙන්නේ. එකපාරටම අබයගුණසේකර 'ඛාන්' වෙලා. ගරු කථානායකතුමනි, එතනත් වංචාවක්ද, හොරකමක්ද කරන්න බොරු නමකිනුයි ඒ වාහනය යට ඇතුළු වෙලා තිබෙන්නේ. ඒක කඩාගෙන වැටුනා. වැටිලා මැරුණා. අන්න ඒ මිනිහාගේ පුතා තමයි මේ අද චන්ඩියා වෙලා, වීරය වෙලා මස්කෙළියේ දෙවන ගරු මන්ත්‍රීතුමාගේ (අනුර බණ්ඩාරනායක මහතා) මවං එක්ක දකුණු අත වගේ ඉඳගෙන පිස් තෝල, කඩු, බයිනෙත්තු, කිරිච්චි අරගෙන මේ යන්නේ ඔන්න පුද්ගලයා. මේ ගොල්ලන් තමයි කොබ්බෑකඩුව මේ රටේ ජනාධිපති වෙන්න ඡන්දය ඉල්ලන්නේ. මේ වාගේ වගකීමක් භාර ගන්න බැරි, අතීතයක් නැති, අනාගතයක් නැති මිනිස්සුයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්නේ. ඒ නිසයි නුවරඑළිය-මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලා සිටින්නේ; මේ රටට ආදර යක් තිබෙනවා නම් තමුන්නාන්සේගේ දිවංගත පියා ටත් ආදරයක් තිබෙනවා නම්, තමුන්නාන්සේගේ මවට ආදරයක් තිබෙනවා නම් මේ අසික්ෂිතයින් වහාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නෙරපාදමා ඔය පක්ෂය ප්‍රජා තන්ත්‍රවාදී පක්ෂයක් බවට හරවන්නය කියා.

මම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක සිටින නිසා ආණ්ඩු පක්ෂයක් වගේම විරුද්ධ පක්ෂයකුත් අපට තිබිය යුතු බව මම පිළිගන්නවා. නමුත් ඒ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ යක් විය යුතුයි. අද මොකක්ද තමුන්නාන්සේලාගේ පක්ෂයට වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේ කොහොම ඔතන ඉන්නවාද මම නම් දන්නේ නැහැ. තමුන්නාන්සේගේ කථාවේදී සාම කලාපයක් ගැන කීවා. තමුන්නාන්සේට ඔය තත්ත්වයෙන් ඉන්න පුදුම ශක්තියක් තිබෙන්නට ඕනෑ බව මම මේ අවස්ථාවේදී කියන්නට කැමතියි. තමුන්නාන්සේගේ ඔය ඉදීම මට නම් හරිම පුදුමයි.

ගරු කථානායකතුමනි, මැදවච්චියේ ගරු මන්ත්‍රී තුමාත් (මෛත්‍රීපාල සේනානායක මහතා) මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමාත් (එම්. හලීම් ඉෂාක් මහතා) කඩ දෙකකට ගැහුවාය කිව්වා. බස් පාරේ ගියාය කිව්වා. තවත් කාටදෝ ගැහුවාය කිව්වා. මේවා පටන් ගත්තේ කොහෙන්ද? අපේ හුඟක් දෙනෙකුට මේවා මතක නැහැ 21 වැනිදා සවස පහට, පහමාරට පමණ 'රොස්මීඩ් ප්ලේස්' එකෙන් මේක ආරම්භ වුණේ. විජය කුමාර තුංගගේ ගෙදරින්. අර අතන වාඩි වී ඉන්න අපේ වත්තල ගරු මන්ත්‍රීතුමා (ජේ. ඒ. ඊ. අමරතුංග මහතා) එදා ඒ පාරේ වාහනයෙන් ආවා. එතුමාට සමන්‍යයෙන් අපට වැඩිය ඇඟපත තිබෙනවා. තුවක්කුවටත්, බෝතල යටත් එතුමාගේ ඇඟ හොඳට පෙනෙනවා. එනකොට මොකද වුණේ? අයි. ආර්. සී. කාරයෝ—වන්ඩි 20 දෙනෙක්—ඉඳල ඔක්කොම එකතුවෙලා ගහල වාහනය කුඩු කළා. එයා පහත්වෙලා, බිඳියාගනයි බේරිලා ආවේ. වැදුනා නම් අද මන්ත්‍රීවරයෙක් මෙතැන නැහැ.

මේක මෙහෙවූ නායකයා කවුද කියා කල්පනා කර බලන්න. ගරු කථානායකතුමනි, සමහරු කථා කරන විට කථා කරනවා කවුද මේක මෙහෙයැවූ අයි. ආර්. සී. කණ්ඩායමේ නායකයා? ලියනෑදුර ධර්මවංශ නොහොත් සුදා. 1977 දී මිනී මැරුමකට හිර ගෙට ගිය පුද්ගලයෙක්. හිරේ හිටිය පුද්ගලයෙක්. ඊළඟට හොරකම්වලට දැන් තලංගම පොලීසියෙන් සොයන පුද්ගලයෙක් සහ නොග වශයෙන් කසිප්පු වෙළඳාම් කරන පුද්ගලයෙක්. අන්න අර රට භාර දෙන්න යන, රාජ්‍ය ඇමති කරන්න යන, ඊළඟට අගමැති කරන්න යන නුවරඑළිය-මස්කෙළිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

දෙවන මන්ත්‍රීතුමාගේ (අනුර බණ්ඩාරනායක මහතා) මස්සිනා වන විජය කුමාරතුංගගේ බොඩිගාඩ්ලාගේ නායකයා.

මෙහෙම මිනිසුන් තබා ගෙනද ජනාධිපතිවරණයට මේ මිනිහා ඡන්දය ඉල්ලන්නේ කියා මම අහන්න කැමතියි. එතනින් මේක පටන් ගත්තේ. පටන්ගෙන ඊළඟට මොකක්ද කළේ ? මේ ගරු මන්ත්‍රීවරුන් සාක්ෂි දරයි හැම ආසනයකම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රසිද්ධ මිනිහෙක් හිටියා නම් ඔහු කළේ මොකක්ද කියන එක ගැන. ගෙය රක්ෂණය කර ගත්තා ; ඉන්ෂුවර් කර ගත්තා ; සමහරවිට ඒ අයම ගෙය කඩා ගත්තා. ඒ ගොල්ලන්ගේම මිනිස්සු දමා වහලට ගස්සවා ගත්තා. මොකටද ? වැඩි මුදලක් ලබා ගන්නට. මගේ ආසනයේත් එවැනි දේවල් වුණා. මම කැමති නැහැ, මගේ ආසනය ගැන කියන්නට. මම දන්නවා පිළිතුරු දෙන පිළිවෙල.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ බුද්ධිමත් දේශපාලනඥයෙක්. අවුරුදු ගණනාවක් දේශපාලන ජීවිතයක් ගත කර, ආසන තරඟ කර, ඒවා දිනාගෙන කථානායක වී සිටින තමුන්නාන්සේ දන්නවා තමුන්නාන්සේගේ පළාතට වුවමනා නැති දේශපාලනඥයෙක් ඇවිත් වලත්ත කථා කිව්වොත් මිනිස්සු කොයි තරම් කුපිත වෙනවාද කියා. මම උදාහරණයක් දෙන්න කැමතියි. මගේ ආසනයේ උයන්වත්තේ ආරියවංශ කියා—මම එයාට හාමුදුරුවෝ කියන්නේ නැහැ—සිවුරු දරා ගත් චීවරධාරී පුද්ගලයෙක් 17 වැනි දා අංගොඩ රැස්වීමේදී කොහොමද ගරු ජනාධිපතිතුමාට කිව්වේ ? පොලීසියේ තිබෙනවා, පටිගත කළ කථාව. කොහොමද කිව්වේ ? ජේ. ආර්. ජයවර්ධන බල්ලාගේ බඩ පළලා බොක්ක අරගෙන මල්ලිමාරච්චිගෙත් බඩ පළලා උගේ බොක්කත් අරගෙන එකට බැඳලා ගඟට දමන්නේ 21 වැනි දා යයි කිව්වා. මුස්ලිම් භක්තිකයෙක් වුණත් තමුන්නාන්සේ කල්පනා කර බලන්න චීවරයක් දරාගත් මෙවැනි පුද්ගලයෙක් පළාතේ රැස්වීමක කථා කර මෙහෙම ආමන්ත්‍රණය කළාම මැතිවරණය ඉවර වීමෙන් පසුව ඒ පළාතේ කලබලයක් සුළුවෙන් හෝ ඇති වුණොත් එයට වගකිය යුත්තේ කවුද කියා. එහෙත් අද වන තුරු ඒ පන්සලටවත් චීවරයක් දරාගත් ඒ පුද්ගලයාටවත් අපෙන් අවහිරයක් වෙලා නැහැ. මම පෙන්වන්න යන්නේ කොතරම් ඉවසිලිවන්තව මේ කටයුත්තේ දී අපි කොතරම් සාධාරණව කටයුතු කර තිබෙනවාද කියන එකයි.

ඊළඟට මම තවත් ප්‍රශ්නයක් අහන්න කැමතියි. හුඟක් සල්ලි හම්බ කර විජය කුමාරතුංගගේ මේ පින්තූර මුද්‍රණය කරන මේ පවුස් කවුද ? කොයින්ද එයාට මේ තරම් මුදල් කන්දරාවක් ලැබුණේ කියා ගරු මුදල් ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න මම කැමතියි. මේවා ගැන අපේ ආදායම් බදු දෙපාර්තමේන්තු විශාල පරීක්ෂණයක් කළ යුතුයි. මේ ජනාධිපතිවරණයේ දී වියදම් කළ මුදල් සම්බන්ධව යම් යම් උදවිය කටයුතු කළ ආකාරය ගැන සොයා බැලිය යුතුයි. ඉදිරියේදී මම ඒ කරුණු ගැන කියන්නට කැමතියි. පවුසිට කොහොමද මේ තරම් මුදල් ආවේ ? අපිත් සමග නගර සභාවේ එකටයි සිටියේ. මම දන්නවා දැනට අවුරුදු 4 කට පමණ කලින් ගුවන් යානයකින් සිංගප්පූරුවේ සිට ආවා. ඔර්ලෝසු බර ගණනක් පටවා ගෙන ඇවිත් ඒවා එයාගේ වාහනයට දමාගෙන ඇවිත් විභාගයකුත් පැවැත්තුවා, ඒ ගෙනා ඔර්ලෝසු ඔක්කොම එයාගේ වාහනයට දමා ගත්තා කියා. ඊළඟට වෙනත් ව්‍යාපාර. මොන මොන ව්‍යාපාර දැන් තිබෙනවාද කියා මම දන්නේ නැහැ. හැබැයි මම එකක් දන්නවා. දැන් මිනිහෙකුට පුළුවන් ඕනෑම බෝරුවක් කර රුවල වවාගෙන නාගුණවැල ගණන් කරන්නට. සැඟවී නොයෙකුත් ව්‍යාපාර කරන පුද්ගලයින්ගේ ලොකුම පිළිවෙළ ඒක තමයි. මෙවැනි පුද්ගලයින් තමයි, අද සුද්ධවන්නයෝ වෙන්න යන්නේ.

එපමණක් නොවෙයි. කොබ්බෑකඩුව මහතාගේ දකුණු අත වගේ ඉඳගෙන මුදල් වියදම් කළ පුද්ගලයෝ කවුද ? එක පුද්ගලයෙක් ගැන මම හොඳට දන්නවා. මේ කොළඹ නගරයේ තිබෙන සුප්‍රසිද්ධ ගණිකා නිවාසයේ—පංචිකාවත්තේ ශාලිමාර් හෝටලයේ—අයිතිකාරයෝ. උපාලි සිල්වා, සුනිල් සිල්වා හා නිමල් සිල්වා. කොච්චර වියදම් කළාද ? ලක්ෂ 7 ක් වියදම් කළ . 31 ශ්‍රී 3926 දරන 504 රතු පාට කාර් එකෙන් තමයි, කොබ්බෑකඩුව ගමන් කළේ. ඒ අය තමයි යාපනයට යන විට අයි. ආර්. සී. කාරයින් අල්ලා ගෙන ගියේ. මේ චන්ඩි අයිය මලෝ තුන් හතර දෙනා තමයි, බොඩි ගාර්ඩ්ලා හැටියට ගමන් කළේ.

එපමණක් නොවෙයි ගරු කථානායකතුමනි, මේ හොරණ ආසනයේ තිබෙනවා ආනන්ද ඉන්ඩස්ට්‍රීස් කියලා තැනක්, එතැන තොප්පි 35,000 ක් මැහුවා, මේ සිල්වාලගේ මස්සිනා. එයා වියදම් කළා ලක්ෂ ගණනක් එතැන. මා අහන්න කැමතියි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද යැපෙන්නේ කොහොමද ? අර හාරිස්පත්තුව දෙවන ගරු මන්ත්‍රීතුමාගේ (ආර්. පී. විජේසිරි මහතා) කථාවේදීත් ඇහුවා, භාණ්ඩාගාරික කෝ කියලා. මොන භාණ්ඩාගාරිකටද මේ සල්ලි ගියේ කියලා නුවරඑළිය-මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමතියි. ඒ වාගේ මුදල්, ඔක්කොම පරිත්‍යාග කළ මුදල් කොබ්බෑකඩුවගේ නෝනා අතටයි දුන්නෙ. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ භාණ්ඩාගාරය කොබ්බෑකඩුව මහත්මයාගේ භාර්යාවද කියලා මම අහන්න කැමතියි, මේ තත්ත්වයෙන් මුදල් වියදම් කළේ ?

එපමණක් නොවෙයි, පිංතූර 50,000 ක් මුද්‍රණය කරලා තිබුණා, 21 වැනිදා හැම තැනම අලවන්න. අපේ ජනාධිපති කොබ්බෑකඩුව කියලා අතකුත් උස්සාගෙන ඉන්න පිංතූරයක්. කව්ද මුද්‍රණය කළේ මේවා ? 50,000 ක් මුද්‍රණය කරලා තිබුණා. එළියට දාන්න පුළුවන් වුණේ නැහැ. ඒ විතරක් නොවෙයි, ඔක්තෝබර් මාසේ 6 වැනිදා ලොකු දේව පූජාවක් පැවැත්වුවා. කොලොන්නාවේ සුප්‍රසිද්ධ ශාස්ත්‍ර කියන හාමුදුරු කෙනෙක් ඉන්නවා, දේශපාලකයෝ හුඟක් එතැනට යනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හුඟ දෙනෙක් මම දැක තිබෙනවා ඒ පාරේ යනවා. ලොකු ලොකු උසස් තනතුරු දරන උදවියත් යනවා. කොපමණ විශ්වාසයක් තිබුණාද කිව්වොත් කොබ්බෑකඩුව දිනන බවට—මේ හාමුදුරුවන්ගේ කීමට—ලොකු දේව පූජාවක් පැවැත්වූවා. මුළු රටටම ප්‍රචාරය කර හැරියා 21 වැනිදා ජනාධිපති වන්නේ කොබ්බෑකඩුව කියලා.

අපේ හැම ආසනයකම, මේ ගරු මන්ත්‍රීවරුන්ගේ හැම ආසනයකම, නොයෙකුත් පච ප්‍රචාර කරලා තිබුණා. මගේ ආසනයේ ඇර තිබුණ ප්‍රචාරය මොකක්ද ? මල්ලිමාරච්චි බඩු ඔක්කොම අස්කරගෙන ගිහිල්ලා කොළඹට පැනලා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුවු හතරක් විතරයි ගෙදර තිබෙන්නෙ කියලා. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ ඉදිරියේ මම කියන්න කැමතියි, මේ රජය යටතේ පමණක් නොවෙයි, පැර දුණත්, දිනුවත්, මොනවා වුනත් මගේ ගෙදරින් නම් මම කවදාවත් හෙල්ලෙන්නෙ නැහැ 'සියඹලා වත්තේ' කොලොන්නාවේ ගෙදරින්. මම කවදාවත් කොළඹ පදිංචි වෙන මිනිහෙක් නොවෙයි.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 'දිනකර' පත්‍රයේ 21 වැනිදායින් පස්සෙ මොකක්ද තිබුණෙ? 30 වැනිද තරුණ බල මණ්ඩලය රැස්වෙයි, ඩාර්ලි පාරේ ප්‍රධාන කාර්යාලයට. කව්ද, කැඳවන්න යන්නෙ? බින්දුවාගේ පුතා, ඔයියා. ඔයි කැඳවන්න යන්නේ මොකටද? නුවරඑළිය-මස්කෙළිය ගරු මන්ත්‍රීතුමාගේ (අනුර බණ්ඩාරනායක මහතා) බෙල්ල කපන්න. වහාම රැස්විය යුතුයි මේ තරුණයාගේ බෙල්ල කපන්න. මොකද තාත්තත් අගමැති, අම්මත් අගමැති. එයාට නොවෙයි, කොහෙන්වත් දත්කුඩ හුරන්න ආ නළුවට තැන දෙන්න. බණ්ඩාරනායක මැතිණිය වෙන්න ඇති—මම දන්නෙ නැහැ. වහාම ඒක තහනම් කළා. නැහැයි කියා කියන්න පුළුවන්ද? මම ඒ මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමතියි. මෙහෙම වුණේ නැද්ද වැඩ?

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, අද සම්පූර්ණයෙන්ම වට කරගෙන ඉන්නෙ ලංකාවේ ඉන්න ප්‍රසිද්ධ කසිප්පුකාරයෝ. කොමිෂන් සභාවක් පත්වුණොත්, මම එකින් එකට දෙන්න කැමතියි නම් ගම්. මගේ කොට්ඨාශයට ඇවිල්ලා වී. බී. ඉලංගරත්න 15 වැනිද සිට 21 වැනිද දක්වා ලක්ෂ 10 කට වැඩිය වියදම් කළා. මේ ගරු සභාවේදී මම ඇත්ත ප්‍රකාශ කරන්නෙ ගරු කථානායකතුමනි. පළාතේ ඉන්න කසිප්පු කාරයෝ ඔක්කොම අල්ලාගත්තා. මාස එකහමාරක් පමණ බලලා බලලා කසිප්පුකාරයෝ ඔක්කොම අල්ලා ගත්තා. ඒ අයට තුවක්කු බෙදුවා. 19 වැනිද රෑ පෝස්ටර් අලවන තැනක හිටිය, මට සහය දුන් ශාඛා සමිතියක සභාපති කෙනකුට පිස්තෝලෙ පෙන්නලා පිස්තෝල මිටෙන් ඔළුවට ගැහුවා. ගහලා තුවාල කළා. පොලීසිය අදත් ඉන්නවා මිනිහාව හොයාගන්න බැරුව, මහතුන් කියලා පුද්ගලයෙක් වැලිවල ප්‍රදේශයේ.

ගරු කථානායකතුමනි, සී. ඩබ්ලිව්. ඊ. එකේ, සතොසේ හිටපු මුරකරුවෙක්, මිනීමැරුමකට සම්බන්ධ, ගිල්මන්. මිනීමැරුම ගැන අදත් නඩුවක් තිබෙන ගිල්මන් කියන මේ පුද්ගලයාට තමයි දුන්නේ වාහන බෙදු හරින්නත්, පිස්තෝල බෙදු හරින්නත්. මේ පුද්ගලයා තමයි මැරවර කණ්ඩායමක් අරගෙන තර්ජනය කරමින් හැම තැනම ගියේ. එපමණක් නොවෙයි. 19 වැනිද ලංකාවේ නීති විරෝධී වැඩ කළා නම් කළේ එක්සත් ජාතික පක්ෂය නොවෙයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. එහෙම මැරවර හමුදාවක් දමල වාහනවලින් ඒ මිනිසුන් තැන් තැන්වලට ගෙන ගොස් නිල් පාට තොප්පි රතු පාට තොප්පි දම්මල වැඩ කරවල මේ රටේ සෑම ආසනයකම මන්ත්‍රීවරුන්ට අපහාස කරල ඒ ආසනවල ඉන්න මහජනතාව කුපිත කරවල මේ රටේ විප්ලවයක් ඇති කරන තත්ත්වයක් ඇති කළේ එක්සත් ජාතික පක්ෂය නොවෙයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. අතනට ගැහුවාය, මෙතනට ගැහුවාය කියල අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙකු කථා කරනව. මේ වුණ සිද්ධින් 1970-77 කාලයේ වුණ සිද්ධින් කොහොමද කියල මම තමුන්නාන්සේගෙන් අහන්න කැමතියි. මේ ලංකා දේශපාලන ඉතිහාසයේ මිනිහෙකුට අඩංතේට්ටම් කළා නම් පහර දීමක් කළා නම් ඒකෙ උපත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මිස එක්සත් ජාතික පක්ෂයේ නොවන බව මම කියන්නට කැමතියි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද මේ වැටිල තියෙන තත්ත්වය ගැන මම කණගාටු වෙනවා. නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමා ආරක්ෂා වෙන්නට ඕනෑ අපෙන් නොවෙයි. තමුන්නාන්සේටත් තමුන්නාන්සේගේ පක්ෂයේ සිටින කිසිම සාමාජිකයෙකුටවත් අපෙන් කරදරයක් වෙන්නෙ නැහැ. තමුන්නාන්සෙත් තමුන්නාන්සේගේ අම්මාත් ආරක්ෂා වෙන්නට ඕනෑ තමුන්නාන්සේගේ මස්සිනාගෙන්. ඒක හොඳට මතක තියා ගන්න. ඉක්මණට බලයට එන්න ඔහුට කොපමණ වුවමනාවක් ආසාවක් තිබෙනවාද කිව්වොත් පාර්ලිමේන්තුවටත් නැවිත් අගමැතිකමට පත් වෙන්නයි. බලන්නෙ. තමුන්නාන්සේගේ තාත්තවත් නොකළ දෙයක් ඒක. එයත් ආවෙ ගම් සභාවේ ඉඳල. නගර සභාවේ ඉඳල. ඊට පසු පාර්ලිමේන්තුවට ඇවිත් විරුද්ධ පක්ෂයේ නායකයා වුණා. එහෙමයි එතුමා පඩියෙන් පඩිය ආවේ. නමුත් අද තමුන්නාන්සේගේ මස්සිනා බලන්නේ කොහොමද? කොහේදෝ ඉඳල මේ වලව්වට කඩා වැටිල ඒ වලව්වේ මාර්ගයෙන් නමේ මාර්ගයෙන්ම ඒ පරම්පරාවත් නැති කරගෙන බලයට එන්නයි ඔහු බලන්නෙ.

කොබ්බෑකඩුව මූලාසනයේ තියාගෙන නුගේගොඩ, වැලිකඩ රැස්වීම්වල දී ඔහු මොකක්ද කිව්වේ? විජයකුමාරණතුංග කොබ්බෑකඩුවට අත දික්කරල "අනාගත ගරු ජනාධිපතිතුමනි,"—කොබ්බෑකඩුවට මේ විජයකුමාරණතුංග කියනව— "අනාගත ගරු ජනාධිපතිතුමනි, තමුන්නාන්සේ ජනාධිපති වුණාම 21 වැනිදායින් පසු ඔය රදළ නාට්ටෝ තමුන්නාන්සේගේ නෑදෑයෝ කියල ඇගේ එල්ලෙන්න එයි, උන්ට ගහල පැන්තකට දමන්න" කිව්ව. කාටද මේ කියන්නේ? නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමාට. තමුන්නාන්සේට මේ කෙලින්ම කියන්නෙ. කොහොමද තත්ත්වය? තමන්ගේ සහෝදරියත් බැඳගෙන අම්මට බටර් ගාල උපලේකම් වෙලා කාර්යාලයත් අල්ලා ගෙන මේ කොහේද යන මිනිහෙක් අගමැති වෙලා ජනාධිපතිකමත් කරන්නට කල්පනා කරනවා.

මේ විධියට පාහර විධියටයි කථා කරන්නෙ. මම දන්නෙ නැහැ තමුන්නාන්සේ මේවා කොහොම ඉවසා දරාගෙන ඉන්නවාද කියල. ඒක නොවෙයි මගේ කණගාටුව. තමුන්නාන්සේ භාවනා කරන්නේ බලාගෙනයි. අද ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා යළිත් මේ රටේ ජනාධිපති වූ නිසා තමුන්නාන්සේ අද හිනහ වෙවී ඔහොම් කථා කරනවා. කොබ්බෑකඩුව ජනාධිපති වුණා නම් තමුන්නාන්සෙත් නැහැ. මමත් නැහැ. කථානායකතුමාත් නැහැ. අගමැතිතුමා හෝ ජනාධිපතිතුමාත් නැහැ. අන්න ඒක මතක තියා ගන්න. මේ "ඇත්ත" පත්‍රය පළ කරන කොමියුනිස්ට්වාදීන්ගේ බලාපොරොත්තුව කොහොම හරි මේ රටේ බලය වැඩක් කරන්නට බැරි නිවට නියාලු පඹයෙක් රූකඩයක් වැනි මිනිහෙකුට ලබා දී ඒ මාර්ගයෙන් බලය අල්ලා ගෙන මේ රටේ සර්ව ජන ඡන්දය නැති කිරීමයි. ඒ අභිප්‍රාය මුදුන්පත් කර ගැනීම සඳහා 1948 සිට අද වන තුරු කොමියුනිස්ට් පක්ෂය නොයෙකුත් වෙර දැරුවා. මහන්සි ගත්තා. අපහාස කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

කීප දෙනෙකුට ලියන්න පුළුවන් වුණාට අරක්කු බාග යක් බීල කුණු හරුප ලිව්වාට මේ රටේ මිනිස්සු ඒවා පිළි ගන්නට සූදානම් නැහැ. අපි රැස්වීම් තියන කොට ඒවා නොයෙක් අන්දමට වාර්තා කරනවා. අපේ ඡන්ද අඩු වුණු ඒවා ගැන කියනවා. මට මතකයි මැතිවරණයට සතියකට කලින් මගේ මැතිවරණ කොට්ඨාශය ගැන පළ කර තිබුණු කතාවක්. සංවර්ධන සභාවේදී මල්ලිමාරච්චි ගේ වීසිතුන්දහ දහත්දහක් වුණාය කිව්වා. දැන් මොකද කියන්නෙ? මම පාත්තය වෙලත් ආසනයක් තරඟ කරල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පළමුවන නියෝජ්‍ය නායකයා ටි. බී. ඉලංගරත්න මහත්මයා ගිය පාර පන්දහසකින් පැරද්දුවා. මම පාඨශාලාවට යනකොටත් ආසනයක් තරඟ කළ පුද්ගලයා, පක්ෂයේ නායකයා. ගිය පාරත් පැරද්දුව පන් දහසකින්. තැපැල් ඡන්ද නැතුව—ඒවා එක් කරන්නෙ නැතුව—මේ පාරත් පැරද්දුවා හාරදහස් හැට අටකින් ගිය මහා මැතිවරණයේදී මම ගන්නෙ ඡන්ද විසි තුන් දහයි. මේ පාර මම ගත්තා ඡන්ද විසි පන්දහක්. ඒකට, මොකද 'ඇත්ත' පත්‍ර කාරය කියන් නෙ? ඒක දමනවාද? "අනේ අපේ නියෝජ්‍ය නායක ටී. බී. ඉලංගරත්න—අනාගත අගමැතිතුමා හරි මොනවා හරි—මෙපමණ ගණනකින් පැරදුණා කියල කිව්වද? කවදාවත් කියන්නෙ නැහැ. ඒක කියන්නෙ කොහොමද? සමසමාජ පක්ෂය නැතිවුණු එක ගැන කියනවා, එකක් වත් නැහැ කියල. ඒ ගොල්ලන්ටත් එකක්වත් නැතුවයි තිවියෙ. කලවානෙ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙ ගම මහතා) පැරදුණු එක ගැන කියන්නෙ නැහැ. මම දන්නෙ නැහැ. ලියන කොට පැනේ තීන්ත ඉවර වෙනවා ඇති ඒ කොටසට එන කොට.

මේ වාගේ බොරු විකාර කරල, මේ විගේ අපහාස කරලා, වමාරල කාලා, මේ රටේ ජනයා මුළා කරන්න බැහැ. අද උදේ පත්‍රයේ මොනවද තියෙන්නෙ? "මැතිවරණයක් නැහැ අවුරුදු හයකට." මැතිවරණයක් නැත්තෙ මො කද? එද, 1975 සිට 1977 දක්වා කාලය දික් කර ගත්තෙ පාර්ලිමේන්තුවේ තුනෙන්-දෙකක බලය අරගෙනද? දී. මු. ජයරත්නත්, ඉලංගරත්නත්, නවරත්නත්—ත්‍රිවිධ රත්නයම—මොනවද කිව්වෙ? "අපිට ඕනැ නම් තමයි අපි මැතිවරණය තියන්නෙ. අපි මැතිවරණයක් තියන් නෙ නැහැ" කියල කිව්ව.

ජනාධිපතිවරණයේ දී සියයට 52 කට වඩා ජනාධිපති තුමාට ඡන්දය දී තිබෙනව. අපි කියන්නෙ, මහජනයා කැමති නම් තුනෙන්-දෙකක ඡන්දයෙන් සම්මත කර ගෙන අපට වරමක් දෙන්න, තවත් අවුරුදු හයක් මේ පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන යන්නටය කියල. එක අත කට මම කල්පනා කරනව, ඒ ජනවරම මහජනයා දුන් නොත්, ඒ ජනවරම මාර්ගයෙන් යහපතක් වෙන්නෙ මේ ආණ්ඩුවට පමණක් නොවෙයි; ශ්‍රී ලංකා නිදහස් පක්ෂ යේ අනුර බණ්ඩාරනායක තරුණ මන්ත්‍රීතුමාට පුළුවන් කමක් ලැබෙයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම්පූර්ණ යෙන්ම පිරිසිදු කරන්නට.

ගරු සභාපතිතුමනි, මම මෙයට වඩා කතා කරන්න යන්නේ නැහැ. මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙ නව මේ අවස්ථාව මට ලබා දීම ගැන. මා තමුන්නාන්සේ ගෙන් ඉල්ලා සිටිනව, මේ ජනාධිපතිවරණයේදී යම් යම් පුද්ගලයන්, රජයේ සේවකයන් කටයුතු කළ ආකාරයත් යම් යම් පුද්ගලයන් මුදල් යෙදවූ ක්‍රමත්, ඒ අතරම රටේ නම ගිය අපරාධකාරයන් මේ වැඩවලට සම්බන්ධ කර ගැනීමත් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කොමිෂන් සභාවක් පත් කරන ලෙස. එසේ ඉල්ල මින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

අ. භා. 9.17

**ආර්. එම්. ධර්මදාස බණ්ඩා මහතා (නියෝජ්‍ය රෙදිපිළි කර්මාන්ත ඇමතිතුමා)**

*(திரு. ஆர். எம். தர்மதாச பண்டா — புடைவைக் கைத் தொழில் பிரதி அமைச்சர்)*

(Mr. R. M. Dharmadasa Banda—Deputy Minister of Tetxile Industries)

ගරු කථානායකතුමනි, පසුගිය දා පැවති ජනාධිපතිවර ණය ගැන එතරම් දුරට කතා කරන්න මම බලාපො රොත්තු වෙන්නෙ නැහැ. නමුත් මට එක කාරණයක් මේ අවස්ථාවේ දී වැටහෙනව. එනම්, ආණ්ඩු පක්ෂයත්, විරුද්ධ පක්ෂයත් කී කරුණු අනුවත්, ජනාධිපතිවරණ ප්‍රතිඵල අනුවත්, විරුද්ධ පක්ෂයේ උදවිය සැහෙන සංවි ධානයක් ඇති කර ගෙන තිබිල තියෙනව.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Order please! The Deputy Chairman of Committees will now take the Chair.

**අනතුරුව කථානායකතුමා, මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [திரு. எட்மன் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES (MR. EDMUND SAMARAWICKREMA) *took the chair.*

**ආර්. එම්. ධර්මදාස බණ්ඩා මහතා**

*(திரு. ஆர். எம். தர்மதாச பண்டா)*

(Mr. R. M. Dharmadasa Banda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය ජනාධිපතිවර ණය අවසන් වුණාට පස්සෙ ලැබෙන තොරතුරු අනුව සැහෙන සංවිධානයක් මේ රටේ තිබිල තියෙනව; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂක මහත්මයා යම් විධිය කින් දිනුවා නම්, ඒ අයට විරුද්ධව ජනතාව සංවිධාන කළ ප්‍රබල පිරිසට—විශේෂයෙන් මැති-ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට— සැහෙන විධියේ වැඩ සටහනක් දෙන් නට ඒ අයගේ කල්පනාවක්, සංවිධානයක් තිබිල තියෙ නව. ඒ තිබුණු කල්පනාව, ඒ තිබුණු සංවිධානය තවමත් ඉවර වී නැති බවයි, මට නම් පෙනෙන්නෙ. ඒ සංවිධානය කළ වැඩ පිළිවෙල එක එක තැන්වල තවමත් ක්‍රියාත්මක වන බව, මට පෙනෙන්නෙ. විශේෂයෙන්ම මේ ගරු සභා වේ සිටින ආණ්ඩු පක්ෂයේ අපේ මන්ත්‍රීවරුන්ට මඩ ගැසීමේ ව්‍යාපාරයක් දැන් ආරම්භ කර තිබෙනව, ඒ කී සංවිධාන තුළින්. මට පෙනෙනවා, දැන් අප කීප දෙනකුට විරුද්ධව සැහෙන සංවිධානයක් ගිහින් තිබෙනවා. මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාටවත් දෙස් කියනවා නොවෙයි. මේ විධියට හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කර තිබෙද්දීත් යම්-යම් අසත්‍ය ප්‍රකාශ, අසත්‍ය ප්‍රචාර රටේ ඇති කරන්න මොන විධියේ සංවිධානයක් තිබෙනවාද කියන එකයි. අපි දැන් කල්පනා කළ යුත්තේ. මම පත්‍රවලට බණින්නේ නැහැ. නමුත් මේක හොයන්න කියලයි, මම කියන්නේ.

82 ඔක්තෝබර් 25 වැනි ද 'දවස' පත්‍රයේ පළමුවැනි පිටේ ප්‍රධාන ශීර්ෂය වී තිබෙන්නේ මොකක්ද?

'කලබලකාරයන් කඩිමුඩියේ හොයයි'

එයයි, ප්‍රධාන ශීර්ෂය. ඒ එක්කම, මෙහෙමත් තිබෙනවා:

'දේශපාලනඥයන් තුන් දෙනකුට විරුද්ධව විනය නීති අනුව පියවර'

මෙවැනි දේවල් පත්තරවල වැටෙන විට මට හිතෙනවා, අර විධියේ සංවිධානවලට ඇබ්බැහි වෙලා හිටපු අය, අන්න හොඳ වෙලාව තමයි, දේශපාලනඥයන් ඉවර කරන්න' කියා හිතා කටයුතු කර තිබෙනවාය කියා. මම දන්නේ නැහැ, මේ ආරංචිය 'දවස' පත්‍රයට ආවේ කොහෙන්ද කියා. නමුත් ඒකෙ ඉඟියකුත් කරල තිබෙනවා, එක-එක මන්ත්‍රීතුමන්ලා ගැන. එයින් එක් කෙනෙක් මම. ඒකෙ එක් කොටසක තිබෙනවා, මෙහෙම:

'ජනාධිපතිවරණ ප්‍රතිඵල ප්‍රකාශ වීමෙන් පසු ඡන්ද ගැටුම්වලට සම්බන්ධ වූ දේශපාලනඥයන් තිදෙනකු සම්බන්ධයෙන් විනයානුකූලව දඬුවම් පැමිණවීමේ ක්‍රියා මාර්ග ගැනීමට රජය දැනටමත් උපදෙස් දී ඇති බව දැන ගන්නට තිබේ.'

පළමු වැනි පිටුවේමයි, ඒක තිබෙන්නේ. මම අනික් මන්ත්‍රීතුමන්ලා ගැන කියන්නේ නැහැ. මන්ත්‍රීතුමන්ලා තුන් දෙනෙක් ගැන තිබෙනවා. එක් කෙනෙක් මම. [බාධා කිරීම්] මම හිතන විධියට ඒ මන්ත්‍රීතුමන්ලා දෙන්නත් කථා කරන නිසා ඒ අයගේ නම් කියන්න මම අදහස් කරන්නේ නැහැ.

නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකෙ එක කොටසක මේ විධියට තිබෙනවා:

'බිබිල ප්‍රදේශයේ දේශපාලනඥයකුගේද සම්බන්ධතාව ඇතිව සංවිධානය වුණු බව කියන පිරිසක් අනවසරයෙන් රැස්වීමක් පැවැත්වීමෙන් පසු නිවෙස් කීපයකට අලාභ-හානි කොට ඇතැයි පොලීසිය කියයි.'

මේක වාර්තාකාර මහත්මයකුගෙන් ලැබුණු වාර්තාවක් නම් එය සම්පූර්ණ අසත්‍ය වාර්තාවක් බව 'දවස' පත්‍රයේ කතෘතුමාට කියන්න කැමැතියි. නමුත් මේක යම්කිසි විධියකින් පොලීසියෙන් ගත්ත වාර්තාවක් නම් රාජ්‍ය රක්ෂක අමාත්‍යාංශයෙන් මා ඉල්ලා සිටිනවා, පොලීසිය මේ වගේ වැරදි ආරංචියක් පත්‍රවලට දුන්නේ කොහොම දැයි සොයා බැලිය යුතුයි කියා. මෙය සම්පූර්ණ අසත්‍ය වාර්තාවක්. යම් විධියකින් ඒ වාර්තාව පොලීසියෙන් සැපයුණා නම්, එය වෙන්න ඇත්තේ මේ විධියටයි: අගමැතිතුමා කීවා, පොලිස්පති වෙන්න හිටියාය කියා කොටකදෙනියද කවුද මහත්මයෙක්. ඒ විධියේ පිරිසක් ඉන්න ඇති. ඒ අය තාමත් පොලිස් මූලස්ථානයේ ඉන්නවා ඇති. මූලස්ථානයේ ඉන්න ඒ පිරිසගේ චක්‍රලේඛ යන් රටේ හැම තැනම පොලීසිවල ඇති. අපේ අධ්‍යාපන ඇමතිතුමාත් කිව්වා, හෝමාගම පැත්තේ එක් කෙනෙක් ගැන. ඒ වගේ තවත් හුඟක් ඇති, සෑම තැනම. 'එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට, නියෝජ්‍ය ඇමතිවරුන්ට, ඇමතිවරුන්ට මඩ ගහන්න දැන් තමයි හොඳම වෙලාව' කියල අදහස් පහළ වෙලා සමහර විට ඒ අය ක්‍රියාත්මක වෙලත් ඇති.

මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, මෙයටම සම්බන්ධ තාව එකක්.

**This is from "The Island, Sunday Edition," of 24th October 1982.**

"Police Warn Deputy Minister.

Police Headquarters said yesterday that the Deputy Minister of Textile Industries, Mr. R. M. Dharmadasa Banda, had to be warned when he tried to lead a 300 strong demonstration through the streets of Bibile town of which he is M.P. Police took this action under the Presidential Election Act which prohibits demonstrations until a week has elapsed from the date of the election. Police which dispersed the procession, also augmented security arrangements in Bibile."

මේකෙ තිබෙනවා, හරි ලස්සණ කතන්දරයක් මේ ගැන මමත් දැන ගත්තේ, මේ ප්‍රවෘත්තියෙනුයි. නමුත් මෙහෙම කිසිම දෙයක් වෙලා තිබුණේ නැහැ. මේකෙ කියා තිබෙනවා, "Police Headquarters said" කියා. එහෙම නම් පොලිස් මූලස්ථානයයි මේක කියා තිබෙන්නේ. මෙවැනි කිසිම සිද්ධියක් වුණේ නැති නමුත් එසේ කියා තිබෙනවා, මට අවවාද කළාය කියා. කවදාවත් කිසිම කෙනෙක්—පොලීසියේ එක් කෙනෙක්—මට අවවාද කළේ නැහැ.

අපේ මොණරාගල දිස්ත්‍රික්කයෙන් තමයි, ජනාධිපතිවරණයේ පළමුවැනි ප්‍රතිඵලය දුන්නේත්. එයිනුත් බිබිලෙ මැතිවරණ කොට්ඨාශයේ තමයි, ඉස්සෙල්ලාම ගණන් කරල ඉවර වුණේත්. ගණන් කරල ඉවර වුණත් දෙවැනි ගැනීමකුත් වෙයි කියල සැක පිට, අපි හුඟක් වෙලා හිටියා. නමුත් එන ප්‍රතිඵල අනුව එහෙම දෙයක් වෙන්නේ නැති බව දැන ගත්තාට පසු, දවල් 12.30-1.00 ට විතර අපි ගෙදර ආවා.

අපේ ජනාධිපතිතුමා සියයට 53 කට ආසන්න වැඩි ඡන්ද ගණනකින් පළමුවැනි රවුමේම ජයග්‍රහණය කළාය කියා ප්‍රකාශයට පත් කළාට පසු, පැයක් යන්න කලින් බිබිලේ පොලිස් ස්ථානාධිපතිතුමා මාව හමුවන්න මගේ නිවසට ආවා. ස්වස පහ හමාරට, හයට පමණ මා හමුවෙන්න ඇවිත් අපේ ජයග්‍රහණය ගැන කතා කරල මට කිව්වා, නියෝජ්‍ය ඇමතිතුමනි, බිබිල නගරයේ 1977 දීත් යම් යම් සුළු සිද්ධීන් සිදුවෙලා තිබෙනවා, ඒ නිසා කරුණාකරල ගිහින් බිබිලේ මහජනතාවට කියන්න, කිසිම කරදරයක් කරගන්න එපා, කාටවත් හිංසාවක් කරන්න එපා, හිරිහැරයක් කරන්න එපා කියල. අපි දෙන්න එකතු වෙලා කොහොම හරි ආරක්ෂාව සලසමු කියලත් කිව්වා. බොහොම හොඳ අදහස, මම හෙට බිබිලේ නගරයට ගිහින් ඔක්කොටම කියන්නම් කියල මම ඒ පොලිස් නිලධාරිතුමාට කිව්වා. ඒ කිව්ව ආකාරයටම ඊළඟ දවසේ දවල් 10.30 ට 11 ට පමණ මම එහේ ගියා. මට ගෙදර සිට බිබිලෙට යනවිට සැතැප්ම 10 ක පමණ දුරක් යන්න තිබෙනවා. ඒ මාර්ගයේ හැම තැනම තිබුණ ශාඛා කාර්යාලවලටත්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදාස බණ්ඩා මහතා]

මැතිවරණ කටයුතු වල යෙදුණ කාර්යාලවලටත් ඒ වගේම හන්දිවල සිටි අයටත්, කඩයක් ළඟ හෝ හන්දියක යම් පිරිසක් හිටියා නම් ඒ පිරිසටත් මම කියා ගෙන ගියා කිසිම කරදරයක් කරන්න එපා කියා. බිබිලෙට යන තෙක්ම මම ඒ විධියට කියාගෙන ගියා. ඊළඟට බිබිලෙ නගරයේ සිටි ඔක්කොම පිරිස එකතු කරල මම කිව්වා, කිසිම කරදරයක් කරන්න එපා, එහෙම කරන එක හොඳ නැහැ, ඒ නිසා කවුරුත් ගෙවල්වලට යන්න කියා. 12.30 පමණ වන විට කිසිම කරදරයක් නැතිව ඔක්කොම ගෙවල්වලට ගියා. මම යන කොට හිටියෙ කවිද? මගේ ජීප් එකයි, මගේ කාර් එකයි පමණයි. එයට සම්බන්ධ වුණා පොලිසියේ ජීප් එකයි, ඕ. අයි. සී ගේ ජීප් එකයි, ආරක්ෂාවට ඇවිත් හිටිය යුද හමුවේ ජීප් එකයි. ඒ හතර විතරයි. ඒ යන අතරේදී එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය නිසා මාව හමුවී ප්‍රීතිය ප්‍රකාශ කරන්න බිබිලේ සිට මගේ නිවසට එන්න ආපු වාහන එකක් දෙකක්—ඒ වාහන ගණන දන් මට කියන්න බැහැ—මම යනවා දැක්කම ආපසු හරවලා එන්න ඇති.

මේකට තමයි මේ ලොකු පෙළපාලියක් යන්න ගියා කියල කියන්නෙ. පෙළපාලි ගියේ කවිද? මමයි, පොලිසියේ ජීප් එකයි, යුද හමුදාවේ ජීප් එකයි ඉතින් මම අහන්නේ ඒක පෙළපාලියක් නම් මොනවාද වුණ අපරාධ කියලයි. කිසිම අපරාධයක් වුණේ නැහැ. මම දන්නේ නැහැ, යන වාහනවලට යටවී කුඹියෙක්වත් මැරුණද කියල. ඒ හැරෙන්න කිසිම කරදරයක් වුණේ නැහැ. මම බිබිලෙට ගිහින් දවල් 12.30 නැත්නම් 1 පමණ වන විට ඒ පිරිස ඔක්කොම ගෙවල්වලට යැව්වා. එදා 22 වෙනිදා බිබිලේ කිසිම කරදරයක් වුණේ නැහැ. ඒ ඔක්කොම ඉවර කර අපි ඔක්කොම කට්ටිය නිවෙස්වලට ගියා. අපි එහෙම නිවෙස්වලට ගියත් මේ පත්තර වල තිබෙන දේවලින් මොකක්ද තේරෙන්නෙ? මම ගියාලු පෙළපාලියක. ඉතින් පෙළපාලියක් ගියා නම් පොලිසියෙන් නවත්වන්න තිබුණා නේ? පොලිස් ජීප් එක ගියෙත් මාත් එක්ක නේ? යුද හමුදාවට පුළුවන් කම තිබුණ නේ නවත්වන්න? යුද හමුදා ජීප් එකත් මා එක්ක ගියේ. එහෙනම් මොකක්ද මේ කියන්නෙ? 21 වෙනිදා සවස පොලිස් ස්ථානාධිපතිතුමා මගේ නිවසට ඇවිත් කරන ලද ඉල්ලීම පිට මම බිබිලෙ නගරයට ගියේ. මම ඒ විධියට, කරදර හිරිහැර කරන්න එපාය කියල කියන්න ගිය එක පොලිස් මූලස්ථානයෙන් ලැබුණ ආරංචියක් හැටියට දන් මේ පත්තරයේ දමනවා, මම පෙළපාලි ගියාය කියා. කවිද මේ විධියට පොලිස් මූලස්ථානයෙන් පත්තරවලට ආරංචි දෙන්නෙ? විකෘති විධියට, අප මහජනයාගේ හිනාවට ලක් වෙන විධියට, අප දාමරිකයන් විධියට මහජනතාවට පෙන්නුම් කරන්නට මේ විධියේ ප්‍රචාරයන් යවන අය, මේ විධියට පත්‍රවලට ප්‍රකාශ දෙන අය ගැන අපි විමසිලිමත් විය යුතුයි

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනාධිපතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දිනුවොත් යම් යම් ව්‍යාපාර, යම් යම් ත්‍රස්තවාදී වැඩ—ආරම්භ කරන්න තිබුණා. ඒ ආරම්භ කරන්න බලාපොරොත්තුව තිබුණ දේවල් තවමත් අවසන් කර නැහැයි කියා මම කියන්නෙ මෙන්න මේ නිසයි. අපි පෙළපාලි ගියයි කියනවා. එපමණක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන කියල තිබෙනවා මට 'වෝන්' කළයි කියලත්. **The Police warned the Deputy Minister.** අද වනතෙක් මම දන්නෙ නැහැ, කොහොමද මේ ආරංචිය පොලිස් මූලස්ථානයට එව්වෙ කියල ඒ නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්නේ මේ ආරංචිය පොලිස් මූලස්ථානයට දුන්න එක්කෙනා කවුද කියා කරුණාකර සොයා බලන්න කියලයි.

මම බදුල්ලේ පොලිස් අධිකාරිතුමාගෙන් අහල බැලුවා. එතුමා එහෙම ආරංචියක් දුන්නෙ නැහැයි කිව්වා. මොනරාගල සහකාර අධිකාරිතුමගෙන් ඇහුවා. එයත් දුන්නෙ නැහැයි කිව්වා හරි විධියට නම් බිබිලේ පොලිස් මූලස්ථානයට යම් ආරංචියක් දෙනවා නම් දෙන්න ඕනෑ සහකාර පොලිස් අධිකාරි විසින් හෝ බදුල්ලේ ඉන්න පොලිස් අධිකාරි විසිනුයි. ඒ දෙන්නගෙන් එක් කෙනෙක්වත් මේ ආරංචිය දීල නැහැ. එහෙම නම් කවිද දුන්නෙ කියල කරුණාකරල සොයා බලන්න. කවුරු හරි ආරංචිය දුන්න එක්කෙනා කොටකදෙනියගේ ලනුවක් කාපු එක්කෙනෙක්ද කියා මම දන්නෙ නැහැ. කොටකදෙනිය අයි. ජී. පී. වුණාට පස්සෙ ඩී. අයි. ජී. වෙන්න හිටිය එක්කෙනෙක්ද කියල මම දන්නෙ නැහැ. කරුණාකර සොයා බලන්න අන්න එයා තමයි මේ ලනුව කවල තිබෙන්නෙ. එහෙම "මැසේජ්" එකක්—ආරංචියක්—පොලිස් මූලස්ථානයට දී තිබෙනවා නම්, ඒ පුද්ගලයා එහෙම නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දිනුවට පස්සෙ ඒ ගොල්ලන් පිටුපස ගිහින් යම් යම් වරප්‍රසාද ලබාගන්න බලාපොරොත්තු වෙන් සිටි කෙනෙක් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ විධියට "මැසේජ්" එකක් ආවේ නැත්නම් පොලිස් මූලස්ථානයේ කොටකදෙනියට සම්බන්ධ කට්ටියක් බොරුවට ආරංචියක් දුන්නාද කියල මම දන්නේ නැහැ. මට ඒක හොයන්න බැහැ. ඒ නිසා මම තමුන්නාන්සේගෙන් එක් කරුණක් ඉල්ලා සිටිනවා මම මෙතෙක් කිව්වේ වුණු දේ. පොලිස් නිලධාරියෙක් අද වන තෙක් මට කිසිවක් කියා නැහැ. 'ඇත්ත' පත්තරයේ හෝ 'දිනකර' පත්තරයේ හෝ අද තිබුණා මම නිවාස අඩස්සියේ ඉන්නවාය කියා. ඒක සම්පූර්ණ බොරුවක් පොලිස් නිලධාරියෙක් ඇවිත් මට උපදෙස් දුන්නේත් නැහැ, අවවාද කළේත් නැහැ. කොයි වේලාවේත් මම සහයෝගයෙන් කටයුතු කර තිබෙනවා. බිබිලේ මට දැන් ලැබෙන සුළු සුළු ආරංචි අනුව මට දැන් සැක හිතෙනවා. බිබිලේ පොලිස් ස්ථානාධිපති හවස 5.30 ට 6 ට පමණ මේ විධියේ ආරංචියක් දුන්නාය කියා කටකතාවලින් මට දැනගන්නට ලැබී තිබෙනවා. ධර්මදාස බණ්ඩා තුන් දාහක පමණ සෙනඟක් ගෙනත් පාර දිගටම ගෙවල් කඩා, කඩවල් කඩා, බිබිලේ නගරයට ඇවිත් කඩවල් ගිනි තියා, අන්තිමට පොලිසියට පවා ගහලා, බේරා ගන්න තත්ත්වයක් තිබෙනවාය කියා, බිබිලේ පොලිස් ස්ථානාධිපති පොලිස් මූලස්ථානයට මැසේජ් එකක් දුන්නාය කියා මට දැනගන්නට තිබෙනවා. මම එවලේම—ආරංචිය ආ හැටියෙම—ජනාධිපතිතුමාගෙන් ඇහුවා එතුමා පුදුම වුණා. මෙහෙම දෙයක් නැහැයි කිව්වාට පස්සේ, අපි දැන හොයාගෙන යනවා, කවුද මේ වාගේ බොරු ආරංචි දෙන්නේ කියා. බිබිලේ එකම කඩයක්වත් ගිනි තියා නැහැ. මම දන්නේ නැහැ, මම ආවාට පස්සේ දැන් ගිනි තියා තිබෙනවාද කියා, මේක ඇත්තක් හැටියට හරිගස්සන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ විධියේ මැසේජ් එකක් බිබිලේ පොලිස් ස්ථානාධිපති දුන්නා නම්, මේ ගරු සභාවේ මන්ත්‍රි කෙනෙක් හැටියට මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, මේ විධියේ බොරු ආරංචි දී, මන්ත්‍රී කෙනෙක් වශයෙන්, නියෝජ්‍ය ඇමති කෙනෙක් වශයෙන් මා මුළු ලංකාවේම සමච්චලයට පත් කරන්නට උත්සාහ කර තිබීම ගැන තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කරන ලෙසයි. පොලිස් මූලස්ථානයට මේ විධියේ බොරු ආරංචි දී, "බිබිලේ ධර්මදාස බණ්ඩා ඇවිල්ලා පොලීසියට ගහනවාය, ධර්මදාස බණ්ඩා ඇවිල්ලා ගෙවල් කඩනවාය, ධර්මදාස බණ්ඩා ඇවිල්ලා කඩවල් ගිනි තියනවාය" කියනවා නම්, තමුන්නාන්සේගෙන් මම ඉල්ලනවා, මන්ත්‍රී වරප්‍රසාද යටතේ අපට තිබෙන ආත්ම ගෞරවය ආරක්ෂා කර ගැනීමට මේ පාර්ලිමේන්තුවේ ආරක්ෂාව

මට විතරක් නොවෙයි තවත් මන්ත්‍රීවරුන් හුඟදෙනකුට මේ තත්ත්වය තිබෙනවා. මේක අවස්ථාවක් කර ගෙන තිබෙනවා මන්ත්‍රීවරුන්ට දඬුවම් කරන්න. මොකද? පත්තරේ තිබුණා මන්ත්‍රීවරුන්ට දඬුවම් කරන්න කොමිටියක් පත් කර තිබෙනවාය කියා. දන් දඬුවම් දෙන්න තමයි ඊළඟට මේ විධියේ බොරු ආරංචි දෙන්නේ. අපේ ඇමතිවරුන්ට හා අනෙක් මන්ත්‍රීවරුන්ට විරුද්ධවත් පොලිස් මූලස්ථානයට බොරු ආරංචි, පැමිණිලි ආවොත් මම පුදුම වන්නේ නැහැ. ගමනාගමන මණ්ඩල නියෝජ්‍ය ඇමති අබේරත්න මහතාට විරුද්ධව දැනටමත් ඇවිත් තිබෙනවා. ඊයේ පත්තරේ තිබුණා. හදිසි අවස්ථා යටතේ මේ විධියේ ප්‍රකාශ කරන විට අපි සැලකිලිමත් වෙන්න ඕනෑ. 'අයිලන්ඩ්' පත්තරයට දොස් කියන්න බැහැ, පොලිස් හෙඩ් ක්වාටර්ස්වලින් ආරංචිය ඇවිත් තිබෙන නිසා. 'දවස' පත්තරයේත් මෙය පළ වී තිබෙනවා. පත්තර වාර්තාකරුවන්ටවත් කතීවරුන්ටවත් මම දොස් කියන්නේ නැහැ, පොලිස් මූලස්ථානයෙන් ආරංචිය ලබා ගත්තා නම්. නමුත් කර්තෘවරුන්ට එක් කරුණක් මතක් කරන්න කැමතියි. මින් පස්සේ, මේ වාගේ වාර්තා ලැබුණාම නැවත වරක් පරීක්ෂා කර බලා පළ කරන ලෙස මම මතක් කරනවා.

මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැටියට අපට මීට වඩා ආරක්ෂාව සැලසෙන්න ඕනෑ බව මම ගරු සභාපතිතුමාට මතක කරනවා. පොලීසිය ඒ අවස්ථාවේදී තිබුණු තත්වය අනුව, කොටකදෙනිය සංවිධානයෙන් වෙන්න ඕනෑ මේක වෙන්න ඇත්තෙ. මම දන්නේ නැහැ, මට කියන්න බැහැ. මේ වාගේ බොරු ආරංචි දී, මන්ත්‍රීවරුන් මහජනයා ඉදිරිපිට සමච්චලයට පත් කර, ත්‍රස්තවාදීන් හැටියට නම් කර, මේ වැරදි වැඩ ඔක්කොම කරන්නේ යූ. එන්. පී. කාරයන්ය, එක්සත් ජාතික පාක්ෂිකයන්ය කියා පෙන්වන්න යම් කෙනෙක් කටයුතු කරනොත් අපට ආරක්ෂාව සැලසීම සඳහා කට යුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම, පෙළපාලි ගියාය කියන එක ගැන මට කියන්න තිබෙන්නේ මම ගෙදරින් ගියේ පොලීසියේ ඉල්ලීම පිට බවයි. මම යන විට පොලිස් ජීප් එකකුත් ආමි ජීප් එකකුත් ගියා. එහෙම නම් අපි හැමදෙනාම එකතු වී පෙළපාලි ගිහින් තිබෙනවා. එක රැස්වීමක්වත් පැවැත්තුවේ නැහැ. මම ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ හදිසි අවස්ථා නීතිය යටතේ, මන්ත්‍රීවරුන්ට විරුද්ධව පත්තරවල පළ වන නොයෙකුත් කට කතා ප්‍රචාර නැවැත්වීමට පිළිවිධාන යොදන ලෙස. ඒහෙම යොදා, මන්ත්‍රීවරුන්ට යහතින් මේ ගත් ජයග්‍රහණය හොඳ ජයග්‍රහණයක් බවට පත් කර ගන්නට කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා

ඒ එක්කම මම ගරු අගමැතිතුමාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. පොලීසියේ කොටකදෙනිය කණ්ඩායම මුළු දිස්ත්‍රික්කයේම කොළපාට තොප්පියක් දාගෙන මිනිහකුට පාරේ යන්න දෙන්නෙ නෑ, ගහනවා. කොළපාට කමිසයක් ඇඳගෙන යන්න දෙන්නෙ නෑ ගහනවා. [බාධා කිරීමක්] පොලීසියත් එක්ක අපට සටනක් නැහැනේ. මම කියන්නේ, අයි. ජී. වෙන්න හිටපු එක්කෙනාගෙ කණ්ඩායමද දන්නේ නැහැ මේව කරන්නෙ. ඒ නිසා, මහජන ආරක්ෂක පනත යොදා, මේ කරදරවලට පත් වී සිටින ජනතාවගේ ආරක්ෂාව, සලසන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ජබීර් ඒ. කාදර් මහතා (මැද කොළඹ දෙවන)**
*(ஜனாப் ஜாபிர் ஏ. காதர் — கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)*
**(Mr. Jabir A. Cader—Second Colombo Central)**

Sir, I wish to say a few words with regard to the Emergency. I think we all must blame the newspapers of the Opposition parties for creating the present situation; and our President has been very thoughtful in declaring the Emergency well in advance in order to protect the people. The President's foresight and timely action have averted a great deal of bloodshed which would otherwise have occurred in this country. His victory in the elections is an example for all of us. He has been fair and impartial to all communities and the ordinary man has endorsed the manner in which he has administered the country. When he went before the people, by providing his own opponents with equal opportunities in the TV., radio and other advertising agencies, he has earned a good reputation as a fair person. He has shown the people that he will give equality even to his opposing candidates. This has brought him more votes.

I must say that after an election, there is always tension in the country, and when it is encouraged by the leaders of the respective parties, it becomes worse. In Colombo-Central the voting was peaceful and there were no incidents.

The hon. Third Member for Colombo Central stated that at Aluthkade a boutique had been broken up. Aluthkade gave me a lot of support and I was in and out of that area on the day of polling. I do not think action was taken regarding this matter in view of the elections. I understand from the municipality that they had issued an order to demolish all unauthorised annexes of those houses because I think the Hon. Prime Minister is going to give the ownership of those houses to the tenants. I telephoned the Commissioner and told him that this was taking place at Kochchikade South and requested him

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජබීර් ඒ. කාදර් මහතා]

not to demolish immediately but to give them time. I hope the Hon. Prime Minister will agree with me and see that the poor people are not put into hardship.

Our policy of an open economy has been accepted by the people and this has been shown by our victory in the Presidential elections. If they have accepted our policy, peace must prevail to implement it. If there is peace and if all communities can live together, the policies of our Government can be easily implemented and there will be more employment and a general upliftment of the poor people.

Further, Sir, from Colombo Central, as pointed out by the Hon. Prime Minister, 25,000 people are out of the island. I think most of them are Muslims, because I know the number of them who have been employed in the Middle East and all their votes would have been UNP votes. Therefore, I would wish to mention in this House that the extension of the Emergerncy is essential if the reports from various parts of the country indicate that we are still in a position where we cannot withdraw the Emergency without creating a lot of difficulties for the poor and innocent people becuase they are the poeple who really suffer during this type of post-polls violence.

Therefore, Sir, I would conclude that the declaration of a state of Emergency is a thing which has been provided in our Constitution, and you cannot simply carry on an Emergency without coming to this House for approval. That itself is feather in the cap of our Government and also of the President.

I thank you, Sir, for giving me an opportuinity to speak a few words.

**ආනන්ද දසනායක මහතා** (කොත්මලේ)
*(திரு. ஆனந்த தஸநாயக்க—கொத்மலை)*
**(Mr. Ananda Dasanayake—Kotmale)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ස්තුතිය නමුත් නාන්සේට මම ගිම් කරනව, හතර විනාවක්ම කතා කරන්නට මම උත්සාහ කළා, නමුත් අවස්ථාවක් ලැබුණේ නැහැ [බාධා කිරීමක්] දැන් ඉඩ දුන්නා, ඒ ගැන මගේ ස්තුතිය ගිම් කරනව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම වැඩි වේලාවක් ගත යුතු නැහැ අද මේ විවාදයට. මොකද? විරුද්ධ පක්ෂයත් මේ හදිසි නීතිය ප්‍රකාශ කිරීම ගැන කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ ගැන පැහැදිලි සතුටකුයි තිබෙන්නෙ. එම නිසා ඒ සම්බන්ධයෙන් ඊට වැඩි යමක් කියන්න ඕනෑ නැහැ. හදිසි තත්ත්වය යටතේ සමහරු වැරදි කර තිබෙනවා. සමහර දෙනෙක් නීතිය ගැන දන්නෙ නැති නිසා වැරදි කරනවා වෙන්න ඇති. සමහර දෙනෙක් නීතිය ගැන දැන දැනම වැරදි කරනවා වෙන්න ඇති. මේ ගැන මට හරියට කියන්න බැහැ. නමුත් මෙහිදී මට නොකියා බැරි කාරණයක් තිබෙනව. හදිසි නීතිය ප්‍රකාශ යට පත් කළේ හරියටම 20 වනදා හැන්දෑවෙ 6ට. හදිසි නීතිය ප්‍රකාශ කළා නම්, හැම දෙනාම නීතියට ගරු කරනවා නම්, සමහර විට දිනුවාට පස්සෙ පෙළපාලි යාම හෝ සමහරවිට පිළිගැනීමේ උත්සව ආදිය පැවැත්වීම හෝ සම්පූර්ණයෙන්ම තහනම් බව මැතිවරණ නීතිය අනුවත්, හදිසි නීතිය අනුවත් සඳහන් වෙනව. විශේෂයෙන්ම හදිසි නීතිය අනුව, එහි 55 වන වගන්තියට අනුව එසේ කිරීම නීති විරෝධියි.

මම ඒ වගන්ති කියවන්න යන්නෙ නැහැ, ඒවා කියවන්න යාමෙන් නොදන්නා දේවල් කියන්න යන වාය කියන හැඟීමක් ඇති කර ගන්න පුළුවනි. මේවා කවුරුත් දන්නා දේවල්, ඒ වාගේම මැතිවරණ නීතිය යටතේ, ජනාධිපතිවරණය යටතේත් පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා ගරු අගමැතිතුමාත් අපත් එකතුවෙලයි ජනාධිපතිවරණ ආදී කටයුතු සම්බන්ධයෙන් මැතිවරණ නීති සංශෝධනය කළේ, අපි මේවා ගැන සාකච්ඡා කර තමයි මේ නීතිරීතිත් ඇතුළත් කළේ. මේ නීතිරීති මෙහෙම ඇතුළත් කරන්නට හේතු වුණේ 1965, 1970 සහ 1977 මැතිවරණ වලින් පසුව ඇති වුණු තත්ත්වයන් නිසයි. ඇත්ත වශයෙන්ම හැම ආණ්ඩුවක්ම මේවාට වග කිව යුතුයි. මම එක් ආණ්ඩුවකට පමණක් දොස් කියන්නෙ නැහැ. ආණ්ඩුවක් බලයට පත් වුණු හැම ඡන්දයකදීම අවසාන ප්‍රතිඵලය වුණේ මේ රටේ සාමාන්‍ය ජනතාවට තමන්ගෙ ගේදොර නැති වීම, සමහර විට තමන්ගෙ නෑදෑයො, නැතිවීම එහෙම නැත් නම් තමන්ගෙ දෙමව්පියන් නැති වීම. මෙන්න මේවා නිසා තමයි, මේ වතාවේ මැතිවරණ නීති ඉතාම කල් පනා කාරීව සකස් කළේ. එම නිසාමයි මා හිතන හැටියට, ගරු ජනාධිපතිතුමා හදිසි නීතිය පැනවීම—ජනාධිපතිතුමා වශයෙන් ඡන්දයෙන් පත් වීමෙන් පසුව එතුමන් ප්‍රකාශ කළේ නැහැ—ඊට කල් තබා ප්‍රකාශ කළේ. ඒ අන්දමට කල් තබා ප්‍රකාශ කිරීම නිසා, මා හිතන්නෙ ඇතිවන්නට තිබුණු සමහර සිද්ධීන් දහස් ගණනක් වැළකී ගියා; ඇති වුණේ නැහැ. ඒක රටේ සාමාන්‍ය ජනතාවගේ වාසනාවක් හැටියට සලකනව.

මම එකක් කියන්න කැමතියි. මේ පෙළපාලි තහනම තිබෙද්දී එදා 21 වනද, 22 වනදා, 23 වනදා, 24 වනදා යන දිනවල කොත්මලේ ආසනයෙ අමුතු දර්ශන තිබුණා. කොත්මලේ ආසනයෙ පෙළපාලි ගියා. මම දන්නෙ නැහැ කවුරුන් මේවාට අනුබල දුන්නාද කියන්න. ඔක්තෝබර් 21 වනදා උදේ 10 ට පුන්ඩලූඔය නගරයෙන් පටන් ගත් පෙළපාලිය සංගිලි පාලම, එල්බඩ, කුඩාඔය, එතැනින් ආපසු ඇවිත් නවංගම කලපිටිය, රේසන්ගම, බෙරමාන, පුස්සැල්ලාව, මඩකුඹුර, හපුගස්තලාව, හරගල දක්වා ආවා. හැම ශාඛාවකම පිළිගැනීම් සංවිධානය කර තිබුණා. මගේ විරුද්ධත්වයක් නැහැ මේවා නීතියට එකඟව කළා නම්. දිනුවත් පැරදුනත් ඕනෑ කෙනෙකුට පිළිගැනීම් උත්සව තියන්න හෝ සාකච්ඡා පවත්වන්න පුළුවන්. නමුත් අපි නීති ගරුව කට ක්‍රියා කරන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන පිරිසක් හැටියට. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට ගියා, අංක 24 ශ්‍රී 8363 දරන ලොරිය. 26 ශ්‍රී 9545. මේවා පරීක්ෂා කරන්නය කියා මා කියන්නේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාටයි. මේවා පරීක්ෂා කර වැරදි කර තිබෙනවා නම් නිසි දඬුවම් දිය යුතුයි. ඊළඟට, 29 ක 663. ඒ කියන්නේ ගමනාගමන මණ්ඩලයේ පුන්ඩලූඔය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බස් එකක්. 31 ශ්‍රී 8987 මහින්ද දල්පිටිය මහත්මයාගේ නිල රථය. ඒ කියන්නේ සංවර්ධන සභාවේ නිල රථය 26 ශ්‍රී 9546. රම්බොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ ලොරියක්. 21 ශ්‍රී 1082. ඒ විධියට ලොරි ගණනාවක් තියෙනවා. කලපිටිය ඇපා වෑන් රථය. 28 ශ්‍රී 1243. පුන්ඩළුඔය විවිධ සේවා සමුපකාර සමිතියේ ලොරියක්. 24 ශ්‍රී 8363. පුන්ඩළුඔය විවිධ සේවා සමුපකාර සමිතියේ ලොරියක්. 24 ශ්‍රී 9545. පුන්ඩළුඔය දාසූ සහෝදරයින්ගේ වාහනය්. 22 ශ්‍රී 5326. ගන්දර සෙනරත් මහත්මයාගේ ලොරියක්. 26 ශ්‍රී 4198. ගමනාගමන මණ්ඩලයේ පුන්ඩළුඔය වාහනයක්. 29 ශ්‍රී 1343. රම්බොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ වාහනයක් 28 ශ්‍රී 2331. මේ සියලුම රථ වාහන එදා පෙළපාළියේ ගියා. පෙළපාළි යන ගමන් කල් ගහගෙන බැණ ගෙන ගියා. මට කමක් නැහැ, බැණ්නට මිනිසුන්ගෙ ඇගේ වදින්නෙ නැහැ. නමුත් ඒ ලොරිවල ගල් පුරවගෙන ගහගෙන යන වෙලාවෙ ගම් දෙක තුනක් ඇවිස්සුණා.

ගරු අගමැත්තුමා මේවා විශේෂයෙන්ම දැනගන්නට ඕනෑ. ගම් දෙක තුනක මිනිසුන්ට ගල් ගහගෙන ගියා. එක් ගමක කෙළවරේ මිල්ටන් කියන ඩයිවර් කෙනෙක් අතික් ගෙවල්වලින් ඈත් වූ නිවාසයක වාසය කරනවා. ඔහු අපේ පක්ෂයට වැඩ කළ බව ඇත්ත. ඒ තනි නිවාසයකට ගැහුවා. ඒ අවස්ථාවේ කොත්මලේ උප දිසාපතිතුමා එතුමාගේ වාහනයෙන් පුන්ඩළුඔය පැත්තට නිල ගමනක් ගිහින් තියෙනවා. එතුමා මේ සිද්ධිය දැකල වාහනයෙන් බැහැල ඒ පෙළපාළි ගිය අයට කරුණු කියා දී තිබෙනවා. "මොකක්ද මේ කරන්නෙ? ගල් ගහන එක නවත්වන්න" කියල කිව්වා. නමුත් නවත්වන්න කිව්වාට ගල් ගැහීම නවත්වා නැහැ. ගල් ගහමින් හිරිහැර කරමින් බණිමින් පෙළපාළි ගියා. ඉන් පසු ඒ අය දෙවන වරටත් ඇවිත් ගල් ගහනවාය කියල අපට ආරංචි වුණා. ඒ අවස්ථාවේ අහළ පහළ හිටපු අය දෙතුන් දෙනෙක් ඇවිත් අර නෑනැත්තාගේ භාර්යාවත් ඈහැර ගෙන යන්න උත්සාහ කරනවාය ආදී වශයෙන් නොයෙකුත් චෝදනා කරමින් පෙළපාළිකරුවන්ට විරුද්ධව කථා කරන විට ගහගන්න ඉදිරිපත් වී තිබෙනවා. ඉන් පසු ලොරියකට ගහල තියෙනවා. ලොරියේ වින්ඩ්ස්ක්‍රීන් එක කුඩු වී තිබෙනවා. ඒ විධියේ දේවල් වුණා.

එතකොට මේකෙ සම්පූර්ණ වරද කාගෙද? වරද පෙළපාළි යෑමයි. මේ පෙළපාළි යන කොට මම බලාගෙන හිටියා. අපේ ගමේ, කඩාදාර, ඔක්කොටම ගෙවල් ඇතුළට වෙලා ඉන්නය කියල නියෝග කරල මම ගියා ඉදිරියට. ඒ අය පෙළපාළි යන කොට මම පාරේ හිට ගෙන හිටියා, ඕනෑ එකක් කරපූවාවෙ මට කියල. ඇත්ත කියන්නට ඕනෑ. මේ මන්ත්‍රීවරු මට දීල තියෙනව "කලු ඇල්බට්" කියල උපාධියක්. ඒක පතුරුවා තිබෙනවා. ඒකට මට කමක් නැහැ. "කලු ඇල්බට් අපට එපා" කියාගෙන පෙළපාළිකරුවන් ගියා. මම කළේ මොකක්ද? "බොහොම ස්තුතියි, හොඳයි" කියමින් ඔවුන්ට අචාර කළා. ලෙරි 11 ක් පමණ ගියා. ඒ අවස්ථාවේදී එතැන ඩී. එම්. ඩිංගිරිබණ්ඩා නමින් හඳුන්වන අබ්බගාත මනුෂ්‍යයෙක් නිදා ගෙන හිටියා. රාත්‍රි හතට පමණ ගල් ගැහුවාය කියල නැවතත් කෑගැසීමක් ඇහුණා. මේ සෑම එකක්ම පොලීසියට පැමිණිලි කර තිබෙනවා. පොලීසියෙන් විභාග කර තිබෙනවා.

අගමැතිතුමා ඊයේ-පෙරේදත් ගිය නිසා සංගිලි පාළම හොඳට දන්නවා. ඒ සංගිලි පාළම ළඟ තිබුණා කඩයක්. යම්තම් දවසකට රුපියල් 10-15-20 ක වෙළෙඳාමක් තමයි, ඒ කඩයට තිබෙන්නේ. බොහොම දුක සේ තමයි, ඒ අය කියක් හරි හම්බ කර ගන්නේ. පුණ්ඩළුඔය පැත්තෙන් ආ ඒ පෙළපාළිකරුවන් 'සමය මන්ත්‍රී' කියන ඒ කඩයට ගිහින් අල්මාරි දෙක-තුනකුත් සමඟ ඒ කඩේ බඩු-මුට්ටු ඔක්කොම පාළමෙන් පල්ලෙහාට දමා තිබෙනවා. ඒ ගැන පොලීසියෙන් පරීක්ෂණයකුත් කර තිබෙනවා. ඒ, එකක්. ඒ පෙළපාළිකරුවන් අඹතලාවට යන කොට ඩබ්ලිව්. එම්. රත්මැණිකා කියන ස්ත්‍රිය හම්බ වුණාම 'එදා අර සාකච්ඡාව තිබුණු දවසෙ තොගෙ ගෙදර දී තමයි කෑම පිළියෙළ කළේ, තොට හොඳ වැඩක් කරනවා' කියල පිරිමියෙක් ඇගේ කටට ගහල තිබෙනවා, එපැයි කියද්දීත්. ගහල තුවාළ වෙලා. පොලීසියෙන් විභාගයකුත් කර තිබෙනවා.

මම කියන්නේ මෙයයි: මේ සියලුම දේවලට හේතුව පෙළපාලි යෑමයි. ජනාධිපතිතුමා හදිසි නීතිය පනවල, ඒ විධියට පෙළපාලි යෑම තහනම් කරල තිබෙද්දීයි, ඒ පෙළපාලි ගියේ. ඒ විධියට මිනිසුන් ඇවිස්සෙන තත්ත්වයෙන් පෙළපාලි යන්න ඉඩ හැරියේ ඇයිද කියන එකයි, අපි අහන්නේ. එම නිසා අද මොකක්ද වෙලා තිබෙන්නේ? දෙපැත්තේම අය රිමාන්ඩ් කරල. පෙළපාලි යන්න එපා යයි පොලීසිය ඒ අයට කීවමත්, වහසි බස් දොඩා තිබෙනවා. මම කැමැති නැහැ, ගරු ජනාධිපතිතුමාගෙ නම මෙතැනට ඈදන්න. 'අපි දිනලයි ඉන්නෙ, මම අහවලාගෙ අහවලා, මට බැරිද මේ වගේ එකක් කරන්න, ඒ නිසා මට යන්න පුළුවන්' කියාගෙන තමයි, පොලීසියෙන් පිටවෙලා තිබෙන්නේ. පුණ්ඩලුඔය පොලීසිය එපැයි කියද්දියි, ඒ අය පෙළපාලි ගිහින් තිබෙන්නේ. පුණ්ඩළුඔය පොලීසිය ඒ කාරණයේදී තදින් හිටියාය කියාදන් ඒ ගොල්ල ඒ පොලීසියට විරුද්ධවත් වැඩ කරගෙන යනවාලු.

මේ වගේ හිරිහැර සම්බන්ධයෙන් නාවලපිටියෙනුත් මට පැමිණිලි වගයක් ලැබී තිබෙනවා. නමුත් නාවලපිටියේ එච්චර දරුණු නැහැ. අහල-පහළ ගෙදරකට ගලක් විසි කිරීම, සමහර විට වත්තමට ගිහින් තර්ජනය කිරීම වගේ දේවල් තමයි, එහි සිදු වී තිබෙන්නේ. මේවායින් සමහරක් පෞද්ගලික එදිරිවාදිකම් පිරිමසා ගැනීම් බව පෙනෙනවා.

ඒවගේම ගම්පොළත් සුළු-සුළු දේවල් කෙරී තිබෙනවා. නමුත් පෙළපාලි වශයෙන් ගිහින් තර්ජනය කිරීම වගේ දේවල් වෙලා නැහැ. මේ වතාවේ හුඟක් තැන්වල නීතිගරුකව කටයුතු කෙරී තිබෙනවා. [බාධා කිරීම්]

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)**

*(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)*

(Mr. W. P. B. Dissanayake—District Minister, Kandy)

ගම්පොළ යම්කිසි සිද්ධියක් ඇති වෙලා තිබෙනවා නම් ඒකට සම්පූර්ණ වගකීම භාර ගන්න ඕනෑ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. 'දිනුවත් ගහනවා, පැරදුණත් කහනවා' කියලයි තමුන්නාන්සේ—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

මම කිව්වෙ නැහැ.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
*(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)*
(Mr. W. P. B. Dissanayake)

තමුන්නාන්සේත් වේදිකාව ඉදිද්දී ජයරත්න මහත්මයයි කොබ්බෑකඩුව මහත්මයයි කිව්වා—

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

මම දන්නෙ නැහැ, ඒක.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
*(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)*
(Mr. W. P. B. Dissanayake)

එක්සත් ජාතික පක්ෂයේ අහිංසක මිනිසුන්ගේ ගෙවල්වල ඉන්න ගෑණු ළමයි උස්සාගෙන යනවා කියා ප්‍රසිද්ධ කර තිබුණා. [බාධා කිරීම්] මම තමුන්නාන්සේට චෝදනා කරන්නේ නැහැ.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේට බෑ, මට චෝදනා කරන්න.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
*(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)*
(Mr. W. P. B. Dissanayake)

මම තමුන්නාන්සේට චෝදනා කරන්නේ නැහැ. අර තර්ජනය නිසා ඒ ගෙවල්වල ගෑණු ළමයි ඔක්කොම හැංගුවා, එක-එක නෑදෑයන්ගේ ගෙවල්වලට යවලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය එනවාය කියල තිබුණා, ඒ ළමයි උස්සගෙන යන්න. ප්‍රතිඵල ප්‍රචාරයේදී කොබ්බෑකඩුව මහත්මයාගෙ නම ඉස්සෙල්ලාම කියන කොට ගෙවල්වලට පැනල ඒ උදවිය රතිඤ්ඤා පත්තු කළා; රෙදි නැතුව ආවා, යූ. එන්. පී. කාරයන්ගෙ කටේ අතුල්ලන්න කියල. දැන් මහ ලොකුවට කථා කරනවා, රහත් වෙන්න වගේ. (බාධා කිරීම්) ගම්පොළ ආසනය ගැන එතුමා කී නිසයි, මම මේවා කියන්නේ. [බාධා කිරීම්] නැහැ. මම මේ කථාව කියන්නම ඕනෑ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழு உபதலைவர்)*
(Mr. Deputy Chairman of Committes)

තමුන්නාන්සේට කථා කරන්න ඉඩ දෙන්නම්.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
*(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)*
(Mr. W. P. B. Dissanayake)

මේ සැරේ ඡන්ද ප්‍රතිඵල කිව්වේ අමුතු විධියකටයි. ඉස්සර වෙලාම කොබ්බෑකඩුව මහතාගෙ නම කීවා. කොබ්බෑකඩුව මහතාගේ නම කියන කොටම රතිඤ්ඤා පත්තු කරල දමන්න පටන් ගත්ත, දඩිබිඩි ගාල ගල් ගහන්න පටන් ගත්තා, යූ. එන්. පී. කාරයන්ගෙ ගෙවල්වලට. යූ. එන්. පී. කාරයො පෙති ගහනව කියල ආවා. එහෙමයි, මේ සිද්ධිය ඇති වුණේ. [බාධා කිරීම්] ගම්පොළ කිසිම සිද්ධියක් ඇති වුණේ නැහැ කියල, එතුමාම කීවා. මමත් එය පිළිගන්නවා. නමුත් යූ. එන්. පී. කාරයන්ගේ ගෙවල්වලට ශ්‍රී ලංකා කාරයන් ගැහුවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழு உபதலைவர்)*
(Mr. Deputy Chairman of Committees)

I will give the Hon. District Minister for Kandy an opportunity to speak. The hon. Member for Kotmale can continue.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

මම එකඟ වෙනවා එතුමාත් සමඟ සෑහෙන දුරට. පෞද්ගලික එදිරිවාදුකම් උඩ සමහර විට දේශපාලන පක්ෂ අල්ලාගෙන පළිගැනීම් කර තිබුණාය කියායි මම කීවෙ. නමුත් ඒ තරම් දරුණු සිද්ධීන් මේ ප්‍රදේශයේ ඇති වී තිබුණේ නැහැ. පෙළපාලි යන්න එපාය කියා ප්‍රදේශයේ පොලිස් අධිකාරිතුමා නියෝග කර තිබෙද්දී ඒ නියෝගය නොතකා පෙළපාලි යනවා නම් රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන්නේ කොහොමද කියායි මම අහන්නේ. මම ප්‍රජාතන්ත්‍රවාදියෙක් වශයෙන් කාගේවත් පෞද්ගලික ජීවිතයට ඇඟිලි ගහන්නෙ නැහැ. (බාධා කිරීම්) තමුන්නාන්සේ ආවේ, 'බාර්' එකට ගිහින්ද?

බාර් එකට ගිහින් ඇවිත් තිබෙන්නේ මේ වෙලාවේ. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழு உபதலைவர்)*
(Mr. Deputy Chairman of Committees)

What is your point of order.

**ගාමිණී අතුකෝරල මහතා (නියෝජ්‍ය යෞවන කටයුතු හා රැකිරක්ෂා ඇමතිතුමා)**
*(திரு. காமினி அத்துக்கோறல — இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்புப் பிரதி அமைச்சர்)*
(Mr. Gamini Atukorale—Deputy Minister of Youth Affairs & Employment)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොත්මලේ ගරු මන්ත්‍රීතුමා " බාර් එකට ගිහින් ඇවිදින් " යයි කියනවා. කරුණා කර ඒක ඉල්ලා අස්කරගන්න කියන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழு உபதலைவர்)*
(Mr. Deputy Chairman of Committees)

That is not a point of order. The hon. Member can continue.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

The point is blunt.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මගේ කථාව අවසාන කරන්නට පෙර මම මතක් කරන්නට ඕනෑ, අපි හොයාගෙන ඇවිදින් තිබෙන කරුණු රාශියක්. ඒවා අපි හොයා දැනගෙන ආ ඒවා නොවෙයි. අප ළඟටම ගෙනැවිත් දුන් ඒවා ඇත්ත වශයෙන්ම ඒ කරුණු සම්බන්ධයෙන් හොයා බලන්නට අපි ගියා. මම හිතන හැටියට මට විශාල පාඩුවක් සිදු වී තිබෙනවා. 1977 දී ස්වාධීනව තරඟ කළ අපේ ප්‍රධාන පෙළේ සංවිධායකයෙකු වන ඩබ්ලිව්. වී. රණතුංග මහතාට නුවරඑළියේ රැස්වීම් ඈදීය සංවිධානය කරන්නට යන විට, ඡන්ද ව්‍යාපාරයේ යන විට යම්කිසි පිරිසක් විසින් පහර දී ඔහුව ආරෝග්‍යශාලාවට ඇතුළත් කරන්නට සිදු වුණා. ඔහුට හුඟක් තුවාල සිදු කර තිබෙනවා. ඔහුව මරන්නට තැත් කර තිබෙනවා. ඒ විධියේ තත්ත්වයක් ඇති වුණ නිසා කොත්මලේ මිනිසුන් තුළ ලොකු බයකුත් ඇති වුණා. ඒ නිසා මට සැහෙන පාඩුවක් වුණ බව කියන්නට පුළුවනි. ඒ වුණත්, කොපමණ තාඩන පීඩන කරන්නට ගියත්, හිරිහැර කරන්නට ගියත් අපේ ජනතාව ඒවාට බිය නොවුණ බව මම මේ අවස්ථාවේ දී කියන්නට කැමතියි. ඒ අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාට සැහෙන සහායක් දී තිබෙනවා.

ඇත්ත වශයෙන්ම කියනවා නම් ජනාධිපතිතුමා රටේ ජනතාවගේ ඡන්දයෙන් ආව ජනාධිපතිතුමාය කියන එක අපි දැන් පිළිගෙන ඉවරයි. ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් ඡන්ද ව්‍යාපාරයේදී තිබුණු සමහර තර්ජන ගර්ජන කවුරුවත් වහන්නට ගියාට ඒවා වහන්නට බැහැ. ඒ විධියේ දේවල් සැහෙන දුරට තිබුණු බව මරණ පරීක්ෂණයක්—'පෝස්ට් මෝටම්' එකක්—තබනවා නම් අපට හොයා ගන්නට පුළුවන් වෙනවා. ඒ පිළිබඳ විස්තර අප ළඟ තිබෙනවා. දැන් අපට ඒවා අවශ්‍ය නැහැ. අපට වුවමනා කරන්නේ ඉදිරියයි. මේ පාර්ලිමේන්තුවේ කාලය දීර්ඝ කිරීම සම්බන්ධව දැන් අදහසක් ඉදිරිපත් කර තිබෙනවා. එහි දී අපිත් ආරක්ෂා වෙනවාය කියා සමහර විට අපට කියනවා. අනේ මම දන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට එනවා නම් මාව ආරක්ෂා වුණාට කමක් නැහැ. එහෙම නැතිව ප්‍රජාතන්ත්‍ර විරෝධීව යනවා නම් අපේ ආරක්ෂාවට වඩා මහජනතාවගේ මතයටයි අපි ගරු කළ යුත්තේ. ඒක මම එදත් කිව්වා, අදත් කියනවා. පාර්ලිමේන්තුව තමුන්නාන්සේගේවත්, මගේවත් කාගේවත් බූදලයක් නොවෙයි. මේක මහජනතාවගේ බූදලයයි. මහජනතාවගේ වස්තුවයි. ඇත්ත වශයෙන්ම කියනවා නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ඒවාගේම එක්සත් ජාතික පක්ෂයත් පමණක් ප්‍රජාතන්ත්‍රවාදීව මේ රට පාලනය කළ යුතුයි කියා මම කියන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී අනිකුත් පක්ෂවලටත් ඒ අයිතියම තිබිය යුතුයි. ඕනෑම කෙනෙකුට පක්ෂයක් ආරම්භ කරන්නට පුළුවන්. ඒ පක්ෂය නඩත්තු වීම හෝ දියුණු වීම හෝ නොවීම භාර වී තිබෙන්නේ මහජනතාවටයි. පක්ෂ ගණනාවක් ආරම්භ කර තිබෙනවා. ඒවා උපන් ගෙයිදීම මැරෙනවා. අපේ ඉතිහාසය අපි දන්නවා. එම නිසා ඒ විධියට පක්ෂ ආරම්භ කළාට අපි භය වෙන්නට වුවමනාවක් නැහැ. ඒවා ආරම්භ කළ පමණින්ම මහජනතාවට ඒවා පිළිගන්වන්න කොච්චර උත්සාහ ගත්තත් මහජනතාව ඒවා පිළිගන්න යන්නෙත් නැහැ.

එම නිසා මම මේ අවස්ථාවේ දී එකක් කියන්නට කැමතියි. තමුන්නාන්සේලා කිව්වා. ලබන මහා මැතිවරණය පවත්වන්නට යන්නේ අනුපාත ඡන්ද ක්‍රමයටය කියා. පසුගිය කාලයේ තමුන්නාන්සේලා කළ කථාවලින් ඒ බව පැහැදිලි කළා. අපි ඡන්දය තියන්න යන්නේ අනුපාත ක්‍රමයටය කියා කිව්වා. දැන් තිබෙන ප්‍රශ්නය අනුපාත ක්‍රමයට ඡන්දය තියන්නෙ නැත්තේ ඇයි කියන එකයි. මැතිවරණයක් පවත්වා ඒ මැතිවරණයෙන් අවුරුදු හයක් සඳහා බලයට පත් වෙන්න අවස්ථාවක් ලබා ගන්නෙ නැත්තේ ඇයි කියන එකයි. එය දැන් අපට ප්‍රශ්නයක් වී තිබෙනවා. ඒකට යම්කිසි සැකයක් හෝ බයක් තිබෙනවාද? එහෙම වෙන්න හේතුව මම හිතන විධියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අනිකුත් විරුද්ධ පක්ෂත් සියයට 49 කට කිට්ටු ඡන්ද ප්‍රමාණයක් ලබා ගෙන තිබීමයි. එක්සත් ජාතික පක්ෂය සියයට 51 ක් අරගෙන තිබෙනවා. සියයට 51 ක් එක්සත් ජාතික පක්ෂයට [බාධා කිරීම්]—

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

ගණන් හදල බලන්න.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

එක්සත් ජාතික පක්ෂයට සියයට 51 යි. එතකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට 49 යි. එහෙම බලන විට විරුද්ධ පක්ෂ ලැබූ ඡන්ද සංඛ්‍යාවත් එක්සත් ජාතික පක්ෂය ලැබූ ඡන්ද සංඛ්‍යාවත් අතර ඉතාම සුළු වෙනසක් තමයි තිබෙන්නෙ. ඇත්තවශයෙන්ම කියනවා නම් එක්සත් ජාතික පක්ෂයට ලැබුණු ඡන්දවලින් වැඩි තරමක් ජනාධිපතිතුමාට පුද්ගලිකව ලැබුණ ඡන්ද වෙන්න පුළුවන්. ඒ කියන්නෙ හැම වෙලාවෙම එහෙමයි. දැන් තිබෙන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට ලැබුණු, මේ පාර්ලිමේන්තුවේ කාලය දික් කරන්නට ලැබුණු, පාර්ලිමේන්තුවේ වැඩ පිළිවෙලට ලැබුණු, තමුන්නාන්සේලාගේ සංවර්ධන වැඩ පිළිවෙලට ලැබුණු ඡන්ද හැටියට සමහර විට ගණන් ගන්න බැහැ. මේ ගැන හොඳට කල්පනාකාරී වෙන්න ඕනෑ. විරුද්ධවාදියා පවා, සමහර විට පුද්ගලිකව මන්ත්‍රීවරයාට විරුද්ධව ඉන්න පුද්ගලයා පවා, මන්ත්‍රීවරයාගේ වැඩ පිළිවෙලට විරද්ධව ඉන්න පුද්ගලයා පවා, සමහර විට පුද්ගලිකව අයින් වෙලා සිටි පුද්ගලයින් පවා මම දන්නවා සාක්ෂි සහිතව—ජනාධිපතිතුමාට ඡන්දය දුන් බව. අපි ඉල්ලන්නේ අපේ ගරු ජනාධිපතිතුමාම ජනාධිපතිකමට ඡන්දයෙන් පත් කරන්න කියන එකයි කියා ඒ අය කෙලින්ම ප්‍රකාශය කළා. ඒ හැඟීමයි වැඩි දෙනෙකුට තිබුණේ. එක්සත් ජාතික පක්ෂයේ වැඩි දෙනෙකුට තිබුණේ ඒ හැඟීමයි. ඒ නිසා අපි මෙතැනදී ඒ තරම උදම් අනනවා නම්, ඒ තරම් ශ්‍රේෂ්ඨ තත්ත්වයක් ඇති වුණා කියල හැඟීමක් ඇතිකර ගන්නවා නම්, මම හිතන හැටියට එය තමුන්නාන්සේලා කර ගන්න වරදක් වෙන්නත් බැරි නැහැ. අපට කමක් නැහැ, අපි පරාජය භාරගන්න කැමතියි.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

වෙන මොනවා කරන්නද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

තමුන්නාන්සේලා කිව්වත් නැතත් අපි පරාජය භාර අරගෙන ඉවරයි. ඉතින් මොකද වෙන්නෙ? අපි භාර ගෙන ඉවරයි. ඒක ඔයගොල්ලො කියන්න ඕනෑ නැහැ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න කැමතියි, මැතිවරණයක් තියන්න කටයුතු කළා නම් එක මැතිවරණයකින්ම අවසන් කරන්නට තිබුණා. එත කොට, ආණ්ඩුවේ වෙනසකුත් නැතිවයි මේ ජනාධිපති වරණය පැවැත්වුවේ. ආණ්ඩුව එහෙමමයි. ආණ්ඩුවේ බලතල එහෙමමයි ගරු ජනාධිපතිතුමාගේ බලතල එහෙමමයි. කිසිම වෙනසක් නැතිවයි මේ ඡන්දය පැවැත්වුවේ. ඒකත් ටිකක් කල්පනාවට ගන්න ඕනෑ. තමුන්නාන්සේලාට ඡන්ද වැඩි වුනා හැටි හිතන විට ඒකත් ටිකක් කල්පනාවට ගන්න ඕනෑ. ආණ්ඩුව විසුරුවා හැර නොවෙයි ඡන්දය පැවැත්වුවේ. ඒ සිද්ධි යම් දවස් ඉදිරියටත් වෙන්න යනවා. ආණ්ඩුව බලයේ සිටිද්දීම ආණ්ඩුවේ කාලය දික් කිරීමට ජන වරමක් ඉල්ලන්න සූදානම් වෙනවා. ඒ ක්‍රමය කරන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. නමුත් එසේ කරන එක හරිද වැරදිද කියන තැනයි ප්‍රශ්නය තිබෙන්නේ.

ජනමත විචාරනයක් පැවැත්වීම අවශ්‍යයි කියනවා. දැන් අවුරුදු පහක් අපි හිටියා. තවත් අවුරුදු 6 ක් ඉන්නයි ඉල්ලන්නෙ. එතකොට ඒ ඉල්ලන්නෙත් 1983 අගෝස්තු මාසයේ සිට එහාට අවුරුදු 6 කටයි. ජනමත විචාරකයක් පවත්වා රජය පැරදුනොත්—මම කියන්නෙ පරදිනවාට නොවෙයි—තමුන්නාන්සේලා දිනනවා කියල නේ සිතන්නෙ. මහජනතාවගේ ඡන්දය තමුන්නාන්සේලාගේ අතේ තිබෙනවා කියල නේ හිතන්නෙ. හා හොඳයි එහෙම හිතමු. තමුන්නාන්සේලා එහෙම හිතුවත් සමහර විට තමුන්නාන්සේලාට ඡන්ද නොලැබී තමුන්නාන්සේලා ජනමත විචාරනයෙන් පරාජය වුණොත් ඊළඟට නැවතත් මහ මැතිවරණයක් පවත්වන්නට සිදු වෙනවා. එතකොට මේ කටයුතු කරන්නෙ කොහොමද? දැන් ජනපතිවරණයක් තිබ්බා. ඊළඟට ජනමත විචාරණයක් පවත්වනවා. එය සමහර විට අසාර්ථක වුණොත් ඊළඟට සිදුවෙන්නෙ මහමැතිවරණයක් තියන්නයි. එතකොට මේ අවුරුදු එකක් දෙකක් තුළදී මේ රටේ මැතිවරණ කීපයක් පැවැත්වීම ඒ තරම් සාර්ථක වැඩපිළිවෙලක්ය කියා මම නම් හිතන්නෙ නැහැ. රටේ ආර්ථික තත්ත්වය අනුව එය ඒ තරම් හොඳ නැහැ.

අද රටේ තිබෙන ආර්ථික තත්ත්වය කොහොමද කියා කවුරුත් දන්නවා. ඒ නිසා මහ මැතිවරණයක් තබා අවසන් කරනවා නම්, එවැනි මැතිවරණයක් පවත්වා එයින් තේරෙන ආණ්ඩුවට මේ පාලන බලය දෙනවා නම් වඩා සුදුසුය යන්නයි මගේ හැඟීම.

**ආරියරත්න ජයතිලක මහතා (දිවුලපිටිය)**
*(திரு. ஆரியரத்ன ஜயதிலக்க—திவுலப்பிட்டிய)*
**(Mr. Ariyaratne Jayatillake—Divulapitiya)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සියලුම කලකෝලාහල කරන්නේත් අකරතැබ්බ කරන්නේත් ජයග්‍රහණය කළ එක්සත් ජාතික පාක්ෂිකයන්යයි පෙන්නුම් කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විශේෂ උත්සාහයක් දරාගෙන යන බව අපට පෙනෙනවා. කොත්මලේ ගරු මන්ත්‍රීතුමාගේ (ආනන්ද දසනායක මහතා) කතා වෙනුත් මට ඒ බව තේරුණා. එතුමා තමාගේ ඡන්ද කොට්ඨාශයෙන් නොව, වෙනත් ඡන්ද කොට්ඨාශ වලින් ඇහිද ගත් කෑලි අල්ලාගෙන ඒවා එක්සත් ජාතික පාක්ෂිකයන්ගෙන් සිදුවුණු අතවර හැටියට පෙන්නුම් කරන්නට උත්සාහ කළ බව එතුමාගේ කතාවට ඇහුම්කන් දීගෙන සිටින විට මට පෙනී ගියා. නමුත්, මහනුවර දිසා ඇමතිතුමාගේ වාග් ප්‍රහාරයෙන් පස්සේ කොත්මලේ ගරු මන්ත්‍රීතුමා පසුබැස්සා.

මම සූදානම් වන්නේ මේ තත්ත්වය ලංකාවේ සෑම තැනම බහුලව පැවතුණු බව පෙන්නුම් කිරීමටයි. විශේෂයෙන්ම දිවුලපිටිය ආසනය තුළ මෙබඳු සිදුවීම් රාශියක් ඇති වී තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපතිවරණයට පෙරාතුව දිවුලපිටිය කොට්ඨාශයේ ආම්ථික ක්‍රියා රාශියක් සිදුවේගෙන ගියා. මම හිතන හැටියට, පසුගිය රජයේ හිටපු නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතමාගේ අනුදැනුමත් දිවුලපිටියේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට අළුතෙන් ඇතුළත් වුණු කොමියුනිස්ට් පක්ෂයත්— කොත්මලේ මන්ත්‍රීතුමා යනවා.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

No, no, you cannot do this sort of thing. The hon. Member for Medawachchiya (Mr. Maithripala Senanayeke) and the hon. Third Member for Colombo Central (Mr. Haleem Ishak) made very serious allegations and ran away. I am here to reply. Why are you also running away ? It is not fair by this House.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dasanayake)**

I will read the HANSARD.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

What HANSARD ? Then, you should have tabled your speech. I protest against this behaviour. That is why the people of Kotmale have rejected you.–(*Interruption*)–So, you should have given your submissions in writing. It is not fair by this House. I vehemently protest against this behaviour.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழுப் பிரதித் தலைவர் அவர்கள்)*
**(Mr. Deputy Chairman of Committees)**

Yes, you can continue now.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

කතා කරලා පැනලා දුවනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආරියරත්න ජයතිලක මහතා**
*(திரு. ஆரியரத்ன ஜயதிலக்க)*
**(Mr. Ariyaratne Jayatillake)**

අපට දැන්මම පේනවා මේ තත්ත්වය. මේ අය මේ ගරු සභාවේ දී නොයෙක් අසත්‍ය ප්‍රකාශ කර, ඒ අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අපේ පක්ෂයේ වගකිවයුතු නායකතුමෙක් පිළිතුරක් දෙන්න ප්‍රථමයෙන් මේ අය පිට වී යනවා. මීට ප්‍රථම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් මේ ගරු සභාවේ දී කළ ප්‍රකාශවල තරාතිරම ඒකෙන්ම අපට වැටහෙනවා, ඇත්ත වශයෙන්ම.

දිවුලපිටිය ආසනය සම්බන්ධයෙන් මම කියන්න සූදානම් වුණේ ජනාධිපතිවරණයට පෙරාතුව එහි කොතරම් දුමරික ක්‍රියා සිදුවුණාද යන කාරණයයි. 19 වැනිද, පාන්දර දෙකට ලක්ෂ්මන් ජයකොඩි මැතිතුමාගේ වාහනයෙන් දුමරික පිරිසක් පැමිණ එක්සත් ජාතික පාක්ෂිකයන් බලහත්කාරයෙන් පැහැරගෙන ගොස් ලක්ෂ්මන් ජයකොඩි මන්ත්‍රීතුමාගේ ගෙදර නතර කරගෙන තිබෙනවා. ඉංග්‍රීසියෙන් ඒක 'ඇබ්ඩක්ෂන්' කියනවා. 'කිඩ්නැපිං' කියන්නේ පුළුවනි. මේ චෝදනා හැම එකටම වාගේ අහු වෙන විධියට මගේ පාක්ෂිකයන් බලහත්කාරයෙන් අරගෙන ගිහින් ලක්ෂ්මන් ජයකොඩි මහතාගේ ගෙදර නතර කරගෙන ඉතාම අමානුෂික විධියට ඒ තරුණයන්ට තලා, කොන්ද කඩලා, එක් තරුණයෙක් වතුර ටිකක් ඉල්ලුවාම පිස්තෝලයක් කටට ලංකොට, මෙන්න මේකෙන් තමයි තොට වතුර දෙන්නේ කියා, හිරිහැර කර ගෙන ගියා.

මම පොලිස් නිලධාරීන්ගේත් සහාය ඇතිව ක්ෂණිකව පියවර ගත් නිසා මට පුළුවන් වුණා ඒ තරුණයා බේරා ගන්නට. එහෙම නැත්නම් අද ඒ අහිංසකයා ජීවතුන් අතරත් නැහැ. එහෙම කරලා ඉවර වෙලා දැන් මේ අය එක්සත් ජාතික පාක්ෂිකයන් හිරිහැර කරනවායයි කියනවා. අහම්බෙන් සිදුවුණු මරණයක් පිට දමාගෙන මා මිනිමරුවකු කිරීමටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක පිරිස සූදානම් වන බව මට මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. දිවුලපිටිය ආසනයේ පෞද්ගලික කෝන්තරයක් නිසා අහිංසක ස්ත්‍රීන් ගණනාවක් මරුමුවට පත් වුණා. ඒ අවස්ථාවේ දී මේ උදවිය විශේෂ වාහනයක් යොදා මුළු ආසනය වටේම කියාගෙන ගියා ජයතිලක සහ ඔහුගේ සහචරයෝ අහිංසක ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් මරණවාය කියා. අභාග්‍යයකට වාගේ ලක්ෂ්මන් ජයකොඩි මහත්මයාගේ රියැදුරුතුමාගේ භාර්යාවත් මේ මරණයට අහුවුණු ස්ත්‍රී කෙනෙක්. එයින් ප්‍රයෝජන අරගෙන පත්තරවල පවා මේ විධියට ප්‍රකාශයන් කර ගෙන ගියා. ඔක්තෝබර් මාසයේ 26 වැනි ද 'දිවයින' පත්‍රයේ ප්‍රවෘත්තියක් පළ වී තිබෙනවා සැකකරුවන් තාවම අල්ලා නැහැ කියා. දිවුලපිටිය ප්‍රදේශයේ සිදු වූ මේ මරණ සම්බන්ධයෙන් එක ඡේදයක තිබෙනවා "දිවුලපිටිය මන්ත්‍රීවරයාගේ නිවස ආසන්නයේ සිදු වූ මේ මිනී මැරීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයාගේ උපදෙස් පරිදි විශේෂ පරීක්ෂණ ආරම්භ කර ඇති අතර දැනටමත් 25 දෙනෙකුගෙන් පමණ පොලිසිය ප්‍රශ්න කර ඇත" කියා. මෙහි බොහොම වෙහෙස මහන්සියක් අරගෙන තිබෙනවා මේ මරණ සිදු වී තිබෙන්නේ මන්ත්‍රීවරයාගේ නිවස අසලයි කියන කාරණය ඉදිරිපත් කර මාව මෙයට හේත්තු කරන්නට. මාව මෙයට හේත්තු කර මුළු එක්සත් ජාතික පක්ෂයටම මඩ තැවරීමේ ව්‍යාපාරයක් කර ගෙන යන්නයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දැන් සූදානම් වන්නේ. එහෙත් ගරු කථානායකතුමනි, මම කියනවා එක්සත් ජාතික පක්ෂයේ කිසිම කෙනෙක්වත් මමවත් චක්‍රවර්ති රාජ්‍ය ලැබුණත් මිනී කඳන් උඩින් බලයට එන්නටවත් මන්ත්‍රීකම් ගන්නටවත් ලැනැස්ති නැත කියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පුරුද්දක් තිබෙනවා මිනී කඳන් මත වැළපිලා මිනී කඳන් උඩින් බලයට යෑමේ. එය තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමතියි. [බාධා කිරීමක්] එම්බාම් කළ මළ මිනීවලින් පවා ප්‍රයෝජන අරගෙන බලයට පත්වීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිරිතයි. මේ මිනී මැරීම සම්බන්ධයෙන් මම පොලිස්පතිවරයාගෙන් ඉල්ලීමක් කර තිබෙනවා, සම්පූර්ණ විභාගයක් කර මේ මිනී මරුවන් අල්ලන්නය කියා. ඔවුන් ඇල්ලූ දවසට අපේ නිර්දෝෂී තත්ත්වය ඔප්පු කරන්න පුළුවන් වෙයි කියා මම තමුන්නාන්සේට කියන්න කැමතියි.

තවත් බොහෝ මන්ත්‍රීවරුන් මේ සම්බන්ධව කථා කරන්නට සිටින නිසා මම වැඩිපුර වේලාව ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් මම කියන්න කැමතියි මේ ඡන්දයට පෙරත් පසුවත් දිවුලපිටිය ආසනයේ සෑම දුමරික කටයුත්තක්ම කර ගෙන ගියේ කරගෙන යන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්ම බව. ඡන්දය ඉවර වී මම ගමට එන්නට කලින් මට ආරංචි වුණු යූඑන්පී ආධාරකරුවන්ගේ මෝටර් සයිකල් දෙකකට ගිනි තබා ඒ අයට වෙඩි තබන්නට එලවන විට ආරක්ෂාව සඳහා ඔවුන් සැඟවුණු අවස්ථාවේ පවා අනික් පක්ෂය පොලිසියට පැමිණිලි කර තිබෙනවා කියා එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයෝ ගෙවල්වලට ගිනි තබමින් මහා විනාශයක් කරගෙන යනවාය කියා. දැන් සැලැස්ම තිබෙන්නේ ප්‍රකෝප කරවලා "ගලේ කකුල හප්පලා ගල ඇවිත් අපේ කකුල් පාගනවා" කියන කියමනේ විධියටයි. දැන් මේ ව්‍යාපාරය සූදානම් කරගෙන යන්නේ ඒ විධියටයි. එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයින්ට විරුද්ධව නොයෙක් දේවල් කර තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ අය වචනයකින් හෝ ඒ සම්බන්ධව විරුද්ධත්වය ප්‍රකාශ කළාම අතිශයෝක්තියෙන් පොලිසියේ පැමිණිලි දමා එක්සත් ජාතික පාක්ෂිකයින් අමාරුවේ දමන උප ක්‍රමයක් දැන් කරගෙන යනවා. ඒ නිසා ගරු ජනාධිපතිතුමා හදිසි නීතිය දමා ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පාක්ෂිකයින් ආරක්ෂා කළ යුතු අවස්ථාවක්ය දැන් තිබෙන්නේ කියා මම කියනවා. අපේ ප්‍රදේශයේ දුමරික ක්‍රියා කරන්නේ එක්සත් ජාතික පාක්ෂිකයින් නොවයි, ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයින් නිසා මේ හදිසි නීතිය තවත් දික් කරන හැටියට ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

**අනුර බණ්ඩාරනායක මහතා** (නුවරඑළිය-මස්කෙළිය දෙවන)
*(திரு. அனுர பண்டாரநாயக்க—நுவரெலிய-மஸ்கெலிய இரண்டாம் அங்கத்தவர்)*
**(Mr. Anura Bandaranaike—Second Nuwara Eliya-Maskeliya)**

Sir, today we have had a very long and tiresome debate lasting nearly seven hours and fifteen minutes and as is customary in this House, which is quite



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනුර බණ්ඩාරනායක මහතා]

unfortunate, all we have had for these seven hours have been accusations and counter-accusations thrown at each by the United National Party to the Sri Lanka Freedom Party and by the Sri Lanka Freedom Party to the United National Party. But it is rather unfortunate that none of the speakers from either side of the House condemned violence. Whether it had originated from your side or from our side violence must be condemned. Up to now I have not heard a single speaker condemn this, apart from making one allegation after another–(*Interruption*). You did so ? I am glad, but I did not hear you saying so. I do not think it prudent at all or wise for a House, an august Assembly as this, to waste seven hours of its time making futile accusations at each other. If violence has been resorted to, whether it be by supporters of the United National Party or by the Sri Lanka Freedom Party, I do not think the average citizen of this country exercised his franchise and gave an overwhelming mandate for President Jayewardene to continue with violence from anyone.

I think the only speech worthwhile that was made from the Government benches, was the speech by the Hon. Prime Minister. As is customary with him, very eloquently, playing with words he was hitting right round the wicket, and today I saw him hitting sometimes into his own goal, his own side with great eloquence. Now, as I proceed I will deal with the Hon. Prime Minister's speech, where there are two or three points which I like to clarify.

Today, the Debate that we are all participating in is the Debate on the Emergency originated as a result of the Presidential Elections. For over one month the United National Party presented its case to the people. During the same one month, the Sri Lanka Freedom Party and the chief opposition force in this country presented its case to the people as well, and the people of this country have decided by a majority vote to repose their confidence in the United National Party candidate, President J. R. Jayewardene.

Now, as is customary with all opposition parties, when one loses one begins to analyse the causes of defeat. Sometime in an attempt to rejuvenate one's own supporters and sometimes in an attempt to malign the victor. Whatever that may be, several statements have originated from the opposition. I do not wish to say " yes " or that I disagree with those statements. But, whatever the analysis may be, whatever criticism one might make, particularly in some of the statements there have been innuendoes, unfortunate innuendoes, a shot here and a shot there, sometimes at our own selves, these analysis are not worth anything at all. The people of this country rightly or wrongly have given a mandate. We may not agree with them, but they have given you an overwhelming mandate to rule this country for six years.

Therefore, as a democratic party, as a party that accepts the verdict of the majority, the Sri Lanka Freedom Party accepts that verdict of the people, and on behalf of the Sri Lanka Freedom Party–I am sorry that none of our speakers referred to this–I think it is our duty in the course of this Debate to congratulate His Excellency, President J. R. Jayewardene on the overwhelming mandate he received.

Sir, while saying that, may I also say that the Sri Lanka Freedom Party has no reason to feel dejected. It has no reason to feel that it has no future, because with all the overwhelming odds that were raised against us, we polled 30 per cent of the votes that were cast, and we increased our votes from 1.8 million to 2.5 million. The Hon. Prime Minister in his speech, tried to show that this increase was insignificant. He tried to argue by quoting various names–I have taken them down–saying that because of those people votes were increased, and he mentioned the names of Mr. Monnekulama and Mr. Jinadasa Niyathapala. I would like to remind the Hon. Prime Minister that both Mr. Monnekulama and Mr. Niyathapala, though they contested as independent candidates in 1977, had the fullest backing of the Sri Lanka Freedom Party. So, if you want to show that we have increased our votes because you add on votes of people like Niyathapala and Monnekulama, I think that is a futile exercise, because we backed them and they were virtually our candidates before they became independent candidates.

The Hon. Prime Minister referred to Mr. Mudiyanse Tennekoon. Mr. Mudiyanse Tennekoon–I am subject to correction–pledged his support to President Jayewardene in the middle of the campaign. I think he made a public statement saying that he was endorsing his candidature (*Interruption*). Yes, but whatever votes he obtained in 1972 would have gone to you (*Interruption*). No, he made a public statement.

ආර්. ප්‍රේමදාස මහතා
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

No, no.

අනුර බණ්ඩාරනායක මහතා
*(திரு. அநுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

Yes, yes !

ආර්. ප්‍රේමදාස මහතා
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

Not in support. He never made a statement in support. He made certain suggestions for the country. But you know that he was one of the candidates who gave his nomination against our candidate.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

That is right. His nomination was rejected. But I think I read it somewhere, and I thought he supported President Jayewardene. That is what I was aware of ?. The Hon. Prime Minister referred to the MEP. What is the total vote of the MEP in this country ? Not even 25,000 votes. They referred to Mr. Dharmasekera. What is the total number of votes he polled in Beruwala last time ? Not even 7 or 8,000 votes. Whatever the small number of votes they polled in 1977, the fact remains that in this country there are two fundamental political parties. The people have endorsed it in 1977. They said it is OK in 1972 – that is the Sri Lanka Freedom Party and the United National Party. There is no doubt about that, Sir (*Interruption*). No. I leave that to the hon. Member for Kalawana.

Now the verdict that the people gave on the 20th of October is a clear and a definite rejection of extremism and of revolutionary politics. What happened to the Janatha Vimukthi Peramuna ? These great heroes of the revolution – they appeared to be the local Che Guevaras or Fidel Castros. If you look at it all, you would have thought that they would have ruled this country for 25 years. They claimed to have 8,00,000 members. What has happened today ? They polled only 4 per cent of the national vote, and Mr. Wijeweera got only about 2 1/2 lakhs of votes. These are the great heroes who wanted to take Mrs. Bandaranaike to Galle Face Green and hang her. But the people hung them on the 20th of October and relegated them to the dust bin of history.

Sir, what happened to the Lanka Sama Samaja Party ? I have my personal regards, the greatest regards for Dr. Colvin R. de Silva. He is an experienced politician and an eminent lawyer in this country. What has happened to him ? His politics for 40 years have been rejected totally, and he polled only 50,000 votes.

I gave you these two illustrations to show that the people of this country have given a clear verdict that these two parties will continue to dominate the politics of this country for a long time, and that the only two parties that will remain in the political arena will be the Sri Lanka Freedom Party and the United National Party.

Now, Sir, I am not saying this with any intent to insult my Colleague on my left. I do not want to talk about the Communist Party, Sir, because they helped us in the election.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உபதலைவர்)
(The Chairman of Committee)

Order, please ! The Hon. Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிக் குழுத் தலைவர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaraike)

Mr. Speaker, I would also like to take this opportunity of placing on record the sincere thanks of the Sri Lanka Freedom Party to the people of Jaffna. Because, for the first time in the history of Jaffna politics, they have voted overwhelmingly for a Sinhala party. I am not going to analyse now the reasons as to why, but I think it is our duty to place on record our sincere thanks to the people of Jaffna for having given us a large number of votes from the Jaffna peninsula.

Now, Sir, the speaker who spoke on behalf of the Opposition said today that there was a pillar in the Sri Lanka Freedom Party. The Elections Commissioner on the 9th of September, without any question, irrefutably decided that there was only one Sri Lanka Freedom Party, and that Sri Lanka Freedom Party is led by Mrs. Sirimavo Bandaranaike. So that there are no two Sri Lanka Freedom Parties in this House. There is no Maithripala Senanayake Sri Lanka Freedom Party. There is only one Sri Lanka Freedom Party. The decision of the Elections Commissioner is final, it is clearly stated in the Constitution, and there is no dispute over the matter whatever. Therefore, I would like to deal with that matter, because that idea was placed on record here during the course of the debate.

Now, Mr. Speaker, the Hon. Prime Minister in his speech, followed by a number of Ministers and Members of Parliament, particularly by my Friend the Hon. District Minister of Colombo, tried to impress upon this House that the Sri Lanka Freedom Party was taken over by some sinister Marxist Group, a Group that was totally opposed to any form of democratic ideals, and so on, and so forth. I am not getting into a debate, Sir, on the veracity of those facts. All I am saying is this. My father built this Party to be a Party committed to Parliamentary democracy, to decency and to human dignity. If there is any doubt about the way in which the Sri Lanka Freedom Party is going, may I assure the House, and through this House the people, that the very soul and spirit of the Sri Lanka Freedom Party cannot be taken on a road which we do not wish to travel on. If there is anybody within the Sri Lanka Freedom Party, who is opposed to what the Sri Lanka Freedom Party has stood for the last 30 years, for what 2 1/2 million people voted only one week ago, and if they want to take us on a road on which we do not want to travel, the doors are open for them to leave the Sri Lanka Freedom Party.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

I would like to have a clarification. Your party newspaper 'The Dinakara' has reported on the 6th October, 1982:

"කොබ්බෑකඩුව ජය ගැනීමෙන් පසු වමේ රජයක් පිහිටුවනවා—ඉලංගරත්න"

You say there is only one Sri Lanka Freedom Party since you were recognised by the Commissioner of Elections, and if that decision is conclusive, I fully agree with you.

In the first instance, please let us know who is your Group Leader in this House. Because we would like to know who is speaking for the Sri Lanka Freedom Party. Secondly, you say one thing now, but Mr. Illangaratna, who is your Deputy Leader, says, "කොබ්බෑකඩුව ජය ගැනීමෙන් පසු වමේ රජයක් පිහිටුවනවා." This is in your own paper. Then your own brother-in-law, who is supposed to be some Assistant Secretary, says, "කොබ්බෑකඩුව දිනවන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවකට නොව වාමාංශික ආණ්ඩුවකටයි. ඒ වාමාංශික ආණ්ඩුවේ සියලුම ප්‍රගතිශීලීන් සමග එක් වී වාමාංශික ආණ්ඩුවක් පිහිටුවනවා සමාජවාදය ගොඩ නැගීමට."

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaraike)

From what are you quoting?

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

I am reading from all the reported speeches in "The Dinakara". I have given the reference. Then the other is in the "Lankadeepa", which has not been denied. The other is in the same "Lankadeepa":

"දිනුවට පස්සෙ කොමියුනිස්ට් පක්ෂය අතරමං කරන්නෙ නැහැ—විජය කුමාරතුංග"

That is also in "The Lankadipa". None of these things have been denied. But now you are coming out with another theory. So we would like to know what is the official statement in regard to the position of the Sri Lanka Freedom Party.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

The Hon. Prime Minister asked me two questions. The first one is, who is the group Leader? I think, if I remember right, when we moved into this House in April, we notified the Hon. Speaker that we recognized Mr. Lakshman Jayakody as the Leader of the Parliamentary Group of the Sri Lanka Freedom Party, but that request was turned down, I think, on the ground that already Mr. Maithripala Senanayake was the leader of the Sri Lanka Freedom Party Group, and at that time there was a dispute that was pending. You yourself said a dispute was pending, and the Election Commissioner had not decided. Now I do not think there should be any dispute over the matter at all. Mr. Maithripala Senanayake is not a member of the Sri Lanka Freedom Party (*Interruption*). He is not a member of the SLFP. He has not applied to join the Sri Lanka Freedom Party yet. So his application has not even been considered. So I request the Hon. Speaker, at this point of time, now that this dispute has been settled conclusively and finally, to recognize the Hon. Member for Attanagalla (Mr. Lakshman Jayakody) as the leader of the Sri Lanka Freedom Party Parliamentary Group until Mr. Maithripala Senanayake is taken in as a Member. There should be no dispute in the matter at all.

The second question raised by the Hon. Prime Minister is about certain alleged speeches made by an Assistant Secretary of the Sri Lanka Freedom Party and by a Deputy Leader.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

Deputy Leader?

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

I would like to remind the Hon. Prime Minister that, in the first two sentences of the Sri Lanka Freedom Party Constitution, our aims are clearly stated:

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මූලික ප්‍රතිපත්තිය ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදයයි, එනම් මැද පිළිවෙතයි.

Now, this is how the Sri Lanka Freedom Party's Constitution starts its preamble. If anybody, a member of the Party, says that we are going to form a Red Government, that is totally against the principles of democracy. These speakers have received no mandate from either the Working Committee of the Sri Lanka Freedom Party or the Politbureau of the Sri Lanka Freedon Party to establish a Red government in this country. (*Interruption*) I wish I had the power to do that.

Mr. Speaker, the Sri Lanka Freedom Party, as some speakers from the government tried to show, is not a party of anarchists, it is not a party of nihilists, neither is it a party that is based or founded on the principles of Marxism. There are certainly Sir, principles of Marxism, of Maoism, of Leninism, of Castroism, or whatever 'ism' there is, that we must learn. But the Sri Lanka Freedom party especially committed and wedded to the Parliamentary system in this country, and whatever changes that take place must take place through peaceful and just solutions particularly through the vote.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Sir, may I say this, that if anybody wishes to take the Sri Lanka Freedom Party on other paths, they are not taking us on the paths the founder of the Sri Lanka Freedom Party meant it to go. Further, we have the ultimate faith in the intrinsic values and aspirations of the people of Sri Lanka. It is by their wisdom, it is by their experience, it is on their ideals and ideas that this Party has been founded. It is precisely because of that that within three years of our foundation we were able to come into power in 1956, defeating a powerful UNP government, and it is because of that that twice after that, in 1960 and 1970, the Sri Lanka Freedom Party was able to gain so many more seats in Parliament. It is precisely because of that that 2 1/2 million people still repose confidence in the Sri Lanka Freedom Party. Therefore, Sir, I would like to assure this House, and the people of this country through this House, that the Sri Lanka Freedom Party will not tolerate any form of anarchy, any form of violence, and if the Government has any evidence, any concrete evidence that can be proved, not just mere allegations, we will take action against those Members. We will not tolerate this kind of violence in our party. May I assure this country, Sir, that if the Hon. Prime Minister can prove the allegations he has made–I am not doubting what he says–if he can prove them, substantiate them, we will deal with them. If any of our members have been trying to resort to violence, to take over the State by means of violence, that is totally against the principles of what we stand for. (*Interruption*)

ආර්. ප්‍රේමදාස මහතා
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

What did they do to the hon. Member for Wattala?

අනුර බණ්ඩාරනායක මහතා
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

I have heard of this. I was out at Nuwara Eliya at that time after the election. If it can be proved, why do you not take action? If innocent people's cars have been attacked, whether they are SLFPers or UNPers, I think we should act. The Government has been appointed–

ජේ. ඒ. ඊ. අමරතුංග මහතා (වත්තල)
*(திரு. ஜே. ஏ. ஈ. அமரதுங்க—வத்தளை)*
(Mr. J. A. E. Amaratunga—Wattala)

ඒ මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නය ගැන මම පිළිතුරු දෙන්න ලැහැස්තියි එතුමා ඉවර වුණාට පස්සෙ.

අනුර බණ්ඩාරනායක මහතා
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

I am not saying that the hon. Member for Wattala must be wrong. What I am saying here is very clearly that whoever had resorted to violence, whether it be the members of our party or members of your party, the people have given you a mandate to deal with this. Therefore, I urge you, if any member of our party or member of your party for that matter–I will come to that in a moment–has resorted to violence, please deal with that. I am not standing up here and saying that the SLFPers have done no wrong. If there is evidence please deal with them. Equally, I am urging you, if there is evidence against members of your Party–there is mounting evidence against some of them–please deal with them in the same manner, because this mandate was given to President Jayewardene in spite of some of our Members in Parliament. I know in many electorates many UNPers have told our supporters that they are voting for President Jayewardene and not for the UNP member of that area. So it is a clear mandate he has got, and I am sure the President will deal with this very severely, because he has already ordered that one hon. member of Parliament be arrested. I do not want to mention names, Sir. He is now on bail, I believe. That is the kind of way you must deal with them. If you deal with the rest of the members of your Party in the same manner, I think there will be no violence hereafter, after elections.

The Hon. Prime Minister, in a long and lengthy analysis, went on to make several allegations. I will deal with just two of them. The Hon. prime Minister made a reference to a speech alleged to have been made by Mrs. Chandrika Kumaranatunga in Attanagalla where he alleged that she called the President a dog. I do not know whether this was said, and I find it very hard to believe it. I must check on the veracity of that satement, and if such statement has been made, I do apologize to the President that a member of our Party should have ever said a thing like that. Because we do not consider the President to be a dog. He is a human being. I do not think Mrs. Chandrika Kumaranatunga has said it, and if she has said it, I do apologize.

Now, Sir, there are Members of this House who have called the President a dog. I never called the President a dog because I always admired him as a person, however much I may have disagreed with him, we do not agree with his economic policies at all. There are a number of occasions where we violently disagreed with him, but I never thought of the President as a dog. But there are Members of this House who called him a dog: සැදෑ දෙදෙන් බල්ලො. They have joined you now. But I do not think Sir, other members of our Party have ever called the President a dog. So if such a statement has been made, I do apologize.

Now, getting on to the other point raised by the Hon. Prime Minister, he made a reference to a former member of this House, a former member of your Party, the Member for Panadura, Dr. Neville Fernando who has now joined us. He made reference to him, and subsequently another member also made reference to



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනුර බණ්ඩාරනායක මහතා]

him. We are proud to have Dr. Neville Fernando with us. I think he is one of the few members of this House who can still walk on the road without allegations been cast on him. An honourable man, for whatever reason he came out of this House, he has been able to raise the SLFP votes in Panadura from three thousand to twentythree thosand. Your majority from eleven thousand was brought down to two thousand entirely because of Dr. Neville Fernando, and we are proud to have men like that. I think it is your loss and our gain to have Dr. Neville Fernando with us.

Now, Sir, this talk of violence and thuggery that has dominated the proceedings of this House for over seven hours is not uncommon in this country. After every election the winners go on the rampage. In 1970 half the voters went on the rampage because there was a change from a U.N.P. administration to an S.L.F.P. administration. In 1977 also there was another change from the SLFP Government to the UNP Government and your supporters went on the rampage. But, here, there has been no change of government at all. When there is a change of government there is euphoria, there is enthusiasm ; there is bound to be some ragging or some stoning–perfectly natural–though it should not be allowed. Out there are certain acts which can be accepted. Here, there was no change of government. It is another six years you have been given to rule this country. It is the continuation of the same Government and the same President. So there was no need for your supporters to have gone on the rampage. If they had done so, you must deal with them. If our supporters had gone on the rampage, even having lost, there also you must deal with those people. Therefore, I do not think we should hide behind the excuse : the SLFP supporters have gone on the rampage ; therefore, what is the harm in the UNP supporters going on the rampage ? That is no argument.

Now, Mr. Speaker, President J. R. Jayewardene declared the Emergency before the presidential election was over. That was indeed a welcome thing. It was a very good thing that he anticipated this kind of incident and declared the Emergency. But has the Emergency that he declared been used wisely ? Has the Emergency been used to prevent your supporters going on the rampage and harassing innocent people ? I do not think that is happening. From a number of cases–I will quote now two or three of them–I will try to show this House some of the events that have taken place.

To start with my electorate in Nuwar-Eliya, on the day before the election the van of one of our principal supporters, Mr. W. V. Ranatunga of Kotmale, was waylaid in Patana near Talavakelle. He was at one time a supporter of your party. He contested as an Independent in 1977 and collected 7,000 votes on his own. Now he has joined us and he is one of my active supporters in Nuwara-Eliya. He was assaulted brutally and, in fact, on the day of the election, before I went to cast my vote, I had to go and see him in hospital. He was badly bruised with a couple of broken ribs. Several complaints had been made to the police and they did not act upon them. The SLFP's office is in Nuwara-Eliya town. The election office was smashed to smithereens. Again, one of my organisers, Mr. R. Senarath, the owner of the property had to incur a loss of over one lakh of rupees. Nothing has been done, no inquiry has been made.

Now, Sir, take the example of what happened in Polgahawela. I do not want to mention the names of anybody here, but I think one of the worst affected electorates has been Polgahawela. My private secretary, Lionel Rajapakse, who was also a very active SLFP politician in Polgahawela had gone to a funeral on the day after the election. He was coming back on his motor cycle with another supporter of his. He was waylaid and brutally assaulted with iron bars, crow-bars and cycle chains.

Then the MEP organiser of Polgahawela, a man by the name of Amarasinghe was also very badly attacked. His child was dashed on the ground. I have seen some newspaper photographs of his child in hospital. The father was attacked. The mother was attacked and the boutique was smashed up. These are two cases which I know personally because I went to visit them in the Kurunegala hospital and I heard the whole story.

These are things that you must control, and particularly now that the President has got into his hand the resignations of all the Members of the UNP, I hope he will take them and act wisely. I am sure that he does not condone this violence. In fact he received a mandate to wipe it out, and a mandate received by Mr. J. R. Jayewardene should not have been misused by Members of Parliament who never received such a mandate.

Those three examples are not the only examples. There is the example of our organizer at Kesbewa, Mr. Dickson J. Perera, who is a member of the Dehiwela Municipal Council and who was also brutally assaulted. Kesbewa Electorate was one of the few electorates in the country that the Sri Lanka Freedom Party won back from the UNP by a majority of nearly 1,000 votes, and our organizer at Kesbewa has been brutally assaulted and he is still in hospital. In Ratnapura, there are reports of various acts of violence and thuggery.

I do not want at this late hour of night to go into the laborious details of incidents that have taken place. I have mentioned to you three or four examples of your top politicos who have abused this and done various wrong things. Now do not reply to me by saying that our fellows have done worse things. That is not the argument, but it is to deal with this kind of violence and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

end it once and for all because the people gave you a mandate for peace and justice and not for war and injustice. Therefore, I urge the government, particularly President J. R. Jayewardene, to deal with this kind of violence so that it will never occur again never again in this country, whenever elections are held, and that is what exactly every citizen in this country, whether he belongs to the UNP or the SLFP wants.

Reference was made, I think, in the course of the Hon. Prime Minister's speech to an attack on a vehicle, I believe, belonging to the hon. Member for Wattala (Mr. J. A. E. Amaratunga). Now, if there is sufficient evidence that certain hooligans or thugs have quite unnecessarily and unprovoked set themselves upon a vehicle of a Member of Parliament, for that matter of anybody else, I think, the Government must firmly deal with that. I am not asking you to protect the SLFP supporters. If they have done it you must deal with them as much as you would deal with the UNP supporters.

I would like now to make three requests from the Government. My first request is to continue the Emergency until the situation completely settles down, to continue it until all acts of violence and thuggery in this country are brought under control. Secondly, I would request the Government, and particularly President J. R. Jayawardene, to appoint a comittee of impartial persons, not of politicians but of former Judges acceptable to both sides of the House, to inquire into all acts of violence that have taken place in this contry. The third request is to pay compensation to alleviate the sufferings that the average man is going through due to thuggery and violence in the villages of this country. These are the three requests that I wish to make from the Government and specially from President J. R. Jayewardene.

Before I wind up may I say that I support the extension of the Emergency as long as this violence continues and we hope that you will have the courage and the foresight to bring it under control as soon as possible.

Mr. Speaker, with these remarks, and thanking you and the House for the indulgence given me at this very late hour of the night, I conclude my speech.

**එච්. බී. අබේරත්න මහතා (නියෝජ්‍ය ගමනාගමන මණ්ඩල පිළිබඳ ඇමතිතුමා)**

*(திரு. எச். பி. அபேரத்ன—போக்குவரத்துச் சபைகள் பிரதி அமைச்சர்)*

(Mr. H. B. Abeyratne—Deputy Minister for Transport Boards)

ගරු කථානායකතුමනි, මගේ මැතිවරණ කොට්ඨාශයේ මේ සභාවේ සාකච්ඡා වුණ කිසිම සිද්ධියක් සිදු වී නැහැ. නමුත් මම කියන්න කැමතියි, මේ හදිසි නීතිය දඬම්මා කරගෙන ඇතැම් රජයේ නිලධාරීන් විසින් කළ අමානුෂික සිද්ධි ගැන. මම මේ සිද්ධිය මේ ගරු සභාවට කියන්නේ විශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය නිසයි.

ජනාධිපතිවරණය පිළිබඳ ප්‍රචාරක කටයුතු අවසන් වුණේ 17 වෙනිදා. 20 වෙනිදා ඡන්දෙ පැවැත්තුවා. 21 වෙනිදා උදේ සිට ඡන්ද ප්‍රතිඵල නිකුත් වුණා. 23 වෙනිදා රාත්‍රී 3 ට පමණ දොරවේරුව කියන ගමේ මගේ ඡන්ද දායකයෝ දෙන්නෙක් මට ඇවිත් ප්‍රකාශ කළා, ගමේ විජේසූරිය කියා තැනැත්තෙක් මේ උදවියට හිංසා පීඩා කරන්න තර්ජනය කරනවාය කියා. ඒ පණිවුඩය ලැබුණු අවස්ථාවෙදි මම මහව පොලීසියට ගිහින් කුරුණෑගල පොලිස් අධිකාරිතුමාට දුරකථනයෙනුත්, ගොකරැල්ලෙ පොලිස් ස්ථානාධිපතිතුමාට ගුවන් මගි නුත් කථා කර කිව්වා, කරුණාකර මේක මැඩපවත්වන්න වහාම කටයුතු පිළියෙල කරන්නය කියා. ඒ කියලා මමත් උදේ පහට හයට පමණ එතැනට ගියා. පොලිස් අධිකාරිතුමා සහකාර පොලිස් අධිකාරිතුමාත් පොලිස් ස්ථානාධිපතිතුමත් ඇතුළු පොලිස් කණ්ඩායමක් ඒ පිළිබඳව අවශ්‍ය පියවර අරගෙන කටයුතු කර ගෙන යමින් තිබුණා.

මේ කියන දවසෙ උදේ මමත් අපේ පක්ෂ හිතවතුනුත් අනුරාධපුරේ ශ්‍රී මහා බෝධියට ජනපතිවරණය සම්බන්ධයෙන් පිළියෙල කරගෙන තිබුණු බෝධි පූජාවක් සඳහා යාමට පිරිසට උදේ අටට මහව මගේ ගෙදරට එන්න කියලා තිබුණා. ඒ සඳහා ලංගම බස් පහකුත් පිළියෙල කරලා තිබුණා. මහව පොලිසියේ නිලධාරීන් ඒ බස් රථ පහම පොලීසියට ගෙනැවිත් එහි සිටි සියලු දෙනාටම අමානුෂික සිටියට පහර දීම් කර තිබෙනවා. විසි එක් දෙනෙක් රිමාන්ඩ් කර තිබෙනවා. මම ඒ අය බලන්න ගියා. හැම කෙනෙකුටම තුවාලයි. වෛද්‍යවරයෙකුට ඉදිරිපත් කරලා ඒ අය පරීක්ෂා කළා. ඊට අමතරව අත් අඩංගුවට නොගත් තව 175 දෙනෙකුට පමණ පිරිසකට අමානුෂික විධියට ගහල තිබෙනවා. ඒ අය මහව ආරෝග්‍ය ශාලාවේත් කුරුණෑගල ආරෝග්‍ය ශාලාවේත් දැනට වෛද්‍ය ප්‍රතිකාර ලබමින් සිටිනවා.

මම විශේෂයෙන් මේ අවස්ථාවෙදි තමුන්නාන්සේට සඳහන් කරන්න කැමතියි. මේ උදවිය පොලීසියෙන් අත් අඩංගුවට අරගෙන සම්බන්ධ කරන්න උත්සාහ කෙළේ මගේ මැතිවරණ කොට්ඨාශයේ මම ප්‍රථමයෙන් සඳහන් කළ සිද්ධියටයි. මහව පොලිසියේ සිට හැතැප්ම තිහක තිස් දෙකක දුර ප්‍රමාණයකට එහායි මා විසින් ගෙකරැල්ල පොලීසියටත් කුරුණෑගල පොලිස් අධිකාරිතුමාටත් සඳහන් කළ සිද්ධිය වුණේ. මහව පොලීසිය අත් අඩංගුවට ගත් බස් රථ සියල්ල දොරවේරුව කියන ගමට ගමන් කරමින් තිබුණේ නැහැ. එයින් බස් රථ 4 ක් මගේ නිවස දෙසට ගමන් කරමින් තිබුණු අතර, එකක් මගේ නිවසට පැමිණ නතර කර තිබුණු බස් රථයක් ඒ රථය තුළ කිසිම මගියෙක් සිටියෙ නැහැ. සියලු දෙනෙක්ම සිටියෙ බස්රියෙන් බැහැල මගේ නිවස ඇතුළෙ. ඒ බස් රථයේ රියැදුරා පමණක් පොලීසියට ගෙන ගියා. අනික් උදවියට ගැහැව්වා. එසේ ගහල ඉවර වෙලා මෙන්න මේ විධියේ පුවතක් 26 වෙනි අඟහරුවාද ප්‍රධාන පුවත හැටියට පළ කර තිබුණා:

"240 දෙනෙක් අත් අඩංගුවට, 36 දෙනෙක් රිමාන්ඩ් භාරයට නියෝජ්‍ය ඇමති පළා යයි. තුවක්කු පිස්තෝල කඩු කිනිසි වැනි භයානක අවි ආයුධ පටවාගෙන බස් රථ පහක් ........"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. බී. අබේරත්න මහතා]

මම දක්කා "බී" රෙජිස්ටරයේ කර තිබෙන පැමිණිල්ල බස් රථ 5 ට නඩු 5 ක් දමා තිබෙනවා. මේ බස් පහේම පූරවාගෙන ගිහින් තිබෙන්නේ, නැත්නම් බස් පහේම තිබී තිබෙන්නේ බලපත්‍ර ඇති තුවක්කු දෙකක් පමණයි. ඒ දෙකත් පොලීසිය විසින් ඒ අයිතිකරුවන්ගේ ගෙදරවලට ගිහින් අත් අඩංගුවට අරගෙන ඇවිත් ඒ අයගේ නම්වලට ඇතුළත් කළ තුවක්කු දෙකක්. මේ වාර්තාවේ තිබෙන්නෙ මහව ප්‍රදේශයෙ ගම් දෙකක කඩ කැඩීමට බස් දෙකක් පූරවාගෙන දාමරික පිරිසක් සමග ගියාය කියලයි. එකම කඩයක්වත් කඩල නැහැ,, එකම ගෙයකටවත් ගලක්වත් ගහල නැහැ, එකම තැනකදීවත් හූ කියල නැහැ. එහෙම කිසිම සිද්ධියක් වෙලා නැහැ. මේ මැතිවරණ කොට්ඨාශයේම, අපේ අයගෙන්වත් විරුද්ධ පක්ෂයේ අයගෙන්වත්. නමුත් මේ පත්‍රයෙ තියෙනව 'ප්‍රශ්න කිරීම සඳහා රජයේ නියෝජ්‍ය ඇමතිවරයකු සොයා ගැනීමට මහව පොලීසිය මහත් උත්සාහයක යෙදී සිටි' කියල. මේ සිද්ධිය වුණාය කියන්නෙ ඔක්තෝබර් මාසයෙ 23 වනදා. 23 වනදා 3 1/2 ට විතර මම මහව පොලීසියෙයි හිටියෙ. දවල් 12 වනතුරු කුරුණෑගල පොලිස් අධිකාරිතුමා සමග ඒ දොරවේරුව කියන ගමේ හිටිය. ඉන් අනතුරුව සවස 3.45 ට ගොකරැල්ල පොලීසියෙ හිටිය. එහෙම හිටපු අවස්ථාවෙදි මම සඳහන් කරන්න සතුටුයි, ගරු අගමැතිතුමා කොළඹ සිට ඒ මම හිටි පොලිස් ස්ථානයේ දුරකථනයෙන් මාත් සමග කතා කළා. ඉන් අනතුරුව සවස 5.30 ට පමණ කුරුණෑගල නගරයට ඇවිත් පොලිස් අධිකාරිතුමා සමග දුරකථනයෙන් කතා කළා. මේ සිද්ධිය සම්බන්ධයෙන් මගෙන් යමක් දැන කියා ගන්න ඕනෑය කියලවත් එදා සවස 5 1/2 වනතුරුවත් මට කිව්වෙ නැහැ.

ගරු කථානායකතුමනි, මාසයකට වැඩි කාලයක් මේ මැතිවරණ කටයුතුවල යෙදී සිටි නිසා, මට විවේකයක් නොතිබුණු නිසා. මගේ දරුවන් තුන් දෙනාම අධ්‍යාපනය ලබන්නෙ කුරුණෑගලයි, ඒ උදවිය නැවතී සිටින නිවසට ගිහින්, ඒ අයගේ අඩුපාඩුකම් සාකච්ඡා කළා, එදත් ඊට පසුවදාත්, නමුත් මේ වාර්තාවෙ කියා තිබෙන්නෙ මෙහෙමයි:

'නියෝජ්‍ය ඇමතිවරයාගේ මෙහෙයවීම පිට ගිය බව කියන 240 ක පමණ පිරිසක් පොලීසිය මගින් අත් අඩංගුවට ගෙන ඇති අතර ඉන් 36 දෙනෙකු රිමාන්ඩ් භාරයට පත් කර ඇත.'

ගරු කථානායකතුමනි, මම මහව නගරයෙන් ඒ කියන දවසෙ පිටත් වුණේ 4 1/2 ට 5 ට විතර ඒ අවස්ථාවේදී පිටත් වුණු මම එදා මුළු දවසේවත්, පසු දවසේවත් මගේ මැතිවරණ කොට්ඨාශයෙ සිටියේ නැහැ. මම හිටියෙ කුරුණෑගලයි. එම නිසා, මම මේක මෙහෙයුවාය කියනවා නම් ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්.

ගරු කථානායකතුමනි, ඊළඟට තවදුරටත් මෙහෙම තියෙනව:

"රිමාන්ඩ් භාරයට පත් කර ඇති මෙම පිරිස අතර නියෝජ්‍ය ඇමතිවරයාගේ සහෝදරයෙක් ද සිටී."

මගේ සහෝදරයො දෙන්නෙක් සිටිනව. එයින් එක් කෙනෙක් මහව මධ්‍ය මහා විද්‍යාලයෙ විදුහල්පති. අනික් එක්කෙනා ඉන්නව කුලියාපිටියෙ. ඒ දෙන්නාගෙන් එක් කෙනෙක්වත් මේ කියන සිද්ධි සම්බන්දයෙන් අත් අඩංගුවට ගෙන නැහැ. ඒ දෙන්නාම වැඩි මහල් සහෝදරයො. මම තමයි පවුලෙ බාලයා. මට බාල සහෝදරයො නැහැ.

මේ පත්‍රයෙ තවදුරටත් මෙහෙම තියෙනව:

'ජනාධිපතිවරණයෙන් පසු දොරවේරුව සහ මහව යන ගම් දෙකක සිටින පිරිසකගේ ගෙවල් දොරවල් විනාශ කිරීමට මෙම පිරිස අදහස් කර ඇතැයි කියන අතර පොලිසියට ලැබුණු ආරංචියක් අනුව ආයුධ සන්නද්ධව බස් රථවල නැගී එමින් සිටි පිරිස අතර මගදී අත් අඩංගුවට ගැනීමට පොලීසිය සමත් වී ඇත'

දැන් මේ හැම බස් රථයක්ම අත් අඩංගුවට අරගෙන තිබෙනවාය කියන්නෙ මහව නගරයෙ මගේ නිවස දෙසට එන විටයි. නමුත් මෙවැනි සිද්ධියක් වුණාය කියා පැමිණිල්ලක් දමා තිබෙන්නෙ දොරවේරුවට යන කොටයි. එම නිසා මා කියන්න සතුටුයි ඉතාම කෙටියෙන් මේ හදිසි නීතිය දඩම්මා කර ගෙන මේ කටයුතු කරන නිලධාරීන් කිප දෙනෙකු සම්බන්ධයෙන් පොලිස් අධිකාරී මහත්මයාට අපි පැමිණිලි කළා. එතුමා මේ අවස්ථාව වනකොට මහව පොලීසියෙ සියලුම නිලධාරීන්ගේ රාජකාරී කටයුතු තාවකාලිකව නතර කරල මේ පරීක්ෂණය පැවැත්වීම සඳහා නිකවැරටියෙ පොලිස් ස්ථානාධිපති තුමා පත් කර තිබෙනව. මෙයින් එක් නිලධාරියෙක් ගැන පමණක් කියන්න සතුටුයි. එදා ඒ ගල්ගමුවෙ ගරු මන්ත්‍රීතුමාගේ නිවසට ගිහින් එතුමා සම්බ වෙන්න ගිය පිරිසකට 'තොපි මන්ත්‍රීතුමාට—දෙන්නද ආවේ' කියල කියා තිබෙනව. ඒ අවස්ථාවෙදි ඒ සිලරත්න කියන පොලිස් සාර්ජන්ට් මහත්මයාට ඒ මන්ත්‍රීතුමාගෙ ගෙදර හිටපු පිරිස ගැහැව්ව. ඊට පස්සේ පොලිස් සාර්ජන්ට් මහත්මය සමාව ඉල්ලා ගෙන තිබෙනව. මේ පොලිස් සාර්ජන්ට් මහත්මය ඇතුළු මහව පොලීසියෙ—මම නම් සඳහන් කරන්න කැමති නැහැ, දැනට පොලිස් පරීක්ෂණයක් පැවැත්වෙන නිසා—විශාල පිරිසක්, පෞද්ගලිකව මටත්, මගේ මැතිණියටත් අපහාස කරමින්, ඒ බස් රථවල ගමන් කළ පිරිසට පහරදීම ගැන මගේ බලවත් විරෝධය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන අතර මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 10.55

**ජේ. ඒ. ඊ. අමරතුංග මහතා, (වත්තල)**
*(திரு. ஜெ. ஏ. ஈ. அமரதுங்க—வத்தளை)*
**(Mr. J. A. E. Amaratunga—Wattala)**

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ න්‍යායයට අනුව දිනුවත් ගහනවා, පැරදුණත් ගහනවා. එක්සත් ජාතික පාක්ෂිකයන් දිනුවත් ගුටි කන්න ඕනෑ. පැරදුනත් ගුටි කන්න ඕනෑ.

අපේ ගරු අගමැතිතුමා සඳහන් කළා යම් සිද්ධියක් ගැන. නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීවරයාත් සිද්ධියක් ගැන සඳහන් කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මූලස්ථානය තමයි රොස්මීඩ් පෙදෙසේ නිවස. මැතිවරණයෙන් අපේ වත්තල ආසනයට විශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබුණා. වැඩි ඡන්ද දාහතරදාස් ගණනක් ලැබුණා. කිසිම හිංසාකාරී සිද්ධියක් ඇතිවුණේ නැහැ. ලේ බින්දුවක්වත් හෙළ වුණේ නැහැ. එක විරුද්ධ පාක්ෂිකයෙකුටවත් කිසිම අලාභයක් පාඩුවක් සිද්ධ වුණේ නැහැ. සාමය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරක්ෂා කරගෙන අපි කටයුතු කළා. මැතිවරණය අවසාන වී 21 වැනිදා සවස අපේ නායකතුමාට, ජනාධිපතිතුමාට, සුබ පතන්නට යන්නට වාහන දෙකක් ගෙනාවා. මමත් ඒ එක වාහනයකට නැගල කොළඹට එන්නට පිටත් වුණා. ඇස් වාට්ටුව හන්දියේ වට රවුමෙන් ඇවිත් වෝඩ් ප්ලේස් එකෙන් දිගටම අපට යන්න ඉඩ දෙන්න බැරිය කියල පොලිස් නිලධාරියෙක් කියපු නිසා අපට සිද්ධ වුණා රොස්මීඩ් පෙදෙස හරහා අනික් පැත්තෙන් බොරැල්ල පැත්තෙන් ඇවිත් අපේ නායකතුමා හමු වෙන්නට යන්නට. මැකාර්ති පාරෙන් හරවල රොස්මීඩ් ප්ලේස් එකට හැරෙද්දිම රොස්මීඩ් ප්ලේය් එකේ බණ්ඩාරනායක මැතිනියගේ මන්දිරය ළඟ ගේට්ටු දෙක ළඟ කණ්ඩායම් දෙකක් ඉන්නවා අප දුටුවා. ඒ අය අතේ බෝතල් සහ ගල් තිබෙන බව මම දැක්කා. මම හිටියෙ කොළ පාට ෂර්ට් එකක් ඇඳල. පිටිපස්සෙන් ආපු අපේ ආධාර කාරයොත් කොළ පාට ෂර්ට් ඇඳල හිටියෙ. අර පිරිස කොළ පාට ඇඳුම් දැක්ක හැටියෙම ගල්වලින් සහ බෝතල්වලින් ගහන්න පටන් ගත්තා. එකක් වැදුණා, මා ගමන් කළ රථයේ ඒ පැත්තේ වීදුරුවට. වාසනාවකට වාගේ අපේ රියැදුරා වාහනය නොනවත්වා කෙළින්ම ඉදිරියටම ගෙන ගියා.

අපේ වාහනය පස්සෙන් ආවා, විවෘත හුඩ් එක නැති ස්පෝර්ට්ස් කාර් එකක්. ඒකෙ පිටිපස්සෙ හිටපු දෙදෙනාට බෝතල් පහරවල් වැදුණා. එකක් ඔළුවට වැදුණා. අනික් එක අතට වැටුණා. ඒ එක්කම පිටිපස්සෙන් ආවා කුලියට දුවන රෝද තුනේ ස්කූටර් රථයක්. මා සිතන හැටියට ඒකෙ ගමන් කළේ ප්‍රවාහණ ඇමතිතුමාගේ ආධාරකරුවන් වගයක්. ඒ අයට හොඳටම තුවාල වුණා. මම දන්නෙ නැහැ, ඒ අය පැමිණිල්ලක් කළාද කියල. ලේ වැක් කෙරී වැක් කෙරී ඒ අය ගියා. තවත් හුඟක් පුද්ගලයන් මේ සිද්ධිය දැක්කා. කොළඹ දිසා ඇමතිතුමාගේ මස්සිනා කෙනෙකුත් මෙම සිද්ධිය දුටුවාය කියා මට පසුව දැනගන්නට ලැබුණා.

ඊටපස්සෙ පොලිස් නිලධාරීන් පිරිසක් අඬ ගහගෙන මම නැවතත් ඒ ස්ථානයට ආවා, තුවාල ලැබූ උදවියත් එක්ක. අර පුද්ගලයො ඒ අවස්ථාවේදී විශාල යකඩ ගේට්ටු දෙක වහගෙන නිවස තුළට වී හිටියා. මම ඉල්ලීමක් කළා පොලිස් නිලධාරීන්ගෙන් විසිපස් දෙනෙක් පමණ වූ ඒ පිරිස අත්අඩංගුවට ගන්නය කියලා. පස්සේ උසස් නිලධාරියෙක් පොරොන්දු වුණා. නීත්‍යානුකූලව ක්‍රියා කරනවාය කියල. පස්සෙ මට දැනගන්නට ලැබුනා දෙදෙනෙකු අත්අඩංගුවට ගත්තාය කියල. ඒ දෙදෙනාම අයි. ආර්. සී. කාරයො. බොහොම නරක වාර්තා තිබෙන නම් දරාපු මිනීමරුවො. මට අද ආරංචියක් ලැබුණා එයින් එක් කෙනෙක් කාණ්ඩු දෙකේ තුවක්කුවක් තියාගෙන අර මම දෙවන වරට ඒ ස්ථානයට පැමිණි අවස්ථාවේදී ඇතුළෙ ඉඳල මට වෙඩි තියන්න තැත් කළාය කියල. නමුත් ඇතුළේ උන්න අනික් අය භය වෙලා ඒ මිනිහට වෙඩි තබන්න දුන්නේ නැතිලු. තලංගම කොට්ඨාශය භාරව කටයුතු කරන පොලිස් නිලධාරි මහතාගෙන් ඒ විස්තර දැන ගන්න පුළුවන් වෙයි. මට පසුව දැන ගන්න ලැබුණා, ඒ විධියට ඇතුළට දමා ගෙන හිටියේ ජනාධිපතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රචාරක කටයුතු බොහොම ඉදිරියෙන් මෙහෙයවපු විජය කුමාරතුංග මහතාගේ පිරිසක්ය කියා.

එපමණක් නොවෙයි. පොලීසිය ඒ ස්ථානයට ගියාම දැක ගන්න ලැබී තිබෙනවා, ඒ යකඩ දොර පිටුපස්සේ ගල් ගොඩවල් තිබෙනවා. එයින් ඔප්පු වෙනවා, ඒ අය මේකට ලෑස්ති වෙලා හිටපු බව. ඒ පාරෙන් ගමන් කරන කවුරු හෝ වේවා යූ. එන්. පී. කාරයන්ට පහර දෙන්න ඒ අය සූදානමින් ඉඳලා තිබෙනවා. නුවරඑළිය-මස්කෙළියේ දෙවැනි මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) කීවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එවැනි ආමරික කම්වලට සම්බන්ධ වන්නේ නැත කියා. එම නිසා මම එතුමාට මතක් කරන්න කැමතියි, මේ සිද්ධිය ඇති වුණේ ඒ ගොල්ලන්ගේ ගෙදරින්, රෝස්මිඩ් පෙදෙසින් බව.

අපේ වෑන් එකට ගල් පහර වැදුණාම ඒක ඉස්සරහින් නවත්වා, බැස්සාම මම දැක්කා, එහි සිටි අය. මගේ පැමිණිල්ලේත් මම සඳහන් කර තිබෙනවා, මැතිණියත් හිටියාය කියා. මම දැක්කා, එතුමියත් උඩ ඉඳලා බලාගෙන ඉන්නවා. අපට ගහනවා, ඒ උදවිය බලා ගෙන හිටියා. එක්සත් ජාතික පක්ෂයේය කියා සැක කරන වාහනයක් ඒ පැත්තෙන් ගියා නම් ඒකට ගහන්න වැඩ පිළිවෙළක් ලෑස්ති කර තිබුණු බවයි, මට නම් පෙනී යන්නේ. මම ඒ අවස්ථාවේදීම කුරුඳුවත්තේ පොලීසියට පැමිණිල්ලක් කළා. එතැනදී කට-උත්තර කීපයක්ම ගත්තා, ඒ වාහනවල ගමන් කළ අපේ ආධාරකාරයන්ගෙන්. එම නිසා මම විස්තර කළේ, සත්‍ය සිද්ධියක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය එහෙම කරන්නේ නැහැ කියා කොපමණ කීවත් ඒ විධියේ සිද්ධියක් වුණු බව සනාථ කරන්නයි, මම මේ වචන ස්වල්පය කථා කළේ.

**ආර්. පී. විජේසිරි මහතා** (හාරිස්පත්තුව දෙවන)
*(திரு. ஆர். பீ. விஜேசிறி—ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர்)*
**(Mr. R. P. Wijesiri—Second Harispattuwa)**

ගරු කථානායකතුමනි, මේ හදිසි නීති විවාදයේ දී මා කථා කරන්න බලාපොරොත්තු වුණේ නැහැ. නමුත් මේ විවාදයේදී සඳහන් වුණු ඇතැම් කරුණු නිසා මට කථා කරන්න සිදු වෙනවා. නුවරඑළිය-මස්කෙළියේ දෙවැනි මන්ත්‍රීතුමා මගහැර ගොස් තිබීම ගැන මම කනගාටු වෙනවා. එතුමා වක්‍ර විධියට 'බිලූ' කථාවක් ඇදල හිටන් ඒ වගේ කථා එයා කරන්නේ නැහැ කියල මගහැර යෑම ගැනයි, මගේ කනගාටුව.

මම අර අපහාස නඩුවට මුහුණ පෑවේ මොන වගේ තත්ත්වයක් යටතේද කියන එක මම අද මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා. ඒ සියලුම දේවල් මම එදා කළේ වැටී තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩ ගැනීමට නම් එක්සත් ජාතික පක්ෂය නමැති ගහේ මුලටම—නායකත්වයට—නොගහා අතු—ඉතිවලට ගහල ඒ ගහ බිම දමන්න බැරි නිසයි. ඒ නඩුවේදී ඊනී ප්‍රශ්නයක් උඩ බේරුණු මා සම්බන්ධයෙන් අති ගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා ප්‍රජාතන්ත්‍රවාදියකු හැටියට අනුගමනය කළ ක්‍රියා පිළිවෙළ ගැන මම පසුගිය ජනාධිපතිවරණයේ රැස්වීම්වලදීත් රට පුරා කියාගෙන ගියා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය මෙතැනට ඇවිත් නම් බොහොම ශුද්ධවන්තයො වගේ කථා කරනවා. නමුත් මගෙන් අහගන්න එපා, පසුගිය කාලයේ ශ්‍රී ලංකා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. පී. විජේසිරි මහතා]

නිදහස් පක්ෂය සංවිධානය කළ දේවල්. ඒවා කියන්න නම් දවස් ගණනාවකුත් මදි වෙයි. වැරදි කර තිබෙනවා නම් ඒ වැරදි කළ උදවියට විරුද්ධව ක්‍රියා කරන්නය කියා අද මෙතැන අභියෝග කළ නුවරඑළිය-මස්කෙළිය දෙවැනි මන්ත්‍රීතුමාට මම එකක් කියන්න කැමැතියි. 1980 ඔක්තෝබර් මාසෙ 16 වැනි ද ඇති වුණු දේවල් මොනවාද? ඒ මන්ත්‍රීතුමා අදත් කියා හිටියා, තමන්ගෙ ලේකම් මහත්මයාට වෙලා තිබෙන හිරිහැරයක් ගැන. එදා පොල්ගහවෙල රේල් පීලි පන්නල කෝච්චි පෙරළුවෙ කවුද? ඔය කියන ලේකම් මහත්මයා නොවෙයිද කියන ඒ මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමැතියි. එයාගේ ලේකම් බැසිල් රාජපක්ෂ මහත්මයා 1980 ඔක්තෝබර් මාසයේ 16 වැනිදා කරපු වැඩ ගැන මගෙන් ඇහුවොත් මම ඒවා දීර්ඝ වශයෙන් කියන්නම්. මම ඒවා පොලිසියට දැනුම් දීලා තිබෙනවා. පොලිසිය මෙතෙක් කල් ඒවා ගැන හරියාකාරව රාජකාරි නොකළ එක ගැන මම කණගාටු වෙනවා. කරලා තිබෙනවාද කියන්න මම දන්නේ නැහැ. නමුත් මේවා මේතරම් ප්‍රමාද කිරීම හොඳ නැහැ. අද මේ වාගේ තත්ත්වයක් උදාවීමට මූලික හේතුව ඒවා ගැන ක්ෂණිකව ක්‍රියා කරපු නැති එකයි කියන එක මම විශේෂයෙන් කියනවා.

අද රණතුංග මහත්මයා ගැන කණගාටුව ප්‍රකාශ කරනවා. දැනට මාස දෙකකට ඉස්සර වෙලා, මේ අවුරුද්දේ අගෝස්තු මාසයේ 28 වැනිදා නුවරඑළියේ එයාගෙයි, එයාගෙ අම්මගෙයි රැස්වීමක දී කී දෙනෙකුට ගැහුවද? කී දෙනෙකුට කෙටුවද? කැළණියේ ඉන්නවා නන්ද සේන කියා මිනීමරුවෙක්. මෙයාගේ හොඳ 'චක්ගෝල යෙක්'. එයා කී දෙනෙකුට ගැහැව්වද? හබරාදූවේ අපේක්ෂක සරත් ඩයස් එදා අගෝස්තු මාසයේ 28 වැනිදා නුවරඑළියේ රැස්වීමෙන් පස්සේ කී දෙනෙකුට ගැහුවද? අපි පක්ෂ මූලස්ථානය භාරව ඉන්න වෙලාවේ මේ නන්දසේන තමයි අපි සමස්ත ලංකා කාරක සභා රැස්වීමක් පවත්වන වෙලාවේ ශාන්ත ජෝශප් විද්‍යාල භූමියේ වාහනයක කඩු, කිරිච්චි ගෙනත් තබාගෙන සිටියේ. මෙයාගේ ගෝලයෙක් නොවේද, ජස්ටින් නවරත්න මොකක්ද කළේ? ලංකාව පුරාම ගිහින් සම්මන්ත්‍රණ පවත්වා ඔක්තෝබර් මාසයේ 16 වැනිදාට මේ විධියට කැරළි ගහන්නට ඕනෑ, මේ විධියට 'ට්‍රාන්ස්ෆෝමර්' වලට ගහන්නට ඕනෑ, මේ විධියට බස් වලට ගහන්නට ඕනෑ, පාලම් කඩන්නට ඕනෑ, කියල උපදෙස් දුන්නේ කවුද? නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමාගේ (අනුර බණ්ඩාරනායක මහතා) ගෝලයෝ තමයි ඔය සම්මන්ත්‍රණවලට ගිහින් උපදෙස් දුන්නේ. අද මෙතැනට ඇවිදින් වැරදි කරලා තිබෙනවා නම් අච්චු කරන්න යයි කියනවා. දඬුවම් කරන්න යයි කියනවා. සුද්දෝ හැටියටයි කථා කරන්නේ.

ගරු කථානායකතුමනි. අම්මගෙ ප්‍රජා අයිතිය නැති වෙන්න ගිය වෙලාවේ මේ රටම ලේ විලක් කරන්නට පමණක් නොවෙයි, මහජනයා සතු සියලුම ආයතන විනාශ කරල, පාලම් කඩල, කෝච්චි පෙරළල තමන්ගේ අම්මගෙ ප්‍රජා අයිතිය රැක ගන්න කටයුතු කරපු නායකයෝ—මන්ත්‍රීවරු—අද මෙතැනට ඇවිදින් සුද්දෝ වගේ කථා කරනවා. දැන් මේ අවස්ථාවේ මෙතැන නැති වීම ගැන මම කණගාටු වෙනවා. මට ප්‍රකාශ කරන්නට හුඟක් දේවල් තිබුණත් දැන් ඒකට වෙලාවක් නැහැ. මම දැන ගත්තා මොනවා හරි කියයි කියල. ඒ නිසා තමයි, ගරු කථානායකතුමනි, මමත් මේ තරම් වෙලා මේ ගරු සභාව ඇතුළටම වෙලා බලාගෙන හිටියේ. මේ උදවිය දුවනවා. කියල දුවනවා. අපට සිරිතක් නැහැ එහෙම. අපි වරදක් කරලා තිබෙනවා නම් ඒ වරද පිළිගන්න ආත්මශක්තියක් අපට තිබෙනවා. බල්ලෝ දුවන ගණනටයි මේ අය දුවන්නේ. කථා කළා, දිව්වා.

අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන කථා කරනවා. එයා පරිවාස කාලයේ ඉන්නේ. තවම එයාගේ සාමාජිකත්වය වත් හරියට නැහැ. ඉතින් එයා කොහොමද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්නේ. මට දැන් අයිතියක් නැහැ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන කථා කරන්න. නමුත් එයා පරිවාස කාලයෙ—ප්‍රොබේෂන් පීරියඩ්—එකේ ඉන්න කෙනෙක්. නියෝජ්‍ය නායක ඉලංගරත්න මහත්මයාගේ කථාවලට විරුද්ධව මේ විධියට කථා කළා පුදුමයි.

ගරු කථානායකතුමනි, මම තවත් වැදගත් කාරණයක් කියන්නට ඕනෑ. 18 වැනිදා, 19 වැනිදා වන විට හාරිස්පත්තුව ආසනයේ ගමක් ගානේ බෝම්බ යවා විශාල වශයෙන් සංවිධානය වෙලා තිබුණා. එක්සත් ජාතික පක්ෂයට ආධාර කරන සියලු දෙනාගේම ගෙවල් ලකුණු කරගෙනයි හිටියේ. දෙවියන් තමයි අපව බේරුවේ කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. මම පසුගිය මාසයේ 28 වැනිදා එක්සත් ජාතික පක්ෂයේ වේදිකාවට නැංග දවසේ ඉඳලා මගේ ගෙදර දුරකථනය පාවිච්චි කරන්න බැරි තත්ත්වයකට ගියා. හැම වෙලාවේම මරණවා කියා තර්ජනය කරනවා. අපහාස කරනවා. බණ්ඩාරනායක මැතිතුමාගේ නම විකුණාගෙන කන මේ අය දැන් ශ්‍රී ලංකා නිදහසක් පක්ෂයේ නමත් විකුණාගෙන කනවා. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බණ්ඩාරනායක මැතිතුමාගේ ප්‍රතිපත්ති කිසිවක් නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. කවුරුත් බලන්නේ ඒක අද ජීවන මාර්ගයක් කර ගෙන ඒකෙන් ජීවත් වෙන්නයි. ඒ මිසක් එතුමාගේ ප්‍රතිපත්ති අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ නැහැයි කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ විධියට මහජනයා පොළඹවනවා, මහජනයා අතරමං කරනවා, මහජනයා කුපිත කරවනවා. මහජනයාට දෙනවා මේ වගකීම: විරුද්ධවාදීන් විනාශ කිරීමට, විරුද්ධවාදීන්ගේ නිවාස විනාශ කිරීමට. මට ආරංචියි විදේශීය ආයතනයකින්—මම මේ චෝදනාව මීට කලිනුත් කළා.—විසි ලක්ෂයක් හාරිස්පත්තුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකයාට ලැබිලා ඒ සල්ලි ඔක්කොම ඔහු විසින් හාරිස්පත්තුවේ ඡන්ද ලබාගන්න වියදම් කළ බවට. නමුත් අපි ආඩම්බරයි කියන්න, ගිය වතාවේදී එක්සත් ජාතික පක්ෂයට—ඡන්ද දෙක බැගින්—ඡන්ද 49,000 යි ලැබුණේ, නමුත් මේ වාරයේ තනි ඡන්ද 43,000 න් ලැබුණා. ගිය වතාවෙ ගණන තනි ඡන්ද නම් 24,500 යි. අපේ විදේශ කටයුතු භාර ඇමතිතුමාටත්, මටත් වාසනාව උදාවුණා ඒ 24,500 ය 43,000 දක්වා වැඩි කරන්න. අපි ඒක ආඩම්බරයෙන් කියනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොකක්ද මේ සංවිධානය, කව්ද සංවිධායකයො? දොස්තර මහරූප් සංවිධානය කළා, මිනිසුන් පෙළ ගැස්සුවා, මිනිසුන්ට නොයෙක් විධියේ අදහස් දුන්නා. 17 වැනිදා සිට ගෙයත් අත්හැරදාලා ගිහිල්ලා. හමුදාවෙන් තමයි 20 වැනිදා සිට මේ පෙරේදා වනතුරු ඒක මුර කළේ. මෙහෙම නායකයින් පස්සෙන් තමයි මේ අසරණ මිනිස්සු ගිහිල්ලා අතරමං වෙන්නෙ. ඒ වාගේම නුවර එළිය—මස්කෙළිය මන්ත්‍රීතුමාත් (අනුර බණ්ඩාරනායක මහතා) කිව්වා, එයා නුවරඑළියේ ගිහිල්ලා හිටියාලු. එයා නුවරඑළියේ අපේක්ෂකයින් ගැන අනුකම්පාව දැක්වූවා. නමුත් ඒ උදවිය මිනිස්සු උසිගන්වලා, මිනිස්සු අමාරුවෙ දාලා හොඳට නිවාඩු ගත කරනවා, නුවරඑළියෙයි, අරෙහෙයි මෙහෙයි. අසරණ පාක්ෂිකයො තමයි මේ හැම දේටම මුහුණපාන්න ඕනෑ. ඒ නිසා මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා හදිසි නීතිය පැනවීම ගැන. එදා 20 වැනිදා හදිසි නීතිය කැඳෙව්වෙ නැත්නම්—මට පවා විශාල තර්ජනවලට මූහුණපාන්නට සිද්ධවුණා. එදා වුනත් මම දන්නෙ නැහැ මම මේ කොළඹ එන බව දැනගෙන, අද මොනවා වෙලා තිබෙනවාද කියන එකවත්. මට ලොකු කල්පනාවක් තිබෙනවා ඒ ගැන. ඒ තත්ත්වයෙනුයි අද අපට ජීවත්වෙන්න වෙලා තිබෙන්නේ, ගරු කථානායක තුමනි.

පැරදිලා මේ වාගේ තර්ජනය කරනවා නම්, වැරදිලාවත් දිනුවූ නම් මම හිතන්නෙ අද අපේ මළ කඳන් තමයි හොයාගන්න වෙන්නෙ. සමහරවිට ඒකවත් හම්බ වෙන්නෙ නැහැ. ඒ තරම් සැලැස්මක් තිබුණෙ. ඒ විධියට මහජනයාට දී තිබුණ ධෛර්යයක්, පාක්ෂිකයින්ට දී තිබුණා විශ්වාසයක්, අපි කොහොමහරි ජයග්‍රහණය කරනවා කියා. ඒකට රජයේ ඇතැම් නිලධාරීන් උදව් වුනා. ඇතැම් පොලිස් නිලධාරීනුත් උදව් වුණා. විශේෂයෙන්ම කුණ්ඩසාලෙ ආසනයෙ—මේ 20 වැනිදාසින් පස්සෙ, ප්‍රතිඵල නිකුත් වුණාටත් පස්සෙ—විශ්‍රාම ගිය පොලිස් පරීක්ෂක මහත්මයෙක්—ඒකනායක කියල—නොයෙක් විධියේ අවි ආයුධ අරන් ගිහිල්ලා එක්සත් ජාතික පාක්ෂිකයින්ට තර්ජනය කරනවා, අදත් තර්ජනය කරනවා. මම කිහිප වරක් පොලිසි කිහිපයකට ගියා මේ පුද්ගලයා ගැන පැමිණිලි කරන්න.

ගරු කථානායකතුමනි, ඒ උදවිය මේ විධියට හිතුවක්කාර විධියට කටයුතු කරනවා නම් මා හිතන්නෙ අපටත් සිද්ධවෙයි ඒවාට පොලිසියේ පිහිට ලැබෙන්නෙ නැත්නම්, අපේ බලයවත් පාවිච්චි කරලා ඒ මැරවරයො නැත්නම් දාමරිකයො මෙල්ල කරන්න. ඒක කරන්න අපට සිද්ධවෙයි කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. එමනිසා මේ සුළු වේලාව දුන් තමුන්නාන්සේට ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා (කලවාන)**
*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*
(Mr. Sarath Muttetuwegama—Kalawana)

ගරු කථානායකතුමනි, හුඟක් රෑ බෝවෙලා තිබෙන අවස්ථාවෙ මම දීර්ඝව තමුන්නාන්සේගේ කාලය ගන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නමුත් මේ විවාදයට තුඩු දී තිබෙන හදිසි නීතිය පිළිබඳවත්, ඒ හදිසි නීතිය ආශ්‍රිතව ඇතිවී තිබෙන යම් යම් සිද්ධීන් කිහිපයක් පිළිබඳවත් මේ විවාදයේදී මතුවුණු යම් යම් සිද්ධීන් කිහිපයක් පිළිබඳවත් යම් යම් කාරණා පිළිබඳවත් බොහොම කෙටියෙන් වචන ස්වල්පයක් කියන්න අවස්ථාව දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

අපි කවුරුත් දන්නා හැටියට, මේ රටේ මැතිවරණ කීපයක ඉඳලම මැතිවරණයකින් පසුව ඇතිවෙන සිද්ධීන් ක්‍රම ක්‍රමයෙන් වැඩි වෙමින් පවතින කාලයක තමයි, මේ ජනාධිපතිවරණය පැවැත්වූවේ. 1977 මැතිවරණයෙන් පසු-විශේෂයෙන්ම මම දන්නේ මගේ ආසනය ගැනයි—මා නියෝජනය කරන ආසනයේ බොහොම දරුණු තත්ත්වයක් උදා වුනා. සමහර විට එක්සත් ජාතික පක්ෂයේ සමහර ආධාරකරුවන්, නිවහල් සමාජයක් ගොඩනංවනවයි කිව්වම එය වැරදියට තේරුම් ගත්තාද කියල මම දන්නෙ නැහැ. මොකද? 1977දී ඒ ප්‍රදේශයේ වහලවල් කීපයක් කඩා දමමින් වැඩ කටයුතු කළ බව ඊට පසුව පැවති පරීක්ෂණවලින් හොඳටම හෙළිදරව් වුණා. 1977 සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කිරීමට දැන් ජනාධිපතිතුමා විසින් ඒ කාලයේ අගමැතිතුමා හැටියට, ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන මහත්මයාගේ ඒක පුද්ගල කොමිෂන් සභාව පත් කළා. වෙච්ච සිද්ධීන් මොනවාද, අලාභ සිදු වුණේ කාටද, මොන ප්‍රමාණයටද කියා සොයා බලා ඒවාට වන්දි ගෙවන්න බලාපොරොත්තු වන බවටත් ප්‍රතිඥාවක් දුන්නා. මම මේ සභාව කල් තැබීමේ අවස්ථාවේදීත් ඒ පිළිබඳව ප්‍රශ්නයක් ඇසුවා. මා හිතන්නේ එයට අපේ පාර්ලිමේන්තු කටයුතු භාර ගරු ඇමතිතුමා පිළිතුරු දුන්නා. වාර්තාව ලැබිල තිබෙනවාය, වන්දි ගෙවීම පිළිබඳව සලකා බලනවාය කියලත් එදා කිව්වා. මම දැන් ඒ කාරණය මතු කළේ ඒ සිද්ධිය ඒ වෙලාවේ එහෙම වුණ බව මතක් කරන්නයි. නමුත් මම එක අතකින් ස්තුතිවන්ත වෙනවා, මේ ජනපතිවරණයට පසු ඒ සිද්ධීන් බොහොම අඩුවෙන් තමයි සිදු වී තිබෙන්නෙ.

මම විශේෂයෙන්ම කිව යුතුයි, මගේ අත්දැකීම්වල හැටියට විශේෂයෙන්ම පොලීසියට ප්‍රශංසා කළ යුතුයි, මේ ජනාධිපතිවරණය පිළිබඳව කටයුතු කළ ආකාරයට. ජනපතිවරණයට පෙරත්, පසුවත් බොහෝ දුරට, පොලීසියේ බහුතර කොටස, බොහොම හොඳට කටයුතු කළයි කියන එක මම හිතන හැටියට බොහෝ දෙනෙකුගේ අත්දැකීම් වෙලා තිබෙනවා. මම නම් පොලිසියෙන් කිසිම උපකාරයක් ඉල්ලුවේ නැහැ. මට ලැබුණෙත් නැහැ. ඇත්තවශයෙන්ම එද් සිද්ධියක් පිළිබඳව මම සතුටු වන ආකාරයට පොලීසිය කටයුතු කළේ නැහැ. නමුත් දළ වශයෙන්, පළල් වශයෙන් බැලුවාම පොලීසියේ බහුතර කොටස බොහොම හොඳට වැඩ කළයි කියා අපට කියන්න පුළුවන්කම තිබෙනවා. පොලිස්පති තුමාත්, ඔහුට සහාය වශයෙන් මැතිවරණය පිළිබඳව වැඩ කට යුතු කළ නියෝජ්‍ය පොලිස්පතිවරුනුත් විශේෂයෙන්ම—රත්නපුර ප්‍රදේශය මම දන්න ප්‍රදේශය නිසා—රත්නපුර පොලීසියේ පොලිස් අධිකාරී සහ සහකාර අධිකාරිවරු දෙදෙනාත් පොලිස් ස්ථාන ගණනාවකම සේවය කළ පොලිස් නිලධාරීනුත් බොහොම හොඳට සාධාරණව කටයුතු කළ නිසා පශ්චාත් මැතිවරණ සිද්ධීන් බොහෝ දුරට වළක්වන්න පුළුවන් වුණා. ඒ වගේම හමුදාවෙන් යවන ලද පිරිසක් වැඩි කලබලයක් නැතිව තමන්ට භාරව තිබුණ ප්‍රදේශවල—විශේෂයෙන් මම දන්නේ මගේ ඡන්ද කොට්ඨාශය ගැනයි—ඇත්තවශයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවෙගම මහතා]

ආරක්ෂාව සැලසෙන ආකාරයට කටයුතු කළ බව කියන්න පුළුවන්කම තිබෙනවා. ඒ ගොල්ලන්ටත් අපි ස්තුතිවන්ත විය යුතුයි.

නමුත් මැතිවරණයෙන් පසු ඇතිවන සිද්ධීන්, කීපයක් ඇති වුණා. මේ සම්බන්ධයෙන් මේ සභාවේ දෙපැත්තෙන් කියවුණු කරුණු අනුව, එක එක්කෙනා තමන් කටයුතු කරන දේශපාලන පක්ෂය අනුව, ඔක්කොම සිද්ධීන් අනික් පැත්තෙන් වුණේ හැටියට තමයි, කියන්න පටන් ගත්තෙ. මම හිතන්නෙ අපි කවුරුත්—මේ කථා කරන උදවිය—අත්දැකීම් ඇතිව තමයි කථා කරන්නෙ. නමුත් මා කියන්න දන්නේ නැහැ, මේ කියාපු විධියේ කුමන්ත්‍රණ තත්ත්වයක් මෙතැන තිබුණාය කියා. එයට සාක්ෂි තිබෙනවාය කියලත් ගරු අගමැතිතුමා කිව්වා. ඒ තිබෙන සාක්ෂි මොනවාද කියල අපි නම් දන්නේ නැහැ. නමුත් අපි දන්නා ප්‍රදේශවල නම් එහෙම කුමන්ත්‍රණ තිබුනෙත් නැහැ.

කොබ්බෑකඩුව මහත්මයාට උදව් කළ අයට අපි කිව්වෙ කොහොමද? අවසාන මැතිවරණ රැස්වීම් තිබුණ දින කීපය තුළදීත් අපි කියා සිටියේ කිසිම කලබලයක් කරන්න එපා කියලයි. මම පුද්ගලිකවත් කීප වතාවක්ම කිව්වා. රැස්වීම්වලදී අපි මහජනතාවට ආයාචනය කළා. කිසිම කලබලයක් ඇති කරන්න එපා කියා. මම හිතන්නෙ ඒ බව කවුරුත් පිළිගන්නවා ඇති.

අනික් පැත්තෙන් බලන විට අපි කවුරුත් දන්නවා, මේ සිද්ධීන්වලට කාගෙවත් උසිගැන්වීමක් වුවමනා නැහැ. බොහෝ විට මැතිවරණය දඩ මීමා කරගෙන සමහර උදවිය තමන්ගේ තිබෙන පුද්ගලික කෝන්තරවලින් පිරිමසා ගැනීමට කටයුතු කරන අවස්ථාවල් තිබෙන බව මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ අත්දැකීම් අනුව පිළිගන්නවා ඇත. ඒ නිසා කවුරුන් විසින් හරි කුමන්ත්‍රණය කර, ක්‍රම ක්‍රමයෙන් යම්කිසි වැඩපිළිවෙළක් ඇති කරන්නට කටයුතු යෙදුවාය කියල පෙන්නුම් කිරීමට උත්සාහ දැරීම සාධාරණ නැති බව කිව යුතුව තිබෙනවා.

ඒ වගේම මම කියන්න ඕනැ—මම හිතන්නෙ ඇමතිතුමන්ලා දන්නවා ඇති—විශේෂයෙන්ම සමහරආයතනවල, ආණ්ඩුවට පක්ෂපාතී යම් යම් පිරිස් පසුගිය දින කීපය තුළදී ආණ්ඩුවට විරුද්ධ උදවියට වැඩට එන්න නොදෙන ආකාරයට, ඔවුන්ට වැඩ කරන්නට ඉඩ නොදෙන ආකාරයට කටයුතු කළ බවට පැමිණිලි රාශියක්ම ලැබිල තිබෙනවා.

විශේෂයෙන්ම, රත්නපුර ප්‍රදේශයේත් ඉන් පිටතත් ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ කීපයක සමහර සේවකයන් වැඩට ආ විට, ඩිපෝ අධිකාරීන් නොව වෙනත් අය එක්සත් ජාතික පක්ෂයට පක්ෂපාත යම් යම් උදවිය එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය දඩ මීමා කරගෙන තම විරුද්ධ වාදීන්ට වැඩට එන්නට නොදී අවහිර කර තිබෙනවා. නොයෙක් විධියේ පැමිණිලි ලැබී තිබෙනවා. ඒ සිද්ධීන් ගැන කරුණු සොයා බලා ඒ උදවියට වැඩට එන්නට අවස්ථාව ලබා දීම ඇමතිතුමාගේ යුතුකමක්.

ලංකා ටයර් සංස්ථාවේත් පිගන් සංස්ථාවේත් සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේත් තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලයේත් ඒ විධියේ පැමිණිලි තිබෙන බවට ආරංචි ලැබී තිබෙනවා. කීප දෙනාකුට වැඩට යන්න දුන්නේ නැහැ. ඒ ගැන ඇති වී තිබෙන තත්ත්වය සොයා බලා සියලුම සේවකයන්ට වැඩට යන්න අවස්ථාව සලසා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

මගේ ඡන්ද කොට්ඨාශයේ අගමැතිතුමාගේ අමාත්‍යාංශයට අදාළ සිද්ධියක් පිළිබඳව කාරණයක් සඳහන් කරන්න තිබෙනවා. කලවානේ විධායක ඉංජිනේරු මහත්මයාගේ ප්‍රදේශයට සීමා වන ඉංජිනේරු කොට්ඨාශයේ පාරක් කපන එක් තැනක, කැණුවල් කම්කරුවෝ 14 ක් 15 ක් පමණ වැඩට ගිය විට ඒ උදවියට වැඩට එන්නට ඉඩ නොදී ඔවුන් සේවයෙන් පහකර තිබෙනවා. මේ සේවක පිරිසටත් වැඩ ලබා දෙන්නට කටයුතු යොදන ලෙස ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ආණ්ඩු පක්ෂයෙන් කථා කරන කථික මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම කොමියුනිස්ට් පක්ෂය පිළිබඳව යම් යම් කරුණු කියන්නට යෙදුණා. කොමියුනිස්ට් පක්ෂය මේ ජනපතිවරණයේදී කොබ්බෑගඩුව මහතාට ආධාර දුන්නේ ලොකු කුමන්ත්‍රණයකින් ආණ්ඩු බලය අල්ලන්න හිතාගෙන යයි අධ්‍යාපන ඇමතිතුමා කිව්ව. දුර්වල කෙනෙක් ජනාධිපති වශයෙන් පත් කරගෙන ඒ මුවාවෙන් රටේ දේශපාලන බලය අල්ලන්න හිතාගෙන කොබ්බෑකඩුව මහතාට වැඩ කළ බව කොළඹ දිසා ඇමතිතුමා කිව්වා. (බාධා කිරීම්) කොමියුනිස්ට් පක්ෂය මේ ජනාධිපතිවරණය පිළිබඳව වැඩ කරන හේතු දක්වන බොහෝම පැහැදිලි ප්‍රකාශනයක් වැඩ කරන්න පටන් ගන්න විටම කළා. කොබ්බෑකඩුව මහතා දිනුවත්, කොමියුනිස්ට් පක්ෂය ආණ්ඩු බලය අල්ලනවා තබා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක අඩු තරමින් සභාග රජයකටවත් සහයෝගය දීමට කිසිසේත්ම බලාපොරොත්තු වන්නේ නැත යන පදනම උඩයි අපි වැඩ කළේ. එය විවෘතව, පැහැදිලිව, ප්‍රකාශිතව දැක්වීමෙනුයි කොමියුනිස්ට් පක්ෂය වැඩ කටයුතු කළේ. (බාධා කිරීම්) අපි වැඩ කළ කරුණු මොනවාද කියන එක හදිසි නීතියට අදාළ නැහැ. අපි වැඩ කළේ මේ විධියට සඳහන් කරලයි.

අප ආණ්ඩු බලය අල්ලන්න හිතාගෙන වැඩ කළාය කියන චෝදනාව ආණ්ඩු පක්ෂය ඉදිරිපත් කරන්නේ වෙනත් කරුණු නිසායි. මේ රටේ විශාල කොමියුනිස්ට් විරෝධී මතයක් ගොඩනංවා, ලොකු තර්ජනයක් තිබෙන බව පෙන්නුම් කර, දැන් මේ බලාපොරොත්තුවන ක්‍රියා මාර්ගයට. රෙෆරෙන්ඩම් එකක් මගින් නැවත පාර්ලිමේන්තුවේ කාලය දීර්ඝ කරගන්නට ගන්නා උත්සාහයට එය තර්කයක් වශයෙන් උපයෝගී කර ගැනීම සඳහා ඒ කථාව දැන් ගොඩනගන්න පටන්ගෙන තිබෙනවා.

ඒ වාගේම, 'ඇත්ත' පත්තරයට විරුද්ධවත් චෝදනා තිබෙනවා. මේ පත්තරය ආණ්ඩුවට ලොකු හිසරදයක් වී තිබෙනවා. 'ඇත්ත' පත්තරය මේ රටේ ජනතාවගේ පත්තරයක්. (බාධා කිරීම්) එය නව පත්තර කලාවක් ගොඩනැංවූ පත්තරයක් බව මට ආඩම්බරයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියන්න පුළුවනි. ඒ ගැන තමුන්නාන්සේලා බිය වන එක, අසතුටු වන එක පුදුමයක් නොවෙයි. මේ ජනාධිපතිවරණයේදී පවා තමුන්නාන්සේලාට විරුද්ධව යම් කිසි බලපෑමක් 'ඇත්ත' පත්තරය නිසා ඇති වුණා යයි අපි විශ්වාස කරනවා. ජනාධිපතිවරණය දැන් ඉවරයි. දැන් තිබෙන්නේ පශ්චාත් මැතිවරණ සිද්ධීන් නැවැත්වීමට හදිසි නීතිය දැම්මාය කියන එකයි.

ඊළඟට ඊයේ ප්‍රකාශ කර තිබෙනවා ලොකු කාලසීමාවකට, තවත් අවුරුදු 6 කට, මේ පාර්ලිමේන්තුවේ කාලය දික් කරන්නට යනවාය කියා. එක්සත් ජාතික පක්ෂයෙන් දැන් නොයෙකුත් චෝදනා තිබුණා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් වෙනත් වෙනත් පක්ෂවලත් ඇතුළේ තිබෙන මතභේද ගැන. තමුන් එක්සත් ජාතික පක්ෂය ඇතුළේ තිබෙන, ඇති වෙන්නට යන, විශේෂයෙන් ඉස්සරහට ඇති වෙන්නට ඉඩ තිබෙන, මත භේද ගැනත් තමුන්නාන්සේලාත් ටිකක් කල්පනාවෙන් සිටින එක හොඳයි කියා මම හිතනවා. මේ මැතිවරණය අවසාන වෙනවාත් සමගම, එමෙන්ම අපේ හාරිස්පත්තුවේ දෙවැනි ගරු මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මහතා) එක්සත් ජාතික පක්ෂයට යනවාත් සමගම, උපාලි විජේවර්ධන මහත්මයාත් එක්සත් ජාතික පක්ෂයට ගියාය කියන කථාවකුත් වාර්තාව වී තිබුණා; කඹුරුපිටියේ තවත් කොහෙද කොහෙදත් රැස්වීම්වල කථා කරලත් තිබුණා. හාරිස්පත්තුවේ දෙවන ගරු මන්ත්‍රීතුමාටයි, උපාලි විජේවර්ධන මහත්මයාටයි මොන විධියේ සාමකාමී සහජීවනයක් පවත්වන්න පුළුවන් වෙයිද කියා පසුගිය කාලයේ ඉතිහාසය දැක්කාම මට නම් හිතන්න අමාරුයි. ඒ. වගේම අපේ ගරු මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේදීද එළිදරව් කර තිබෙනවා උපාලි විජේවර්ධන මහත්මයා පිළිබඳව නොයෙකුත් දේවල්. දැන් තමුන්නාන්සේලාගේ ඉල්ලා අස්වීමේ ලියුම් ටිකත් ගරු ජනාධිපතිතුමා අතේ තිබෙනවා.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
*(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)*
**(Mr. R. J. G. de Mel)**

මම කී ඒවා එකක්වත් ඉල්ලා අස් කර ගන්නේ නැහැ. මේ ගරු සභාවේදී කී එක දෙයක්වත් ඉල්ලා අස් කර ගන්නේ නැහැ.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

ඔය ඔය. මම නිකම් කිව්වේ. තමුන්නාන්සේලා ඉල්ලා අස්වීමේ ලිපි භාර දී තිබෙනවා, ගරු ජනාධිපතිතුමාට. මුදල් ඇමතිතුමා උපාලි විජේවර්ධන මහත්මයා ගැන කී දේවල් ඉල්ලා අස් කර ගත්තා කියලා නොවෙයි, මම කිව්වේ. මම කිව්වේ තමුන්නාන්සේලා මන්ත්‍රීවරු හැටියට මේ ගරු සභාවේ—

**ආර්. ජේ. ජී ද මැල් මහතා**
*(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)*
**(Mr. R. J. G. de Mel)**

"ඇත්ත" පත්‍රය කිව්වත් ඉල්ලා අස්කර ගන්න කියා මම එය කරන්නේ නැහැ.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

'ඇත්ත' පත්‍රය කියන්නේ නැහැ, ඉල්ලා අස්කර ගන්න කියා. මම කිව්වේ ඉදිරි කාලය ගැනයි. මම දන්නවා මේ පාර්ලිමේන්තුවේ කාලය දික් කිරීමත් සමගම නව අලුත් සංකල්පයන් අපේ රටේ දේශපාලනයට එකතු වන්නට ඉඩකඩ තිබෙනවා කියා.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

කථා කර පැනලා යනවාද? අපේ පිළිතුර අහන්න ඉන්නවාද?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

මම ඉන්නම්. ජාතික ආණ්ඩු සංකල්පයත් සමග එන විට මොනමොන උදවිය අලුත් ආණ්ඩුවල අලුත් පදවිවලට එයිද කියා ඇත්ත වශයෙන්ම කිසි කෙනෙකුට සහතිකයක් දෙන්නට පුළුවන්ද කියා මම දන්නේ නැහැ. විශේෂයෙන්ම මේ රටේ ජනතාවටත් මේ සභාවටත් අලුත් ජනමත විචාරණයක් තබන්නට යන මේ අවස්ථාවේදී මොන විධියේ ආණ්ඩුවක් ගොඩනගන්නට යනවාද කියන එක පිළිබඳව විශේෂයෙන්ම ඉදිරි කාලයේ තිබෙන ආර්ථික අමාරුකම් දෙස බලන විට ඒ ආර්ථික යථාර්ථයට මුහුණ දෙන්නට මේ ආණ්ඩුවට සිදුවන විට කොයි විධියේ පුද්ගලයින්ගෙන් සමන්විත වූ ආණ්ඩුවක් අපට මේ රටේ ආණ්ඩුව හැටියට දකින්නට ලැබෙයිද කියන එක පිළිබඳව, යම්කිසි ඉඟියක්වත් අපට ගරු අගමැතිතුමාගෙන් ලැබෙනවා නම් ඉදිරි කාලයේදී සිදුවන සිද්ධීන්ට මුහුණ දීමට එය අපට ප්‍රයෝජනවත් වෙයි කියා මතක් කරමින් තමුන්නාන්සේටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් නතර කරනවා.

අ. භා. 11.28

**පත්මින් ෆොන්සේකා මහතා,** (පානදුර)
*(திரு. பத்மின் பொன்சேக்கா—பாணந்துறை)*
**(Mr. Pathmin Fonseka—Panadura)**

ගරු කථානායකතුමනි, නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) කථා කරන අවස්ථාවේදී එතුමා සඳහන් කළා පානදුරේ ඡන්ද ප්‍රතිඵල ගැන. මම කියන්න සතුටුයි, 1977 දී එක්සත් ජාතික පක්ෂයේ අපේ හිටපු මන්ත්‍රී නෙවිල් ප්‍රනාන්දු මහතා ඡන්ද 28,000 ක් ලබා ගත් බව. ඒ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙක් හැටියටයි, ඒ මහත්මයා ඉදිරිපත් වුණේ. එමෙන්ම ඒ මහතා මේ පාර්ලිමේන්තුවෙන් අස් වන දවසේ කියා හිටියා එතුමාට පානදුර ආසනයේ තිබෙනවා කියා පෞද්ගලික ඡන්ද දොළොස් දහස් ගණනක්. මොකද, ඒ මහතා වෛද්‍යවරයෙක් නිසා ඡන්දය දුන් ලෙඩුන් 12,000 ක් ඒ මහතාට හිටියා කිව්වා.

1977 ඒ අවස්ථාවේ ඒ මහත්මයාත් සමග තරඟ වැදුණේ ලංකා සමසමාජ පක්ෂයේ ලෙස්ලි ගුණවර්ධන මහත්මයායි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් වූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපේක්ෂකයාට ඡන්ද තුන්දස් හත් සිය ගණනක් ලැබුණා. නමුත් 1982 මේ ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට ඡන්ද 26,648 ක් ලැබුණා. ලංකා සම සමාජ පක්ෂයට ලැබුණේ ඡන්ද 1776 යි. ඒ නිසා මා කියන්න කැමතියි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මේ අවස්ථාවේදී ඡන්ද 23,861 ක් ලැබුණේ දොස්තර මහතා අපේ එක්සත් ජාතික පක්ෂයෙන් අරගෙන ගිය ඡන්ද නිසා නොවෙයි, අර ලංකා සමසමාජ පක්ෂයට තිබුණු ඡන්ද සංඛ්‍යාව නිසායි කියා. සාමාන්‍යයෙන් ලෙස්ලි ගුණවර්ධන මහතා පානදුරෙන් ඡන්ද 20,000 ත් 25,000 ත් අතර ගණනක් ගත්තා. ලංකා සමසමාජ පක්ෂයෙ ඒ ඡන්ද තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මේ අවස්ථාවේදී ගියේ. කලුතර දිස්ත්‍රික්කයෙ අනික් ආසන සමග සසඳා බලන කොට අපේ ආසනයෙ ඡන්ද සංඛ්‍යාව විශාල වශයෙන් අඩුවෙලා නැහැ. අපි ඡන්ද 2787 කින් ඒ ආසනය ජයග්‍රහණය කර තිබෙනව. ගරු කථානායකතුමනි, නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) ආඩම්බර වෙනව, දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහත්මය ඒ පක්ෂයට ඒම ගැන. නමුත් මම මතක් කරන්න කැමතියි, එක්සත් ජාතික පක්ෂයෙ මන්ත්‍රීවරයෙක් හැටියට සිටි කාලයේදී එදා සිරිමා බණ්ඩාරනායක මැතිණියට පාවිච්චි කළ වචන මොනවාද කියල. 'බලු කික්කි, වැරහැලි ඇඳගත් හිඟන ගෑණියෙක්.' මේ මන්ත්‍රීවරයාට 'හිඟන කොල්ලෙක්' ඔන්න ඔය විධියෙ වචන පාවිච්චි කරමින් තමයි කතා කළේ. අද මම කන ගාටුවෙන් කියන්න ඕනෑ, මේ මැතිවරණයේදී අපේ අතිගරු ජනාධිපතිතුමාට, රට වටේ යමින් දේශපාලන වේදිකාවලදී නොසෑහෙන විධියට අපහාස කළ දේශපාලනඥයකු සිටිනවා නම්, ඒ තමයි අපේ හිටපු මන්ත්‍රී නෙවිල් ප්‍රනාන්දු මහත්මයා. එතුමා ඇතැම් අවස්ථාවලදී 'තිරිසනා, තක්කඩියා, කපටියා,' මේ වාගේ වචන පාවිච්චි කරමින් තමයි අපේ අතිගරු ජනාධිපතිතුමාට අපහාස කළේ. අපේ අතිගරු ජනාධිපතිතුමා රූපවාහිනියෙන් ජනතාව ඇමතූ දවසට පසුවදා ඒ හිටපු මන්ත්‍රීවරයා කතාවක් කරමින් කියා සිටියෙ, එතුමා රූපවාහිනියෙන් කතා කළේ හරියට මරන්න අරගෙන යන හරකෙක් වගේය කියල. මෙන්න මේ විධියට තමයි ඒ මහතා මෙම ඡන්ද ව්‍යාපාරයේදී අපේ ජනාධිපතිතුමාට අපහාස කළේ. එම නිසා මම කියා සිටිනවා. නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමාට ආඩම්බර වෙන්න කිසිම දෙයක් නැහැයි කියල, මේ වාගේ පුද්ගලයන් එම පක්ෂයට බැඳුණු එක ගැන.

ගරු කථානායකතුමනි, 1977 දී මහ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය පානදුර ආසනය දිනුවෙ එක්සත් ජාතික පක්ෂයෙ ජනප්‍රියතාවය නිසා බව අපි කියා සිටිනව. ඒ වාගේම අපේ ගරු අගමැතිතුමා පෙන්වා දුන් පරිදි පෝස්ටර් එකක් ගහලා තිබෙනව්, සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ ප්‍රජා අයිතිය උදුරාගෙන අවුරුදු දෙකක් ගත වී තිබෙනවාය කියල. මේ පෝස්ටර් ගහල තියෙන්නෙ දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහත්මයාට අයිති මුද්‍රණාලයෙ. මේ දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහත්මය රට වටේ ගියා අපේ පක්ෂයත්, අපේ සමහර මන්ත්‍රීවරුන්ගෙත් දූෂණ ගැන කතා කරමින්, ඒ චෝදනාවල කිසිම සත්‍යයක් තිබුණේ නැහැ. නමුත් දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහත්මයා පාර්ලිමේන්තුවෙ සිටින කාලයේදී පාර්ලිමේන්තු බලතල, වරප්‍රසාද පාවිච්චි කරමින් තමන්ගේ වෙළඳ ව්‍යාපාර දියුණු කර ගැනීම මගේ හැඟීමේ හැටියට මම කියා සිටිනවා, එයා කියා සිටි දූෂණවලටත් වඩා බලවත් දූෂණයක් බව [බාධා කිරීමක්] තවමත් ලැබෙන වාලු! මේ විධියට විශාල ධනස්කන්ධයක් අපේ රජයෙ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට සොයාගෙන තිබෙනව. ඒ මුදල් තමයි

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

දෙස් කියනව දුන්නෙ නැතිනම්.

**පත්මින් ෆොන්සේකා මහතා**
*(திரு. பத்மின் பொன்சேக்கா)*
**(Mr. Pathmin Fonseka)**

ඔව්. ඒ මුදල් තමයි, අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැය කර තිබෙන්නෙ රට වටේම පෝස්ටර් ගහන්න. මම දන්නෙ නැහැ කොපමණ දුරට හරිද කියන්න, නමුත් මට ආරංචියි අර හාල්පොත්වලින් සමහරකුත් ගහල තිබෙනවාය කියන්නෙ එයාගේ මුද්‍රණාලයෙන්. මෙන්න මේ විධියටයි එයා කටයුතු කර තිබෙන්නෙ. එයා බොරු ප්‍රචාරයක් කර ගෙන ගියා පානදුර ආසනයෙ අයට රක්ෂා දුන්නෙ එක්සත් ජාතික පක්ෂයෙන් නොවෙයි, එයාය කියල. මේ විධියට ඡන්දදායකයින් මුලා කළා. අපේ ගරු අගමැතිතුමා ඒ පළාතට ගෙවල් දී තිබෙනව. එයා ගම වටේම කියමින් ගියේ එයා ලබා දුන්නාය කියලයි. මෙන්න මේ විධියට එය, ඡන්දදායකයින් මුලා කර ගෙන ගියා. ජාති භේදය අවුස්සන්න ගියා. අන්තිමට මැරවර බලයත් පාවිච්චි කළා. මැතිවරණයට අන්තිම දවසෙ අයි. ආර්. සී. කාරයොත් එක්ක අපේ ආණ්ඩුවෙන්ම ලැබුණු ජීප් රථයෙන්—දැන් ඒක ඔහුගේ—ගම වටේම ගියා. නමුත් අන්තිමේදී මම ඉදිරිපත් වෙලයි ඔහුට කිසිම හානියක් නොවන පරිදි, පොලිස් ආරක්ෂාව සැලසුවෙ. ගරු කථානායකතුමනි, මෙන්න මේ වාගේ බොරු ප්‍රචාර කරලයි යම්කිසි ඡන්ද සංඛ්‍යාවක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලබාගත්තෙ. ඔහු මුල ඉඳලාම කිව්ව, අලුත් පක්ෂයක් බිහි කළ අවස්ථාවක අපේ මන්ත්‍රීවරු 40 ක්—මැති ඇමතිවරු—ඉන්නවාය කියල කිව්ව ඔහුට ඇවිත් බැඳෙන්න. මෙන්න මේ වාගේ බොරු ප්‍රචාර කරලයි එක්සත් ජාතික පාක්ෂිකයන් මුලා කළේ. රක්ෂාවල් දුන්නෙ ඔහුය කිව්ව. ගෙවල් දුන්නෙ ඔහුය කියල කිව්ව. ජාති භේද ඇවිස්සුව. අපේ ජනාධිපතිතුමාට අපහාස කළා. අපේ මන්ත්‍රීවරුන්ගෙ නැති දූෂණ ගැන කථා කළා. නමුත් අපට එතුමා ගැන එතුමා කළ දේවල් ගැන කියන්න පුලුවන්. ගරු මන්ත්‍රීවරයකු හැටියට තමන්ගේ තත්ත්වය පාවිච්චි කර, ආසනය ගැන කිසි දෙයක් නොබලා, කොළඹ ඉඳගෙන එදා ගෙන ගිය ක්‍රියා කලාපය මා හිතන්නෙ එතුමා නැගූ චෝදනාවලට වඩා බරපතලයි.

මා මෙය සඳහන් කළේ ගරු කථානායකතුමනි, නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) සඳහන් කළ කරුණු සත්‍ය නැති බව කියන්නයි. හිටපු මන්ත්‍රීතුමා 1977 දි දින්නෙ එක්සත් ජාතික පක්ෂයේ ජනප්‍රියත්වයෙන් ඒ ලබාගත් ඡන්ද සංඛ්‍යාවම අපට 1982දි, පත් වී ආ මන්ත්‍රීවරයෙක් හැටියට මාස 8ක් තුළ කළ සංවිධානයෙන් මට ලබාගන්න පුළුවන් වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ප්‍රේමදාස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

*(திரு. ஆர். பிரேமதாச—பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)*

**(Mr. R. Premadasa—Prime Minister, Minister of Local Government, Housing and Construction, Minister of Highways, and Leader of the House of Parliament)**

කථානායකතුමනි, මම ප්‍රථමයෙන්ම විරුද්ධ පක්ෂයේ අවසානයට කථා කළ කලවානෙ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) කථාවෙන් පටන්ගන්න කැමතියි. අද එතුමා කථා කළේ හුළං බැහැපු බැලුං බෝලයක් වගෙයි. වෙනදා තිබිච්ච ගාම්භීරකම වෙනදා එතුමා අපට නිතරම කරන අභියෝග අද තිබුණේ නැහැ. එතුමා මේ සභාවට ආපු දවසෙ ඉඳලම අපට අභියෝග කළා රෙෆරන්ඩම් එකක් තියන්න කියා; ජනමත විචාරණයක් තියන්න කියා. අද ඒ ගැන මොකුත් කිව්වෙ නැහැ. ඇයි ජනතාව මතය ප්‍රකාශ කර තිබෙනවා, එතුමා ගැනත් කොමියුනිස්ට් පක්ෂය ගැනත්.

එතුමා අපූරු දෙයක් කිව්වා අද. කොමියුනිස්ට් පක්ෂය හෙක්ටර් කොබ්බෑකඩුව උන්නැහේට උදව් කෙළේ කිසිම දෙයක් ආපසු බලාපොරොත්තුව නොවෙය කිව්වා. නායකතුමනි, කාටද මේවා කියන්නෙ? 1977 බඩගාගෙන ගිහින් නොවේද සිරිමා බණ්ඩාරනායක මහත්මියගෙන් ඇමතිකම් ලබා ගත්තෙ. කාටද මේ කියන්නෙ මේවා. ඇයි එදා අපට ඒ ඨානන්තර එපයි නොකිව්වෙ? 1970 දී මහ මැතිවරණයෙන් පස්සෙ දොස්තර වික්‍රමසිංහ මහතාට ඇමති ධුරයක් නොලැබුණු වෙලාවෙ—ඉල්ලූ ඇමති ධුරය නොලැබුණු වෙලාවෙ—උන්නැහේට හොරෙන් ගිහින් නොවේද පීටර් කෙනමන්නුත් තුඩාවෙත් ඇමති ධුර භාර ගත්තෙ. ඇයි එදා කිව්වෙ නැත්තෙ අපට එපයි කියා, ඒ දිනපු වෙලාවෙ. දැන් පැරදිලා කියනවා, අපි ඔක්කොම කළේ තනතුරු බලාපොරොත්තුව නොවෙයි කියා කාටද මේව කියන්නෙ? මේ ලංකාවෙ ජනතාවටද?

එතකොට කොබ්බෑකඩුව ජයගත්තාට පසු වමේ රජයක් පිහිටුවනවා කියන කොට, විජය කුමාරතුංග කියන කොට, කොමියුනිස්ට් පක්ෂයත් එකතු කරගන්නවාය කියා ඇයි ප්‍රසිද්ධියේම කිව්වෙ නැත්තෙ ඒක. ඒ අවස්ථාවෙදි කිව්වෙ නැත්තෙ ඇයි? කලවාන ගරු මන්ත්‍රීතුමාට මම කියන්න කැමතියි, ටික දෙනෙක් හුඟක් කල් රවට්ටන්න පුළුවන්, හුඟ දෙනෙක් ටිකක් කල් රවට්ටන්න පුළුවන්, හැම දෙනෙකේම හැමදම රවට්ටන්න බැරි බව. ඒක එතුමා මේ ජනපතිවරණයෙන් ඉගෙන ගන්න ඕනෑ. මම හිතන්නෙ කලවානෙ ජනතාවම ඔප්පු කළා ඒක. එතුමාම කියනවා වෙන මැතිවරණවලින් පස්සෙ වාගේ නොවෙයි, මේ අවස්ථාවෙදි බොහෝම අඩු වෙන්ලු සිද්ධි ඇති වුණේ කියා. මොනවද මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) කිව්වෙ? එයාගෙ ජීවිතයෙ කවදාවත් දැක්කෙ නැහැල්ලු මේ විධියේ අයුතු සිද්ධි ඇති වෙනව. මේ ගොල්ලන් කාටද මේ කථා කරන්නෙ? මොනවද මේ කියන්නෙ? එක්කෙනකුට එක්කෙනෙක් පරස්පර විරෝධී දේවල් නොවේද ප්‍රකාශ කරන්නෙ?

මගෙන් අහනවා දැන් මහජන කැමැත්ත විමසීමෙන් පස්සෙ ආණ්ඩුවේ ඇති තත්ත්වය ගැන විස්තරයක් කරන්නය කියා; දැන් ඔක්කොගේම ඉල්ලා අස්වීමේ ඉල්ලුම්පත්‍ර ජනාධිපතිතුමා අතේ තියෙන්නෙ මොකක්ද ඇති වෙන්න යන තත්ත්වය කියා. පොඩ්ඩක් ඉඳලා බලන්න. ඇති වෙන්න යන තත්ත්වය මොකක්ද කියලා තමුන්නාන්සේලාට පෙනේවි. කොමියුනිස්ට් පක්ෂයට දල දුවන්න තත්ත්වයක් මේ රටෙ ඇති වන බව මම එතුමාට ප්‍රකාශ කරන්න කැමතියි.

මීළඟට ඇතිවන පොදුජන කැමැත්ත විමසීමෙන් පස්සෙ, ජූනි දෙන් පස්සෙ එදාට තේරේවි, මේ රටේ ජනතාව කොමියුනිස්ට් පක්ෂයට වඩා බුද්ධිමත් බව. අද කොමියුනිස්ට් පක්ෂය කරන්නේ දර දිය අදින එකනේ. අද කුලියට දර දිය අදිනව විදේශිය බලවේගයකට. එච්චරක් නොවෙයි කරන්නෙ. ඒක දේශීය විශයෙනුත් කළා මේ ජනපතිවරණයේදී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. එකතු වෙන්නෙ නැහැ කියා කියලා හෙක්ටර් කොබ්බෑකඩුව ආවාම කොහොමද ඒ අපේක්ෂකයා දිනවන්න ක්‍රියා කළේ? මන්ද ක්‍රියා කළේ? තමන්ගෙ හෘදය සාක්ෂියත් දන්නවා නොවැ. එතුමා බොහෝම වැයම් කළා මාමණ්ඩියත් නවත්වන්න. ඇයි? එතුමා මා එක්ක අමනාප වෙන්න තරකයි ඇත්ත කිව්වොත් එතුමා කොච්චර කොමියුනිස්ට්වාදියෙක් වුණත් රදලි බල වේගය තවමත් හිතේ තිබෙන කෙනෙක්. අප්පො කෙනෙකුට අප්පො කෙනෙක් එකතු වුණා. ඔන්න සමාජවාදය. ඒක මේ රටේ ජනතාව දන්නවා. එදා කොමියුනිස්ට්වාදියෙක් හැටියට ඉදිරිපත් වුණ කලවාන දුන්නා. මේ වාරයේ ඉදිරිපත් වුණේ රදළවාදියෙක් හැටියට. ඒක ජනතාවට පැහැදිලිව පෙනුනා. මා එතුමාට කියන්නට කැමතියි එක්සත් ජාතික පක්ෂය අද නිසි අරමුණක් නිසි විනයක් නිසි සංවරයක් සංවිධානයක් ඇතිව ගමන් කරන පක්ෂයක් බව මේ පක්ෂය තුළ අවස්ථාවාදීන්ට ඉඩ නැති බව මා අවධාරණයෙන්ම ප්‍රකාශ කරන්නට කැමතියි. අවස්ථාවාදියො ගියේ කොතැනටද එතැන පරාද වූ බවත් මා එතුමාට කියන්නට කැමතියි. ඒක මා හොඳින්ම පැහැදිලි ලෙස එතුමාට කියන්නට කැමතියි.

එක්සත් ජාතික පක්ෂයට අද එකතු වී සිටින සියළු දෙනාම මේ පක්ෂයේ ප්‍රතිපත්ති පිළිගන්න මේ පක්ෂය සමග ඕනෑම ඉරණමකට මුහුණ දෙන්න ලෑස්ති පිරිසක් බව—මන්ත්‍රීවරු සංඛ්‍යාවක් බව—මම මතක් කරන්නට කැමතියි. අපට නිසි නායකත්වයක් තිබෙනවා. ඒ නායකත්වය ජනතාවගේ විශ්වාසය දිනාගෙන තිබෙනවා. පස්සා දොරෙන් ඇවිත් ජනාධිපති වුණය කියපු අයගේ කටින්ම—නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීවාගෙ උදවියට—අද පිළිගන්නට සිද්ධ වුණා දැන් අපි ජනාධිපතිතුමා පිළිගන්නවාය කියල. මෙපමණ කලක් අපි කියන කොට ඒක පිළිගත්තෙ නැහැ. දැන් පිළිගන්නවා- අපේ ජනාධිපතිතුමාගේ බුද්ධිමත් භාවය අද මේ රට පමණක් නොවෙයි, මුළු ලෝකයම පිළිඅරන් තිබෙනවා. එතුමාට මේ මන්ත්‍රීවරු කෙරෙහි විශ්වාසයක් තිබෙනවා; මන්ත්‍රීවරුන්ට එතුමා කෙරෙහි විශ්වාසයක් තිබෙනවා. මුළු රටම එක්සත් ජාතික පක්ෂයත් නායකත්වය කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා: මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

ලංකාවේ වෙන ඕනෑම පක්ෂයකට නායකත්වයකට මම අභියෝග කරනවා, පුළුවන් නම් තමන්ගේ සාමාජිකත්වයට කියන්න නායකයා විශ්වාස කරල ඉල්ලා අස්වීමේ ලියකියවිලි දෙන්නය කියල. එක් කෙනෙක් දෙන්නෙ නැහැ. මොනවද කථානායකතුමනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාවට බැරි වුණා නොවැ දවස් ගණනක් තිස්සෙ තමන්ගෙ ලේකම් හොයා ගන්න ඔන්න තිබෙන විනය.

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்தியு)*
**(Mr. Cyril Mathew)**

නිකම් සල්ලිවලට යට වුණා.

**ආර් ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

ඔව්. සමහරු සල්ලිවලට යට වුණා. සමහරු රදළවාද යට යට වුණා. කොමියුනිස්ට් පක්ෂයට තිබුණු විනය මොකක්ද? වික්‍රමසිංහ, එච්. ජී. එස්. රත්නවීර කල්ලිය අණ්ඩුවෙන් ඉවත් වෙන්න ඕනෑය කියන කොට පීටර් කෙනමන් කල්ලිය මොකක්ද කළේ? "අපි ඉවත් වෙන්නෙ නැහැ" කියල ආණ්ඩුවෙන් එක්ක හිටියෙ නැද්ද? විනයක් තිබුණද? මේ රටේ ජනතාව ආඩම්බර වෙන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂය කෙරෙහි. මේ හැම 'මන්ත්‍රීවරයෙක්'ම මෙතැන ඉන්නේ මේ ධානාන්තර රැක ගන්නට නොවෙයි. පක්ෂයත් පක්ෂයේ දර්ශනයත් ප්‍රතිපත්තිත් ජනතාවත් රැක ගන්නයි මේ හැම දෙනාම මෙතැන සිටින්නේ. ජනපතිවරණයේදී ඒ හැම දෙනාම කැප වී ක්‍රියා කළ ආකාරයෙන් ඒක ඔප්පු වුණා.

පක්ෂයේ සුබ සෙත වෙනුවෙන් ඕනෑම පරිත්‍යාගයක් කරන්නට හැම මන්ත්‍රීවරයකුම සූදානමින් සිටිනවා. ජනාධිපතිතුමා දන්නවා ජන මතය. නිසියාකාරව ක්‍රියා කරන්නට එතුමා දන්නවා. ඒ කපිකයින් කවුරුත් කිව්වේ මොකක්ද? ඔව්, මේ ඡන්දය දුන්නේ ජනාධිපතිතුමාට පෞද්ගලිකවය කිව්වා. ජනාධිපතිතුමා ජනතාව ඉදිරියට ගියේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන්, අපේ දර්ශනය අනුව. එම නිසා නිකම් උගුරට හොරා බෙහෙත් කන්නෙ නැතිව ඇත්ත තත්ත්වය ප්‍රකාශ කරන්නය කියල මම කියන්නට කැමතියි. ඔය කුහක තත්ත්වයෙන් කවදාවත් ජනතාව මුළා කරන්නට පුළුවන්කමක් නැහැ. "එක්සත් ජාතික පක්ෂයෙ ඉන්නෙ රන්පොලු හොරු විදේශ විනිමය හොරු අල්ලස්කාරයො පගාකාරයො" ආදී වශයෙන් නොයෙකුත් දේවල් කියාගෙන කියාගෙන ගිහින් අවසානයේදී "ඇත්ත" පත්‍රයේ දාපු ප්‍රවෘත්තිය මොකක්ද? ජනාධිපතිතුමා හොරෙන් නීති විරෝධී ලෙස ඉඩම් අත්පත් කර ගත්තාය කියල මහ මුසාවක් ලොකු සුදු අකුරුවලින් කළු තලයක පළ කළේ නැද්ද කියල මම අහන්න කැමතියි. අන්තිමට කීවෙ මොකක්ද? 'ඇත්ත' පත්තරේ තිබුණු දේවල් මට හොඳට මතකයි. අද කට පුරා කියනවා, 'ජනතා විශ්වාසය දිනූ නායකයා' කියා. මෙන්න, ඔක්තෝබර් 19 වැනිදා ජනපතිවරණයට ඉස්සරින් දා—ඇත්ත' පත්තරය:

'ජේ. ආර්. කරපු මගඩි මෙන්න'

කලවානේ මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) මේවා ගැන ලජ්ජා වෙන්න ඕනෑ. මේ ප්‍රචාර ඔක්කොම තූ තූ කොට විසි කළා, මහජනතාව. අපේ ජනාධිපතිතුමාට විරුද්ධව ඒ විධියේ ප්‍රචාර ගෙන ගියත් ජනතාව පිළිගත්තා, ඒවා කියන මිනිස්සු ජාත්‍යන්තර හොරු බව. සිරිමා බණ්ඩාරනායක නොවෙයිද, එච්. ජී. එස්. රත්නවීරව අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව—සී. ජේ. සී. එක—ඉස්සරහට ගෙනිච්චෙ?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

ගෙනිච්චෙ නැහැ.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
**(Mr. R. Premadasa)**

එහෙනම්, ගෙනියන්න හැදුවා? [බාධා කිරීම්] විදේශ විනිමය මංකොල්ලකාරයෙක් කියල ඒ කොමිසම ඉදිරියට ගෙනිච්චෙ නැද්ද? ඒ අතීතය මතක නැද්ද? [බාධා කිරීම්] ඔව්, දුම්න්ද බිල්ඩිම ගැන. කොමියුනිස්ට් පක්ෂයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හොඳයි, නායිකාව හොඳ නැහැ?

කොමියුනිස්ට් පක්ෂයේ චාල්ස් වේදකන් අහු වුණේ මොනව කළාටද? කථානායකතුමනි, යේසුස් වහන්සෙ කියපු එකක් මට මේ වේලාවෙ මතක් වෙනවා. පවුකාරයෙක් නොවෙනව නම් ගල් ගහපල්ල කියල එතුමා කිව්වා. කොමියුනිස්ට් පක්ෂය අපේ ජනාධිපතිතුමාට විරුද්ධව මොන තරම් කැත ප්‍රචාර ගෙනිච්චත් මේ රටේ ජනතාව ඔවුන්ට වඩා බුද්ධිමත්. ඒ, පත්‍රයේ දාපු සේනකට මොකද වුණේ? කොහේ හිටපු අයද මේ? [බාධ කිරීමක්] දැන් විපක්ෂයේ මන්ත්‍රීවරු අපේ මන්ත්‍රීවරුන්ට අපහාස කර-කර කථා කරනවා. එදා—19 වැනි දා—අන්තිමට අපේ නායකතුමාටත් අපහාස කළා. 'හොරෙන් ඉඩම් මංකොල්ල කෑවා, ජේ. ආර්. කරපු 'මගඩි' කියල. ඒ උදවිය හාල් පොත් මගඩියකුත් කළා.

නමුත් අපේ මුද්ධිමත් ජනතාව 20 වැනි දා දුන්නා, තමන්ගේ ඡන්දය. මා කනගාටු වෙනවා මේ අවස්ථාවේදී නුවරඑළිය—මස්කෙළිය දෙවැනි මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) මෙතැන නැති එක ගැන. එතුමා මට තුණ්ඩු කෑල්ලක් එවල තිබුණා, 'සවස හයේ ඉඳලම මාව හමු වන්න ආපු නියෝජිත පිරිසක් බලා ගෙන සිටින නිසා 'මට යන්න වෙලා තිබෙනවා' කියා. එතුමා නම් යන බව දැනුම් දුන්නා. නමුත් කෝ, අනිත් මෙතැනට ඇවිත් කථා කරපු මන්ත්‍රීවරු? දැන් දොළහට කාලක් වෙන්න ආවා. අපි ඒ තරම් වෙලා මෙයි රැඳී සිට පාර්ලිමේන්තුවට තිබෙන අපේ ගෞරවය,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැලකිල්ල දක්වනවා. නමුත් අරගොල්ල ඇවිල්ල හිටන් මෙතැන නොයෙකුත් චෝදනා කරල පැනල යනව.

මැදවච්චියේ මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) මේ තරම්—අද වගේ—පහත් තත්ත්වයකට වැටෙයි කියල මම කවදාවත් හිතුවෙ නැහැ. එතුමා මොකක්ද කීවෙ, මට? එතුමා අර කොමිටිය ඉදිරියේ දීපු කට උත්තර පෙන්වන්න මම ලෑස්ති වෙන කොට 'ඒක හරි නැහැ මෙතැන ඒව ඉදිරිපත් කරන්න බැහැ' කියල මට බාධා කරල රීති ප්‍රශ්නයකුත් මතු කරල, ඊට පස්සෙ කියනවා, 'නැහැ, මම කීවෙ මේකට ඒක අදාළ නැහැ කියන එකයි' කියල.

මොකක්ද මට ඕනෑ කළේ, පෙන්වන්න? එතුමා ඇවිල්ල දීපු සාක්ෂි අනුව බණ්ඩාරනායක මහත්මියගේ ප්‍රජා උරුමය නැති වන දවසේදී ක්‍රියාත්මක කරන්න හිටපු වැඩ පිළිවෙළ ගැන බලන කොට 'මේ රටේ ලේ ගංගාවක් ඇති කරන්න ඒ අය ක්‍රියා කළාය කියන චෝදනාව බොරුයි කියන්න බැරියයි' ඔප්පු කරන්නයි, මට ඕනෑ කළේ. හැරිස්පත්තුවේ දෙවැනි මන්ත්‍රීතුමාත් දැන් ඒ ගැන කිව්වනේ! ඒක ඔප්පු කරන්නයි, මට ඕනෑ කළේ. මැදවච්චියේ මන්ත්‍රීතුමාගේ කටින්මයි, එය කියැවුණේ.

මොකක්ද, අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තත්ත්වය? නුවරඑළිය—මස්කෙළියේ දෙවැනි මන්ත්‍රීතුමා නැඟිට කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දැන් පිල් නැහැ කියා. [බාධා කිරීම්] මෙයා කියනවා, මෛත්‍රී පිල කියා එකක් තියෙනවා කියල. ඊළඟට අරයා කියනවා, වැරදි කරල තියෙනවා නම් කාට වුණත් කමක් නැහැ, දඬුවම් කරන්නය කියල. ඒ ගොල්ලන්ගේ සීමා මාලකය තුළ මේ කරපු අපරාධය? නිකන් යන මන්ත්‍රීවරයකුට ගහපු එක? එයා නොදන්නවා කියල කියනවද ඒක? අනික් අය දඬුවම් කරන්න ඉස්සෙල්ලා මොකක්ද පක්ෂයෙන් කරන දඬුවම?

හෙක්ටර්—ඇක්ටර් පිළ. එතකොට මේ ඉලංගරත්න පිල මොකක්ද? මෙයා දැන් කියනවා එයාට බලයක් නැතිලු මෙහෙම කතාවක් කියන්න. "කොබ්බෑකඩුව ජයගත් පසු වමේ රජයක් පිහිටුවනවා." ඉලංගරත්න කියනවා. කාගෙ පත්තරයද මේ කියන්නෙ? අක්කගෙ පත්තරේ හා පක්ෂය වෙනුවෙන් ගහන "දිනකර" පත්තරේ මේ කියන්නේ. ඒ කථාවෙන් පස්සේ දැන් පිල් වැඩි වෙලා බව මට පෙනෙනවා. මොණරටත් වැඩිය පිල් තිබෙනවා දැන්. ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීවරු මේ ගරු සභාවේ කථා කරන්නේ හරියට මේ රටේ ජනතාව බබ්බුයි කියා හිතාගෙන.

මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) සිද්ධි වගයක් ගැන කිව්වා. මේ වාර්තාව මම පොලීසියෙන් ගෙන්වා ගත්තා.

Sir, he made very serious allegations in regard to some incidents at Medawachchiya. In fairness to the Medawachchiya electorate and our organiser Mr. Ariyadasa, I think it is my duty to read this report and see that it goes into HANSARD. Now this is the report that was sent by Mr. J. D. M. Ariyasinghe, D.I.G. North Central Region to the Inspector General of Police :

R. Rajasingham Esq.,
I.G. Police.

ALLEGATIONS OF MR. MAITHRIPALA SENANAYAKE OF ELECTION INCIDENTS AT MEDAWACHCHIYA

1. Regarding your telephone conversation this morning, I had the allegations made looked into by S/S. P. Anuradhapura and A.S.P. Adhapura (2) whose report is annexed herewith.

2. I also personally questioned O.I.C. Medawachchiya and A.S.P. Anuradhapura (2) and I too personally visited Medawachchiya and looked into the situation. The picture painted by Mr. M. Senanayake is highly exaggerated. There is no evidence of disconnection of Electricity or Telephones during this period. There have been no reports of supporters of Mr. Ariyadasa going about in vehicles and harassing S.I.F.P. supporters. On the 21st evening after the announcement of the results Mr. Ariyadasa visited Medawachchiya and at 3 points people were collected to greet him and the A.S.P. and O.I.C. had been personally present and saw to the dispersal of the crowds gathered. Mr. Ariyadasa himself had co-operated to get them away and had stopped further visits on the request of the A.S.P. That evening I too visited Medawachchiya and checked on this. Army Patrols were also sent to Medawachchiya.

3. In all, seven pre-Election incidents and two post-Election incidents had been reported by S.L.F.P. supporters and all these incidents had been inquired into and appropriate action taken. Only one incident had led to physical injury to persons, that of assaulting with a club on the head and robbery of a gun of R. M. Rajakaruna of Kadawathgama, on 1982.10.24. The two suspects in this case had surrendered to the A.S.P. and allege that Rajakaruna was parading with a gun when they took away his gun. On a statement this gun was recovered. The suspects have been produced in courts to be remanded. OIC Medawachchiya had conducted proper inquiries into this case. No cases of damage to dwelling houses or shops have been reported.

4. I have inquired from Mr. Maithripala Senanayake who rang me to-day and also from the persons who had called at Mr. Maithripala Senanayake's house and ascertained the sensitive spots and having discussed with the A.S.P. and the OIC arranged for special patrolling of the sensitive areas, both by the Police and the Army. I informed Mr. Maithripala Senanayake of the action being taken.

5. A report from S/S.P. Anuradhapura Division is annexed.

(J. D. M. Ariyasinghe)
*D.I.G. N.C.R.*

Office of the D.I.G. N.C.R.,
Anuradhapura,
1982.10.26.

Now these are the facts. These are Police facts. He just comes here and shouts, and makes all sorts of baseless allegations and quietly run away. So was the hon. Member for Kotmale. What was he saying? He says :

"මම නම් ඔය ජනමත විචරණ ඡන්දයකින් එනවාට කැමති නැහැ" අප්පෝ! මොන තරම් ප්‍රජාතන්ත්‍රවාදියෙක්ද? එහෙනම් මොකටද ඔය ඉන්නේ? ඒ ප්‍රදේශයේ ජනතාවට ඉතාමත්ම පැහැදිලි ලෙස කොත්මලේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

මන්ත්‍රීතුමාව (ආනන්ද දසනායක මහතා) පරාජය කළා. මෙතැනට ඇවිදින් හරියට කථා කරනවා ජනසම්මත වාදයේ පීතෘවරයෙක් වගේ. නොයෙක් චෝදනාවල් නැගුවා. හරි නම් එතුමාගේ තර්කය අනුව අද මෙතැන ඉන්න ඕනෑ මහින්ද දැල්පිටිය මහතා. කොත්මලේ මන්ත්‍රීතුමා කැමති නැතිලු වෙන ක්‍රමයකට පාර්ලිමේන්තුවේ ඉන්න. මගේ කථාවේදී මම සඳහන් කළ පරිදි ඉතාමත්ම අනර්ඝ සංවිධානයක් මම දැක්කා කොත්මලේ ආසනයේ. නව මැතිවරණයක් තිබුණත් මෙතුමා ඒකෙනුත් පරදිනවා. කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) ඒ තරම් ජන අප්‍රසාදයට පත් වෙච්ච මන්ත්‍රීවරයෙක් බවට පත් වෙලා තිබෙනවා. ඒ බව අද කොත්මලේට යන ඕනෑම කෙනෙකුට තේරෙනවා. එතුමා මෙතැනට ඇවිදින් නොයෙක් විධියේ අභූත චෝදනාවල් නගනවා. ගරු කථානායකතුමනි නීති විරෝධී වැඩක් කෙරුණා නම් ඒ අනුව සුදුසු පරිදි ක්‍රියා කරන්න ඕනෑම කෙනෙකුට අවකාශයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, නීති විරෝධී වැඩක් කෙරුණා නම් ඒ අනුව සුදුසු පරිදි ක්‍රියා කරන්න ඕනෑම කෙනෙකුට අවකාශයක් තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමා කී කාරණා ගැන අපි සොයා බලනවා. මා කියන්න කැමතියි මේ අවස්ථාවේ දී—මැද කොළඹ සිදු වූ සිද්ධි කිහිපයක් ගැන මා මුලින් සඳහන් කළා—මා කලින් ඉදිරිපත් කළ දිවුරුම් පෙත්සම ලැබී තිබෙන්නේ නාගරික මන්ත්‍රී ඊ. එම්. සංඝදාස මහතාගෙන්. හැන්සාඩ් වාර්තාගත වෙන්න මගේ මුල් කථාව කරන අවස්ථාවේ දී සභාගත කළා.

ඒ වාගේම එතුමා මට දී තිබෙන ලිපියක් මෙන්න:

"1982. 10. 27 දින.

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය,
ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා,
15, සුචරිත මාවත,
කොළඹ 12.

ගරු අග්‍රාමාත්‍යතුමණි:

**එක්සත් ජාතික පක්ෂ රජය පළිගැනීම්වලින් තොර බවට සාක්ෂි**

1970 මැයි මස 27 වන දින පැවැත්වූ මහ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය පරාජයට පත්වූ අවස්ථාවේදී, සීමාසහිත සිනමාස් සමාගමට අයත්, රත්නපුර ලක්ෂ්මි සිනමා හලේ තිරගත වූයේ ගාමිණී ෆොන්සේකා මහතා ප්‍රධාන චරිතය රඟපාන "ආත්ම පූජා" චිත්‍රපටයයි. එම අවස්ථාවේදී නන්ද එල්ලාවල මහතාගේ මැදිහත් වීමෙන් එම සිනමා හලටත්—සිනමා හල ඉදිරිපිට සවිකර තිබූ කටවුට් වලටත් දාමරිකයන් පිරිසක් විසින් ගිනි තබන ලදී. ඉන් ඉක්බිතිව සතියක් ගතවීමට මත්තෙන් එම ලක්ෂ්මි සිනමා හල රජ්‍යයේ පාලනයට ගෙන, සමූපකාරයකට පරිවර්තනය කරන ලදී. මීට හේතුව් ඇත්තේ "ආත්මපූජා" චිත්‍රපටයේ ප්‍රධාන චරිතය රඟපෑ ගාමිණී ෆොන්සේකා මහතා එ. ජා. ප. වේදිකාවල කථා කළ බැවිනි.

ඉකුත් කාල සීමාව තුළ රූපවාහිනියෙන් විසුරුවා හැරි බොහෝ සිංහල චිත්‍රපටද විජය කුමාරතුංග මහතා රඟපෑ ඒවායි. ගුවන් විදුලියෙන් ඔහුගේ නම පක්ෂ භජනයකින් තොරව නිරතුරු ප්‍රචාරය කෙරෙයි. 1982 ඔක්තෝබර් මස 20 දින පැවති ජනාධිපතිවරණයට කලින් "දිනකර" පුවත්පත මඟින් ජනාධිපතිතුමාට විරුද්ධව ප්‍රකාශයකට අත්සන් කර තිබූ අය අතුරින් කෙනෙකු වන චිත්‍රපට අධ්‍යක්ෂ වසන්ත ඔබේසේකර මහතාව යුනිසෙෆ් ආයතනයෙන් රූපවාහිනී සාකච්ඡාවකට පසුගිය 24 වැනිදා රාත්‍රී කැඳවා තිබුණි.

තවද, ජනාධිපතිතුමාට විරුද්ධව, විපක්ෂයේ ප්‍රචාරක අංශයේ ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කළ චිත්‍රපට අධ්‍යක්ෂ යසපාලිත නානායක්කාර මහතා දැනට පදිංචිව සිටින්නේ එ. ජා. ප. යේ හිතවතක වන ආනන්ද වික්‍රමසිංහ මහතාගේ නිවසේය. ආනන්ද වික්‍රමසිංහ මහතා යසපාලිත නානායක්කාර මහතාත් විවාහ වී සිටින්නේ එක් කුස උපන් අක්කා—නගෝ දෙනනකු සමගය. මැතිවරණ ප්‍රතිඵල නිකුත් වන අවස්ථාවේ සුවිනීතා කෝන්ගහගේ මහත්මිය හා එම මහතාද ජනතාවට මුහුණ දීමට බැරිව ලජ්ජාවෙන් සැඟවී සිටියේ ද මෙම නිවසේය.

සැම මැයි දිනයකම භාරතයෙන් ගායක ගායිකාවන් එ. ජා. ප. ය වේදිකාවට ගෙනාවේ වික්‍රමසිංහ මහතාගේ අනුග්‍රහයෙනි. දිනකර පුවත් පතේ ජනාධිපතිතුමාට විරුද්ධව අත්සන් කර තිබූ අය අතර සිටින ප්‍රේමසිරි කේමදාස මහතාට රූපවාහිනියේ අලුත්ම ප්‍රවෘත්ති තේමාව සම්පාදනය කරන්නට දී ඇත.

එ. ජා. පක්ෂය කිසිවකුගෙන් පළි නොගන්නා බවට ඉහත සඳහන් කාරණා හොඳටම සාක්ෂි බව ඔබතුමාට යටහත්ව දන්වමි.

මෙයට—
ඊ. ඇම්. සංඝදාස,
(නාගරික මන්ත්‍රී)"

මැද කොළඹ ඇතිවූ සිද්ධි මගේ කථාවේ මුලින්ම කියා ඒ සිද්ධි පිළිබඳ දිවුරුම් පෙත්සම මම සභාගත කළා.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මීට වඩා ප්‍රමාද කරන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. මේ විවාදයට සහභාගිවුණ සියලුම මන්ත්‍රීවරුන්ට මම ස්තුති වන්ත වෙනවා. අපි සම්පූර්ණ අවස්ථාවක් දුන්නා සියලු දෙනාටම මේ අවස්ථාවේදී ජනාධිපතිවරණයත්, ඊට අදාළ සිද්ධිත්, හදිසි නීතියත් පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න. ඒ නිසා ඒ අදහස් ප්‍රකාශ කිරීමෙන්, මෙපමණ වේලාවක් ප්‍රමාදවී රාත්‍රි 12 වනතුරු ඉඳ මේ සභාවේ කටයුතු වලට සහභාගී වීම ගැන තමුන්නාන්සේටත්, සියලුම මන්ත්‍රීවරුන්ටත් මම ස්තුතිවන්ත වෙනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
### ஒத்திப்போடல்
### ADJOURNMENT

**එකල්හි වේලාව අ. භා. 8 පසුකර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.**

**පාර්ලිමේන්තුව ඊට අනුකූලව 1982 ඔක්තෝබර් 28 වන බ්‍රහස්පතින්දා මධ්‍යම රාත්‍රි 12 ට අද දින සභා සම්මතිය අනුව, 1982 නොවැම්බර් 2 වන අඟහරුවාදා අ. භා. 3 වන තෙක් කල් ගියේ ය.**

*அப்பொழுது பி. ப. 8 மணிக்குப் பிந்திவிட்டமையால் சபாநாயகர் அவர்கள் வினாவின்றி பாராளுமன்றத்தை ஒத்திவைத்தார்கள்.*

*இதன்படி நள்ளிரவு 12 மணிக்கு பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 1982 நவம்பர் 2, செவ்வாய்க்கிழமை பி. ப. 3 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 8.00 p.m.*, MR. SPEAKER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly at 12 midnight on Thursday 28th October, 1982, until 3 P.M. on Tuesday 2nd November, 1982, pursuant to the Resolutions of the Parliament of this day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු පිසු මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1982 නොවැම්බර් 11 වන බ්‍රහස්පතින්ද,**

**නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.**

---

குறிப்பு

*அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு*

***1982 நொவம்பர் 11, வியாழக்கிழமைக்குப் பிந்தாமற்***

**கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.**

---

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD,

**not later than**

**Thursday, 11th November 1982**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් :- පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா: ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions:** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org